# දෙවැනි කොටස

## දෙවැනි කොටස

## ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

**පිටුව**


| | | |
|---|---|---|
| 1. | ගිණුම් සහ මූල්‍ය | 1 |
| 2. | බැංකු අධීක්ෂණ | 57 |
| 3. | බැංකු විදු පියෙස | 62 |
| 4. | සන්නිවේදන | 63 |
| 5. | ව්‍යවහාර මුදල් | 65 |
| 6. | දේශීය කටයුතු | 68 |
| 7. | ආර්ථික පර්යේෂණ | 71 |
| 8. | සේවක අර්ථසාධක අරමුදල | 75 |
| 9. | විනිමය පාලන | 80 |
| 10. | පහසුකම් කළමනාකරණ | 83 |
| 11. | මූල්‍ය කටයුතු | 84 |
| 12. | මූල්‍ය බුද්ධි ඒකකය | 86 |
| 13. | මූල්‍ය ස්ථායීතා අධ්‍යයන | 87 |
| 14. | අධිපති ලේකම් | 88 |
| 15. | මානව සම්පත් කළමනාකරණ | 89 |
| 16. | තොරතුරු තාක්ෂණ | 96 |
| 17. | අභ්‍යන්තර විගණන | 98 |
| 18. | ජාත්‍යන්තර මෙහෙයුම් | 99 |
| 19. | ගෙවීම් සහ පියවීම් | 101 |
| 20. | ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ | 104 |
| 21. | පළාත් කාර්යාල මෙහෙයුම් කටයුතු | 105 |
| 22. | රාජ්‍ය ණය | 106 |
| 23. | ප්‍රාදේශීය සංවර්ධන | 109 |
| 24. | ලේකම් දෙපාර්තමේන්තුව | 113 |
| 25. | ආරක්ෂක සේවා | 114 |
| 26. | සංඛ්‍යාන | 114 |
| 27. | කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ | 117 |
| 28. | බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ | 118 |

## I. ගිණුම්කරණ සහ මූල්‍ය

**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2013 දෙසැම්බර් 31 දිනට කළමනාකාරිත්ව ප්‍රකාශය**

**ස්වකීය අරමුණුවලට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්කටයුතු භාවය සහ මූල්‍ය කාර්යසාධනය**

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස මහ බැංකුව මූල්‍ය නීති පනත යටතේ ස්ථාපිත කරන ලදී. එම පනතේ විධිවිධාන පරිදි ප්‍රධාන පරමාර්ථයන් වන ආර්ථික සහ මිල ස්ථායිතාවය හා මූල්‍ය පද්ධති ස්ථායිතාවය සාක්ෂාත් කර ගැනීමේ වගකීම බැංකුව වෙත පැවරී ඇත.

එබැවින්, මහ බැංකුවේ ගිණුම්කටයුතුභාවය සහ එකී මෙහෙයුම් වල සාර්ථකත්වය වන්නේ එම ප්‍රධාන පරමාර්ථයන් කරා ළඟාවීම සඳහා වන ප්‍රතිපත්ති හා මෙහෙයුම් වල සඵලතාවය විනා එහි ලාභදායීත්වය නොවන්නේය. මහ බැංකුව, වෙනත් පුද්ගලික හෝ රාජ්‍ය ආයතනවලින් වෙන් කොට හඳුනා ගැනෙන මූලික ලක්ෂණය නම් මෙම ව්‍යවස්ථාපිත පරමාර්ථයන්ය. පොළී අනුපාතය සහ විදේශ විනිමය අනුපාතය කෙරෙහි බලපාන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් මගින් ලාභ ජනනය කිරීමේ අද්විතීය හැකියාවක් මහබැංකුව සතු බැවින් එය ලාභදායිත්ව ප්‍රවේශයක් අනුගමනය කළේ නම් ලාභ ජනනය වන අතර ප්‍රධාන පරමාර්ථ නොසලකා හැරීමක් වනු ඇත. එබැවින් මහ බැංකුවේ ආර්ථික හා මිල ස්ථායිතා මූල්‍ය පද්ධති ස්ථායිතා පරමාර්ථයන්, ලාභදායිතා අරමුණු වලින් වියුක්ත කළයුතු අතර එය හුදෙක් ආනුශාංගික අරමුණක් වියයුතු වන්නේය.

මහ බැංකුවේ ප්‍රතිපත්ති මෙහෙයුම්, විනිමය අනුපාත කළමනාකරණය, මුදල් නෝට්ටු නිකුතුව ආදිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල, උපලබ්ධි වටිනාකම් මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන්හි අදාල ගිණුම්කරණ සහ වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූලව සටහන් කරන අතර, මෙය සමස්ත රාජ්‍ය ගිණුම්කරණ කටයුතුභාවයෙන් කොටසක් සාක්ෂාත් කර ගැනීමක් ලෙස මූල්‍ය ගිණුම්කරණ කටයුතුභාවය සඳහා පදනම සපයනු ලබන අතර, මෙම ප්‍රකාශයන්හි වාර්තා කර ඇති මූල්‍ය කාර්යසාධනය සහ අවබෝධ කර ගැනීම එම පසුතලයේ පිහිටා කළයුතුය.

මූල්‍ය නීති පනතේ 42 හා 43 වගන්ති ප්‍රකාර විගණකාධිපති විසින් කරනු ලබන බාහිර විගණනයකට ශ්‍රී ලංකා මහ බැංකුව භාජනය වේ. ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූල බවට සහතික වීම සඳහා ජාත්‍යන්තර විගණක ප්‍රමිතයන්ට අනුකූලව විගණනයක් කිරීම සඳහා අර්න්ස්ට් සහ යංග් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සේවය විගණකාධිපතිතුමා විසින් ලබාගෙන ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / துலைவா / My No: එෆ්බී/කේ/සීබීඑස්එල්/එෆ්ඒ/2013

ඔබේ අංකය / உமது இல / Your No.:

දිනය / திகதி / Date: 2014 මාර්තු 24 දින

ගරු මුදල් අමාත්‍යතුමා,

**ශ්‍රී ලංකා මහ බැංකුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මුදල් නීති පනතේ (422 අධිකාරිය) 42 (2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ මුදල් නීති පනතේ (422 අධිකාරිය) 42 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්වලට අනුකූලවීම පිළිබඳව වූ විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැළි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහය වන ලදී.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

එච්.ඒ.එස්. සමරවීර
**විගණකාධිපති**


අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

# ශ්‍රී ලංකා මහ බැංකුව

## 2013 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

| | සටහන | **2013**<br>**රු. 000** | නැවත ප්‍රකාශිත<br>2012<br>රු. 000 | නැවත ප්‍රකාශිත<br>2011<br>රු. 000 |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | |
| මුදල් සහ මුදල් සමානයන් | | **425,676,763** | 235,278,133 | 303,551,702 |
| ලාභ හෝ අලාභ මත සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 5 | **94,137,368** | 169,312,604 | 106,006,361 |
| විකුණුම් සඳහා වූ ආයෝජන | 5 | **357,531,750** | 386,761,690 | 270,664,801 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 6 | **5,670,258** | 3,989,701 | 2,794,334 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) සම්බන්ධ වත්කම් | 7 | **85,400,764** | 81,352,282 | 73,090,517 |
| අනිකුත් ලැබිය යුතු දෑ | | **591** | 8,243,512 | 19,361,831 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | **968,417,494** | 884,937,922 | 775,469,546 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 8 | **15,853,513** | 175,251,772 | 183,885,564 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | 9 | **109,167,071** | 111,291,843 | 94,743,013 |
| බැංකු සඳහා දෙන ලද ණය | 10 | **1,375,396** | 1,844,237 | 2,313,533 |
| අනිකුත් ලැබිය යුතු දෑ | | **1,829,712** | 2,970,099 | 2,924,028 |
| මූල්‍ය සහ අනිකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | 11 | **41,095** | 41,095 | 41,211 |
| අනිකුත් වත්කම් | 12 | **6,443,534** | 5,573,731 | 4,695,913 |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | | **134,710,321** | 296,972,777 | 288,603,262 |
| **මුළු මූල්‍ය වත්කම්** | | **1,103,127,815** | 1,181,910,699 | 1,064,072,808 |
| **විදේශීය මූල්‍ය නොවන වත්කම්** | | | | |
| රන් | 13 | **95,601,221** | 77,688,838 | 43,819,156 |
| **දේශීය මූල්‍ය නොවන වත්කම්** | | | | |
| තොගය | 14 | **3,103,281** | 2,942,193 | 2,484,681 |
| අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම් | | **29,910,697** | 2,296,826 | 1,980,518 |
| දේපල පිරියත සහ උපකරණ | 15 | **14,228,915** | 13,913,077 | 9,996,697 |
| අස්පෘශ්‍ය වත්කම් | 16 | **35,598** | 24,153 | 13,723 |
| විශ්‍රාම වැටුප් සහ අනෙකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් | 43 | **-** | - | 1,020,925 |
| **මුළු මූල්‍ය නොවන වත්කම්** | | **142,879,712** | 96,865,087 | 59,286,346 |
| **මුළු වත්කම්** | | **1,246,007,527** | 1,278,775,786 | 1,123,359,154 |
| **බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය** | | | | |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | 17 | **21,504,196** | 2,619,847 | 937,712 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 6 | **16,183,282** | 3,257,119 | 1,041,597 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 18 | **37,301,553** | 28,953,955 | 90,032,085 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) | 19 | **422,032,012** | 467,642,196 | 328,772,419 |
| අනිකුත් | 20 | **47,221,119** | 64,520,662 | 58,621,764 |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | | **544,242,162** | 566,993,779 | 479,405,577 |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | 21 | **148,809,893** | 166,288,378 | 146,269,185 |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | 22 | **416,230** | 699,628 | 1,799,030 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | 23 | **84,601,000** | 7,015,000 | 14,089,000 |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | 24 | **2,419,087** | 1,341,268 | 875,124 |
| අනිකුත් ගෙවිය යුතු දෑ | 25 | **5,659,718** | 31,934,646 | 28,041,215 |
| **මුළු දේශීය මූල්‍ය බැරකම්** | | **241,905,928** | 207,278,920 | 191,073,554 |
| **මුළු මූල්‍ය බැරකම්** | | **786,148,090** | 774,272,699 | 670,479,131 |
| **අනිකුත් බැරකම්** | | | | |
| සංසරණයෙහි පවතින මුදල් | 26 | **339,770,981** | 318,060,142 | 293,233,361 |
| විලම්භිත ප්‍රදාන | 27 | **1,449** | 2,389 | 3,468 |
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | 43 | **4,936,339** | 3,832,688 | - |
| විවිධ බැරකම් සහ උපචිතයන් | 28 | **243,455** | 143,916 | 884,048 |
| **මුළු අනිකුත් බැරකම්** | | **344,952,224** | 322,039,135 | 294,120,877 |
| **මුළු බැරකම්** | | **1,131,100,314** | 1,096,311,834 | 964,600,008 |
| **හිමිකරු ප්‍රාග්ධනය** | | | | |
| ප්‍රාග්ධන අරමුදල | | **35,000,000** | 35,000,000 | 25,000,000 |
| සංචිත | | **79,907,213** | 147,463,952 | 133,759,146 |
| **මුළු හිමිකම් ප්‍රාග්ධනය** | | **114,907,213** | 182,463,952 | 158,759,146 |
| **මුළු බැරකම් සහ හිමිකම් ප්‍රාග්ධනය** | | **1,246,007,527** | 1,278,775,786 | 1,123,359,154 |

මෙම මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් 2014 පෙබරවාරි 28 වැනි දින මුදල් මණ්ඩලය වෙනුවෙන් නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

අජිත් කබ්රාල්

අජිත් නිවාඩ් කබ්රාල් - අධිපති　　　　　　　　　　　　එම්. අයි. සුහියාන් - ප්‍රධාන ගණකාධිකාරී

පිටු අංක 07 සිට 56 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
### 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා
### ආදායම් ප්‍රකාශනය

| | සටහන | 2013 රු. 000 | 2012 රු. 000 |
|---|---|---|---|
| මෙහෙයුම් ආදායම | | | |
| **විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොළී ආදායම | 31 | **18,505,656** | 13,571,866 |
| උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය / (පාඩුව) | | **(27,892,406)** | 296,049 |
| මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වාසිය / (පාඩුව) | | **13,389,159** | 16,770,494 |
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් මුළු ආදායම** | | **4,002,409** | 30,638,409 |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත වියදම්** | | | |
| පොළී වියදම | 32 | **(4,447,401)** | (5,769,658) |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත මුළු වියදම** | | **(4,447,401)** | (5,769,658) |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය / (පාඩුව) | | **(26,758,639)** | 25,181,713 |
| **විදේශීය මූල්‍ය ආයෝජන ආදායම / (පාඩුව)** | | **(27,203,631)** | 50,050,464 |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොළී ආදායම | 31 | **14,450,134** | 25,957,602 |
| පොළී වියදම | 32 | **(2,979,850)** | (1,091,540) |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත මුළු ආදායම** | | **11,470,284** | 24,866,062 |
| අනිකුත් ආදායම් | 33 | **2,919,260** | 976,019 |
| මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම / (පාඩුව) | | **(12,814,087)** | 75,892,545 |
| **මෙහෙයුම් වියදම් :** | | | |
| සේවක මණ්ඩල වියදම් : | 34 | | |
| - වැටුප් සහ වේතන | | **(3,138,445)** | (2,865,544) |
| - නිශ්චිත දායක සැලසුම් පිරිවැය | | **(447,626)** | (426,622) |
| - පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් පිරිවැය සඳහා වූ අතිරේක දායකත්වය | | **(1,988,525)** | (344,328) |
| | | **(5,574,596)** | (3,636,494) |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | | **(365,644)** | (322,622) |
| තොග පිරිවැය | | **(1,476,937)** | (1,816,933) |
| සෙමින් චලනය වන විෂයන් සඳහා වෙන් කිරීම් | | **(20,000)** | - |
| පරිපාලන වියදම් | 35 | **(1,997,048)** | (1,378,295) |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන ශුද්ධ අලාභය | | **-** | (3,963) |
| මුළු මෙහෙයුම් පිරිවැය | | **(9,434,225)** | (7,158,307) |
| ආදායම් බදු වලට පෙර ලාභය / (අලාභය) | | **(22,248,312)** | 68,734,238 |
| ආදායම් බද්ද | 36 | **(2,016,217)** | (2,525,694) |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය / (අලාභය) | | **(24,264,529)** | 66,208,544 |

පිටු අංක 07 සිට 56 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
### 2013 දෙසැම්බර් 31 න් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා
### විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| | 2013 රු. 000 | 2012 රු. 000 |
|---|---|---|
| ශුද්ධ ලාභය/(අලාභය) | **(24,264,529)** | 66,208,544 |
| **අනෙකුත් විස්තීරණ ආදායම්** | | |
| විකුණුම් සුරැකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම ලාභය/(අලාභය) | **(13,904,065)** | 1,835,087 |
| දේපළ පිරියත - උපකරණ ප්‍රත්‍යාගණන ලාභය | **-** | 3,280,575 |
| විකුණූ දේපළ පිරියත උපකරණයන්හි ප්‍රත්‍යාගණන ලාභය මාරුකිරීම් | **(40)** | - |
| පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් පිරිවැය අනෙකුත් විස්තීරණ ආදායම්වලට මාරු කිරීම් | **(592,417)** | (4,619,242) |
| මුළු විස්තීරණ ආදායම | **(38,761,051)** | 66,704,964 |

පිටු අංක 07 සිට 56 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා
## ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශනය

| | දායක ප්‍රාග්ධනය | ප්‍රාග්ධන ලෙස විසර්ජනය කළ සංචිතය | ප්‍රත්‍යාගණන සංචිතය | අනිකුත් සංචිතය (සටහන 29) | සමුච්චිත ලාභ | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු.000 |
| **2012 ජනවාරි 01 දිනට පෙර වාර්තා කළ පරිදි** | 15,000 | 24,985,000 | 2,706,067 | 82,890,980 | 48,132,745 | 158,729,792 |
| අ.ගි.ප්‍ර.අ. 19 ට අනුව ගැලපුම් | | | | | 29,354 | 29,354 |
| **නැවත ප්‍රකාශිත** | | | | | | |
| **2012 ජනවාරි 01 දිනට** | 15,000 | 24,985,000 | 2,706,067 | 82,890,980 | 48,162,099 | 158,759,146 |
| ශුද්ධ ලාභය / (අලාභය) | - | - | - | - | 66,208,544 | 66,208,544 |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන් අරමුදලට පැවරීම | - | - | - | 153,751 | (153,751) | - |
| පොදු සංචිතයට පැවරීම | - | - | - | 10,142,076 | (10,142,076) | - |
| වෙළඳපල අගයකිරීමේ සංචිතයට පැවරීම | - | - | - | 4,884,031 | (4,884,031) | - |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය මාරුකිරීම | - | - | - | 25,181,686 | (25,181,686) | - |
| ශ්‍රී.ලං.ම.බැ. විශේෂ සංචිතවලට මාරු කිරීම | - | - | - | 93,084 | (93,084) | - |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම් | - | - | 3,280,575 | - | - | 3,280,575 |
| අනෙකුත් විස්තීරණ ආදායම් | - | - | - | 1,835,087 | - | 1,835,087 |
| ශ්‍රී ලංකා මහ බැංකු සේවාදයක සහ විශ්‍රාම ආපද සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | - | - | - | - | (158) | (158) |
| 2011 වර්ෂය සඳහා වූ ඉතිරි ලාභය රජයට පැවරීම | - | - | - | - | (10,000,000) | (10,000,000) |
| 2012 වර්ෂයට අදාළ අන්තර් ලාභයන් රජයට පැවරීම | - | - | - | - | (33,000,000) | (33,000,000) |
| විශ්‍රාම අරමුදල් සංචිතයට මාරු කිරීම | - | - | - | 1,000,000 | (1,000,000) | - |
| සංචිත ප්‍රාග්ධනිත කිරීම | - | 10,000,000 | - | (10,000,000) | - | - |
| පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් පිරිවැය අනෙකුත් විස්තීරණ ආදායම්වලට මාරු කිරීම් | - | - | - | - | (4,619,242) | (4,619,242) |
| **2013 ජනවාරි 01 දිනට** | **15,000** | **34,985,000** | **5,986,642** | **116,180,695** | **25,296,615** | **182,463,952** |
| ශුද්ධ ලාභය/(අලාභය) | **-** | **-** | **-** | **-** | **(24,264,529)** | **(24,264,529)** |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන් අරමුදලට පැවරීම | **-** | **-** | **-** | **191,428** | **(191,428)** | **-** |
| පොදු සංචිතයට පැවරීම | **-** | **-** | **-** | **126,315** | **(126,315)** | **-** |
| විශ්‍රාම පාරිතෝෂිත අරමුදලට හා වෛද්‍ය ප්‍රතිලාභ අරමුදල්වලට මාරු කිරීම | **-** | **-** | **-** | **595,490** | **(523,602)** | **71,888** |
| පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් පිරිවැය අනෙකුත් විස්තීරණ ආදායම්වලට මාරු කිරීම | | | | | **(592,417)** | **(592,417)** |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන අලාභය මාරු කිරීම | **-** | **-** | **-** | **(26,758,632)** | **26,758,632** | **-** |
| ශ්‍රී.ලං.ම.බැ. විශේෂ සංචිතවලට මාරු කිරීම | **-** | **-** | **-** | **91,317** | **(91,317)** | **-** |
| වෛද්‍ය ප්‍රතිලාභ අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිත සංචිතවලින් අදාළ වගකීම් ගිණුම්වලට මාරු කිරීම | **-** | **-** | **-** | **(1,511,789)** | **-** | **(1,511,789)** |
| විකිණූ ස්ථාවර වත්කම්වල ප්‍රත්‍යාගණන ලාභය මාරු කිරීම | | | **(40)** | **40** | **-** | **-** |
| අනෙකුත් විස්තීරණ ආදායම් | **-** | **-** | **-** | **(13,904,065)** | **-** | **(13,904,065)** |
| ශ්‍රී ලංකා මහ බැංකු සේවාදයක සහ විශ්‍රාම ආපද සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | **-** | **-** | **-** | **-** | **(122)** | **(122)** |
| වෙළෙඳපොළ ප්‍රත්‍යාගණන සංචිතයෙන් සමුච්චිත ලාභයට කළ ශුද්ධ මාරු කිරීම | **-** | **-** | **-** | **(6,703,951)** | **6,703,951** | **-** |
| 2012 වර්ෂය සඳහා වූ ඉතිරි ලාභය රජයට පැවරීම | **-** | **-** | **-** | **-** | **(2,355,705)** | **(2,355,705)** |
| 2013 වර්ෂයට අදාළ අන්තර් ලාභයන් රජයට පැවරීම | **-** | **-** | **-** | **-** | **(25,000,000)** | **(25,000,000)** |
| **2013 දෙසැම්බර් 31 දිනට** | **15,000** | **34,985,000** | **5,986,602** | **68,306,848** | **5,613,763** | **114,907,213** |

පිටු අංක 07 සිට 56 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව

### 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2013 රු. 000 | 2012 රු. 000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම්:** | | | |
| ලැබුණු පොළිය - විදේශීය මුදල් | | **21,656,589** | 8,920,505 |
| ලැබුණු පොළිය - දේශීය මුදල් - අනිකුත් | | **513,044** | 485,687 |
| ද්‍රවශීලතා කළමනාකරණ සහ වෙළෙඳ ආදායම් | | **13,389,159** | 16,770,494 |
| උපලබ්ධි වු විනිමය වාසිය / (පාඩුව) | | **(13,638,407)** | (2,713,634) |
| ලැබුණු අනිකුත් ආදායම් | | **1,175,609** | 967,667 |
| | | **23,095,994** | 24,430,719 |
| **විය පැහැදම්** | | | |
| ගෙවන ලද පොළිය - විදේශීය මුදල් | | **4,681,100** | 3,236,655 |
| ගෙවන ලද පොළිය - දේශීය මුදල් | | **2,827,328** | 1,095,513 |
| සේවකයින්ට ගෙවීම් | | **3,947,528** | 3,017,754 |
| සැපයුම්කරුවන්ට ගෙවීම් | | **29,596,753** | 483,137 |
| ගෙවන ලද ආදායම් බදු | | **2,016,217** | 2,525,694 |
| | | **43,068,926** | 10,358,753 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **37** | **(19,972,932)** | 14,071,966 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම් :** | | | |
| අනිකුත් දේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ (වැඩිවීම) / අඩුවීම | | **(858,623)** | (1,252,418) |
| අනිකුත් ආයතනවලට ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම් - ප්‍රාග්ධන අයකරගැනීම් | | **1,448,949** | 1,466,198 |
| මූල්‍ය සහ අනිකුත් ආයතනවල ආයෝජන අපහරණය / මුදාහැරීම | | **-** | 117 |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීම් | | **2,268** | 74,343 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගත් සුරැකුම්පත්වල ශුද්ධ වැඩිවීම | | **77,586,000** | (7,074,000) |
| | | **78,178,594** | (6,785,760) |
| **විය පැහැදම් :** | | | |
| විදේශ මුදල් සුරැකුම්පත්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(101,781,795)** | 95,692,569 |
| අනිකුත් විදේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **1,407,072** | (266,442) |
| අනිකුත් විදේශීය මූල්‍ය බැරකම්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(1,510,810)** | 80,569,162 |
| අනිකුත් දේශීය තැන්පතු සහ ගෙවිය යුතු මුදල්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(722)** | 130 |
| දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනීම් (ප්‍රදානයන් අඩුකිරීමෙන් පසු) | | **694,982** | 957,284 |
| රන් තොගයේ ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **55,585,071** | 29,842,972 |
| අනෙකුත් ආයතන වෙත ලබා දුන් ණයපත් අත්තිකාරම් | | **980,109** | 996,902 |
| | | **(44,626,093)** | 207,792,577 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **122,804,687** | 214,578,337 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම් :** | | | |
| සංසරණ මුදල් ආපසු ගැනීම් | | **259,640,254** | 382,207,833 |
| සංසරණ මුදල් නිකුතුව | | **(237,929,416)** | (357,381,088) |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව | | **21,710,838** | 24,826,825 |
| **අඩුකිරීම් :** | | | |
| රජයේ ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | **38** | **(175,136,711)** | (16,427,265) |
| බැංකු සහ මූල්‍ය ආයතන ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | **39** | **17,284,956** | (19,325,888) |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | | **(157,851,755)** | (35,753,153) |
| **සංසරණ මුදල් ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | **179,562,593** | 60,579,978 |
| **විය පැහැදම් :** | | | |
| විදේශීය මුදල් කාලීන බැරකම් ආපසු ගෙවීම | | **59,020,350** | (97,544,268) |
| අනිකුත් අරමුදල් සඳහා ගෙවීම | | **122** | 158 |
| රජයේ ඒකාබද්ධ අරමුදල සඳහා ලාභ පැවරීම | | **26,350,000** | 43,000,000 |
| | | **85,370,472)** | (54,544,110) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **94,192,121** | 115,124,088 |
| **මුදල් සහ මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම / අඩුවීම** | | **197,023,876** | (85,382,283) |
| මුදල් සහ මුදල් සමානයන් මත වන විනිමය අනුපාතයන් බලපෑම | | **(6,625,246)** | 17,108,714 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමානයන් | | **235,278,133** | 303,551,702 |
| **දෙසැම්බර් 31 දිනට ශුද්ධ මුදල් සහ මුදල් සමානයන්** | **40** | **425,676,763** | 235,278,133 |

පිටු අංක 07 සිට 56 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්ගේ කොටසක් ලෙස කියවිය යුතු සටහන

### 1. වාර්තා කිරීමේ ඒකකය සහ ව්‍යවස්ථාපිත පදනම

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස 1949 අංක 58 දරණ මූල්‍ය නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව ("බැංකුව" හෝ "ශ්‍රී.ලං.ම.බැ.") ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව නිත්‍යව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ පිහිටුවා ඇති අතර, කොළඹ 01, ජනාධිපති මාවතේ අංක 30 දරණ ස්ථානයේ පිහිටා ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශනයන්, මුදල් මණ්ඩලය වෙනුවෙන් නිකුත් කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරි විසින් 2014 පෙබරවාරි 28 වැනි දින අනුමත කරන ලදී.

### 2. ගිණුම්කරණ ප්‍රතිපත්ති

#### 2.1 පිළියෙල කිරීමේ පදනම

පහත සඳහන් නිශ්චිත ගණකාධිකරණ ප්‍රතිපත්තිවලින් හඳුන්වා දී ඇති පරිදි සාධාරණ වටිනාකමට අගය කරන ලද ඉඩම්, ගොඩනැගිලි, රන් සහ ඇතැම් මූල්‍ය වත්කම් හැර, ඓතිහාසික පිරිවැය පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කරන ලදී.

#### 2.1.1 වාර්තා කිරීමේ ආකෘතිය

බැංකුව විසින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් ද ඒවාට අදාල ආදායම් සහ වියදම් මාර්ග ද විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස වෙන්කොට ඉදිරිපත් කරනු ලැබේ. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් සහ බැරකම් ඉදිරිපත් කිරීමේ දී පුළුල් වශයෙන් එක් එක් වර්ගය යටතේ ද්‍රවශීලතාවයේ පිළිවෙලට දක්වා ඇත. මෙම වාර්තාකරණ ප්‍රවේශය මගින්, අංක 4 දරණ සටහනෙහි විස්තරාත්මකව දක්වා ඇති බැංකුවේ ක්‍රියාකාරකම් උචිතව වාර්තා කෙරෙන බව බැංකුවේ අදහස වේ.

#### 2.1.2 අනුකූලතා ප්‍රකාශනය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (ජා.මු.වා.ප්‍ර.) ප්‍රකාර පිළියෙල කර තිබේ. මුදල් නීති පනත අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති අතර විගණකාධිපති විසින් විගණනය කර නීතිමය අවශ්‍යතා මත ගැසට් පත්‍රයේ පල කර ඇත. ජා.මු.වා.ප්‍ර. වල සමහර අවශ්‍යතා මත ගැසට් කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශනවල, ඒවායෙහි වර්ගීකරණය සහ එම නිසා අගයන් මෙම මූල්‍ය ප්‍රකාශන සමග වෙනස් විය හැකිය.

#### 2.1.3 වාර්තා කිරීමේ මුදල් ඒකකය

වෙනත් අන්දමකට දක්වා නොමැති නම්, සියළුම සංඛ්‍යා ආසන්නතම ශ්‍රී ලංකා රුපියල් දහස් වලින් දැක්වේ.

#### 2.2 වැදගත් ගිණුම් නිශ්චයන් සහ ඇස්තමේන්තු

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම මත, වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් ප්‍රමාණයන් සහ අනුගාමී හෙළිදරව් කිරීම් මෙන්ම අසම්භාව්‍ය බැරකම්වල හෙළිදරව් කිරීම්වලට බලපාන්නා වූ නිශ්චයන් ඇස්තමේන්තු හා උපකල්පනයන් සකස් කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙම උපකල්පනයන් හා ඇස්තමේන්තු හා සම්බන්ධ අවිනිශ්චිතතාවය, වත්කම් හා බැරකම්හි ධාරණ අගයන්වලට අනාගත කාලපරිච්ඡේදවලදී බලපාන ලෙස ප්‍රමාණාත්මක ගැලපීමක් අවශ්‍ය කරන ප්‍රතිඵලයක් ඇති කළ හැක.

#### 2.2.1 විකිණීමට ඇති ආයෝජන හානිකරණය

සැලකිය යුතු ලෙස සහ අඛණ්ඩව සාධාරණ අගය එහි පිරිවැයට වඩා පහළට යනවිට, විකිණීම සඳහා ඇති ආයෝජන අගය හානි වී ඇති බව බැංකුව තීරණය කරයි. මෙම ආයෝජන සම්බන්ධයෙන් සැලකිය යුතු බව හෝ අඛණ්ඩ බව යන කරුණු නිශ්චය කිරීමේ දී යම් විනිශ්චයක් කිරීම අවශ්‍ය වේ.

#### 2.2.2 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය ආයුගණන ඇගයීම් මත තීරණය කරනු ලැබේ. ආයුගණන ඇගයීමක දී වට්ටම් අනුපාත, වත්කම්වල අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාත, අනාගත වන්දි ගෙවීම් වැඩිවීම්, මරණ අනුපාතය සහ විශ්‍රාම වැටුප්වල අනාගත වැඩිවීම් පිළිබඳ උපකල්පනයන් සිදුකරනු ලැබේ. මෙම සැලසුම් වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු ලෙස අවිනිශ්චිතතාවයකට භාජනය වේ. භාවිතා කරන ලද උපකල්පන සටහන් අංක 41 හි දැක්වේ.

#### 2.2.3 මූල්‍ය උපකරණවල සාධාරණ අගය

මූල්‍ය වත්කම් හා වගකීමවල සාධාරණ අගයන් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ වාර්තාගත කරන විට එම අගයන් සක්‍රීය වෙළඳපළ තුළින් ලබාගත නොහැකි අවස්ථාවලදී, එම අගයන් ලබා ගැනීම සඳහා විවිධ ආකාරයේ ආගණනය කරනු ලබන ගණිතමය ආකෘතිවලින් යුතු ශිල්පීය ක්‍රම උපයෝගී කරගෙන ඇත. මෙම ආකෘති තුළට යොදාගන්නා යෙදවුම් හැකි සෑම විටම නිරීක්ෂිත වෙළඳපොළ දත්ත මත ලබාගන්නා අතර, එවැනි දත්ත නොමැති අවස්ථාවන්හිදී නිගමන මගින් සාධාරණ අගය ලබාගනු ලබයි. නිගමනවලට එළඹීමේදී ද්‍රවශීලතාවය සහ ආකෘතිවලට යොදාගන්නා ලද යෙදවුම් ආදී වල ඇතුළත් දීර්ඝ කාලීන ව්‍යුත්පන්න (longer-dated derivatives) සැලකිල්ලට ගෙන ඇත.

#### 2.3 ගිණුම්කරණ ප්‍රතිපත්තීන් වෙනස්වීම හා අනාවරණය කිරීම්

#### 2.3.1 ජා. ගි. ප්‍ර. 19 සේවක ප්‍රතිලාභ (2011 සංශෝධිත)

ශ්‍රී ලං.ම.බැ. විසින් ජා. ගි. ප්‍ර. 19 (2011 සංශෝධිත) වර්තමාන කාල පරිච්ඡේදය සඳහා අතීතයට බල පැවැත්වෙන පරිදි, සංශෝධිත ප්‍රමිතියෙහි දක්වා ඇති අන්තර්වාර ප්‍රතිපාදනයන්ට අනුකූලව භාවිතා කර ඇත.

මෙයට අනුකූලව පළමුවෙන් දක්වා ඇති සන්සන්දනාත්මක කාල පරිච්ඡේදයෙහි (2012 ජනවාරි 01) මූල්‍ය තත්ත්වයට අදාළ ආරම්භක ප්‍රකාශය සහ සන්සන්දනාත්මක අගයයන් නැවත ප්‍රකාශ කර ඇත.

මෙම ජා. ගි. ප්‍ර. 19 (2011 සංශෝධිත) මගින් අනෙකුත් වෙනස්කම් ද ඇතුළුව නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් ගිණුම්කරණයන් වෙනස්

වී ඇත. මෙයට අදාළ බැංකුව කෙරෙහි බලපෑමක් කිරීමට සමත් වූ විශේෂ වෙනස්කම් කිහිපයක් පහත දැක්වේ.

සියළුම අතීත සේවා පිරිවැය හඳුනාගනු ලබන්නේ සංශෝධනයන්/ලුහුඩු කිරීමේ ඇතිවන අවස්ථාව හෝ, අදාළ ප්‍රතිව්‍යුහගත කිරීමේ හෝ අවසන් කිරීමේ ගාස්තු හඳුනාගැනීමේ අවස්ථාව යන දෙකින් පළමුවන අවස්ථාවෙහිදී ය. ඒ අනුව, පැවරිය නොහැකි වූ අතීත සේවා පිරිවැය හඳුනාගැනීම තවදුරටත් ඉදිරි පැවරීම් කාල පරිච්ඡේදයකට ගෙන යා නොහැකිය.

මීට ඉහතදී බැංකුව විසින් හඳුනාගන්නා ලද්දේ ජා. ගි. ප්‍ර. 19 ට අනුකූල ව, පෙර කාල පරිච්ඡේදයට අදාළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සහ සැලසුම් වත්කම්වල සාධාරණ අගයයන් යන දෙකින් වැඩි වටිනාකමක් සහිත අගය මත 10% ඉක්මවූ ශුද්ධ සමුච්චිත හඳුනා නොගත් ආයුගණන ලාබ අලාභ පමණි.

මෙහි ප්‍රතිඵලයක් ලෙස හඳුනා නොගත් ශුද්ධ ආයු ගණන ලාභ හා අලාභ අගයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් බැංකුවෙහි මූල්‍ය තත්ත්වය පෙන්වන වාර්තා මගින් පිළිබිඹු නොවුනි. සංශෝධිත ජා. ගි. ප්‍ර. 19 අනුව මෙම ක්‍රමය තවදුරටත් අනුමත නොකරන අතර එබැවින්, බැංකුව විසින් ආයුගණන ලාභ හා අලාභ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයන්හි එය හටගන්නා කාලපරිච්ඡේදයෙහි ම හඳුනාගත හැකි වන පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කර ඇත.

ජා.ගි.ප්‍ර 19 (සංශෝධිත 2011) අනුව තවදුරටත් සවිස්තර හෙළිදරව් කිරීම් අවශ්‍යවේ. මෙම විස්තර සටහන් අංක 43හි, පහත දක්වා ඇති කරුණු සම්බන්ධව හැර, අතීතානුයෝගී ලෙස යොදාගෙන ඇත.

- 2012 ජනවාරි 01 පෙර ඇතුළත් කරන ලද සේවා ප්‍රතිලාභ වියදම් වල වෙනස් වීම් ඇතුළත් අනෙකුත් වත්කම්හි ධාරණ අගයන් ගළපා නැත.

නිශ්චිත ප්‍රතිලාභ බැදියාවන්ට සම්බන්ධ සාපේක්ෂ කාලයට (2012 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා) අදාල සංවේදී හෙළිදරව්වන් මෙහි ඉදිරිපත් කර නොමැත.

ආයුගණන ලාභ අලාභ හඳුනාගැනීම විලම්භනය සඳහා වූ විකල්ප ක්‍රමවේදය ජා.ගි.ප්‍ර. 19 සඳහා වූ සංශෝධන මගින් ඉවත්කොට ඇත. වෙනත් වචනවලින් කිවහොත් පරාස යාන්ත්‍රණය (Corridor Mechanism) ඉවත් කොට ඇත. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල අගයෙහි ඇතිවන සියලු වෙනස්කම් ලාභ අලාභ ප්‍රකාශනයේ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගත යුතුය. මෙම සංශෝධන 2013 ජනවාරි 01 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත. බැංකුව ජා.ගි.ප්‍ර. 19 (සංශෝධිත 2011) මුල්වරට වත්මන් මූල්‍ය වාර්තාවලට භාවිතා කර ඇත. ප්‍රමිතයේ සඳහන් කර ඇති පරිදි එයින් ඇතිවූ සංක්‍රාන්ති වෙන්කිරීම් (Transitional Provisions) මුල්ම සන්සන්දනාත්මක වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය වූයේ 2012 ජනවාරි මස 01 වන දිනය. සන්සන්දනාත්මක දත්ත ඒ අනුව මූල්‍ය තත්ව ප්‍රකාශනයේ නැවත ප්‍රකාශයට පත් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනවලට ප්‍රධාන වශයෙන් බලපෑ වෙනස්කම් සමහරක් පහත දක්වා ඇති අතර අනෙකුත් විස්තීර්ණ ආදායමේ හඳුනාගෙන ඇති හඳුනානොගත් ආයුගණන (ලාභය) /අලාභය රුපියල් මිලියන 592.4 (2012 දී එය රුපියල් මිලියන 4,619.2) ක් විය.

**නැවත ප්‍රකාශයට පත් කළ පෙර වාර්තා කළ ශේෂයන් (2012)**

| | නැවත වාර්තා කරන ලද<br>රු. 000 | පෙර වාර්තා කරන ලද<br>රු. 000 |
|---|---|---|
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් වගකීම් | **3,832,688** | - |
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් වත්කම් | **-** | 964,379 |
| සංචිත | **147,463,952** | 152,053,840 |
| අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් අගය | **4,619,242** | - |

**නැවත ප්‍රකාශයට පත් කළ පෙර වාර්තා කළ ශේෂයන් (2011)**

| | වාර්තා කරන ලද<br>රු. 000 | පෙර වාර්තා කරන ලද<br>රු. 000 |
|---|---|---|
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් වගකීම් | **-** | - |
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් වත්කම් | **1,020,925** | 991,571 |
| සංචිත | **133,759,146** | 133,729,792 |
| අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් අගය | **(29,354)** | - |

### 2.3.2 ජා. මූ. වා. ප්‍ර. 13 සාධාරණ අගය මිනුම් කිරීම

ජා. මූ. වා. ප්‍ර. යටතෙහි ඇති සියළුම සාධාරණ අගය මිනුම් කිරීම සඳහා ජා. මූ. වා. ප්‍ර. 13 මගින් තනි මූලාශ්‍ර මාර්ගෝපදේශයන් සපයනු ලැබේ. යම් ආයතනයක් විසින් සාධාරණ අගය මිනුම් කිරීමක් කරන්නේ ද නැද්ද යන්න තීරණය ජා. මූ. වා. ප්‍ර. 13 මගින් වෙනස් වීමකට භාජනය නොවන අතර එමගින් කෙරෙන්නේ ජා. මූ. වා. ප්‍ර. 13 යටතේ සාධාරණ අගය මිනුම් කිරීමක් උදෙසා මාර්ගෝපදේශනයක් සැපයීම පමණි.

මෙය ජා. මූ. වා. ප්‍ර. 13 මගින් 'සාධාරණ අගය' යන්න 'ඉවත්වීමේ' මිලක් ලෙස නිර්වචනය කෙරේ. ජා. මූ. වා. ප්‍ර. 13 හි දක්වා ඇති මාර්ගෝපදේශනයන්ට අනුව, බැංකුව විසින් එහි සාධාරණ අගයන් මිනුම් කිරීම හා අදාළ ප්‍රතිපත්ති, විශේෂයෙන් ඊට අදාළ වගකීම් සාධාරණ අගය මිනුම් කිරීමට අදාළ ක්‍රියාකාරී නොවීම පිළිබඳ අවදානම ආදී තක්සේරු යෙදවුම් නැවත ආගණනයක් කර ඇත. මෙම ජා. මූ. වා. ප්‍ර. 13 මගින් තවත් අතිරේක හෙළිදරව් කිරීම් ද නියම කර ඇත. මෙම ජා. මූ. වා. ප්‍ර. 13 භාවිතය මගින් බැංකුවෙහි සාධාරණ අගයයන් මිනුම් කිරීම කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් සිදු වී නොමැත. සාධාරණ අගය මිනුම් කිරීම හා සම්බන්ධ අතිරේක හෙළිදරව් කිරීම් සාධාරණ අගයයන් නිශ්චය කරනු ලැබූ වත්කම් හා වගකීම් හා අදාළ සටහන් සමග දක්වා ඇත. සාධාරණ අගයන් ධූරාවලිය සටහන් අංක 44 හි ඉදිරිපත් කර ඇත.

**2.4 ප්‍රකාශිත කර ඇති නමුත් මේ වන තෙක් බල සහිත නොවූ ප්‍රමිතීන්, අර්ථ නිරූපණයන් සහ සංශෝධනයන්**

ප්‍රකාශිත නමුත් බැංකු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කරන දිනය වන තෙක් බල සහිත නොවූ ප්‍රතිත්තීන් පහත පරිදි වේ. මෙම ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණයන් අනාගත දිනක දී අදාළ වන බවට බැංකු බලාපොරොත්තු වේ. මෙම ප්‍රමිතීන් බල සහිත වූ විට ඒවා අදාළ කරගැනීමට බැංකුව අපේක්ෂා කරයි.

**2.4.1 ජා. මූ. වා. ප්‍ර. 9 මූල්‍ය උපකරණ**

ක්‍රියාත්මක වන දිනය ජා. ගි. ප්‍ර. 39 ප්‍රතිෂ්ඨාපනය කිරීම සම්බන්ධ අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිත (අ.ගි.ප්‍ර.) ආයතනයේ නිරාවරණ කෙටුම්පතට යටත් වුවත්, ජා.මූ.වා.ප්‍ර. 9 අ.ගි.ප්‍ර ආයතනයේ පළමු අදියරේ ක්‍රියාකාරකම් පිළිබිඹු කරන අතර එය ජා. ගි. ප්‍ර. 39 හි නිර්වචනයකර ඇති පරිදි මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණය හා මිනුම් කිරීම සඳහා අදාළ වේ.

ආරම්භයේ දී මෙම ප්‍රමිතිය 2013 ජනවාරි 01 දින හෝ පසුව ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේදය සඳහා බලපවත්වනු ලැබුවද 2011 දෙසැම්බර් මස නිකුත් කරනු ලැබූ ජා.ගි.වා.ප්‍ර. 9 සඳහා වූ සංශෝධනයන් වන ජා.ගි.වා.ප්‍ර. 9 අනිවාර්ය බලාත්මක දිනය සහ සංක්‍රාන්ති හෙළිදරව් මගින් මෙම අනිවාර්ය බලාත්මක දිනය 2015 ජනවාරි 01 දින දක්වා කල් දමන ලදී. පසු අදියරයන්හිදී මණ්ඩලය විසින් අපනයනය හා ඉදිරි රැකුම් ගිණුම්කරණය සම්බන්ධයෙන් සලකා බලනු ලබයි. වඩාත් විස්තීරණ තත්ත්වයන් ඉදිරිපත් කරනු පිණිස බැංකුව විසින් ජා.ගි.වා.ප්‍ර. 9 හි පළමු අදියර හා අනෙකුත් අදියරයන් නිකුත් කිරීමෙන් අනතුරුව එය ක්‍රියාත්මක කිරීමෙන් වන බලපෑම අගය කරනු ඇත.

**3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය**

**3.1 විදේශීය මුදල් පරිවර්තනය**

බැංකුවේ ගනුදෙනු සඳහා භාවිතා වන (Functional) සහ ඒවා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල වේ. විදේශීය මුදල්වලින් වන ගනුදෙනු, එකී ගනුදෙනු සිදුවන දිනයේ දී පවතින විනිමය අනුපාතික ප්‍රකාර බැංකුවේ භාවිතා වන මුදල් වටිනාකමට සටහන් කරනු ලැබේ. විදේශීය මුදල්වලින් වූ මූල්‍ය වත්කම් සහ බැරකම්, ශේෂ පත්‍ර දිනට පවතින විනිමය අනුපාතිකයන් ප්‍රකාර නැවත පරිවර්තනය කරනු ලැබේ. වෙනස්කම් සියල්ල ආදායම් ප්‍රකාශනයට ගනු ලැබේ. වටිනාකම් නැවත පරිවර්තනය කිරීමේ දී, ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට වූ පහත දැක්වෙන ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතයන් භාවිතා කරන ලදී.

| | **2013**<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| ඔස්ට්‍රේලියානු ඩොලර් 1 | **116.6709** | 132.2409 |
| කැනේඩියානු ඩොලර් 1 | **122.7324** | 127.8255 |
| යුරෝ 1 | **180.4522** | 168.1257 |
| ජපන් යෙන් 1 | **1.2459** | 1.4799 |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) 1 | **201.3550** | 195.3110 |
| ස්ටර්ලින් පවුම් 1 | **215.5790** | 205.4728 |
| ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 1 | **130.7530** | 127.1608 |
| චීන යුවාන් (අක්වෙරළ) | **21.5800** | 20.4373 |

මූල්‍ය නොවන අයිතමයන් ඒවා සිදුවුන දින තිබූ විදේශීය මුදල් පරිවර්තනයට අනුව ඓතිහාසික අගයට පොත්වලට සටහන් කර ඇත.

**3.2 සාධාරණ අගය මිනුම් කිරීම**

බැංකුව විසින් මූල්‍ය සුරැකුම්පත්, ව්‍යුත්පන්න උපකරණ වැනි මූල්‍ය උපකරණයන් සහ ඉඩම් හා ගොඩනැගිලි ආදී වූ මූල්‍ය නොවන උපකරණයන් එකී ශේෂපත්‍ර දිනයන්හි දී සාධාරණ අගයන්ට මිනුම්ගත කර ඇත. මීට අමතරව, ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්ගත කරන ලද මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් අංක 44 සටහනෙහි හෙළිදරව් කර ඇත.

සාධාරණ අගය යනු වෙළෙඳපොළ හවුල්කරුවන් අතර සිදුවන ක්‍රමවත් ගනුදෙනුවක දී, මිනුම්ගත කරන ලද දිනයට, වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් හුවමාරු කිරීමේ දී ගෙවීමට සිදුවන මුදල ය.

මෙම සාධාරණ අගය මිනුම් කිරීම සඳහා පදනම් වන පූර්ව නිගමනය වනුයේ වත්කමක් විකිණීම හෝ වගකීමක් හුවමාරු කිරීම යන ගනුදෙනුවක්:

- වත්කම හෝ වගකීම අදාළ ප්‍රධාන වෙළෙඳපොළෙහි දී සිදුවීම හෝ,
- එවැනි ප්‍රධාන වෙළෙඳපොළක් නොමැති අවස්ථාවකදී එම වත්කම හෝ වත්කම සඳහා වඩාත් ම වාසි සහගත වෙළෙඳපොළෙහි දී සිදුවීමය.

මෙම ප්‍රධාන වෙළෙඳපොළ හෝ වඩාත් ලාභදායී වෙළෙඳපොළ බැංකුවට පිවිසිය හැක්කක් විය යුතු ය.

වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මිනුම් ගත කරනු ලබන්නේ වෙළෙඳපොළ හවුල්කරුවන් ඔවුන් උපරිම ආර්ථික වාසියක් ලබාගැනීම උදෙසා හැසිරෙනු ඇතැයි යන උපකල්පනය මත වත්කමක් හෝ වගකීමක් මිලකිරීමේදී යොදාගන්නා උපකල්පනයන් යොදා ගැනීමෙනි. මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මිනුම්ගත කිරීමේ දී වෙළෙඳපොළ හවුල්කරුවන්ගේ වත්කමක් එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කිරීම මගින් හෝ උපරිම හා විශිෂ්ට වාසි ලැබෙන ලෙස භාවිතාවේ යොදා ගන්නා වෙනත් වෙළෙඳපොළ හවුල් කරුවකුට විකිණීම මගින් හෝ, ආර්ථික වාසි ජනනය කිරීමේ හැකියාව සලකා බලනු ලබයි.

බැංකුව විසින් සාධාරණ අගයයන් මිනුම් කිරීමේ ක්‍රියාවලිය උදෙසා අවස්ථාවට ඉතාමත් උචිත සහ සාධාරණ අගයන් මිනුම්ගත කිරීම අදාළ නිරීක්ෂණ යෙදවුම් හි උපරිම භාවිතය සහ අපරික්ෂාකාරී යෙදවුම් භාවිතය අවම කිරීම යන කාර්යයන් සඳහා ප්‍රමාණවත් දත්ත අගය කිරීමේ ක්‍රමවේදයන් යොදා ගනු ලබයි. මූල්‍ය වාර්තාවන්හි සාධාරණ අගය මිනුම්ගත කළ හෝ හෙළිදරව් කළ සියළු වත්කම් හා වගකීම් සාධාරණ අගයන් ධුරාවලිය තුළ පහත දැක්වෙන පරිදි වර්ගීකරණයට ලක් කර ඇති අතර එය සමස්තයක් වශයෙන් සාධාරණ අගයන් නිශ්චය කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම් වේ.

පළමුවන මට්ටම - අනන්‍ය වත්කම හා වගකීම සඳහා ක්‍රියාකාරී වෙළෙඳපොළ තුළ හිමි ප්‍රකාශිත (නො සැකසූ) මිළ ගණන්

දෙවන මට්ටම - ඍජුව හෝ වක්‍රාකාරයෙන් නිරීක්ෂණය කළ හැකි, සාධාරණ අගයන් මිනුම් කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්

තෙවන මට්ටම - නිරික්ෂණය කළ නොහැකි, සාධාරණ අගයන් මිනුම්ගත කිරීම සඳහා වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්.

මූල්‍ය වාර්තාවන්හි පුනරාවර්තන පදනම මත හඳුනාගන්නා ලද වත්කම් හා වගකීම් සම්බන්ධයෙන්, මෙම ධූරාවලියෙහි මට්ටම් අතර හුවමාරු වීම් සිදුවී ඇත්දැයි බැංකුව විසින් සාධාරණ අගයන් මිනුම්කරණය උදෙසා සමස්තයක් වශයෙන් වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම්ව මෙම වර්ගීකරණය නැවත තක්සේරු කිරීම තුළින් වාර්තා කිරීමේ කාල පරිච්ඡේදය අවසානයේ තීරණය කරනු ලබයි.

**3.3 මූල්‍ය වත්කම් සහ බැරකම්**

බැංකුව, මූල්‍ය වත්කම් සහ බැරකම් සහ ආශ්‍රිත ආදායම් හා වියදම් මාර්ගයන් ඉදිරිපත් කරනු ලබන්නේ විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් වෙන්කොට හඳුනා දැක්වීමෙන්ය. විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් උද්ගත වන්නේ බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යයන්ගෙන්ය. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මුදල් නිකුතු සහ බැංකු කටයුතුවලට ආශ්‍රිත වත්කම් සහ බැරකම් දේශීය මූල්‍ය ක්‍රියාකාරකම්වලින් පිළිබිඹු වේ.

මෙම ක්‍රියාකාරකම් වෙන් වෙන්ව වාර්තා කිරීම මගින්, බැංකුවේ මූල්‍ය තත්ත්වය මූල්‍ය කාර්ය සාධනය සහ අවදානම් ආකෘතිය වඩා යෝග්‍ය අයුරින් ඉදිරිපත් කිරීම අපේක්ෂා කරනු ලැබේ. විදේශීය සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ඒකාබද්ධව වාර්තා කිරීමෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි දැනුවත් කිරීමේ අගය දුර්වල වන බව බැංකුව විසින් සලකනු ලැබේ.

සියළු මූල්‍ය වත්කම්, මූලිකව පිරිවැය මත හඳුනාගනු ලබන අතර ආයෝජනයට අදාල අත්පත් කර ගැනීමේ වියදම් ද ඇතුළුව, ඉදිරිපත් වන ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ වටිනාකම පිරිවැයට ඇතුළත් වේ. මෙම මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව මිනුම් පදනම්, පහත විස්තර කරනු ලැබේ. සාමාන්‍යයෙන් මිලට ගනු ලබන සහ විකුණනු ලබන සියළු මූල්‍ය වත්කම් වෙළෙඳාම් දිනයේ දී හඳුනාගනු ලැබේ. මෙලෙස මිලට ගනු ලබන සහ විකුණන මූල්‍ය වත්කම් වු කලි සාමාන්‍ය රෙගුලාසි මගින් හෝ වෙළෙඳපොළේ පවත්නා සම්ප්‍රදාය මගින් නියමිත කාල රාමුව තුළ දී භාරදිය යුතු මිලට ගනු ලැබූ හෝ විකුණනු ලැබූ මූල්‍ය වත්කම් වන්නේය.

**3.3.1 ලාභය හෝ පාඩුව මත සාධාරණ අගයට ඇති සුරැකුම්පත්**

වෙළෙඳාම සඳහා ගැනෙන මූල්‍ය වත්කම්, ලාභය හෝ පාඩුව මත සාධාරණ අගයට ඇති වත්කම් යටතේ වර්ග කර ඇතුළත් කර ඇත. මෙම සුරැකුම්පත් අනතුරුව ප්‍රකාශිත වෙළෙඳපොළ මිල ප්‍රකාර අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි සුරැකුම්පත් යටතේ වටිනාකම් වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස හඳුනා ගන්නා අතර එයින් උද්ගත වන වාසිය/අවාසිය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ඇත.

සුරැකුම්පත් තවදුරටත් අයිතිව පවතින්නේ නම් අදාල වාසිය/අවාසිය උපලබ්ධි නොවු මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/අවාසිය ලෙස වාර්තා කරනු ලැබේ. සුරැකුම්පත් විකිණීම මගින් වාසියක් හෝ අවාසියක් උද්ගත වන්නේ නම්, එය මිල වෙනස්වීමේ උපලබ්ධි වාසිය/අවාසිය ලෙස වාර්තා කරනු ලැබේ.

**3.3.2 අලෙවිය සඳහා ඇති විදේශ විනිමය සුරැකුම්පත්**

වෙළෙඳාම සඳහා ගැනෙන විදේශ විනිමය සුරැකුම්පත් පසුව වෙළෙඳපොළ මිල අනුව අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ විකිණීමට ඇති සුරැකුම්පත්වල වටිනාකම වැඩිවීම හෝ අඩුවීම වශයෙන් හඳුන්වනු ලැබේ.

වෙළෙඳාම සඳහා ගැනෙන විදේශීය මුදල් සුරැකුම්පත්වල වෙළෙඳපොළ අගය වෙනස්වීමෙන් උද්ගතවන වාසිය හෝ අවාසිය, එම ආයෝජන විකුණා, ප්‍රතිග්‍රහණය කර හෝ වෙනත් අයුරකින් අපහරණය කරන තෙක් හෝ එම ආයෝජනය දුබල බවට නිරීක්ෂණය කරන තෙක් හෝ හිමිකරු ප්‍රාග්ධනයේ වෙනම සංරචකයන් (මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ වෙනත් සංචිත ලෙස දක්වා ඇති) ලෙස හඳුන්වනු ලබන අතර, එවැනි අවස්ථාවක් උද්ගතවීමේ දී හිමිකරු ප්‍රාග්ධනය ලෙස මුලින් වාර්තා කළ වාසිය හෝ අවාසිය ආදායමට එකතු කරනු ලැබේ.

**3.3.3 මූල්‍ය ව්‍යුත්පන්න ලියවිලි**

මූල්‍ය ව්‍යුත්පන්න ලියවිලි පිළිබඳව බැංකුවේ සම්බන්ධතාවය ප්‍රධාන වශයෙන් ඉදිරි විදේශ විනිමය කොන්ත්‍රාත්වලට අදාළ වේ. එවැනි ව්‍යුත්පන්න මූල්‍ය ලියවිලි සාධාරණ වටිනාකමින් ප්‍රකාශිතය. ඒවා සමාන පරිණත නියමයන් සහිත කොන්ත්‍රාත්වලට අදාළව පවත්නා ඉදිරි විනිමය අනුපාතයන්ට යොමු කරමින් ගණනය කර ඇත. ලාභ හෝ පාඩු තත්ත්වයේ පවතින මිල ගිවිසගත් ලියවිලි තිබේ නම්, ශේෂ පත්‍රයෙහි විදේශීය මුදල් වෙළෙඳාම හෝ විකිණීමට තිබෙන සුරැකුම්පත් ශේෂය යටතේ වාර්තා කරනු ලැබේ.

**3.3.4 එක් දින වෙනස**

ගනුදෙණුවක මිල ඒ හා සමාන ගණුදෙණු පවතින්නා වූ නිරීක්ෂණය කළ හැකි වර්ථමාන වෙළෙඳපළක සාධාරණ අගයෙන් වෙනස් වේ නම් හෝ මිල නිරීක්ෂණය කල හැකි වර්ථමාන වෙළෙඳපළෙහි දත්ත පමණක් විචල්‍යන් ලෙස යොදාගත් ඇගයීම් ශිල්ප ක්‍රමයක් භාවිතයෙන් ලබාගත් මිලෙන් වෙනස් වේ නම්, බැංකුව විසින් එම ගණුදෙණුවේ මිල හා සාධාරණ අගය අතර වෙනස (දිනට වෙනස) ඉක්මනින්ම උපලබ්ධි නොවු ප්‍රත්‍යාගණන ලාභ/පාඩු ලෙස හඳුනාගනු ලබයි.

ගණුදෙණුවක සාධාරණ අගය නිරීක්ෂණය කළ නොහැකි දත්ත මත පැනවිම තිරණය කළ අවස්ථාවක එම ගණුදෙණුවේ මිල

හා අදාල ඇගයීම් රාමුවේ මිල අතර වෙනස, අදාළ යෙදවුම් නිරීක්ෂණය කළ හැකි වූ විට හෝ එම උපකරණ මූල්‍ය ප්‍රකාශණ තුළින් ඉවත්ව ගිය විට පමණක් අදායම් ප්‍රකාශය තුළ ගලපනු ලබයි.

### 3.3.5 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශේෂයන් (IMF)

බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) සමග කරනු ලබන ගනුදෙනු ශ්‍රී ලංකා රජයේ නියෝජිතයෙකු ලෙස නොව, තම බලතල ප්‍රකාර සිදුකරනු ලැබේ. බැංකුව විසින් ජා.මු.අ. සමඟ සිදුකෙරෙන සියළු ගනුදෙනු එම පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කර ඇත.

ජා.මු.අ. සමඟ වූ පංගුව වත්කමක් වශයෙන් බැංකුව විසින් සටහන් කර ඇති අතර, එම පංගුව සඳහා ජා.මු.අ. වෙත ගෙවිය යුතු මුදල බැංකුවේ බැරකමක් ලෙස සටහන් කර ඇත. ජා.මු.අ. විසින් වෙන් කරන ලද සමුච්චිත විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) ප්‍රමාණය බැරකමක් ලෙස සලකනු ලැබේ. ජා.මු.අ. විසින් ශේෂ පත්‍ර දිනට ප්‍රකාශයට පත්කරන ලද විනිමය අනුපාතිකයන් අනුව ජා.මු.අ. වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උද්ගත වන විනිමය ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාග නු ලැබේ.

ජා.මු.අ. සමඟ වූ ශේෂයන්ට අදාළ සියළුම ගාස්තු සහ පොළිය එසැනින් ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

### 3.3.6 මුදල් සහ මුදල් සමානයන්

විදේශීය බැංකු සහ මූල්‍ය ආයතනයන්හි ඇති මුදල් සහ කෙටිකාලීන තැන්පතු මුදල් සහ මුදල් සමානයන්ට අයත් වේ.

දේශීය මුදල් ක්‍රියාකාරකම්වල අංගයක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව  ඇතැම් ආදායම් ඉපැයීම් ද ඇතැම් වියදම් දැරීම ද සිදුකරන නමුත්, එමගින් මුදල් චලනයක් සිදු නොවේ. එම ක්‍රියාකාරකම්වලින් ඇතැම් වත්කම් සහ බැරකම් ද උද්ගත වන අතර එයට ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රජය සමග සහ දේශීය බැංකු සහ මූල්‍ය ආයතන සමග ගනුදෙනු අදාළ වේ. ශ්‍රී ලංකා රජය සමග වන ගනුදෙනුවලට මූල්‍ය ප්‍රතිපත්ති කාරකයක් ලෙස රජය විසින් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත්වල ආයක නොවූ කොටසක් සහ රජය විසින් නිකුත් කරනු ලබන බැඳුම්කර අයත් වේ. එවැනි මිලට ගැනීම්, අපහරණයන් හෝ ඒ මත පොළිය හුදෙක් පොත් සටහන් වශයෙන් පමණක් ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවල සටහන් කරනු ලැබේ. මේවා මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් 37 සහ සටහන් 38 යටතේ වෙන් වෙන්ව හෙළිදරව් කර ඇත.

මූල්‍ය නීති පනතේ විධිවිධාන ප්‍රකාර, ව්‍යවස්ථාපිත අධිකාරිය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනයා වෙත මුදල් නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල්, දරන්නා වෙනුවෙන් බැංකුව මත හිමිකමක් පවතී. මෙය බැංකුවට බැරකමක් වන අතර දරන්නාට අතැති මුදල් වේ. සංසරණ මුදල්වල චලනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙන් ඉදිරිපත් කරන අතර, මහ බැංකු අතර පවත්නා පරිචය ප්‍රකාර, මූල්‍ය ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස ඇතුළත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල්/ගෙවීම් නියෝග ක්‍රියාවලිය මගින් නෝට්ටු සහ කාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුව මත නිකුත් කරන චෙක්පත් මගින් ලබාගන්නා භාණ්ඩ සහ සේවා සඳහා සැපයුම්කරුවන් සහ සේවකයින් වන විවිධ අණ ලද්දන් වෙත මුදල් ගෙවනු ලැබේ. ඒවා සංසරණ මුදල් බැරකමට හෝ වාණිජ බැංකු සමග වන ශේෂයන්ට හෝ එකතු කරනු ලැබේ. එවැනි කටයුතු සඳහා වූ මුදල් භාවිතා කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පිටතට යන මුදල් ප්‍රවාහයට අයත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි, මුදල් සහ මුදල් සමානයන්ට මුදල්/මුදල් විධානයන්ගේ ශුද්ධ ගලායෑම් හා ඉහත විස්තර කරන ලද මුදල් සහ මුදල් සමානයන් ද අඩංගු වේ.

### 3.3.7 ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු

ප්‍රතිමිලදී ගැනීම සඳහා ගිවිසුම් යටතේ විකුණනු ලබන සුරැකුම්පත්, වත්කම් ලෙස අඛණ්ඩව ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම සඳහා වූ වගකීම් (ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත විකුණන ලද සුරැකුම්පත්) බැරකමක් ලෙස හෙළිදරව් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනුවල විකුණුම් සහ ප්‍රතිමිලදී ගැනීමේ මිල සහ ප්‍රතිවර්තන මිලදී ගැනීමේ ගනුදෙනුවල මිලදී ගැනීමේ මිල සහ විකුණුම් මිල අතර වෙනස පිළිවෙලින් වියදමක් සහ ආදායමක් වන අතර, එය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත රඳවාගෙන ඇති සුරැකුම්පත් (නැවත විකිණීම සඳහා වූ ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්) වත්කම් ලෙස ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු නිසා උපචිත ආදායමක් හෝ උපචිත වියදමක් උද්ගත වුයේ නම්, එය ද ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු වටිනාකම සමග වාර්තා කරනු ලැබේ.

### 3.3.8 ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත්

වෙළෙඳපොළේ අතිරික්ත ද්‍රවශීලතාවය අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මකවීම් යටතේ බැංකුව විසින් කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කරනු ලබයි.

නිකුත් කරනු ලබන සුරැකුම්පත් වගකීමක් ලෙස වාර්තා කරයි. මුහුණත අගය සහ නිකුතු මිල අතර වෙනස ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස වාර්තා කරනු ලබයි.

### 3.3.9 ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්

ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්, ශ්‍රී ලංකා රජයෙන් මිලට ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත්වලින් සමන්විත වේ. ඒවායින් බැංකුව විසින් ශ්‍රී ලංකා රජයට සපයන ලද ණය නියෝජනය කෙරෙන බැවින් එම කළඹ ක්‍රමක්ෂය පිරිවැයට සටහන් කරනු ලැබේ.

### 3.3.10 රජයට දෙන ලද කාලීන අත්තිකාරම්

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ (සංශෝධිත පරිදි) 89 වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජය වෙත සෘජුව දෙන ලද කාලීන අත්තිකාරම්වලින්, රජයට දෙන ලද අත්තිකාරම් නියෝජනය වේ.

### 3.3.11 අනිකුත් ආයතනවලට දෙන ලද ණය

අනිකුත් ආයතනවලට දෙන ලද ණය ආරම්භයේ දී ප්‍රදානය කළ මුදලින් අයකරගත නොහැකි ප්‍රමාණයක් සඳහා වූ මුදල් අඩුකර, හඳුනාගෙන දක්වා ඇත. අයකරගත යුතු සියළු මුදල් බැංකුවට අයකරගත නොහැකි බවට නිශ්චිත සාක්ෂි තිබේ නම්, ඒ සඳහා (ණය අඩාලවීම) අඩමාන ණය ප්‍රතිපාදනයන් සලසනු ලැබේ.

එම ප්‍රතිපාදනයේ ප්‍රමාණය ධාරණ මුදල් සහ ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදල අතර වෙනස වේ. බොල් ණය හඳුනාගත් අවස්ථාවේ දී කපාහරිනු ලැබේ.

### 3.3.12 සුරැකුම්පත් ණයට දීම සහ ණයට ගැනීම

බැංකුව විසින් එහි මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාකාරිත්ව අවශ්‍යතා සඳහා ප්‍රධාන සංස්ථාපිත ආයෝජකයින් වෙතින් රාජ්‍ය සුරැකුම්පත් ණයට ගැනීම සිදු කරයි. මෙම ණයට ගත් සුරැකුම්පත්, බැංකුව විසින් ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරිත්වය මත වෙළෙඳපොළ තුළ පවතින අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමට යොදා ගනී.

සුරැකුම්පත් ණයට ගැනීම යනු නැවත බාරදීම අතපසු වන විටක දී, සුරැකුම්පත් නැවත භාරදීම, එකඟ වූ ගාස්තු ගෙවීම සහ වෙළෙඳපොළ වටිනාකම මත වන්දි ගෙවීම (බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළ සහභාගීවන්නන්ට දැනුම් දී ඇති වෙළෙඳපොළ මිල) සඳහා වන කොන්දේසි විරහිත ඇපවීමකි. ණයට ගත් සුරැකුම්පත් වෙළෙඳපොළ වටිනාකමින් කිසියම් අවස්ථාවක දී ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරකම් සඳහා යොදා නොගත් සුරැකුම්පත් අසම්භව්‍ය වගකීම් ලෙස වාර්තා කරනු ලැබේ. අදාළ ගාස්තු ගෙවීම උපචිත පදනම මත වර්තාකරණු ලබයි.

ණයට දීමේ ගනුදෙනුවක් යටතේ ප්‍රතිපාර්ශවයකට සුරැකුම්පත් මාරු කිරීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්නුම් කරෙනුයේ හිමිකාරිත්වයේ අවදානම් හා ප්‍රතිලාභයන්ද මාරු වූයේ නම් පමණි.

### 3.3.13 සේවක ණය

සහනදායී පොළී අනුපාත යටතේ ණය පහසුකම් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ට හිමිකම ලැබේ. ජා.ගි.ප්‍ර. 39 අනුව, වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිතා කරමින් මෙම ණය පහසුකම ඒවායේ සාධාරණ අගයට ගණනය කරනු ලැබේ.

**වට්ටම් අනුපාතය** - මෙම අනුපාතය ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් ඉලක්ක කරගත් දිගුකාලීන උද්ධමනය පදනම් කොට ශ්‍රී ලංකා මහ බැංකු ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මඟින් සම්පාදනය කරන ලදී. විගණන කමිටුව මඟින් එකඟ වී ඇති පරිදි වාණිජ්‍ය පොළී නිර්දේශිත අනුපාතය (CIRR) සඳහා සියයට 1 ක අවදානම් අධිකයක් ද එකතු කරමින් වට්ටම් අනුපාතය ලෙස භාවිත කොට ඇති අතර එය ණයවල කාලපරිච්ඡේදය සමඟ වෙනස් වේ.

මෙම ණය සහනදායී පොළී අනුපාතයන් යටතේ ලබාදීම නිසා බැංකුව විසින් දරණ ලද වියදම වාර්තා කිරීමට සේවක ණයවල වර්ෂ ආරම්භ දිනට සහ වර්ෂ අවසාන දිනට වර්තමාන අගයන්ගේ වෙනස වාර්ෂිකව ක්‍රමක්ෂය කරන අතර බැංකුව විසින් මෙම ණය වෙළෙඳපොළ අනුපාතිකයන්ට දෙනු ලැබුවේ නම් බැංකුව විසින් උපයනු ලබන ආදායම වාර්තා කිරීමට සමාන අගයක් අනෙකුත් ආදායම් ලෙස වාර්තා කරයි.

**සාධාරණ අගයකරන ගණනය සඳහා යොදාගනු ලබන උපකල්පනයන් :**

- 2008 වර්ෂයේ සිට ලබාදුන් සේවක ණය සලකා බලන ලදී.
- සේවක ණය ලබාදුන් දිනය ලෙස ජනවාරි 01 දින සලකන ලදී.
- මෙම ණය සඳහා කිසිදු ආකාරයක ගැලපීමක් හෝ පියවීමක් සිදුවී නොමැත.

ණය කළමනාකරණ පද්ධතිය වඩාත් සරල කිරීමේ අභිප්‍රායෙන් මහ බැංකුව විසින් පරිගණක ණය සහ බී කාණ්ඩ ණය යටතේ වූ තවත් ණය වර්ග දෙකක් රුපියල් ලක්ෂ 3 ක ණය සීමාවකට සහ වසර 10 ක නැවත ගෙවීමේ කාලයකටද යටත්ව ඒකාබද්ධ කිරීමකට හා නැවත සැලසුම් කිරීමකට ලක් කොට ඇත. එමඟින් ඉහත ප්‍රභේද ත්‍රිත්වය එක් ණය ගැතියකුට අයිති තනි ණයක් ලෙස ඒකාබද්ධ කෙරෙනු ඇත. ඒ අනුව මෙම ප්‍රභේදය යටතේ නව ණය මුදලක් ප්‍රධානය කරන ඕනෑම අවස්ථාවක එකී මුදල සහ හිඟ ණය මුදල් ප්‍රමාණය යන අයිතිමයන් දෙකම නැවත සැලසුම් කිරීමකට ලක් කරනු ඇත.

### 3.3.14 මූල්‍ය වත්කම් හානිකරණය

කිසියම් මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇත්දැයි බැංකුව විසින් මූල්‍ය තත්ව ප්‍රකාශන දිනයන්හි දී තක්සේරු කරනු ලැබේ.

### 3.3.15 ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කළ වත්කම් හානිකරණය

ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කළ ණයක් හෝ ලැබිය යුතු මුදලක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි ඇත්නම්, එම අලාභය ගණනය කරනු ලබන්නේ වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන්ගේ (මෙතෙක් දරා නොමැති අනාගත ණය අලාභ හැර) වත්කමේ මුල් සඵල පොළී අනුපාතයත් වට්ටම් කළ අගයත් අතර වෙනසය. වත්කමක ධාරණ අගය ඍජුව හෝ දීමනා ගිණුමක් මගින් හෝ අඩුකරනු ලැබේ. පාඩු වු ප්‍රමාණය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ.

බැංකුව ප්‍රථමයෙන් තනිව වැදගත් හා තනිව හා සාමූහිකව නොවැදගත් මූල්‍ය වත්කම් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි තිබේදැයි විමර්ෂණය කරනු ලබයි. එසේ වැදගත් හෝ නොවැදගත් තනිව විමර්ෂණය කළ මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි නොමැති යැයි තීරණය කළහොත් එම මූල්‍ය වත්කම සමාන ණය අවදානමක් ඇති මූල්‍ය වත්කම්වලට ඇතුළත් කර එම වත්කම් හානිකරණය සඳහා සාමූහිකව විමර්ශණය කරනු ලැබේ. තනිව හානිකරණ පාඩු සඳහා තක්සේරු වටිනාකමට අදාළව හානිකරණ පාඩු පවතී නම් හෝ ඒ බව අඛණ්ඩව හඳුනාගෙන තිබේ නම් ඒවා සාමුහික තක්සේරුවකට ඇතුළත් කරනු නොලැබේ.

පසුකාලයේ දී හානිකරණ අලාභයේ අගය අඩුවන්නේ නම් සහ හානිකරණය හඳුනාගැනීමෙන් පසු සිදු වූ සිදුවීමකට විෂයානුබද්ධව අදාල කර ගතහැකි නම් කලින් හඳුනාගත් හානිකරණ අලාභය ආපසු ගලපයි. පසුකාලයක දී ආපසු ගලපන ලද ඕනෑම හානිකරණ අලාභයක් ආපසු ගලපන ලද දිනට වත්කමේ ධාරණ අගය එහි ක්‍රමක්‍ෂය පිරිවැය නොඉක්මවන ප්‍රමාණයක් දක්වා ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

### 3.3.16 විකිණීමට ඇති ආයෝජන හානිකරණය

විකිණීමට ඇති වත්කමක් හානිකරණය වී ඇත්නම් එහි පිරිවැය (මූලික ගෙවීම සහ ක්‍රමක්ෂය අතර ශුද්ධ අගය) හා එහි වර්තමාන සාධාරණ අගය, මීට පෙර ලාභය හෝ අලාභය යටතේ හඳුනාගත් හානිකරණ අලාභයක් වේ නම් එය අඩුකර හිමිකරු ප්‍රාග්ධනයෙන් ආදායම් ප්‍රකාශනයට මාරුකරනු ලැබේ. විකිණීමට ඇති ලියවිලි ලෙස වර්ගකර ඇති හිමිකම් ප්‍රාග්ධන ලියවිලි නැවත ගැලපීම් ලාභය සඳහා හඳුනාගන්නේ නැත.

ණය ලියවිලිවල හානිකරණ අලාභ, ලියවිල්ලෙහි සාධාරණ අගයෙහි වැඩිවීම, හානිකරණ පාඩුව හඳුනා ගැනීමට පසුව වූ සිද්ධියකට අදාල වන බවට නිශ්චිත සාක්ෂි තිබේ නම් පමණක්, එය ලාභ හෝ පාඩු හරහා නැවත ගැලපිය හැකිය.

### 3.3.17 විදේශීය මුදල් කාලීන බැරකම්

විදේශීය මුදල් කාලීන බැරකම්, බැරකම්වල ක්‍රමක්ෂය පිරිවැයට පසුව වාර්තා කරනු ලැබේ. මෙම බැරකම්වල අගය වෙනස්වීම කාලීන බැරකම්වල වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස ශේෂ පත්‍රයෙහි දක්වනු ලැබේ. විදේශීය මුදල් කාලීන බැරකම්වල වෙනස්වීම් වලින් උද්ගතවන වාසි සහ අවාසි වහාම ආදායම් ප්‍රකාශනයෙහි වියදමක් ලෙස හඳුනාගනු ලැබේ. බැරකමේ අයිතිය තවදුරටත් පවතී නම් වාසිය හෝ අවාසිය උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/(අවාසිය) ලෙස වාර්තා කරනු ලැබේ. වාසිය හෝ අවාසිය උපලබ්ධි වූ (බැරකම ආපසු ගෙවීම් මගින්) අවස්ථාවන්හිදී එය මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වූ වාසිය/(අවාසිය) ලෙස වාර්තා කරනු ලැබේ.

### 3.3.18 මූල්‍ය ඇපකර

මූල්‍ය වාර්තාවලදී මූල්‍ය ඇපකර මූලික වශයෙන් සාධාරණ අගය මත අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ හඳුනාගනු ලැබේ. ආරම්භක හඳුනා ගැනීමෙන් අනතුරුව එක් එක් ඇපකරය යටතේ බැංකුවේ වගකීම ගණනය කිරීම, ඇපකරය හේතුවෙන් උද්ගතවන මූල්‍ය බැඳීම් බේරුම් කිරීම සඳහා වන හොඳම ඇස්තමේන්තුව ප්‍රකාර සිදුකරනු ලැබේ.

### 3.3.19 වෙනත් මූල්‍ය වත්කම් සහ බැරකම්

මුදල්, තැන්පතු සහ කෙටිකාලීන අත්තිකාරම් වශයෙන් වූ දේශීය සහ විදේශීය මුදල් වෙළෙඳ දිනයේ දී හඳුනාගනු ලැබේ.

## 3.4 අනිකුත් වත්කම් සහ බැරකම්

### 3.4.1 රන්

ජාත්‍යන්තර සංචිතයේ සංයුතිය මුදල් නීති පනතේ 67(1) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රන්, මෙම සංචිතයේ කොටසක් ලෙස දැරිය හැක. එම නිසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස දරා සිටි රන්වල අගය 2013 දෙසැම්බර් 31 දිනට රුපියල් බිලියන 115.6 කි. (බෙදා වෙන්කළ හැකි රන් රුපියල් බිලියන 95.6 ක් සහ බෙදා වෙන් කළ නොහැකි රන් රුපියල් බිලියන 20 ක් වශයෙන්) රන් සාධාරණ අගයට අගය කොට ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයට මාරු කරනු ලැබේ. රන්වලින් උපලබ්ධි නොවූ ලාභය හෝ අලාභය ලාභාලාභ විසර්ජනයට පෙර අදාළ සංචිත ගිණුමට මාරු කරනු ලැබේ.

### 3.4.2 තොග

තොග, පිරිවැය හෝ උපලබ්ධි වටිනාකම් වන දෙකෙන් අඩු ප්‍රමාණය මත දක්වා ඇත. බර තබන ලද සාමාන්‍ය පිරිවැය පදනම්ව පිරිවැය නිශ්චය කරනු ලැබේ. සෙමින් වැයවන තොග සඳහා වෙන් කිරීමක් සලසා ඇත.

### 3.4.3 දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ එදිනෙදා සේවා වියදම් හැර, සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ වටිනාකම අඩුකළ පිරිවැයට දක්වනු ලැබේ. එකී දේපළ, පිරියත සහ උපකරණවල කොටස් ආදේශ කිරීමේ පිරිවැය එය දරන අවස්ථාවේදී හඳුනා ගැනීම සඳහා වූ නිර්නායකයන් සපුරන ලද්දේ නම්, එකී වියදම් ද එවැනි පිරිවැයට ඇතුළත් වනු ඇත.

ගොඩනැගිලි සඳහා වූ ක්ෂය සහ ප්‍රත්‍යාගණන දිනයට පසුව අඩුකළ හානිකරණ පාඩු අඩුකර, ඉඩම් සහ ගොඩනැගිලි ගණනය කර ඇත.

සින්නක්කර ඉඩම් හැර, වත්කම්වල පහත සඳහන් ඇස්තමේන්තු කළ ජීවකාලය තුළ සරළ මාර්ග ක්‍රමය අනුව ක්ෂය ගණනය කරනු ලැබේ.

| වත්කම් වර්ගය | ජීවකාලය |
|---|---|
| සින්නක්කර ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | වර්ෂ 50 ක් තුළ |
| කල්බදු ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | කල්බදු කාල පරිච්ඡේදය තුළ |
| පිරියත සහ පිරියත කොටස් | වර්ෂ 20 ක් තුළ |
| ලී බඩු සහ උපකරණ | වර්ෂ 10 ක් තුළ |
| මෝටර් රථ | වර්ෂ 5 ක් තුළ |
| පරිගණක දෘඩාංග | වර්ෂ 4 ක් තුළ |
| වෙනත් | වර්ෂ 3 ක් තුළ |

ධාරණ අගයක් අයකරවාගත නොහැකි බවට සිද්ධීන් හෝ අවස්ථානුකූල වෙනස්කම් හෝ මගින් පෙන්නුම් කරන විටක යන්ත්‍ර හා උපකරණවල සාධාරණ අගය හානිකරණය සඳහා සමාලෝචනය කළ යුතුය. පළමුව පිරිවැය මත හඳුනා ගැනීමෙන් අනතුරුව ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කළ වටිනාකම පවත්වා ගෙන යනු ලබන අතර, එය වූ කලී පසුකාලීන සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ සාධාරණ අගය වේ.

ප්‍රත්‍යාගණනය කළ වත්කම්වල සාධාරණ අගය, ඒවායේ ධාරණ අගයෙන් විශාල ලෙස වෙනස්වීම මගහරවා ගැනීමට නිරතුරුව අගය කිරීම් කරනු ලැබේ.

ප්‍රත්‍යාගණන අතිරික්ත ප්‍රත්‍යාගණන සංචිතයට බැරකර, ශේෂ පත්‍රයේ හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. කෙසේ වුවද මීට පෙර එම වත්කමෙහි හඳුනාගත් ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්තනය කරනු ලබන ප්‍රමාණයට එම ප්‍රත්‍යාගණන වැඩිවීම, ආදායමක් ලෙස හඳුනාගෙන ආදායම් ප්‍රකාශනයෙහි දක්වනු ලැබේ. ප්‍රත්‍යාගණන අඩුවීම් ද ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. කෙසේ වුවද, ප්‍රත්‍යාගණන අඩුවීමක් එම වත්කම සම්බන්ධයෙන්ම වූ පෙර ප්‍රත්‍යාගණන අතිරික්තයක් නිෂ්ප්‍රභා කරන්නේ නම්, එම ප්‍රත්‍යාගණන අඩුවීම් ප්‍රත්‍යාගණන සංචිතයේ ඇති අතිරික්තය සමග ගලපනු ලැබේ. වත්කමක් අපහරණයේ දී, කිසියම් වත්කමකට සම්බන්ධ ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙතොත් එය රඳවාගත් ඉපැයීම්වලට මාරු කරනු ලැබේ. කිසියම් වත්කමක් ඉවත් කිරීමෙන් භාවිතා කිරීමෙන් හෝ ඉවත්කිරීමේ අනාගත ප්‍රතිලාභ ලැබීමේ අපේක්ෂාවක් නොමැතිනම් එය දේපළ, පිරියත සහ උපකරණ ලෙස හඳුනා ගනු නොලැබේ. එවැනි අවස්ථාවක උද්ගත වන ලාභ හා අලාභ (ඉවත් කිරීමෙන් ලබන ශුද්ධ මුදල සහ ධාරණ අගය අතර වෙනස) එම වර්ෂයේදීම ආදායම් ප්‍රකාශනයෙහි

හඳුනාගනු ලැබේ. වත්කමෙහි අවශේෂ වටිනාකම, ජීවකාලය සහ ක්‍රමයන් සමාලෝචනයට භාජනය කරනු ලබන අතර අවශ්‍ය වේ නම් නිරතුරුව ගැලපීම් කරනු ලැබේ.

**3.4.4 අස්පෘශ්‍ය වත්කම්**

පරිගණක දෘඪාංගවල සංරචකයන් නොවන පරිගණක මෘදුකාංග අස්පෘෂ්‍ය වත්කම් ලෙස දක්වා පිරිවැයට හඳුනාගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව මෙම අස්පෘෂ්‍ය වත්කම්, වර්ෂ 4 ක ජීවකාලයක් පදනම් කළ සමුච්චිත ක්‍රමක්ෂය අඩුකළ ධාරණ අගයකට පවත්වා ගෙන යනු ලැබේ.

**3.4.5 ලැබිය යුතු ගිණුම්**

ලැබිය යුතු ගිණුම්, නිශ්චිත සාක්ෂි මත අඩමාන ණය සඳහා වෙන්කිරීම් පිළිබඳ පසුව අපේක්ෂිත උපලබ්ධි වටිනාකම මත දක්වනු ලැබේ.

**3.4.6 විවිධ වත්කම්**

අනෙකුත් විවිධ වත්කම් අපේක්ෂිත උපලබ්ධි වටිනාකමට පවත්වාගෙන යනු ලැබේ.

**3.4.7 මූල්‍ය නොවන වත්කම් හානිකරණය**

කිසියම් මූල්‍ය නොවන වත්කමක් හානිකරණයට භාජනය වීමේ සලකුණු දක්වන්නේ නම් හෝ පවත්නා සිද්ධීන් හෝ වෙනත් තත්ත්වයක් හේතුවෙන් ධාරණ අගය හානි වියහැකි බව පෙන්නුම් කරන්නේ නම් බැංකුව විසින් ඒවා එක් එක් වාර්තා කිරීමේ දිනයේ දී සමාලෝචනය කරනු ලැබේ. එවැනි සලකුණක් පවතී නම්, බැංකුව විසින් වත්කමෙන් අයකර ගත හැකි මුදල් ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරණ අගය අයකරගත හැකි මුදල් ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම හානිකරණය වූ ලෙස සලකා, අයකර ගත හැකි වටිනාකමට ගිණුම් තබනු ලැබේ.

**3.4.8 ප්‍රතිපාදන**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන වගකීමක් (නෛතික හෝ සම්මුතියකින්) ඇතිවිටෙක දී වගකීම බේරුම් කිරීම සඳහා ආර්ථික වාසි ඇතුළු සම්පත් ගලායාමක් අවශ්‍යවීමත්, එම වගකීම පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට හැකිවීම මත ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. ප්‍රතිපාදනයක් ප්‍රතිපූර්ණය කිරීමට බැංකුව අපේක්ෂා කරන්නේ නම්, එම ප්‍රතිපූර්ණය නිසැකවම තහවුරු වන්නා වූ අවස්ථාවලදී, එය වෙන ම වත්කමක් ලෙස හඳුන්වනු ලැබේ.

**3.4.9 සංසරණයේ පවතින මුදල්**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල් ඒවා දරන්නන්ට බැංකුව මත හිමිකමක් පවතී. සංසරණයේ පවතින මුදල් සඳහා බැරකම, ඒවායේ මුහුණත වටිනාකම මත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

**3.4.10 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ යෝජනාක්‍රම**

බැංකුව විසින් මෙහෙයවනු ලබන විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රම 41 වැනි සටහනෙහි හෙළිදරව් කර ඇත.

**3.4.11 නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම**

බැංකුව විසින් විශ්‍රාම වැටුප්, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂිත සහ විශ්‍රාම සේවක වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනාක්‍රම පවත්වා ගෙන යනු ලබයි. ඉන් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලබන පළමු යෝජනා ක්‍රම 3 ට බැංකුව සහ සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් විසින් දායක මුදල් ගෙවනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම යටතේ ප්‍රතිලාභ ගෙවීමේ පිරිවැය, පුරෝකථනය කළ ඒකීය බැර ආයුගණන ක්‍රමයක් මත එක් එක් යෝජනා ක්‍රමයට වෙන් වෙන් වශයෙන් තීරණය කරනු ලැබේ. ආයුගණන අගය කිරීම් වර්ෂ තුනකට වරක් බැගින් සිදු කරනු ලැබේ.

**3.4.12 නිශ්චිත දායක යෝජනා ක්‍රම**

අදාල ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායකත්වයට හිමිකමක් ලැබේ. බැංකුව විසින් සේවකයින්ගේ දළ පාරිශ්‍රමිකයෙන් සියයට 24 ක් සහ සියයට 3 ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක වශයෙන් ගෙවනු ලැබේ. මෙම අරමුදලේ නිශ්චිත දායක සැලසුම් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

**3.4.13 ප්‍රදානයන්**

සාධාරණ වටිනාකමට හඳුනාගෙන ඇති ප්‍රදානයන්, ඒවා ලබා ගැනීම සඳහා පමුණුවා ඇති කොන්දේසිවලට අනුකූලවීමට ඇති ඉඩකඩ පිළිබඳ සාධාරණ තහවුරුවක් ඇතිවිට ඒවා හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. ප්‍රදානයන් වියදම් විෂයකට අදාල වන අවස්ථාවක දී වියදමට සරිලන කාල පරිච්ඡේදයක් තුළ ක්‍රමානුකූල පදනමක් මත එය ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රදානයක් වත්කමට අදාල වන අවස්ථාවක දී එහි සාධාරණ අගය රජයේ විලම්භිත ප්‍රදාන ගිණුමකට බැරකර, එම වත්කමේ ක්ෂය ප්‍රතිපත්තියට අනුකූල වූ ක්‍රමානුකූල පදනමක් මත එහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයුකාලය තුළ ආදායම් ප්‍රකාශනයට මුදාහරිනු ලැබේ.

**3.4.14 සේවක මණ්ඩල වියදම්**

සේවක මණ්ඩල වියදම්වලට, මුළු කාර්ය මණ්ඩල ප්‍රතිලාභවල පූර්ණ පිරිවැය ඇතුළත් ය. වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු වැටුප් සහ සම්බන්ධිත වියදම් අනිකුත් දේශීයව ගෙවිය යුතු ශේෂයන් යටතේ දක්වනු ලැබේ.

**3.4.15 ක්‍රියාත්මක කල්බදු**

බැංකුව කල්බදු ගැනුම්කරු වන අවස්ථාවන්හි දී, කල්බදු ගත් වත්කම්වලින් අපේක්ෂිත ප්‍රතිලාභ පදනම් කරගෙන, ක්‍රියාත්මක කල්බදු සඳහා ගෙවිය යුතු කුලිය එය බල පවත්නා කාල පරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

**3.4.16 බදුකරණය**

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ 118 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් වේ. තවද

2013 අංක 06 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත යටතේ සහ 2013 අංක 17 දරණ එකතුකළ අගය මත බදු (සංශෝධිත) පනත යටතේ ආර්ථික සේවා ගාස්තු සහ මූල්‍ය සේවා සැපයීම මත වන එකතුකළ අගය මත බද්දෙන් බැංකුව නිදහස් වේ.

**3.4.17 ආදායම සහ වියදම**

බැංකුව වෙත ආර්ථික ප්‍රතිඵල ගලාඒමේ හැකියාව සහ ආදායම නිසැකව ම මිනුම් කළ හැකි ප්‍රමාණය අනුව ආදායම් ගිණුම්ගත කරනු ලැබේ. දරන ලද පිරිවැය සහ උපයන ලද නිශ්චිත ආදායම අතර ඍජු සම්බන්ධතාවය පදනම් කරගෙන ආදායම් ප්‍රකාශනයෙහි වියදම් සටහන් කරනු ලැබේ. ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපල, පිරියත, උපකරණ කාර්යක්‍ෂමව පවත්වා ගැනීම සඳහා දරන ලද සියළුම වියදම්, වර්ෂය සඳහා ප්‍රතිඵල ගණනය කිරීම පිණිස ආදායමට එරෙහිව සටහන් කර ඇත.

ආදායම් වියදම් හැඳින්වීමට පෙර පහත දැක්වෙන ගිණුම්ගත කිරීමේ උපමානයන් ද සපුරාලිය යුතුය.

**3.4.17.1 පොළිය**

පොළිය ලැබීම පිළිබඳ සැකයක් නොමැති නම්, මිලට ගැනීමේ සත්‍ය මිල පදනම්ව සඵල ඵලදායිත්ව ක්‍රමයට උපචිත පදනම මත පොළී ආදායම සහ වියදම, ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ස්ථාවර ආදායම් ආයෝජන සහ සුරැකුම්පත් මත උපයන කූපන් සහ භාණ්ඩාගාර බිල්පත් සහ අනිකුත් වට්ටම් උපකරණ මත උපචිත වට්ටම් සහ අධිමිල පොළී ආදායමට ඇතුළත් ය. ණය අයකර ගැනීම සැක සහිත අවස්ථාවල දී පොළී ආදායම අත්හිටුවන අතර, ඒවා ලැබෙනතුරු පොළී ආදායමෙන් බැහැර කරනු ලැබේ.

**3.4.17.2 ලාභාංශ**

ලාභාංශ ආදායම කොටස්හිමියා වෙත ලැබීමේ අයිතිය තහවුරු වූ විට හඳුනාගනු ලැබේ.

**3.4.17.3 විවිධ**

විවිධ ආදායම් සහ වියදම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ අපහරණයේ දී උද්ගතවන ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ හෝ පාඩු, වත්කම් ධාරණ අගය සහ විකුණුම් වියදම් අපහරණයෙන් ලද වියදම් අඩුකොට ආදායම් ප්‍රකාශනයෙහි ගිණුම්ගත කර ඇත. ප්‍රධාන ලාභ උත්පාදන ක්‍රියාකරකම්වලට අනුෂාංගික ක්‍රියාකාරකම්වලින් උද්ගතවන සහ සමාන ගනුදෙනු සමූහයකින් උද්ගතවන එතරම් වැදගත් නොවන ලාභ සහ පාඩු එකතුකොට ශුද්ධ පදනම මත වාර්තාකර ඉදිරිපත් කරනු ලැබේ.

**3.4.18 මූල්‍ය තත්ව ප්‍රකාශනයෙන් බාහිර විෂයයන් ඇතුලු අසම්භාව්‍යයන් සහ බැඳීම්**

ශේෂ පත්‍රයෙහි බාහිර විෂයයන් නියෝජනය කෙරෙන ණය ගැතිකම් සහතිකවීම්, ඉදිරි විදේශ විනිමය ගනුදෙනු සහ අනිකුත් බැඳීම් සියල්ල ශේෂ පත්‍රයෙන් බාහිර විෂයයන් ලෙස හඳුනාගෙන අදාල ශීර්ෂ යටතේ දක්වා ඇත. අවශ්‍යවන අවස්ථාවන්හිදී මෙම ප්‍රමාණ වඩාත් උචිත ඇස්තමේන්තු අනුව මිනුම් කර ඇත.

**4. ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ විෂය පථය**

1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්ති පියවර නිශ්චය කිරීමට අමතරව මහ බැංකුවේ බලතල, යුතුකම් සහ කර්තව්‍යයන් පැවැරෙන අතර, බැංකුවේ කළමනාකාරිත්වය, මෙහෙයුම් සහ පරිපාලනය සඳහා පොදුවේ වගකිවයුතු වන්නේය. බැංකුව විසින් මූලිකව ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය සඳහා පොදුවේ වගකිවයුතු අතර රජයේ මූල්‍ය නියෝජිත ලෙස ද කටයුතු කරනු ලැබේ. බැංකුවේ ක්‍රියාකාරකම්වලට ප්‍රධාන වශයෙන් පහත සඳහන් දෑ ඇතුළත් ය.

- මුදල් සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- මුදල් නිකුත් කිරීම.
- මූල්‍ය පද්ධතියෙහි නිදහස් තරගකාරිත්වය සහ ස්ථායීතාවය සැලසීම.
- සුදුසුකම්ලත් මූල්‍ය ආයතනවලට බලපත්‍ර ලබාදීම සහ අධීක්ෂණය.
- අන්තර් බැංකු බේරුම් කිරීමේ පද්ධතිය සංවිධානය හා කළමනාකරණය සහ ගෙවීම් පද්ධතියෙහි නිසි ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කිරීම.
- විවිධ පහසුකම් යටතේ රජයට, බැංකුවලට සහ මූල්‍ය ආයතනවලට ණය සහ අත්තිකාරම් සැපයීම.
- රජය සහ රජය වෙනුවෙන් ක්‍රියාකරන නියෝජිත ආයතන සමග නිශ්චිත විධිවිධාන යටතේ සුරක්ෂිතාගාරයක් ලෙස ක්‍රියාකිරීම.

ශ්‍රී ලංකාවේ ඵලදායී සම්පත් සංවර්ධනය, දිරි ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමේ අදහසින් යුතුව එහි පරමාර්ථය වන ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සපුරාගැනීම සඳහා පවත්වා ගෙනයන ක්‍රියාකාරකම්, විදේශීය මුදල් ක්‍රියාකාරකම් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස පුළුල්ව වෙන්කර දැක්විය හැකිය. මෙම ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල ආදායම් ප්‍රකාශනයට අදාළව මෙහෙයුම් ක්‍රියාකාරකම් වේ.

**4.1 විදේශීය මුදල් ක්‍රියාකාරකම්**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි විදේශීය සංචිත කළමනාකරණය යටතේ පවත්වාගෙන යනු ලබන විදේශීය මුදල් වත්කම්වලින් විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් ජනිත වේ. විදේශීය සංචිත කළමනාකරණ කළඹ, විදේශීය මුදල් මැදිහත්වීමේ කාර්යයන් සඳහා වූ විදේශීය මුදල් වත්කම් සහ වෙළෙඳ කටයුතු සඳහා වූ අනිකුත් විදේශීය මුදල් වත්කම්වලින් සමන්විත වේ.

විදේශීය මුදල් වත්කම් විවිධ මුදල් වර්ගවලින් පවත්වා ගනු ලැබේ. එයින් වැඩි ප්‍රමාණයක් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්, ඔස්ට්‍රේලියානු ඩොලර්, යුරෝ, බ්‍රිතාන්‍ය පවුම්, ජපන් යෙන් සහ නවසීලන්ත ඩොලර් වලින් හඳුන්වා ඇත.

මෙම විදේශීය මුදල් කළඹ තුළ වූ මූල්‍ය ලියවිලි ප්‍රධාන වශයෙන් ශෛවරී සුරැකුම්පත් ප්‍රතිවර්තිත මිලදී ගැනීමේ

ගනුදෙනු යටතේ දරනු ලබන සුරැකුම් හෝ අනිකුත් මහ බැංකු, වාණිජ බැංකු හා අනිකුත් භාරකාර ආයතන වෙත වූ ශේෂයන්ගෙන් සමන්විත වේ.

විදේශීය වෙළෙඳපොළේ මෙහෙයුම්වලින් උද්ගත වන්නා වූ විදේශීය මුදල් වත්කම් සහ බැරකම් ද, කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලැබේ.

### 4.2 දේශීය මුදල් ක්‍රියාකාරකම්

දේශීය මුදල් ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි උද්ගත වේ.

(i) ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම්: බැංකු පද්ධතියට අරමුදල් අත්තිකාරම් දීමෙන් හෝ බැංකු පද්ධතියෙන් අරමුදල් ආපසු ගැනීමෙන් රජයට හෝ මූල්‍ය වෙළෙඳපොළට දෛනිකව සිදුවන ශුද්ධ ගලායාම් හිලව් කරනු ලැබේ. මෙම කටයුතු බොහොමයක් දෛනික වෙළෙඳපොළ මෙහෙයුම් මගින් සිදුකරනු ලැබේ.

(ii) විවෘත වෙළෙඳපොළ කටයුතු සඳහා ආධාරකයක් වශයෙන් ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වලින් සමන්විත ආයෝජන කළඹක් බැංකුව පවත්වා ගනී. බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ මෙම ආයෝජන වෙළඳාම සඳහා නොව මුදල් මෙහෙයුම් කටයුතු සඳහා පමණක් පවත්වා ගැනීමය.

### 4.3 භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්

භාරකාර සහ පරිපාලන විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන මුදල්, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන් ගෙන් අන්තර්ගත කොටසක් නොවන බැවින් ඒවා මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුළත් කර නොමැත.

## 5. විදේශීය සුරැකුම්පත්වල අයෝජනයන්

| | 2013 රු. 000 | 2012 රු. 000 |
|---|---|---|
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | **94,137,368** | 169,312,604 |
| විකිණීම සඳහා ඇති ආයෝජන | **357,531,750** | 386,761,690 |
| **එකතුව** | **451,669,118** | 556,074,294 |

## 6. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

අ) පහත දක්වා ඇති වගුව මගින් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් එහි කාල්පනික අගයන් සමග වත්කම් හෝ බැරකම් වශයෙන් වාර්තා කර ඇත. දළ අගයන් වශයෙන් වාර්තා කර ඇති කාල්පනික අගයන් ලෙස හඳුනා ගනුයේ ව්‍යුත්පන්නයට පාදක වූ වත්කමේ නිර්දේශ අනුපාතයේ හෝ දර්ශකයේ අගය වන අතර ව්‍යුත්පන්න උපකරණයන්ගේ අගයන්හි සිදුවන වෙනස්වීම් මිනුම් කිරීමේ පදනම ද වේ. කාලපරිච්ඡේදයේ අවසාන දිනට හිඟව පවතින ගනුදෙණුවල පරිමාව කාල්පනික අගයන්ගෙන් නිරූපණය වන අතර එමගින් වෙළඳපල අවදානම හෝ ණය අවදානම නොහැඟ වේ.

| | 2013 | | | 2012 | | |
|---|---|---|---|---|---|---|
| ව්‍යුතපන්න මූල්‍ය උපකරණ | වත්කම් රු. 000 | වගකීම් රු. 000 | කාල්පනික අගය රු. 000 | වත්කම් 2012 රු. 000 | බැරකම් 2012 රු. 000 | කාල්පනික අගය රු. 000 |
| මුදල් හුවමාරු Currency SWAPS | **5,670,258** | **4,703,881** | **360,929,041** | 3,989,701 | 3,250,937 | 205,552,318 |
| ඉදිරියෙහි වූ හුවමාරු (Forward Forex) | - | **451** | **180,452** | - | 6,182 | 1,027,364 |
| අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය විකල්පයන් (Currency Option) | - | **11,478,950** | **119,808,712** | - | - | - |
| එකතුව | **5,670,258** | **16,183,282** | **480,918,205** | 3,989,701 | 3,257,119 | 206,579,682 |

ආ) ඉහත සඳහන් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සමන්විතවනුයේ මුදල් හුවමාරු, මුදල් විකල්ප සහ ඉදිරි රැකුම් විදේශ විනිමය ගිවිසුම්වලිනි. මෙවැනි උපකරණ යොදාගනුයේ බැංකුවේ ව්‍යවස්ථාපිත අරමුණක් වන ජාත්‍යන්තර අරමුදල් පවත්වාගැනීමද වන අතර, ජාත්‍යන්තර අරමුදල්වලින් පැන නගින්නා වූ සමහර අවදානම් කළමනාකරණය කිරීම මගින් සමපේක්ෂණ චේතනාවක් මත එම උපකරණ විවෘත තත්ත්වයන්හි පවත්වාගෙන ගනුදෙනු කිරීමෙන් ලාභ ඉපයීම නොවේ. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සාධාරණ අගයට පවත්වාගෙන යනු ලබන අතර, සාධාරණ අගය ධන අගයක් වන විට එය වත්කමක් ලෙසද, සාධාරණ අගය ඍණ අගයක් වන විට එය වගකීමක් ලෙස ද සටහන් කරනු ලබේ.

ඇ) ස්වල්පවශයෙන් වටිනාකම මාරු කිරීම හෝ වටිනාකම මාරු කිරීමකින් තොරව, අනෝන්‍ය ප්‍රතිපාදන හුවමාරු කිරීම මගින් පමණක් ව්‍යුත්පන්න උපකරණයන්ගේ ආරම්භය සිදුවේ. කෙසේ වුවත් නිතර ඉහළ තොලන මට්ටමක් ඇති මෙම උපකරණ චංචල උපකරණයන් වේ. ව්‍යුත්පන්න ගිවිසුමක ගැබ්ව ඇති වත්කමක වටිනාකම, අනුපාතය හෝ දර්ශකය සිදුවන්නා වූ සුළු සංචලනයක් මගින් බැංකුවේ ලාභය හෝ අලාභය කෙරෙහි සැලකිය යුතු මට්ටමේ බලපෑමක් සිදු කරයි. අත්පිට ව්‍යුත්පන්න උපකරණයක් මගින් විවෘත තත්වයන් සංවෘත කිරීම සඳහා හුවමාරු වෙළෙඳ පොළක් නොමැති වීම හා සම්බන්ධ අවධානමක් බැංකුව වෙත ඇති කරණු ලැබේ.

ඈ) අදාළ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවලින් අපේක්ෂිත ප්‍රතිලාභ තහවුරු කිරීමට ජාත්‍යන්තර සංචිතවල බැංකුවේ වෙළෙඳ අවදානම සමස්ත කළමණාකරණයෙහි කොටසක් ලෙස නිරාවරණය සමීප වශයෙන් අධීක්ෂණය කරණු ලබයි.

ඉ) ජාත්‍යන්තර සංචිත වැඩි දියුණු කිරීම වූ උපාය මාර්ගයක් ලෙස එළඹුණු හුවමාරු (Swaps) බැංකුවේ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ කළඹෙහි ඉතා වැදගත් කොටසක් වශයෙන් අඩංගු වී ඇත. හුවමාරු යනු නිශ්චිත පාදක වූ දර්ශකයක එනම් පොලී අනුපාතයක් ලෙස, විදේශ විනිමය අනුපාතයක් ලෙස හෝ ස්කන්ධ දර්ශකයක වෙනස් වීම්වලට අදාලව නිශ්චිත කාල්පනික ප්‍රමාණයනට පදනම්ව කාලයක් පුරාවට පාර්ශවයන් දෙපිරිසක් අතර

ගෙවීම් ප්‍රවාහයක් හුවමාරු කරගැනීමට වූ ගිවිසුම් ගත එකඟතාවයකි. විනිමය හුවමාරුවකදී, බැංකුව නිශ්චිත ප්‍රමාණයක් එක මුදල් වර්ගයකින් ගෙවන අතර වෙනත් මුදල් වර්ගයකින් නිශ්චිත ප්‍රමාණයක් ලබා ගනී.

**7. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම්**

| | **2013** රු. 000 | 2012 රු. 000 |
|---|---|---|
| විශේෂ ගැනුම් හිමිකම් දැරීම | **2,032,177** | 491,322 |
| ජා.මූ.අ. පංගුව | **83,240,157** | 80,741,567 |
| ජා.මූ.අ. තැන්පතුව | **128,430** | 119,393 |
| **මුළු ජා.මූ.අ. සම්බන්ධ මුළු වත්කම්** | **85,400,764** | 81,352,282 |

**අ) විශේෂ ගැනුම් හිමිකම් දැරීම**

විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) දැරීම වූ කලී ජා.මූ.අ. සාමාජිකයන් හට බාධාවකින් තොරව පාවිච්චි කළ හැකි මුදල් වර්ග සඳහා පවතින විභව්‍ය හිමිකමකි. එනම්, වි.ගැ.හි. දරන්නන් විසින් එම මුදල් සඳහා වි.ගැ.හි. හුවමාරු කරගත හැකිවීමය. එකී සාමාජිකයන් එම මුදල් වි.ගැ.හි. දැරීමට සහ පිළිගැනීමට බැඳී සිටීම සහ වි.ගැ.හි. පද්ධතියේ මෙහෙයුම්වලට අදාලව විවිධ වගකීම්වලට ගරු කිරීමට බැඳී සිටීම නිසා සංචිත වත්කමක් ලෙස වි.ගැ.හි. වල ඇති විශේෂත්වය ඇති වේ. අබාධව පාවිච්චි කළ හැකි මුදල් මත වි.ගැ.හි. වල පවතින හිමිකම දෙයාකාරයකින් ගරු කිරීම ජා.මූ.අ. විසින් තහවුරු කරනු ලැබේ. එනම්, දුර්වල විදේශීය තත්ත්වයන්හි පවතින සාමාජිකයන්ගෙන් වි.හැ.ගි. මිලට ගැනීම සඳහා බලවත් විදේශීය තත්ත්වයන් පවත්නා සාමාජිකයන් නම් කිරීම මගින් සහ කළමනාකරණය කළ වෙළෙඳපොළක් තුළ සාමාජිකයන් අතර, ස්වෙච්ඡා හුවමාරු කිරීම මගින් ය. අදාළ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනයේ දී බැංකුව විසින් දරන ලද මුළු ප්‍රමාණය ඉහත සංඛ්‍යාවන්ගෙන් දැක්වේ.

**ආ) ජා.මූ.අ. පංගුව**

ජා.මූ.අ. අරමුදලෙහි වත්කම් වල ප්‍රාථමික මූලශ්‍රය වන්නේ එහි සාමාජික රටවලින් ලබා ගන්නා ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් පංගුව හෙවත් ප්‍රග්ධන දායකත්ව යන්නෙහි එක් එක් රටවල පංගුව එම රටෙහි සාපේක්ෂ ආර්ථික වටිනාකම පදනම් කර ගනිමින් තිරණය කරනු ලබයි. ජා.මූ.අරමුදලෙහි සාමාජිකත්වය ලබාගැනීමෙන් පසු තම පංගුවෙන් 25%ක ප්‍රමාණයක් පුළුල්ව පිළිගත් විදේශ මුදලකින් හෝ විදේශ ගැනුම් හිමිකම මගින්ද ඉතිරි 75%ක මුදල එම රටෙහි දේශිය මුදලින්ද ගෙවිය යුතුය.

i.) **ආයකය** - ජා.මූ.අ. වෙත සාමාජිකයකුගේ ආයකය සාමාජිකයාගේ පංගුවට සමාන වේ. එමගින් සාමාජිකයා විසින් ජා.මූ.අ. වෙත ලබාදීමට බැඳී ඇති උපරිම මූල්‍ය සම්පත් ප්‍රමාණය නිශ්චය කරනු ලැබේ. සාමාජිකයකු විසින් ආයකය සම්පූර්ණයෙන් ම ගෙවිය යුතු අතර, සියයට 25 ක් ජා.මූ.අ. විසින් නියම කරනු ලබන සංචිත වත්කම්වලින් (වි.ගැ.හි. හෝ පාවිච්චි කළ හැකි මුදල්) ගෙවිය යුතුය. ඉතිරි ප්‍රමාණය සාමාජිකයාගේ මුදල්වලින් ගෙවිය යුතුය.

ii.) **ඡන්දය දීමේ බලතල** - ජා.මූ.අ. තීරණවලදී සාමාජිකයාගේ ඡන්දය දීමේ බලතල පංගුව මගින් නිර්වචනය වේ. එක් එක් ජා.මූ.අ. සාමාජිකයාට මූලික ඡන්ද 250 ක් ද පංගුවෙහි සෑම වි.ගැ.හි. මිලියන 0.1 ක් සඳහා එක් අතිරේක ඡන්දයක් බැගින් ද හිමි වේ.

iii.) **මූල්‍යකරණය පිවිසීම** - සාමාජිකයෙකුට ලබාගත හැකි මූල්‍ය පහසුකම්වලින් (පිවිසීමේ සීමා) සාමාජිකයාගේ පංගුව පදනම් වේ. සමීපස්ථ සහ ව්‍යාප්ත කළ සැලසුම් ප්‍රකාර සාමාජිකයෙකුට ප්‍රවර්තනය වාර්ෂිකව පංගුවෙන් සියයට 200 ක් ද සමුච්චිත වශයෙන් සියයට 600 ක් ද දක්වා ණය ලබාගත හැකිය. අසාමාන්‍ය අවස්ථාවකදී සහ නිශ්චිත ගැටළු විසඳා ගැනීම සඳහා ප්‍රවේශය මීට වැඩිවිය හැකිය.

iv.) **වි.ගැ.හි. වෙන්කිරීම්** - සාමාජිකයන්ගේ පංගුවලට සමානුපාතිකව ඔවුන්ගේ වි.ගැ.හි. වෙන්කිරීම් ප්‍රමාණය නියම කරනු ලැබේ.

එබැවින් වි.ගැ.හි. පංගුව වත්කමක් වේ. බැංකු විසින් ජා.මූ.අ. සමග සිදුකරනු ලබන ගනුදෙනු ශ්‍රී ලංකා ආණ්ඩුවේ නියෝජිතයකු වශයෙන් නොව, තම බලතල අනුව සිදුකරන බැවින් ජා.මූ.අ. පංගුව බැංකුවේ වත්කමක් ලෙස එහි මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වයි. ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල් ප්‍රමාණය 17 වැනි සටහනේ පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත.

**ඇ) ජා.මූ. අරමුදලේ තැන්පතු - දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම - (PRGF - HIPC) භාර තැන්පතුව**

දැඩි ණයගැති භාවයට පත්වී සිටින රටවල් වෙනුවෙන් දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම (PRGF - HIPC) වෙනුවෙන්, 2000 අප්‍රේල් 21 වන දින, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාව පවත්වාගෙන යනු ලබන (පරිපාලිත -Administered) වි.ගැ.හි. 788.783 ක ශේෂයකින් යුත් විශේෂ විලම්භිත ගිණුම (SCA 2) පැවරීමෙන් අරඹන ලදී. මෙම ගිණුම අරඹන ලද්දේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මග පෙන්වීම මත SCA 2 ගිණුම වසා දැමීමට තීරණය කිරීමේ දී SCA 2 ගිණුමෙහි පැවැති ශේෂය මාරු කිරීමෙනි.

මෙම ගිණුමෙහි ශේෂයන් ඇති රටවලින් ජා.මූ.අ. පහත දැක්වෙන ඉල්ලීම් කරන ලදී. උක්ත ගිණුමෙහි සඳහන් ශේෂයන් (PRGF-HIPC) භාර ගිණුම වෙත ප්‍රතිපාදන කිරීම කළ යුත්තේ එකවර දෙනු ලබන පැවැරුමක් ලෙසින් හෝ සහනාධාරයක් ලෙසිනි. මෙය PRGF-HIPC ණය වෙනුවෙන් සපයා දිය යුතුය. ඒ අනුව SCA 2 ගිණුමේ ශේෂය PRGF-HIPC භාර ගිණුම වෙත පවරා දීමට ශ්‍රී ලංකා රජය එකඟ විය. මෙය පවරා දෙනු ලබන්නේ එකවර මුදාහරිනු ලබන සහනාධාරයක් ලෙසින් නොව (act as an out right grant) 2018 වසර දක්වා බල පැවැත්වෙන පොළී රහිත තැන්පතුවක් වශයෙනි.

**8. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්**

මුදල් නීති පනතේ 90(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පවත්වාගෙන යනු ලබන කෙටි කාලීන රාජ්‍ය සුරැකුම්පත් කළඹ මේ යටතට ගැනේ.

**9. රජයට දෙන ලද කාලීන අත්තිකාරම්**

1949 අංක 58 දරන මුදල් නීති පනතේ (සංශෝධිත පරිදි) 89 වැනි වගන්ති ප්‍රකාර දෙන ලද සෑම අත්තිකාරකමක්

මාස හයකට නොවැඩි කාලයකින් ආපසු ගෙවන්නේ නම් සහ ඕනෑම අවස්ථාවකදී පරිශේෂව තිබෙන එම අත්තිකාරම් ප්‍රමාණය අත්තිකාරම් දෙනු ලබන වර්ෂයේ ශ්‍රී ලංකා රජයේ ඇස්තමේන්තුගත ආදායමින් සියයට 10 ක් නොඉක්මවන්නේ නම්, ඒකාබද්ධ අරමුදලින් දැරීම සඳහා අනුමාන වියදම් මූල්‍යයනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට (ශ්‍රීලංර) ඍජු තත්කාලීන අත්තිකාරම් දීමට මහ බැංකුවට හැකිය. බැංකුව විසින් එසේ දෙන ලද අත්තිකාරම් ශේෂයෙන් දැක්වේ.

## 10. බැංකුවලට දෙන ලද ණය

| | 2013<br>රු. 000 | 2012<br>රු. 000 |
|---|---|---|
| මධ්‍යකාලීන හා දිගුකාලීන ණය යෝජනා ක්‍රමය යටතේ ලැබිය යුතු | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **37,377** | 39,510 |
| - අනෙකුත් | **546** | 607 |
| *සුසහන සුනාමි යෝජනා ක්‍රමය යටතේ ලැබිය යුතු මුදල්* | | |
| - සම්බන්ධිත පාර්ශවයන් | **104,576** | 191,982 |
| - අනෙකුත් | **17,794** | 63,301 |
| ප්‍රාදේශීය සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ලැබිය යුතු දෑ | | |
| - සම්බන්ධිත පාර්ශවයන් | **1,242,405** | 1,576,139 |
| අඩුකළා | | |
| අඩමාණ ලැබිය යුතු මුදල් සඳහා වෙන්කිරීම | **(27,302)** | (27,302) |
| ශුද්ධ ලැබිය යුතු මුදල | **1,375,396** | 1,844,237 |

අඩමාණ ලැබිය යුතු මුදල් සඳහා වෙන්කිරීමේ චලනය මෙසේය.

| | 2013<br>රු. 000 | 2012<br>රු. 000 |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | **27,302** | 27,302 |
| අඩමාන ණය කපාහැරීම | - | - |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **27,302** | 27,302 |

## 11. මූල්‍ය සහ අනිකුත් ආයතන වල හිමිකරු ප්‍රාග්ධන ආයෝජන

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ, කාර්මික හෝ වෙනත් ආයතනයක ඍජු සම්බන්ධකම් ඇතිවන පරිදි වෙළෙඳ හෝ වෙනත් කටයුතුවල නිරතවීම හෝ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී වෙනත් බැංකුවල කොටස් මිලදී ගැනීම හෝ 1949 අංක 58 දරන මුදල් නීති පනතේ (සංශෝධිත) 105A වගන්ති ප්‍රකාර නිශ්චිත වශයෙන් තහනම් කරනු ලැබේ. කෙසේ වුවද, මුදල් මණ්ඩලයේ මතය පරිදි බැංකු සහ මූල්‍ය අංශයේ මානව සම්පත් සහ තාක්ෂණික සංවර්ධනය, දියුණුව සහ ප්‍රවර්ධනය සඳහා හෝ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවල ගනුදෙනු නිශ්කාෂණය කිරීම පහසු කිරීම සඳහා පිහිටුවන ලද සමාගමක කොටස් අත්පත්කර දැරීමට පනත මගින් බලතල පවරා තිබේ.

(ආ) ඉහත සඳහන් අවශ්‍යතාවයන් පදනම්ව බැංකුව විසින් ශේෂ පත්‍ර දිනට පහත සඳහන් ආයෝජන දරනු ලැබේ.

| ආයතනය | ව්‍යාපාර කටයුතුවල ස්වභාවය | දරණ ප්‍රතිශතය 2013 | 2012 |
|---|---|---|---|
| සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම | ස්වයංක්‍රීය චෙක්පත් නිශ්කාෂණය | **19.66** | 19.66 |
| සීමාසහිත ෆිච් රේටිංස් ලංකා සමාගම | ණය ශ්‍රේණිගත කිරීම | **10.00** | 10.00 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විස් බියුරෝ ලිමිටඩ් | ස්වයංක්‍රීය අරමුදල් හුවමාරුව | **7.50** | 7.50 |
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යංශය | ණය තොරතුරු සම්පාදනය | **19.30** | 19.30 |

(ඇ) අදාළ ආයතනවල වූ ආයෝජනයන්ගේ ධාරණ වටිනාකම මෙසේය:

| | 2013<br>රු. 000 | 2012<br>රු. 000 |
|---|---|---|
| සිමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | **5,845** | 5,845 |
| සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම | **29,500** | 29,500 |
| සීමාසහිත ෆිච් රේටිංස් ලංකා සමාගම | **3,500** | 3,500 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විස් බියුරෝ ලිමිටඩ් | **2,250** | 2,250 |
| මූල්‍ය සහ අනිකුත් ආයතන වල මුළු ආයෝජනය | **41,095** | 41,095 |

## 12. අනිකුත් වත්කම්

| | 2013<br>රු. 000 | 2012<br>රු. 000 |
|---|---|---|
| අභ්‍යන්තර අරමුදල්හි ආයෝජන | **2,034,546** | 1,799,394 |
| කාර්ය මණ්ඩල ණය ක්‍රමක්ෂය පිරිවැයට | **4,400,751** | 3,767,064 |
| ණයකරවල ආයෝජන ක්‍රමක්ෂය පිරිවැයට | **8,237** | 7,273 |
| | **6,443,534** | 5,573,731 |

ණයකරවල ආයෝජන මගින් නියෝජනය වන්නේ මර්කන්ටයිල් ක්‍රෙඩිට් සමාගම වෙත 1990-1992 දක්වා වූ කාලය තුළ බැංකුව විසින් ලබා දී තිබූ සහ 2011 දී සම්පූර්ණයෙන්ම කපා හරින ලද ප්‍රතිමූල්‍ය ණය පහසුකමෙන් කොටසක් පියවා ගැනීම සඳහා ලැබුණු ණයකරවල වටිනාකමයි. මෙම සමාගම ඈවර කිරීමේ කටයුතු තවමත් සම්පූර්ණ කර නොමැති අතර ඉතිරි මුදල ඈවර කිරීමෙන් උත්පාදනය වන මුදලින් පියවා ගනු ඇත.

ණයකර ආයෝජනවලින් නියෝජනය වන්නේ මර්කන්ටයිල් ක්‍රෙඩිට් සමාගමට ලබාදී තිබූ 2011 දී ලියාහරින ලද ප්‍රතිමූල්‍ය ණය වලින් කොටසක් වෙනුවෙන් ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ

බැංකුව නිකුත් කරන ලද ණයකරවේ. වටිනාකම රු. 10,839,500 යුත් සුරැකු නොලත් ණයකර වර්ෂ 10 ක් සඳහා යටත්, නිදහස් කල හැකි හා 5% වාර්ෂික පොළි හිමිකමක් හෝ එක් අවුරුදු භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිලාභ අනුපාතයන් අතුරින් අඩු අගයට වාර්ෂිකව උපචිත කරයි.

## 14. තොග

| | **2013 රු. 000** | 2012 රු. 000 |
|---|---|---|
| සංසරණය සඳහා ඇති නෝට්ටු | **2,035,994** | 2,171,534 |
| සංසරණය සඳහා ඇති කාසි | **732,232** | 706,071 |
| මාර්ගස්ථ කාසි | **109,233** | - |
| මාර්ගස්ථ නෝට්ටු | **233,897** | 51,564 |
| *අඩුකළා :* සෙමින් චලනය වන | **3,111,356** | 2,929,169 |
| විෂයයන් සඳහා වෙන්කිරීම් | **(45,000)** | (25,000) |
| | **3,066,356** | 2,904,169 |
| ලිපි ද්‍රව්‍ය සහ විවිධ තොග | **36,766** | 37,908 |
| වෛද්‍ය මධ්‍යස්ථාන තොගය | **149** | 116 |
| පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකමට මුළු තොගය | **3,103,281** | 2,942,193 |

## 13. රන්

මුදල් නීති පනතේ 67(1) වගන්තිය ප්‍රකාරව බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස රන් දරා සිටී. මුදල් මණ්ඩලය මුදල් නීති පනතේ 67(2) වගන්ති ප්‍රකාරව රන් න්‍යෂ්ඨික සංචිතයක් ලෙස හෝ නිදහසේ පරිවර්තනය කළ හැකි විනිමයක් ලෙස ඍජුව හෝ වක්‍රව රන් දරා සිටීමට ඉඩ ලබා දී ඇත.

## 15. දේපළ පිරියත සහ උපකරණ

| | ඉඩම් සහ ගොඩ නැගිලි | පිරියත සහ පිරියත උපකරණ | ලී බඩු සහ උපකරණ | මෝටර් වාහන | පරිගණක | අනිකුත් කියවීම් උපකරණ | නොනිමි ඉදිකිරීම් | එකතුව 2013 | එකතුව 2012 |
|---|---|---|---|---|---|---|---|---|---|
| **සමුච්චිත ක්ෂය අඩුකර** | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ජනවාරි 01 දිනට අගය | **12,332,079** | **1,144,261** | **764,765** | **400,719** | **720,374** | **49,047** | **633,906** | **16,045,151** | 12,414,835 |
| ප්‍රත්‍යාගණනය | **-** | - | - | - | - | - | - | **-** | 2,746,379 |
| එකතු කිරීම් | **2,401** | **21,472** | **42,573** | **-** | **78,087** | **1,357** | **546,306** | **692,196** | 1,709,550 |
| නැවත වර්ග කිරීම් | - | - | | - | - | - | - | - | - |
| අපහරණයන්/මාරු කිරීම් | **(2,000)** | **(211)** | **(11,948)** | **-** | **(936)** | - | **(20,343)** | **(35,438)** | (825,613) |
| **සමුච්චිත ක්ෂය අඩුකර** | | | | | | | | | |
| දෙසැම්බර් 31 දිනට අගය | **12,332,480** | **1,165,522** | **795,390** | **400,719** | **797,525** | **50,404** | **1,159,869** | **16,701,909** | 16,045,151 |
| **ක්ෂය** | | | | | | | | | |
| ජනවාරි 01 දිනට | **125,436** | **537,262** | **543,550** | **248,686** | **647,470** | **29,670** | **-** | **2,132,074** | 2,418,138 |
| ප්‍රත්‍යාගණනය | **-** | - | - | - | - | - | - | **-** | (541,949) |
| වර්ෂය සඳහා ක්ෂය | **174,663** | **57,486** | **36,828** | **41,115** | **43,776** | **1,348** | **-** | **355,216** | 312,070 |
| අපහරණයන් | **(1,398)** | **(92)** | **(11,872)** | **-** | **(934)** | - | - | **(14,296)** | (56,185) |
| දෙසැ 31 දිනට අගය | **298,701** | **594,656** | **568,506** | **289,801** | **690,312** | **31,018** | **-** | **2,472,994** | 2,132,074 |
| ශුද්ධ පොත් අගය | **12,033,779** | **570,866** | **226,884** | **110,918** | **107,213** | **19,386** | **1,159,869** | **14,228,915** | 13,913,077 |

ඉඩම් සහ ගොඩනැගිලි සඳහා පොත් වටිනාකම, සාධාරණ වටිනාකම අනුව සටහන් කරනු ලැබේ. ඉතා ආසන්නම ස්වාධීන තක්සේරුව 2012 මාර්තු 31 දිනට වරලත් තක්සේරුකරුවකු වන පී.බී. කළුගලගෙදර මහතා විසින් සිදු කරන ලද අතර 2012 අප්‍රේල් 30 දින වාර්තා ගත කර තිබුණි'.

**ඉඩම් සහ ගොඩනැගිලිවල සංයුතිය**

| | ධාරණ අගය 2013 රු. 000 | ධාරණ අගය 2012 රු. 000 |
|---|---|---|
| සින්නක්කර ඉඩම් | **5,243,100** | 5,180,100 |
| සින්නක්කර ඉඩම්වල ගොඩනැගිලි | **6,705,474** | 6,939,096 |
| කල්බදු ඉඩම්වල ගොඩනැගිලි | **85,205** | 84,447 |
| | **12,033,779** | 12,206,643 |

ප්‍රත්‍යාගණනය කළ ඉඩම් සහ ගොඩනැගිලි, මූල්‍ය ප්‍රකාශනයන්හි ක්ෂය අඩුකළ පිරිවැයට දැක්වූයේ නම් ඒවායේ ධාරණ වටිනාකම රුපියල් මිලියන 9,305.235 ක් වේ. (2012 දී එය රුපියල් මිලියන 9,464.544 කි).

## 16. අස්පෘශ්‍ය වත්කම්

| | 2013 රු. 000 | 2012 රු. 000 |
|---|---|---|
| පරිගණක මෘදුකාංග පිරිවැය - | | |
| ජනවාරි 01 දිනට | **614,997** | 595,731 |
| එකතුකිරීම් | **23,023** | 19,266 |
| දෙසැම්බර් 31 දිනට | **638,020** | 614,997 |
| ක්‍රමක්ෂය සහ හානිකරණය - | | |
| ජනවාරි 01 දිනට | **590,844** | 582,008 |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය ගාස්තුව | **11,578** | 8,836 |
| දෙසැම්බර් 31 දිනට | **602,422** | 590,844 |
| ශුද්ධ පොත් වටිනාකම - | | |
| ජනවාරි 01 දිනට | **24,153** | 13,723 |
| දෙසැම්බර් 31 දිනට | **35,598** | 24,153 |

## 17. බැංකු සහ මූල්‍ය ආයතන

| | 2013 රු. 000 | 2012 රු. 000 |
|---|---|---|
| විදේශීය බැංකුවලට ගෙවිය යුතු මුදල් | **20,863,380** | 1,485,466 |
| අනිකුත් විදේශීය ආයතනයන්ට ගෙවිය යුතු මුදල් | **640,816** | 1,134,381 |
| බැංකු සහ මූල්‍ය ආයතනයන්ට ගෙවිය යුතු මුළු මුදල් | **21,504,196** | 2,619,847 |

## 18. ආසියානු නිශ්කාෂණ සංගමය

සහභාගිවන රටවල මහ බැංකු අතර ගෙවීම් බේරුම් කිරීමේ ආයතනයක් වශයෙන් ආසියානු සහ පැසිෆික් කලාපයේ ආර්ථික සහ සාමාජික කටයුතු කොමිසමේ අනුග්‍රහය යටතේ ආසියානු නිශ්කාෂණ සංගමය (ආ.නි.ස.) 1974 වර්ෂයේ දී පිහිටුවන ලදී. ශ්‍රී ලංකාව එක් සහභාගිවන්නකි. බංගලාදේශය, ඉරාන ඉස්ලාම් සමූහාණ්ඩුව, නේපාලය, පකිස්ථානය, ඉන්දියාව, භූතානය සහ මියන්මාරය එහි අනිකුත් සහභාගි රටවල් වේ. මෙය සහභාගි වන රටවල් අතර ප්‍රවර්තන ජාත්‍යන්තර ගනුදෙනු බහුපාර්ශ්වීය පදනමක් මත බේරුම් කිරීම සඳහා වූ නිශ්කාෂණ ක්‍රමයකි. එක් එක් මාසය අවසානයේ දී පවත්නා ශුද්ධ තත්ත්වය මාස දෙකක ණය කාල පරිච්ඡේදයකින් පසුව බේරුම් කිරීම හෝ ලබාගැනීම සිදුකරනු ලැබේ. ශුද්ධ ණයගැතියන් විසින් සියයට 0.05 ක සිට සියයට 0.17 ක් දක්වා වූ පොලියක් එ.ජ. ඩොලර් සඳහා ද (2012 දී එය සියයට 0.01 ක් සහ සියයට 0.17 ක් විය) යුරෝ සඳහා සියයට 0.00 ක සිට සියයට 0.00 දක්වා වූ පොලියක් (2012 - සියයට 0.00 සහ සියයට 0.01) මෙම පහසුකම් සඳහා ගෙවනු ලැබේ. එය බේරුම් කිරීමේ දිනයන් අතර ශුද්ධ ණය හිමියන්ගේ දෛනික පරිශේෂ ශේෂයන්ට මාරු කරනු ලැබේ. ශේෂයෙන් අදාල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනට ආ.නි.ස. වෙත ගෙවිය යුතු ප්‍රමාණය නියෝජනය වේ.

## 19. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.)

| | 2013 රු. 000 | 2012 රු. 000 |
|---|---|---|
| පොලිය දරන ණය - ප්‍රවර්තන නොවන | **173,416,994** | 260,727,978 |
| පොලිය දරන ණය - ප්‍රවර්තන | **95,379,347** | 58,278,166 |
| වි.ගැ.හි. වෙන්කිරීම් | **79,627,890** | 77,237,728 |
| ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල් | **48,517,078** | 48,432,045 |
| පංගු බැරකම් | **25,090,703** | 22,966,279 |
| | **248,615,018** | 206,914,218 |
| ජා.මූ.අ. සම්බන්ධ මුළු බැරකම් | **422,032,012** | 467,642,196 |

අ) පොලිය දරන ණයවලට, ජා.මූ.අ. වෙතින් වරින් වර ලබා ගන්නා ලද දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම, ව්‍යාප්ත කළ අරමුදල් පහසුකම මෙන්ම හදිසි ආධාර පහසුකම් ද ඇතුළත් වේ.

ආ) දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම (PRGF) යනු මෙම පහසුකම, අඩු ආදායම් ලබන සාමාජිකයන්ට ජා.මූ.අ. විසින් සපයනු ලබන දිගුකාලීන මූල්‍යකරණ පහසුකමකි. මෙම පහසුකම, මීට ඉහත දී වැඩි දියුණු කළ ව්‍යාප්ත ගැලපීම් පහසුකම ලෙස හඳුන්වන ලදී. දුගීබව අඩුකර තිරසාර පදනමක් මත වැඩි වර්ධනයක් ප්‍රවර්ධනය කිරීම මගින් උසස් ජීවන තත්ත්වයක් කරා පිවිසීම මෙම වැඩසටහනේ ඉලක්කය වේ. මෙම පහසුකම යටතේ අය කරන පොළී අනුපාතය වර්ෂයකට සියයට 0.5 ක් වේ. මෙය යටතේ ජා.මූ.අ. විසින් ප්‍රදානය කරනු ලබන ණය ආපසු ගෙවීමේ කාල පරිච්ඡේදය උපරිම වශයෙන් වර්ෂ 10 කි.

2013 අප්‍රියෙල් මස 30 වන දින අවසානය ආපසු ගෙවීම සිදු කරන ලදී. (වි.ගැ.හි. 3,839,000)

ඇ) දීර්ඝ කරන ලද අරමුදල් පහසුකම (EFF) යනු සාර්ව ආර්ථික අසංතුලනය සහ ව්‍යුහගත ගැටළු මගින් උද්ගත වන ගෙවුම් ශේෂ අපහසුතාවන් මැඩ පැවැත්වීම සඳහා මධ්‍යකාලීන වැඩසටහන්වලට ආධාර කෙරෙන මූල්‍ය පහසුකමකි. මෙය වැඩිදියුණු කළ ව්‍යුහගත ගැලපීම් පහසුකම්වල ව්‍යාප්තියකි. මේ යටතේ ණය සඳහා අය කෙරෙන පොලී අනුපාතය වර්ෂයකට සියයට 0.5 කි. ජා.මූ.අ. විසින් මේ යටතේ ලබාගත් ණය ආපසු ගෙවීමට සලසා ඇති කාල පරිච්ඡේදය වර්ෂ 4 1/2 ක අනුග්‍රහ කාල පරිච්ඡේදයක් සහිත වර්ෂ 10 කි.

මේ යටතේ ලබාගත් ණයෙහි අවසානය ආපසු ගෙවීම සිදු කරන ලද්දේ 2013 අප්‍රියෙල් මස 24 වන දිනදී ය. (වි.ගැ.හි. 1,722,500)

ඈ) සම්පස්ථ ණය පහසුකම (SBA) යනු ණය ගනු ලබන රටවල්වල සාර්ව ආර්ථික කළමණාකරණ කටයුතු සඳහා වූ නිශ්චිත කොන්දේසිවලට යටත් ව ගෙවුම් ශේෂ කටයුතු මූල්‍ය කරනය සඳහා ලබා දෙනු ලබන තවත් පහසුකමකි.

ජා.මූ.අ. විසින් 2009 ජූලි මස වි.ගැ.හි. බිලියන 1.65ක් (එ.ජ. ඩොලර් බිලියන 2.6ක) සම්පස්ථ ණය පහසුකමක් ගෙවුම් ශේෂ කටයුතුවලට සහය දීම සඳහා අනුමත කරන ලදී.

2012 ජූලි මස අවසාන වාරිකය හිමිවීමත් සමග සම්පස්ථ ණය පහසුකම 2012 වසර තුළදී සාර්ථකව අවසන් වන ලදී.

මෙම ණය මුදල ආපසු ගෙවීම සඳහා වර්ෂ 4ක කාලසීමාවක් හිමිවන අතර එය 2012 ඔක්තෝබර් මසින් ආරම්භ වුනි. මෙම ණය පහසුකම සඳහා අයකරන පොලී අනුපාතය, සේවා ගාස්තු හා ස්ථාවර අනුපාතය යන කොටස් දෙකකින් සමන්විත වේ. සේවා ගාස්තුව, විශේෂ ගැනුම් හිමිකම් පොලී අනුපාතයට යටත්ව සතිපතා ගණනය කරනු ලැබේ. නොගෙවූ ණය මුදල ජා.මූ. අරමුදලේ පංගුවෙන් 300% තෙක් වන අවස්ථාවකදී ස්ථාවර අනුපාතය වාර්ෂිකව 1% වේ. නොගෙවූ ණය මුදල ජා.මූ. අරමුදලේ පංගුවෙන් 3000%ක් ඉක්මන අවස්ථාවකදී වර්ෂයකට 2% ක් වූ අමතර ගාස්තුවක් අයබදු ලෙස ගෙවිය යුතුවේ. 2012 ඔක්තෝබර් 25 වන දින වි.ගැ.හි. මිලියන 25.8 ක මුදලක් ප්‍රථම ආපසු ගෙවීම ලෙස පියවන ලදී. 2013 වර්ෂය තුළදී වි.ගැ.හි. මිලියන 25.8ක මුදලක් ප්‍රථමව ආපසු ගෙවීම ලෙස පියවන ලදී. 2013 වර්ෂය තුළදී වි.ගැ.හි. මිලියන 292.83 ක මුදලක් ආපසු ගෙවන ලද අතර 2013 දෙසැම්බර් 31 දිනට නොගෙවූ ශේෂය වි.ගැ.හි. මිලියන 1334.938 වේ.

පොලී දරණ ණය සඳහා මාස 12 කට පෙර සහ පසු බේරුම් කිරීමට අපේක්ෂිත මුදල් පහත සඳහන් පරිදි වේ.

| | බලපවත්වන පොලී අනුපාතික % | පරිණත වර්ෂය | 2013 රු. 000 | 2012 රු. 000 |
|---|---|---|---|---|
| ප්‍රවර්තන | | | | |
| දීර්ඝ කරන ලද - අරමුදල් පහසුකම (EFF) | | | - | 336,423 |
| දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම (PRGF) | 0.5 | | - | 749,799 |
| සම්පස්ථ ණය පහසුකම (SBA) | | | **95,379,347** | 57,191,944 |
| | | | **95,379,347** | 58,278,166 |
| ප්‍රවර්තන නොවන | | | | |
| සම්පස්ථ ණය පහසුකම (SBA) | | 2017 | **173,416,994** | 260,727,978 |
| | | | **173,416,994** | 260,727,978 |
| | | | | |
| පොලී දරණ මුළු ණය මුදල | | | **268,796,341** | 319,006,144 |

ඉ) **විශේෂ ගැනුම් හිමිකම (වි.ගැ.හි.)** යනු පවත්නා සංචිත වත්කම්වලට පරිපූරණයක් වශයෙන් දිගුකාලීන ගෝලීය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ජා.මූ.අ. විසින් පිහිටුවන ලද සංචිත වත්කමකි. සාමාජික රටවලට ඒවායේ ජා.මූ.අ. පංගු ප්‍රකාර වි.ගැ.හි. වෙන්කිරීම් සිදු කරයි. ජා.මූ.අ. වි.ගැ.හි. දෙපාර්තමේන්තුවට (ජා.මූ.අ. තුළ පිහිටි ගිණුම් ඒකකයකි) සහභාගී වන රටවලට පමණක් වි.ගැ.හි. වෙන් කළ හැකිය. ජා.මූ.අ. සතු රන්, විදේශ විනිමය සහ සංචිත තත්වයන්ට පරිපූරක වශයෙන් ජා.මූ.අ. විසින් වි.ගැ.හි. බිහි කරන ලදී. බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් අත්සන් කරන ලද ගිවිසුමේ සඳහන් ඇතැම් කොන්දේසි ප්‍රකාර, ජා.මූ.අ. විසින් සාමාජිකයන්ට ඔවුන්ගේ ජා.මූ.අ. පංගු ප්‍රමාණය අනුව වි.ගැ.හි. වෙන් කළ හැකි වන්නේය. ජා.මූ.අ. විසින් වි.ගැ.හි. වෙන්කිරීම මගින් එක් එක් සාමාජිකයාට පිරිවැය රහිත වත්කමක් උද්ගත වන අතර ඒ සඳහා පොලී ඉපැයීමක් හෝ ගෙවීමක් සිදු නොවේ. වි.ගැ.හි. අවලංගු කිරීමට ද ගිවිසුමේ කොන්දේසිවලින් විධිවිධාන සලසා තිබෙන නමුත් මෙතෙක් එම විධිවිධාන ක්‍රියාත්මක කර නොමැත. වි.ගැ.හි. වෙන් කිරීම් වැඩි වීමෙන් 7 වැනි සටහනේ විස්තර කර ඇති පරිදි වි.ගැ.හි. ඇරීම් වැඩි වේ. එහි ශුද්ධ වෙන්කිරීමට සමාන මුදල් සහ එය වි.ගැ.හි. දෙපාර්තමේන්තුවේ කටයුතුවලට සහභාගීවීමේ හේතුවෙන් ජා.මූ.අ., වි.ගැ.හි. දෙපාර්තමේන්තුව අවසන් කළ හෝ ඇවර කළ අවස්ථාවේ දී ගෙවිය යුතු අනිකුත් යම් මුදලක් වෙතොත් ඒවා ජා.මූ.අ. වෙත ගෙවීමට සාමාජිකයන් බැඳී සිටී.

ඊ) **ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල් :** මෙහෙයුම් සහ පරිපාලන ගනුදෙනු වෙනුවෙන් බැංකුව ජා.මූ.අ. වෙත ගෙවිය යුතු ප්‍රමාණය මෙයින් දැක්වේ.

උ) **පංගු බැරකම:** අංක 7 දරන සටහනේ විස්තර කර ඇති ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත.

## 20. අනිකුත්

| | 2013 රු. 000 | 2012 රු. 000 |
|---|---|---|
| එස්කෝරුව ගිවිසුම (Escrow Agreement) යටතේ චීන සංවර්ධන බැංකුවට ගෙවිය යුතු ප්‍රමාණය | **29,052,050** | 43,324,799 |
| EIB/DFCC ගෝලීය ණය II | **36,264** | 35,268 |
| මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘති ණය | **15,657,844** | 19,056,691 |
| අනෙකුත් විදේශීය බැරකම් | **2,474,961** | 2,103,904 |
| | **47,221,119** | 64,520,662 |

**(අ) එස්කෝරුව ගිවිසුම (Escrow Agreement) යටතේ චීන සංවර්ධන බැංකුවට ගෙවිය යුතු ප්‍රමාණය.**

එ.ජ. ඩොලර් මිලියන 500 ණය පහසුකමක් ලබා ගැනීම සඳහා 2011 මාර්තු 31 දින ශ්‍රී ලංකා රජය හා චීන සංවර්ධන බැංකුව (CDB) අතර පහසුකම් එකඟතාවක් සඳහා අත්සන් තබන ලදී. මෙම පහසුකම් එකඟතාවේ අරමුදල් ප්‍රමුඛතා මාර්ගයන් සංවර්ධනය හා පුනරුත්ථාපනය සඳහා යොදා ගැනේ. පහසුකම් එකඟතාවය අනුව, බැංකුව එස්කෝරු නියෝජිතයා ලෙස පත් කරන ලදී. ඒ අනුව ණය තැන්පත් කිරීම හා එලෙස ලැබෙන මුදල් මාර්ග ව්‍යාපෘති සඳහා බෙදා හැරීමේ හුදු අරමුණ ඇතුව එස්කෝරු ගිණුමක් බැංකුවේ විවෘත කරන අතර සහ එකී ගිවිසුම ප්‍රකාරව ණයහිමියා (චීන සංවර්ධන බැංකුව) හා ණය ගැනුම්කරු (ශ්‍රී ලංකා රජය) යන දෙපාර්ශවයම එම එස්කෝරු ගිණුම හවුලේ බල පවත්වනු ලබයි.

මෙම ණය පහසුකම් යටතේ එ.ජ. ඩොලර් මිලියන 326 මුදලක් ප්‍රථම වාරිකය ලෙස 2011 ජූනි 29 දින ලැබුණු අතර දෙවන වාරිකය වූ එ.ජ. ඩොලර් මිලියන 174 ප්‍රමාණය 2011 ඔක්තෝබර් 28 දින ලංකාවට ලැබුණි.

වැය අනුමත නිවේදනය එස්කෝරු නියෝජිතයා වෙත එවීම මගින් ණයහිමියා විසින් එස්කෝරු ගිණුමේ ඇති මුදල් වැය ඉල්ලුම් පත්‍රයේ සඳහන් ගිණුම් වෙත වැය කිරීම සඳහා උපදෙස් ලබාදේ.

ඒ අනුව 2011 ඔක්තෝබර් 18 දින එ.ජ. ඩොලර් මිලියන 1.768 ප්‍රමාණයක් මේ යටතේ ප්‍රථමයෙන් බෙදා හරින ලදී.

චීන සංවර්ධන බැංකුවෙන් ලද වියදම් අනුමැතියට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2011 සහ 2012 වර්ෂයන් තුළ එ.ජ. ඩොලර් මිලියන 157.5 ක මුදලක් බෙදා හැර ඇත. එසේම 2012 වර්ෂය අවසානය වන විට එස්කෝරුව ගිණුමේ ඉතිරි ශේෂය එ.ජ. ඩොලර් මිලියන 340.7 කි.

2013 වර්ෂය තුළ එ.ජ. ඩොලර් මිලියන 118.52 ක මුදලක් බෙදා හැරීම් කර ඇති අතර, 2013 දෙසැම්බර් මස 31 වන දින වන විට ඉතිරි ශේෂය එ.ජ. ඩොලර් මිලියන 222.190 කි.

**(ආ) EIB/DFCC ගෝලීය ණය II**

යුරෝපීය ආයෝජන බැංකුවෙන් යුරෝ මිලියන 50 ක ණය ගිවිසුම් ප්‍රකාරව ක්ෂුද්‍ර මූල්‍යනය සඳහා ණය ලැබී ඇත. කෙසේ වුවත් පසුව ලද කොටස ඇමරිකානු ඩොලර්වලින් ලැබී ඇත. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් කරන ලද ඉල්ලීමකට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විශේෂ ඩොලර් ගිණුමක් පොදු ලෙජරයේ, ගෝලීය EIB/DFCC ගෝලීය ණය II යටතේ DFCC බැංකුවට අරමුදල් රැස් කිරීම සඳහා විවෘත කර ඇත. 2012 පෙබරවාරි 3 වන දින එ.ජ. ඩොලර් මිලියන 12.7 ක ණය මුදලක් යුරෝපීය ආයෝජන බැංකුවෙන් ප්‍රථම ඩොලර් වාරිකය ලෙස ගිණුම් අංක 4897 ට ලැබී ඇත. 2012 ජූනි මස 01 වන දින එ.ජ. ඩොලර් මිලියන 19.2 මුදලක් දෙවන වාරිකය ලෙස ලැබුණි. පළමු බෙදාහැරීම 2012 මාර්තු 01 වන දින එ.ජ. ඩොලර් 4,002,299.29 ලෙස ද, තව බෙදාහැරීම් දෙකක් එ.ජ. ඩොලර් 6,573,500 හා 2,142,170.71 ලෙස ද 2012 මාර්තු මස 3 දින සිදුකර ඇත. 2012 අගෝස්තු මස 14 වන දින භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි එ.ජ. ඩොලර් 12,342,500 හා එ.ජ. ඩොලර් 6,171,250 ක වටිනාකමින් යුත් බෙදාහැරීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකර ඇත. තවත් බෙදාහැරීමක් එ.ජ. ඩොලර් 473,368,81 ලෙස 2012 නොවැම්බර් මස 19 දින සිදුකර ඇත. ඒ අනුව 2013 දෙසැම්බර් මස 31 දිනට ඉතිරි වූ ශේෂය එ.ජ. ඩොලර් මිලියන 0.277 කි.

**(ඇ) මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘති ණය**

එ.ජ.ඩො. මිලියන 214.2 සඳහා වූ මෙම ණය ගිවිසුම චීන සංවර්ධන බැංකුව (ණය දායකයා) සහ ශ්‍රී ලංකා රජය (ණය ගැනුම්කරු) අතර 2012 ජූනි 28 දින අත්සන් කර ඇත. මෙම ණය ගිවිසමේ අරමුණ වන්නේ මොරගහකන්ද ජල විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා පහසුකම් සැපයීමයි. ජල සම්පාදන හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ගිවිසුම යටතේ බැංකුව ලෙස, ණය ලැබීමට හා බෙදා හැරීමට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි බැංකුව විසින් පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කරන ලදී.

2012 ජූනි 29 එ.ජ. ඩොලර් මිලියන 214.2 ක ණය මුදලක් චීන සංවර්ධන බැංකුවෙන් ලැබී ඇත. 2012 අගෝස්තු 24 දින ප්‍රථම බෙදාහැරීම ලෙස එ.ජ. ඩොලර් 64,337,066.36 ක ගෙවීම් කර ඇත. 2013 වසරේදී ඇ.එ.ඩොලර් මිලියන 30.1 ක් බෙදා හැර ඇති අතර 2013 දෙසැම්බර් 31 දිනට ඉතිරි ශේෂය එ.ජ. ඩොලර් මිලියන 119.751 කි.

## 21. බැංකු සහ මූල්‍ය ආයතනයන් විසින් තැන්පතු

තත්කාලීන දළ පියවුම් ක්‍රමය යටතේ (RTGS) සහභාගිවන්නන් වන බලපත්‍රලාභී වාණිජ බැංකු, ප්‍රාථමික අලෙවිකරුවන් සහ සේවක අර්ථසාධක අරමුදල යන ආයතනවලට

පොළී රහිත, සම්පූර්ණයෙන් ම සුරැකුම් සහිත දිනක් තුළ සපයනු ලබන ද්‍රවශීල පහසුකම් යටතේ අවශ්‍ය අරමුදල් ලබාගැනීමේ හැකියාව ඇත. එම දිනක් තුළ සපයනු ලබන ද්‍රවශීල පහසුකම යටතේ ලබාගත් අත්තිකාරම්, විකුණුම් කළ හැකි රජයේ සුරැකුම්පත්වල ඔඩපන කළ යුතුයි. මෙම පහසුකම යටතේ ලබාගත් අත්තිකාරම්, විකුණුම් කළ හැකි රජයේ සුරැකුම්පත්වලට එරෙහිව ලබාගත් අත්තිකාරම් නියෝජනය කරනු ලබන අතර වාර්තා කරන ලද කාලච්ඡේද දෙක අවසානයේ දී ශූන්‍ය වටිනාකමක් දැක්වීය.

| | 2013<br>රු. 000 | 2012<br>රු. 000 |
|---|---|---|
| බැංකුව විසින් තැන්පත් කිරීම් | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **77,899,164** | 84,679,924 |
| - අනිකුත් | **70,906,573** | 81,572,604 |
| | **148,805,737** | 166,252,528 |
| මූල්‍ය ආයතන විසින් තැන්පත් කිරීම් | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **202** | 242 |
| - අනිකුත් | **3,954** | 35,608 |
| | **4,156** | 35,850 |
| බැංකු සහ අනිකුත් මූල්‍ය ආයතන විසින් කරන ලද මුළු තැන්පතු | **148,809,893** | 166,288,378 |

## 22. රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු

| | 2013<br>රු. 000 | 2012<br>රු. 000 |
|---|---|---|
| රජයේ තැන්පතු | **27,766** | 340,506 |
| රජයේ නියෝජිතයන් සහ අරමුදල් | **388,464** | 359,122 |
| | **416,230** | 699,628 |

## 23. ප්‍රති මිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත්

| | 2013<br>රු. 000 | 2012<br>රු. 000 |
|---|---|---|
| රජයේ සුරැකුම්පත් | **84,601,000** | 7,015,000 |
| | **84,601,000** | 7,015,000 |

මුදල් නීති පනතේ වගන්ති 90 හා 91 යටතේ හිමිවන බලතල යටතේ විවෘත වෙළඳපල මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව විසින් ප්‍රති මිලදී ගැනීමේ එකඟතාවන් නිර්මාණය කරනු ලබයි. ශ්‍රී.ල.ම.බැ. සතු සුරැකුම්පත් මෙන්ම ශ්‍රී.ල.ම.බැ. මුදල් මණ්ඩලයේ අනුමැතිය යටතේ සුරැකුම්පත් ණයට ගැනීමේ වැඩසටහන යටතේ ලබා ගන්නා සුරැකුම්පත් ප්‍රති මිලදී ගැනීමේ එකඟතාවයන් සඳහා ආධාරකයක් ලෙස යොදා ගනී.

## 24. සේවක ප්‍රතිලාභ සැලසුම්වල වූ ශේෂයන්

බැංකුව විසින්, බැංකුවේ සාමාන්‍ය කාර්යයන් ලෙස එහි සේවක ප්‍රතිලාභ සැලසුම් සඳහා ජංගම ගිණුම් පහසුකම් සපයනු ලැබේ. වෙනම පරිපාලනය කරන සේවක ප්‍රතිලාභ සැලසුම්වල බැරට රඳවා ගෙන ඇති මුදල් ප්‍රමාණයන් මෙසේය.

| | 2013<br>රු. 000 | 2012<br>රු. 000 |
|---|---|---|
| ශ්‍රී.ල.ම.බැ. සේවක අර්ථසාධක අරමුදල | **429,932** | 150,895 |
| ශ්‍රී.ල.ම.බැ. සේවක විශ්‍රාම යෝජනා ක්‍රමය | **600,119** | 694,165 |
| වැන්දඹු/ වැන්දඹූ හා අනත්දරු අරමුදල | **1,440** | 1,113 |
| විශ්‍රාම පාරිතෝෂිකය වෙනුවෙන් ගෙවිය යුතු | **90,398** | 63,104 |
| වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය වෙනුවෙන් ගෙවිය යුතු | **1,297,198** | 431,991 |
| අනිකුත් තැන්පතු මුළු ප්‍රමාණය | **2,419,087** | 1,341,268 |

## 25. අනෙකුත් ගෙවිය යුතු දෑ

| | 2013<br>රු. 000 | 2012<br>රු. 000 |
|---|---|---|
| දේශීය පොලී වෙනුවෙන් ගෙවිය යුතු මුදල් | **161,223** | 1,445 |
| වෙන්කිරීම් සහ අයකිරීම් | **610,465** | 502,892 |
| ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් කළ තැන්පතු | **1,880,078** | 1,869,662 |
| අත්හරින ලද දේපළ ලැබීම් සඳහා වූ වගකීම් | **2,335,466** | 1,962,473 |
| විදේශීය මහ බැංකුවකට හුවමාරු පහසුකම (Swap facility) වෙනුවෙන් අනෙකුත් ගෙවිය යුතු මුදල් | **-** | 27,473,460 |
| අනෙකුත් ගෙවිය යුතු මුදල් | **672,485** | 124,714 |
| | **5,659,717** | 31,934,646 |

බැංකුවල අත්හරින ලද දේපලවල වටිනාකමට අදාළව රැස්කරගත් අරමුදල් අනෙකුත් ගෙවියයුතු මුදල්වල ඇතුළත්ව ඇත. මෙය බලපත්‍රලාභී වාණිජ බැංකුවල අත්හරින ලද දේපළ හඳුනාගැනීම වාර්තා කිරීම, මාරු කිරීම හා පවත්වාගෙන යෑමට අදාළ 2009 අංක 05 දරණ බැංකු පනතේ විධානයට අනුකූලව රැස් කරගත් අරමුදල වේ. අත්හරින ලද දේපල වලට හිමිකම් පාන අවස්ථාවකදී බැංකුව තැන්පතු මුදල හා එයට අදාල පොලීය ගෙවීමට වගකීමෙන් බැදේ. එම නිසා මුළු තැන්පතු මුදල හා බරතැබූ සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතය අනුව ගණනය කරන ලද පොලීය බැංකුවෙහි වගකීමක් ලෙස වාර්තා කරයි.

## 26. සංසරණයේ ඇති මුදල්

ශ්‍රී ලංකාවේ මුදල් නිකුත් කිරීමේ එකම බලධාරියා වශයෙන් බැංකුව විසින් අඛණ්ඩව නීතියෙන් වලංගු මුදල් නිකුත් කිරීම සිදු කරනු ලැබේ. අදාල මූල්‍ය ප්‍රකාශන දිනට නිකුත්කර සංසරණයේ තිබූ මුදල් ප්‍රමාණයන් පහත සඳහන් පරිදි විය.

| වර්ගය | 2013<br>රු. 000 | 2012<br>රු. 000 |
|---|---|---|
| කාසි | | |
| සත 1 | **3,631** | 3,631 |
| සත 2 | **5,702** | 5,702 |
| සත 5 | **23,245** | 23,245 |
| සත 10 | **39,211** | 39,209 |
| සත 25 | **120,566** | 120,732 |
| සත 50 | **185,798** | 185,378 |

| | | |
|---|---|---|
| රුපියල් 1 | **714,252** | 702,536 |
| රුපියල් 2 | **1,013,765** | 998,102 |
| රුපියල් 5 | **3,035,467** | 2,981,784 |
| රුපියල් 10 | **1,672,674** | 1,275,959 |
| අනිකුත් සමරු කාසි | **574,663** | 572,256 |
| | **7,388,974** | 6,908,534 |
| **නෝට්ටු** | | |
| රුපියල් 1 | **4,981** | 4,981 |
| රුපියල් 2 | **26,698** | 26,698 |
| රුපියල් 5 | **37,198** | 37,198 |
| රුපියල් 10 | **1,638,800** | 1,735,340 |
| රුපියල් 20 | **3,725,554** | 3,350,440 |
| රුපියල් 50 | **4,041,101** | 3,779,318 |
| රුපියල් 100 | **15,332,034** | 14,978,744 |
| රුපියල් 200 | **138,465** | 144,531 |
| රුපියල් 500 | **23,668,137** | 23,317,647 |
| රුපියල් 1,000 | **105,385,676** | 101,046,102 |
| රුපියල් 2,000 | **87,798,698** | 109,370,204 |
| රුපියල් 5,000 | **90,584,665** | 53,360,405 |
| | **332,382,007** | 311,151,608 |
| සංසරණයේ ඇති මුළු මුදල් ප්‍රමාණය | **339,770,981** | 318,060,142 |

## 27. විලම්භිත ප්‍රදානයන්

| | **2013 රු. 000** | 2012 රු. 000 |
|---|---|---|
| ජනවාරි 01 වන දිනට | **2,389** | 3,468 |
| වර්ෂයතුල ක්‍රමක්ෂය | **(940)** | (1,079) |
| දෙසැම්බර් 31 දිනට | **1,449** | 2,389 |

විලම්භිත ප්‍රදානයන් අදාල වත්කමෙහි ක්ෂය පිළිවෙතට සරිලන පරිදි කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. ගෙවීමක් නොමැතිව බැංකුවට හිමි වූ වත්කම් මෙහි ඇතුලත් වේ. වත්කමෙහි සාධාරණ අගය විලම්භිත ප්‍රදානයන් ගිණුමට බැර කරන ලද අතර අදාල වත්කමෙහි ක්ෂය පිළිවෙත හා සංගත වන පරිදි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා අනෙකුත් ආදායම් වෙත ලියා හරින ලදී.

## 28. විවිධ බැරකම් හා උපචිතයන්

විවිධ බැරකම් හා උපචිතයන්හි ශේෂයන් තුළ ගෙවීමට ඇති ගිණුම්, කොන්ත්‍රාත් ධාරණයන්, නැවත ලබා දිය යුතු ටෙන්ඩර් තැන්පතු, සහ රජයට ගෙවිය යුතු, විනිමය පාලන දෙපාර්තමේන්තුවෙන් රැස් කර ගන්නා ලද දඩ මුදල් අන්තර්ගතය.

## 29. හිමිකරු ප්‍රාග්ධනය

**(අ) හිමිකරු ප්‍රාග්ධන විෂයයන්ගේ ස්වභාවය**

ප්‍රාග්ධන අරමුදල්

**i.** *දායක ප්‍රාග්ධනය :* මුදල් නීති පනතේ 6 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ප්‍රාග්ධනය, ප්‍රාග්ධන ගිණුමෙන් පෙන්නුම් කරයි.

**ii.** *ප්‍රාග්ධනය ලෙස විසර්ජනය කළ සංචිත :* MB/F/22/12/2008 දරණ මුදල් මණ්ඩල තීරණය පරිදි 2008 වර්ෂයේ පොදු සංචිතයෙන් රුපියල් මිලියන 24,985 ක් මාරු කිරීම මගින් මෙම සංචිතය සකසා ඇත. තවද, MB/F/5/17/2012 දරණ මුදල් නීති මණ්ඩල තීරණය පරිදි 2012 මාර්තු මස තුළ රුපියල් බිලියන 10 ක් පොදු සංචිතයෙන් මාරු කර ඇත.

**(ආ)ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණ සංචිතය-** ජා.ගි.ප්‍ර. අංක 16 ප්‍රකාරව දේපළ පිරියත, හා උපකරණ ප්‍රත්‍යාගණන අතිරික්තයක් තුළින් මෙම සංචිතය ගොඩනැගී ඇත.

**(ඇ)අනෙකුත් සංචිත පහත සඳහන් දේ වලින් සමන්විත වේ.**

**i.** *ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය (ජාප්‍රස)* - ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය වු කලී මුදල් නීති පනතේ 41 වැනි වගන්තිය ප්‍රකාර පිහිටුවන ලද සංචිතයක්ය. මෙම වගන්තිය ප්‍රකාර රන් සහ විදේශ මුදල්වලින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උපලබ්ධි නොවූ ලාභ හෝ පාඩු බැංකුවේ ශුද්ධ ලාභය ගණනය කිරීම සඳහා සැලකිල්ලට නොගත යුතු අතර, ඒ වෙනුවට එම ලාභ හෝ පාඩු ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කළ යුතුය.

**ii.** **වෙළඳපල අගය කිරීමේ සංචිතය** - ජාත්‍යන්තර වෙළඳපල තුල සිදුවන අහිතකර චලන ප්‍රතිවිපාකයන් හි ප්‍රතිඵලය ලෙසද ජාත්‍යන්තර මුල්‍ය වත්කම් වල වෙළඳපල මිල ගණන් හි සිදුවන අහිතකර වෙනස් වීම් වලට මුහුණ දීමේ පරමාර්ථයෙන් ජාත්‍යන්තර වත්කම් වල වෙළඳපලවල් අතර ඇති වන මිල ඇගැයීමේ ලාභ හෝ අලාභ මාරු කිරීම සඳහා 2003 ජනවාරි 30 දින ලබා දුන් මුදල් මණ්ඩල තීරණයට අනුව වෙළඳපල අගය කිරීමේ සංචිතය පිහිටුවන ලදී.

මුදල් මණ්ඩලය විසින් මෙම සංචිතය ශ්‍රී.ලං.ම.බැ. දළ විදේශ සංචිත වලින් සියයට දහයක ප්‍රමාණයක් දක්වා ගොඩනැගීමට තීරණය කරන ලදී.

**iii.** **අනෙකුත් සංචිත** - පොදු සංචිතය, ගොඩනැගිලි සංචිතය හා ණය ඇපකාර සංචිතයන් අනෙකුත් සංචිතයන් තුල ඇතුලත් වේ. මුදල් මණ්ඩලය විසින් රඳවාගත් ලාභයන්ගෙන් වෙන්කල ප්‍රමාණයන්ගෙන් පොදු සංචිතය සමන්විත වේ.

**iv.** **විකිණීම සඳහා තිබෙන සුරැකුම්පත්වල සහ අනුමත රන් ගිණුම්වල ශුද්ධ සාධාරණ අගය/(අලාභය)** විකිණීමට තිබෙන ලෙස නම් කර ඇති සුරැකුම්පත් සහ අනුමත නොවූ රන් ගිණුම් ප්‍රත්‍යාගණනයෙන් 2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා උපලබ්ධි නොවූ ලාභ සහ පාඩු මෙම සංචිතයට මාරු කරන ලදී.

**v.** **තත්කාලීන දළ පියවුම් නිධන් අරමුදල** - තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා සහභාගිවන්නන්ගේ අයකිරීම්වලින් මෙම අරමුදල් ගොඩනගා ඇත. මෙම අරමුදල ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල ආයෝජන සඳහා සීමාකර ඇත.

**vi.** **විශ්‍රාම ප්‍රතිලාභ සංචිතය** - මෙම සංචිතය 2007 වර්ෂයේ ලාභයෙන් රුපියල් බිලියන 3 ක් මාරු කිරීමෙන්

ආරම්භ කරන ලද අතර, බැංකුවේ ආදායම් ඉපැයීමේ වන උච්ඡාවචනයන් හමුවේ විශ්‍රාම අරමුදලේ වන හිඟතාවයන් සඳහා මෙය යොදාගැනීමට අපේක්ෂා කෙරේ.

**vii. තාක්ෂණික අභිවර්ධන සංචිතය** - මෙම සංචිතය 2007 වර්ෂයේ ලාභයෙන් ගොඩනගා ඇති අතර මහ බැංකුවේ දැනට භාවිතා කරන පොදු ලෙජර පද්ධතිය, තත්කාලීන ගෙවුම් පියවුම් පද්ධතිය, භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය හෝ නිර්ලේඛනගත සුරැකුම්පත් පියවීම් ක්‍රමය යන පද්ධතීන්වල සිදු කළ යුතු වැඩි දියුණු කිරීම් සඳහා අවශ්‍ය අරමුදල් සැපයීම සඳහා මෙය යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

**viii. පළාත් සංවර්ධන ණය යෝජනා ක්‍රම අරමුදල** - 2010 වර්ෂය තුළ බැංකුවේ ලාභවලින් රුපියල් බිලියන 2.9 ක අරමුදලක් ගොඩනගා, එමගින් කලාපවල මධ්‍ය හා දිගුකාලීන සංවර්ධන අරමුණු සඳහා, ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී. එම ණය ප්‍රදානයන් ලංකා බැංකුව හා මහජන බැංකුව හරහා සිදුවිය.

| | මධ්‍ය සහ දිගු කාලීන ණය සංචිත | වෙළෙඳපල ප්‍රත්‍යාගණන සංචිතය | අනෙකුත් සංචිත | ශ්‍රී.ලං.බ.බැ. නිශ්චිත සංචිත | තත් කාලීන දළ පියවුම් නිධන් අරමුදල | ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය | විකිණීම සඳහා තිබෙන සුරැකුම්පත්වල ශුද්ධ/ සාධාරණ අගය/අලාභය | විශ්‍රාම අරමුදල් සංචිතය | තාක්ෂණික අභිවර්ධන සංචිතය | පළාත් සංවර්ධන ණය යෝජනාක්‍රම අරමුදල | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2013 ජනවාරි 01 දිනට | 11,425,000 | 11,354,757 | 9,852,383 | 824,982 | 672,598 | 67,593,177 | 6,557,798 | 4,000,000 | 1,000,000 | 2,900,000 | 116,180,695 |
| තත්කාලීන දළ පියවුම සංචිතයට මාරුකිරීම | - | - | - | | - | 191,428 | - | - | - | | 191,428 |
| ශ්‍රී.ල.ම.බැ. වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට මාරු කිරීම | - | - | - | 84,852 | - | - | - | - | - | - | 84,852 |
| ශ්‍රී.ල.ම.බැ. විශ්‍රාම පාරිතෝෂික අරමුදලට මාරු කිරීම | - | - | | 6,465 | - | - | - | - | - | - | 6,465 |
| ලාභය පොදු සංචිතයට හා ගොඩනැගිලි සංචිතයට මාරුකිරීම | - | - | 126,315 | - | - | - | - | - | - | - | 126,315 |
| විශ්‍රාම පාරිතෝෂිත අරමුදල් සංචිතයට හා වෛද්‍ය අරමුදල් සංචිතයට මාරුකිරීම | - | - | - | 595,490 | - | - | - | - | - | - | 595,490 |
| විශ්‍රාම පාරිතෝෂිත හා වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා සංචිතවිලින් අරමුදල් අදාළ බැරකම්වලට මාරු කිරීම් | - | - | - | (1,511,789) | - | - | - | - | - | - | (1,511,789) |
| විදේශ විනිමය ප්‍රත්‍යාගණන ශුද්ධ පාඩුව මාරු කිරීම් | - | - | - | - | - | (26,758,632) | - | - | - | - | (26,758,632) |
| විකිණීමට ඇති සුරැකුම්පත්වල හා රන් තොගයේ ශුද්ධ සාධාරණ අගය/පාඩුව | - | - | - | - | - | - | (13,904, 065) | - | - | - | (13,904,065) |
| විකුණූ ස්ථාවර වත්කම්වල ප්‍රත්‍යාගණන ලාභය | - | - | 40 | - | - | - | - | - | - | - | 40 |
| වෙළෙඳ පොළ ප්‍රත්‍යාගණන සංචිතයෙන් සමුච්චිත ලාභයට කළ ශුද්ධ මාරු කිරීම | - | (6,703,951) | - | - | - | - | - | - | - | - | (6,703,951) |
| 2013 දෙසැම්බර් 31 දිනට | 11,425,000 | 4,650,806 | 9,978,738 | - | 864,026 | 40,834,545 | (7,346,267) | 4,000,000 | 1,000,000 | 2,900,000 | 68,306,848 |

## 30. ශුද්ධ ලාභ මාරු කිරීම

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ (සංශෝධිත පරිදි) 39 (ඇ) වගන්තිය ප්‍රකාර, නිශ්චය කරන ලද ශුද්ධ ලාභ, මුදල් නීති පනතේ 38 වැනි වගන්තිය ප්‍රකාර අවශ්‍ය පරිදි සංචිතවලට විසර්ජනය කිරීමෙන් අනතුරුව රජයට ගෙවිය යුතුය. බැංකුව විසින් මෙම කාලය තුළ 2012 වර්ෂය සඳහා රුපියල් බිලියන 2.35 ක් සහ 2013 වර්ෂය සඳහා රුපියල් බිලියන 25 ක් රජයට මාරු කරන ලදී.

## 31. මූල්‍ය වත්කම්වලින් පොළී ආදායම

| | 2013 | 2012 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොළී ආදායම** | | |
| මුදල් හා මුදල් සමානයන් | **2,048,673** | 1,934,021 |
| මූල්‍ය වත්කම් | **9,634,528** | 9,566,537 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | **5,147** | 4,616 |
| සම්බන්ධ වත්කම් | | |
| හුවමාරු ලාභය | **6,817,308** | 2,066,692 |
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ මුළු පොළී ආදායම** | **18,505,656** | 13,571,866 |
| **දේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොළී ආදායම** | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **13,897,078** | 25,441,705 |
| අනිකුත් ණය සහ අත්තිකාරම් | **553,056** | 515,897 |
| **දේශීය මූල්‍ය වත්කම් වලින් ඉපැයූ මුළු ශුද්ධ පොළී ආදායම** | **14,450,134** | 25,957,602 |
| අලෙවි කළ හැකි සුරැකුම්පත් | **12,929,296** | **20,413,029** | **67,917,803** | **136,130,521** | **161,748,684** | **399,139,332** |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | **11,668,079** | **-** | **-** | **128,430** | **73,604,255** | **85,400,764** |
| අනිකුත් ලැබිය යුතු දෑ | **591** | **-** | **-** | **-** | **-** | **591** |
| මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වත්කම් | **554,380,292** | **20,413,029** | **67,917,803** | **136,258,951** | **235,352,939** | **1,014,323,013** |
| දේශීය මුදල් මූල්‍ය වත්කම් | | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **15,985,640** | **-** | **-** | **-** | **-** | **15,985,640** |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | **109,167,071** | **-** | **-** | **-** | **-** | **109,167,071** |
| බැංකු සඳහා දෙන ලද ණය | **429,931** | **399,568** | **552,877** | **144,913** | **-** | **1,527,289** |
| අනෙකුත් ලැබිය යුතු දෑ | **1,829,712** | **-** | **-** | **-** | **-** | **1,829,712** |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | **-** | **-** | **-** | **-** | **41,095** | **41,095** |
| අනෙකුත් වත්කම් | **721,285** | **92,126** | **555,410** | **1,270,660** | **3,910,923** | **6,550,404** |
| මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වත්කම් | **128,133,639** | **491,695** | **1,108,287** | **1,415,573** | **3,952,018** | **135,101,211** |
| මුළු වට්ටම් නොකළ මූල්‍ය වත්කම් | **682,513,931** | **20,904,724** | **69,026,090** | **137,674,524** | **239,304,957** | **1,149,424,225** |
| **විදේශීය මූල්‍ය වගකීම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | **23,181,098** | **1,281,220** | **1,806,400** | **1,249,856** | **1,038,652** | **28,557,225** |
| ආසියානු නිශ්කාශන සංගමය | **37,301,553** | **-** | **-** | **-** | **-** | **37,301,553** |
| ජා.මූ.අ. | **45,088,418** | **50,290,928** | **72,835,137** | **100,581,856** | **153,235,672** | **422,032,012** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අනෙකුත් | - | | | | 1,784,046 | 1,784,046 |
| මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වගකීම් | 105,571,069 | 51,572,148 | 74,641,537 | 101,831,712 | 156,058,369 | 489,674,836 |
| දේශීය මුදල් මූල්‍ය වගකීම් | | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | 148,809,893 | - | - | - | - | 148,809,893 |
| රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු | 416,230 | - | - | - | - | 416,230 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | 84,601,000 | - | - | - | - | 84,601,000 |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | 2,419,087 | - | - | - | - | 2,419,087 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 5,659,719 | - | - | - | - | 5,659,719 |
| මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වගකීම් | 241,905,929 | - | - | - | - | 241,905,929 |
| මුළු වට්ටම් නොකළ මූල්‍ය වගකීම් | 347,476,998 | 51,572,148 | 74,641,537 | 101,831,712 | 156,058,369 | 731,580,765 |
| ශුද්ධ වට්ටම් නොකළ මූල්‍ය වත්කම්/වගකීම් | 335,036,932 | (30,667,424) | (5,615,447) | 35,842,812 | 83,246,587 | 417,843,460 |

| | හය මසක් අඩු<br>රු. 000 | මාස 6 සිට 12 දක්වා<br>රු. 000 |
|---|---|---|
| 2013 දෙසැම්බර් 31 දිනට | | |
| ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් | 272,936,121 | 96,790,456 |
| ව්‍යුත්පන්න මූල්‍ය වගකීම් | **(270,565,621)** | **(92,955,576)** |

**විදේශීය මුදල් පරිවර්තනය**

විදේශීය මූල්‍ය වත්කම් හා වගකීම්වලට සම්බන්ධ සියලුම අනාගත මූල්‍ය ප්‍රවාහ වාර්තාගත කරන මුදල් ඒකකයට පරිවර්තනය කර ඇත්තේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශ දිනයට අදාළ විනිමය අනුපාතිකයටයි.

**42.5 ද්‍රවශීලතා අවදානම**

මූල්‍ය ලියවිලි ආශ්‍රිත බැඳීම් සපුරාලීමට අවශ්‍යවන අරමුදල් කෙටි දැනුම්දීමක දී සපයා ගැනීමේ දී ඒකකයක් විසින් මුහුණපානු ලබන දුෂ්කරතා ද්‍රවශීලතා අවදානම වේ. ඒකකයකට තම මූල්‍ය වත්කම් ඉක්මණින්, සාධාරණ අගයට වඩා අඩු මිලකට විකිණීමට සිදුවීම ද ද්‍රවශීලතා අවදානමකි.

(අ) බැංකුවේ විදේශීය මුදල් සංයුතිය නිශ්චය කිරීමේදී ද ප්‍රධාන වශයෙන් සැලකිලිමත් වන්නේ ද්‍රවශීලතාවය සම්බන්ධයෙනි. අවශ්‍ය අවස්ථාවන්හි දී මැදිහත්වීමේ කාර්යයන් ද රාජ්‍ය ණය සහ ජා.මූ.අ. ණය ආපසු ගෙවීම වැනි වූ බැඳීම් බේරුම් කිරීම සඳහා විදේශීය සංචිත ඇවර කිරීමේ දී මෙය විභව අවශ්‍යතාවයකි. අරමුදල්වලට ඉක්මණින් ප්‍රවේශවීම තහවුරු කර ගැනීම සඳහා බැංකුව පහත සඳහන් පියවර යොදා ගනී.

- රඳවාගෙන ඇති සුරැකුම්පත්වල ද්‍රවශීලතා ලක්ෂණයන් පදනම් කළ ද්‍රවශීලතා වත්කම් අනුපාත.
- එක් එක් මුදල් වර්ගයෙන් සහ එක් එක් ප්‍රතිපාර්ශ්වය සමග රඳවා ගත හැකි සංචිතවල අවම හා උපරිම සංකලනය වන සීමාවන්.

(ආ) විවට වෙළෙඳ කටයුතු වැනි දේශීය මූල්‍ය ඒකකයන් භාවිතා කරමින් කරන කටයුතුවල දී වන අවදානම අඩු කිරීම සඳහා භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සුරැකුමක් ලෙස භාවිතා කර ඇත. ඒ මගින් දේශීය මූල්‍ය වෙළෙඳපොළේ දිනපතා ද්‍රවශීලතාවය, අරමුදල් යෙදවීම හා පාලනය කිරීමට භාණ්ඩාගාර බිල්පත් හා මහබැංකු සුරැකුම්පත් ප්‍රතිමිලදී ගැනීම්/විකිණීම් හා අමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මත ශ්‍රී ලංකා රුපියල් හුවමාරුකරණය යොදාගෙන ඇත.

**43. විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්**

සියළුම සුදුසුකම්ලත් සේවකයින් ආවරණයවන නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පහක් බැංකුව විසින් මෙහෙයවනු ලැබේ. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ, 1998 ජනවාරි 01 දිනට පෙර බැංකුවට බැඳුනු සේවකයින්, වර්ෂ 10 ක සේවා කාලයක් නිම කිරීමෙන් අනතුරුව එයට සුදුසුකම් ලබති. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ආයක මුදල් නොගෙවන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් වන අතර, එහි ප්‍රතිලාභ පිරිවැය සම්පූර්ණයෙන්ම බැංකුව විසින් දරනු ලැබේ. පිරිමි සේවකයන් සඳහා වූ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ගැහැණු සේවිකාවන් සඳහා වූ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය, 1998 ජනවාරි 01 දිනට පෙර බැංකුවේ සේවයට බැඳුනු සේවකයින්ට විවෘතය.මෙම සැලසුම්වලට 1994.08.01 දිනට පෙර බඳවා ගත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 5% ක ප්‍රමාණයකින් ආයක වන අතර, 1994.08.01 දින හෝ ඊට පසු බඳවාගත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 10% කින් ආයක වෙයි.

අවුරුදු 5 ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවක වැටුප් විශ්‍රාම ක්‍රමය යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන සේවකයන් සඳහා පාරිතෝෂික ප්‍රතිලාභ ද බැංකුව විසින් සලසනු ලැබේ. මෙම බැරකම පියවීම සඳහා ආයුගණන අගය කිරීමට අනුකූලව ගණනය කළ බැරකම සඳහා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ප්‍රතිපාදනයන් ඉදිරියට ගෙනයනු ලැබේ.

පශ්චාත් වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාමලත් බැංකු සේවකයන් හට තමා හා තම කාලත්‍රයන් සහ වැන්දඹුවන්/වැන්දඹු පුරුෂයන් වෙනුවෙන් දරන ලද සමහර වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කරගත හැක.

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රමවලට නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වර්තන වියදම් සඳහා ආයුගණන අගයීම් නැවත තක්සේරු කිරීම සඳහා වර්ෂය තුළ ස්වාධීන ආයුගණකයෙකු වශයෙන් කන්සල්ටන්ට් ඇන්ඩ් ඇක්චුවරි (බොම්බාය) හි කේ. ඒ. පණ්ඩිත් මහතාගේ සේවය ලබාගෙන ඇත.

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු හා අනත්දරු විශ්‍රම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයන්හි අරමුදල් වෙන්ව කළමනාකරණය කරන අතර, වෙන් වූ පොත් පවත්වාගෙන යනු ලබයි. කෙසේ හෝ පාරිතෝෂිත විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රම බැංකුවේ ගිණුම් පොත්වලින් වෙන්ව පවත්වාගෙන යනු නොලැබේ. තවදුරටත්, ආයෝජන හා ආයෝජන ආදායම්, බැංකු පොත්වල මෙම අරමුදල්වලට පරිබාහිරව වාර්තා කරනු ලැබේ. තවද, ආයෝජන ආදායම් නැවත මෙම අරමුදල්වලට මාරු කරන අතර බෙදාහැරීමකින් තොරව නැවත ආයෝජනය කරනු ලැබේ.

සියළු ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගය රුපියල් මිලියන 33,511.975 (2012 - රුපියල් මිලියන 29,955.104) අතර එහි හිඟ අගය රුපියල් මිලියන 4,936.339 (2012 - රුපියල් මිලියන 3,832.688) ක අගයකින් ඉක්මවූ රුපියල් මිලියන 28,575.636 (2012 - රුපියල් මිලියන 26,122.416) සියළු සැලසුම්වල සාධාරණ වටිනාකමක් වර්ෂය අවසානයේ දී වාර්තා විය.

| 2013<br>ප්‍රතිලාභ බැරකම/(වත්කම) | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2013 |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ප්‍රතිලාභ බැඳීම්වල ප්‍රවර්තන වටිනාකම | 26,890,798 | 4,012,787 | 659,706 | 184,040 | 1,764,644 | 33,511,975 |
| සැලසුම් වත්කම්වල සාධාරණ වටිනාකම | (21,381,994) | (4,504,946) | (1,394,026) | (105,787) | (1,188,883) | (28,575,636) |
| හඳුනා නොගත් ශුද්ධ ආයුගණන (ලාභය) / පාඩුව | - | - | - | - | - | - |
| **ප්‍රවර්තන නොවන ප්‍රතිලාභ බැරකම්** | **5,508,804** | **(492,159)** | **(734,320)** | **78,253** | **575,761** | **4,936,339** |
| **ප්‍රතිලාභ බැරකම්වල චලනය** | | | | | | |
| 2013 ජනවාරි 01 දිනට | 4,576,066 | (650,436) | (646,013) | 70,224 | 482,847 | 3,832,688 |
| ප්‍රතිලාභ වියදම් | 919,024 | (65,044) | (64,601) | 33,325 | 106,613 | 929,317 |
| අනෙකුත් විස්තීරණ ආදායම් හඳුනාගත් කොටස | 335,057 | 247,277 | (14,080) | (5,586) | 29,749 | 592,417 |
| දායක ගෙවීම් | (321,343) | (23,956) | (9,626) | (19,710) | (43,448) | (418,083) |
| 2013 දෙසැම්බර් 31 දිනට - ප්‍රවර්තන නොවන ප්‍රතිලාභ/වියදම් | 5,508,804 | (492,159) | (734,320) | 78,253 | 575,761 | 4,936,339 |
| ප්‍රතිලාභ බැඳීම් මත පොළී පිරිවැය | 457,606 | (65,044) | (64,601) | 7,022 | 48,285 | 383,268 |
| සැලසුම් වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභය | - | - | - | - | - | - |
| වර්ෂය තුළ හඳුනාගත් ශුද්ධ ආයු ගණන (ලාභය) / පාඩුව | - | - | - | - | - | - |
| ශුද්ධ ප්‍රවර්ථන සේවා | 461,418 | - | - | 26,303 | 58,328 | 546,049 |
| පෙර සේවා පිරිවැය | - | - | - | - | - | |
| **ශුද්ධ ප්‍රතිලාභ වියදම** | **919,024** | **(65,044)** | **(64,601)** | **33,325** | **106,613** | **929,317** |
| **සැලසුම් වත්කම්වල සත්‍ය ප්‍රතිලාභය** | **2,677,443** | **610,533** | **187,353** | **11,693** | **170,945** | **3,657,967** |
| **සැලසුම් වත්කම්වල සත්‍ය ප්‍රතිලාභය සාමාන්‍ය ශේෂයේ ප්‍රතිශතයක් ලෙස** | **13.06%** | **14.19%** | **14.39%** | **12.90%** | **14.92%** | **13.38%** |
| **ගෙවූ ප්‍රතිලාභය මත ඉපැයූ අතිරික්ත පොලී** | **1,425,146** | **382,691** | **174,056** | **10,599** | **42,645** | **2,035,137** |
| **අ.ශ්‍රි.ප්‍ර. 19 ට අනුව ඉදිරි වර්ෂයේ අපේක්ෂිත ඉපැයීම්** | **2,138,199** | **450,495** | **139,403** | **10,579** | **118,888** | **2,857,564** |
| **ඉදිරි වර්ෂයේ අපේක්ෂිත ගෙවීම්** | **1,223,134** | **249,140** | **25,319** | **7,303** | **135,485** | **1,640,381** |
| **සැලසුම් වත්කම්වල සාධාරණ අගයෙහි චලනය** | | | | | | |
| වර්ෂ ආරම්භයේ දී සැලසුම් වත්කම්වල සාධාරණ අගය | 19,635,505 | 4,098,299 | 1,210,344 | 75,478 | 1,102,790 | 26,122,416 |
| සැලසුම් වත්කම්වල සත්‍ය ප්‍රතිලාභය | 2,677,443 | 610,533 | 187,353 | 11,693 | 170,945 | 3,657,967 |
| දායක ලැබීම් | 321,343 | 23,956 | 9,626 | 19,710 | 43,448 | 418,083 |
| ප්‍රතිලාභ ගෙවීම් | (1,252,297) | (227,842) | (13,297) | (1,094) | (128,300) | (1,622,830) |
| වර්ෂ අවසානයේ සැලසුම් වත්කම්වල සාධාරණ අගය | 21,381,994 | 4,504,946 | 1,394,026 | 105,787 | 1,188,883 | 28,575,636 |

| 2012<br>ප්‍රතිලාභ බැරකම/(වත්කම) | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2012 |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ප්‍රතිලාභ බැඳීම්වල ප්‍රවර්තන වටිනාකම | 24,211,571 | 3,447,863 | 564,331 | 145,702 | 1,585,637 | 29,955,104 |
| සැලසුම් වත්කම්වල සාධාරණ වටිනාකම | (19,635,505) | (4,098,299) | (1,210,344) | (75,478) | (1,102,790) | (26,122,416) |
| **ප්‍රවර්තන නොවන ප්‍රතිලාභ බැරකම්** | 4,576,066 | (650,436) | (646,013) | 70,224 | 482,847 | 3,832,688 |
| **ප්‍රතිලාභ බැරකම්වල චලනය** | | | | | | |
| 2012 ජනවාරි 01 දිනට | 1,630,200 | (2,015,903) | (773,683) | 35,238 | 103,223 | (1,020,925) |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ප්‍රතිලාභ වියදම් | 334,040 | (201,591) | (77,369) | 19,710 | 29,071 | 103,861 |
| දායක ගෙවීම් | (398,608) | 369,983 | 172,232 | (14,362) | 1,265 | 130,510 |
| අනෙකුත් විස්තීරණ ආදායම් හඳුනාගත් කොටස | 3,010,434 | 1,197,075 | 32,807 | 29,638 | 349,288 | 4,619,242 |
| 2012 දෙසැම්බර් 31 දිනට - ප්‍රවර්තන නොවන | 4,576,066 | (650,436) | (646,013) | 70,224 | 482,847 | 3,832,688 |
| **ප්‍රතිලාභ වියදම** | | | | | | |
| ප්‍රතිලාභ බැඳීම් මත පොළී පිරිවැය | 163,020 | (201,591) | (77,369) | 3,524 | 10,322 | (102,094) |
| ශුද්ධ ප්‍රවර්තන සේවා | 171,020 | - | - | 16,186 | 18,749 | 205,955 |
| ශුද්ධ ප්‍රතිලාභ වියදම | 334,040 | (201,591) | (77,369) | 19,710 | 29,071 | 103,861 |
| සැලසුම් වත්කම්වල සත්‍ය ප්‍රතිලාභය | 1,112,722 | (46,328) | 75,266 | 6,699 | 54,208 | 1,202,567 |
| සැලසුම් වත්කම්වල සාධාරණ අගයෙහි චලනය | | | | | | |
| වර්ෂය ආරම්භයේදී සැලසුම් වත්කම්වල සාධාරණ අගය | 19,281,669 | 4,724,335 | 1,320,757 | 54,417 | 1,177,086 | 26,558,264 |
| සැලසුම් වත්කම්වල සත්‍ය ප්‍රතිලාභය | 1,112,722 | (46,328) | 75,266 | 6,699 | 54,208 | 1,202,567 |
| දායක ලැබීම් | 398,608 | (369,983) | (172,232) | 14,362 | (1,265) | (130,510) |
| ප්‍රතිලාභ ගෙවීම් | (1,157,494) | (209,725) | (13,447) | - | (127,239) | (1,507,905) |
| වර්ෂ අවසානයේ සැලසුම් වත්කම්වල සාධාරණ අගය | 19,635,505 | 4,098,299 | 1,210,344 | 75,478 | 1,102,790 | 26,122,416 |

සියළුම සේවක ප්‍රතිලාභ බැඳීම් නිශ්චය කිරීමේ දී යොදාගන්නා ලද ප්‍රධාන උපකල්පනයන් පහත දැක්වේ.

| | **2013** | 2012 |
|---|---|---|
| වට්ටම් අනුපාතිකය | **10.00%** | 10.00% |
| වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතිකය | **10.00%** | 10.00% |
| අනාගත වැටුප් වැඩිවීම් | **8.50%** | 8.50% |
| අනාගත විශ්‍රාම වැටුප් වැඩිවීම | **7.50%** | 7.50% |
| ඉතිරි සාමාන්‍ය සේවා කාලය | | |
| ශ්‍රී ලං.ම.බැ. විශ්‍රාම වැටුප් | **අවුරුදු 27** | අවුරුදු 27 |
| වැන්දඹු හා අනන්දරු | **අවුරුදු 27** | අවුරුදු 27 |
| වැන්දඹු පුරුෂ හා අනන්දරු | **අවුරුදු 27** | අවුරුදු 27 |
| පාරිතෝෂික විශ්‍රාම වැටුප් | **අවුරුදු 21** | අවුරුදු 21 |
| වෛද්‍ය ප්‍රතිලාභ | **අවුරුදු 31** | අවුරුදු 31 |
| විශ්‍රාමික වයස | **අවුරුදු 60** | අවුරුදු 60 |

## 43.1 විශ්‍රාම වැටුප් සහ අනෙකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම්

| | **2013** | | | | | |
|---|---|---|---|---|---|---|
| | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ සහ අනන්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2013 |
| | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** |
| ශුද්ධ අර්ථ දැක්වූ සේවක ප්‍රතිලාභ වත්කම්/වගකීම් | **5,508,804** | **(492,159)** | **(734,320)** | **78,253** | **575,761** | **4,936,339** |
| ශුද්ධ ප්‍රතිලාභ වියදම් 2013 (ලාභයේ හෝ අලාභයේ හඳුනාගත්) ප්‍රවර්ථන සේවා පිරිවැය | **461,418** | **-** | **-** | **26,303** | **58,328** | **546,049** |
| අර්ථ දැක්වූ ප්‍රතිලාභ වත්කම්/බැඳීම් මත පොළී ආදායම / පිරිවැය | **457,606** | **(65,044)** | **(64,601)** | **7,022** | **48,285** | **383,268** |
| | **919,024** | **(65,044)** | **(64,601)** | **33,325** | **106,613** | **929,317** |

අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳීම් හි වර්තමාන වෙනස්කම් පහත පරිදි වේ.

| | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ සහ අනන්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2013 |
|---|---|---|---|---|---|---|
| අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳීම් ජනවාරි 01 දින | **24,211,571** | **3,447,863** | **564,331** | **145,702** | **1,585,637** | **29,955,104** |
| පොලී පිරිවැය | **2,421,157** | **344,786** | **56,433** | **14,570** | **158,564** | **2,995,510** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ප්‍රවර්ථන සේවා පිරිවැය | 461,418 | - | - | 26,303 | 58,328 | 546,049 |
| අරමුදලින් ගෙවූ ප්‍රතිලාභ | (1,252,297) | (227,842) | (13,297) | (1,094) | (128,300) | (1,622,830) |
| බැඳීම් මත ආයුගණන ලාභය/පාඩුව | 1,048,949 | 447,980 | 52,239 | (1,441) | 90,415 | 1,638,142 |
| අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳීම් දෙසැම්බර් 31 දිනට | **26,890,798** | **4,012,787** | **659,706** | **184,040** | **1,764,644** | **33,511,975** |

සැලසුම් වත්කම්වල සාධාරණ අගයන් ප්‍රධාන අංශවලට බෙදා වෙන් කළ විට එය මුළු සැලසුම් වත්කම්වල සාධාරණ අගය පහත පරිදි වේ.

**2013**

| | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2013 |
|---|---|---|---|---|---|---|
| **ක්‍රියාකාරී වෙළෙඳපොළ තුළ නියම කළ ආයෝජන** | | | | | | |
| රජයේ බැඳුම්කර | 20,899,505 | 4,474,898 | 1,371,874 | 105,787 | 1,188,883 | 28,040,947 |
| ස්ථාවර තැන්පතු | 169,949 | 2,478 | 1,432 | - | - | 173,859 |
| **නියම නොකළ ආයෝජන** | | | | | | |
| ණයකර | 312,540 | 27,570 | 20,720 | - | - | 360,830 |
| | **21,381,994** | **4,504,946** | **1,394,026** | **105,787** | **1,188,883** | **28,575,636** |

**2012**

| | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2013 |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **ක්‍රියාකාරී වෙළෙඳපොලෙහි නියම කළ ආයෝජන** | | | | | | |
| රජයේ බැඳුම්කර | 19,634,960 | 4,097,978 | 1,210,344 | 61,262 | 1,105,278 | 26,109,822 |
| ස්ථාවර තැන්පතු | - | - | - | - | - | - |
| **නියම නොකළ ආයෝජන** | | | | | | |
| ණයකර | - | - | - | - | - | - |
| | 19,634,960 | 4,097,978 | 1,210,344 | 61,262 | 1,105,278 | 26,109,822 |

කාණ්ඩ සඳහා අර්ථ දක්වන ලද ප්‍රතිලාභ බැඳීම් තීරණය කිරීමේදී යොදාගත් ප්‍රධාන උපකල්පන පහත පරිදි වේ.

**2013**

| | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය |
|---|---|---|---|---|---|
| | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** |
| වට්ටම් සාධකය | **10.00%** | **10.00%** | **10.00%** | **10.00%** | **10.00%** |
| අනාගත වැටුප් වර්ධක අනුපාතය | **8.50%** | **8.25%** | **8.50%** | **8.50%** | **8.50%** |

2013 දෙසැම්බර් 31 දිනට වැදගත් උපකල්පන සඳහා ප්‍රමාණාත්මක සංවේදීතා විශ්ලේෂණයක් පහත පරිදි වේ.

**වට්ටම් සාධකය**

| | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | | වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **වැඩිවීම්** | **අඩුවීම්** | **වැඩිවීම්** | **අඩුවීම්** | **වැඩිවීම්** | **අඩුවීම්** | **වැඩිවීම්** | **අඩුවීම්** | **වැඩිවීම්** | **අඩුවීම්** |
| සංවේදීතා මට්ටම | **5%** | **5%** | **5%** | **5%** | **5%** | **5%** | **5%** | **5%** | **5%** | **5%** |
| අර්ථ දක්වන ලද ප්‍රතිලාභ බැඳීම් මත බලපෑම | **(1,419,645)** | **1,554,063** | **(218,458)** | **241,353** | **(49,187)** | **55,115** | **(12,926)** | **14,323** | **(68,166)** | **73,738** |

පහත දැක්වෙන ගෙවීම් ඉදිරි වර්ෂ සඳහා අර්ථ දක්වන ලද ප්‍රතිලාභ සැලසුම් බැඳීම්වලට වන අපේක්ෂිත දායකවීම් වේ.

| | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව |
|---|---|---|---|---|---|---|
| ඉදිරි මාස 12 ඇතුළත | **1,223,134** | **249,140** | **25,319** | **7,303** | **135,485** | **1,640,381** |
| වර්ෂ 2 සහ 5 අතර | **6,746,844** | **1,100,891** | **125,415** | **33,545** | **643,398** | **8,650,093** |
| වර්ෂ 5 ස 10 අතර | **14,293,628** | **1,625,952** | **226,390** | **97,425** | **1,065,869** | **17,309,264** |
| අපේක්ෂිත මුළු ගෙවීම් | **22,263,606** | **2,975,983** | **377,124** | **138,273** | **1,844,752** | **27,599,738** |

## 44. මූල්‍ය ලියවිලි

### අ) මූල්‍ය ලියවිලිවල සාධාරණ වටිනාකම

මූල්‍ය ලියවිලි වල සාධාරණ අගය වන්නේ අවබෝධය සහ කැමැත්ත ඇති පාර්ශවයන් අතර, සිදුවන සමීප ගනුදෙනුවක දී වත්කමක් හුවමාරු කිරීමට හෝ බැරකමක් බේරුම් කිරීමට අදාළ වන මුදල් ප්‍රමාණයන් වේ. මූල්‍ය ලියවිල්ලක් විකුණන්නාට එරෙහිව මිල චලනයක් සිදු නොවන පරිදි සැලකිය යුතු ගනුදෙනුවක්, ග්‍රහණය කරගත හැකි ලෙස සංවිධාන වූ සහ ද්‍රවශීලතාවය ඇති වෙළෙඳපොළක මූල්‍ය ලියවිල්ලක් විකිණීම කළ විට එහි ප්‍රකාශිත මිල සාධාරණ අගය වේ.

**සාධාරණ අගය නිශ්චය හා සාධාරණ අගය ධූරාවලිය**

ඇගයුම් ක්‍රමයන්ට වන මූල්‍ය මෙවලම් වල සාධාරණ අගය නිශ්චය කිරීමට සහ අනාවරණය කිරීමට බැංකුව විසින් පහත ධූරාවලිය උපයෝගී කරගනු ලැබේ.

**පළමුවන මට්ටම :** අනන්‍ය වත්කම හා වගකීම සඳහා ක්‍රියාකාරී වෙළඳපල තුළ හිමි ප්‍රකාශිත (නොසැකසූ) මිල ගණන්.

**දෙවන මට්ටම :** වාර්තා කරන ලද සාධාරණ අගය කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් කළ හැකි සියළුම යෙදවුම් සඳහා ඍජුව හෝ වක්‍රාකාරයෙන් නිරීක්ෂණය කලහැකි යෙදවුම් භාවිතා කරන අනෙකුත් ක්‍රම.

**තෙවන මට්ටම :** වාර්තා කරන ලද සාධාරණ අගය කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් කළ හැකි යෙදවුම්, නිරීක්ෂණය කළ හැකි වෙළඳපල දත්ත මත පදනම් නොවූ යෙදවුම් භාවිතා කරනු ලබන ක්‍රම.

පහත දැක්වෙන වගුව මගින් සාධාරණ අගය ධූරාවලිය අනුව වාර්තා කරන ලද මූල්‍ය උපකරණයන්හි විශ්ලේෂණයක් පෙන්නුම් කරයි.

| 2013 දෙසැම්බර් 31 දිනට | පළමුවන මට්ටම රු. 000 | දෙවන මට්ටම රු. 000 | තෙවන මට්ටම රු. 000 | එකතුව රු. 000 |
|---|---|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | | | |
| ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | **94,137,368** | **-** | **-** | **94,137,368** |
| විකුණුම් සඳහා වන ආයෝජන | **357,531,750** | **-** | **-** | **357,531,750** |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **-** | **5,670,258** | **-** | **5,670,258** |
| | **451,669,118** | **5,670,258** | **-** | **457,339,376** |
| **මූල්‍ය නොවන විදේශ විනිමය වත්කම්** | | | | |
| රන් | **95,601,221** | **-** | **-** | **95,601,221** |
| | **95,601,221** | **-** | **-** | **95,601,221** |
| **අනෙකුත් මූල්‍ය නොවන වත්කම්** | | | | |
| ඉඩම් | **-** | **-** | **5,433,100** | **5,433,100** |
| ගොඩනැගිලි | **-** | **-** | **7,707,380** | **7,707,380** |
| | **-** | **-** | **13,140,480** | **13,140,480** |
| **මූල්‍ය වගකීම්** | | | | |
| අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය - විනිමය විකල්ප | **-** | **-** | **10,162,977** | **10,162,977** |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **-** | **6,020,305** | **-** | **6,020,305** |
| | **-** | **6,020,305** | **10,162,977** | **16,183,282** |

| 2012 දෙසැම්බර් 31 දිනට | පළමුවන මට්ටම රු. 000 | දෙවන මට්ටම රු. 000 | තෙවන මට්ටම රු. 000 | එකතුව රු. 000 |
|---|---|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | | | |
| ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | 169,312,604 | - | - | 169,312,604 |
| විකුණුම් සඳහා වන ආයෝජන | 386,761,690 | - | - | 386,761,690 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 3,989,701 | - | 3,989,701 |
| | 556,074,294 | 3,989,701 | - | 560,063,995 |

| | | | | |
|---|---|---|---|---|
| **මූල්‍ය නොවන විදේශ විනිමය වත්කම්** | | | | |
| රන් | 77,688,838 | - | - | 77,688,838 |
| | 77,688,838 | - | - | 77,688,838 |
| **අනෙකුත් මූල්‍ය නොවන වත්කම්** | | | | |
| ඉඩම් | - | - | 5,180,100 | 5,180,100 |
| ගොඩනැගිලි | - | - | 7,151,979 | 7,151,979 |
| | - | - | 12,332,079 | 12,332,079 |
| **මූල්‍ය වගකීම්** | | | | |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 3,257,119 | - | 3,257,119 |
| | - | 3,257,119 | - | 3,257,119 |

## ඉඩම් හා ගොඩනැගිලි

### අගය කිරීමේ ක්‍රමය

ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල අගය කිරීමේ දී එහි ඇති ඉහළ වාණිජමය ස්වභාවය සලකා බලා වට්ටම් මුදල් ප්‍රවාහ ක්‍රමය යොදා ගනී. අනෙකුත් ගොඩනැගිලි ප්‍රවර්ථන පිරිවැයට ප්‍රධාන වැඩි දියුණු කිරීමේ ප්‍රතිස්ථාපනය කිරීමෙන් හා ක්ෂය වීම් සඳහා දළ ප්‍රමාණයක් අඩු කර ගණනය කිරීමෙන් අගය කරයි.

ප්‍රවර්ථන වෙළෙඳ අගය ලබා ගැනීමෙන් ඉඩම් අගය කිරයි. නිව්යෝක් ගොඩනැගිල්ලෙහි ධාරණ අගය එහි සාධාරණ අගයට සමාන බව උපකල්පනය කරනු ලැබේ.

### අගය කිරීමට යොදා ගන්නා ලද උපකල්පන

ඉඩම් හා ගොඩනැගිලි සංවේදීතා විශ්ලේෂණයේ දී යොදාගත් ප්‍රධාන උපකල්පනයන් පහත පරිදි වේ.

වට්ටම් සාධකය 6.5%

කුලී වර්ධනය 5%

වැය 45%

### ප්‍රධාන ගොඩනැගිල්ල හා ඉඩම් සඳහා සංවේදීතා විශ්ලේෂණය

| වට්ටම සාධනය | කුලී වර්ධනය | වැය | ඉඩම් | ගොඩනැගිලි |
|---|---|---|---|---|
| | | | රු. 000 | රු. 000 |
| 5% | 5% | 45% | 3,548,316 | 6,386,765 |
| 6% | 5% | 45% | 2,906,605 | 5,231,722 |
| 7% | 5% | 45% | 2,453,546 | 4,416,242 |
| 7% | 4% | 45% | 2,297,649 | 4,135,637 |
| 6% | 4% | 45% | 2,714,813 | 4,886,508 |
| 6% | 5% | 45% | 2,906,605 | 5,231,722 |
| 6% | 6% | 45% | 3,112,269 | 5,601,906 |
| 6% | 5% | 40% | 3,170,842 | 5,707,333 |
| 6% | 5% | 45% | 2,906,605 | 5,231,722 |
| 6% | 5% | 50% | 2,642,368 | 4,756,111 |

### අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ - මූල්‍ය විකල්පයන්

අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල අගය බ්ලැක්ස්කෝල්ස් ආදර්ශකය භාවිතා කරමින් ගනණය කර ඇත.

| | තෙවන මට්ටම් | |
|---|---|---|
| | **විකල්ප** | **එකතුව** |
| | **රු. 000** | **රු. 000** |
| ආරම්භක ශේෂය | - | - |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ වගකීම් | 10,162,977 | 10,162,977 |
| **අවසන් ශේෂය** | 10,162,977 | 10,162,977 |
| ඉපයීම්වල ඇතුළත් උපලබ්ධි නොවූ ඉපැයීම්වල එකතුව | 15,725,740 | 15,725,740 |

**භාවිතා කරන ලද නිරීක්ෂණය නොවූ සුවිශේෂී යෙදවුම්**

| | |
|---|---|
| වට්ටම් සාධකය | 10% |
| වාෂ්පශීලතාව | 6% |

| සංවේදීතා විශ්ලේෂකය | වට්ටම් සාධකය | | උච්චාවචනය | |
|---|---|---|---|---|
| | 9% | 11% | 5% | 7% |
| | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** |
| අන්තර්ගත ව්‍යුත්පන්න උපකරණ - මූල්‍ය විකල්පයන් | 10,536,088 | 9,848,731 | 10,059,639 | 10,515,221 |

| **හුවමාරු ගනුදෙනුවලට එළඹීමේදී තිබූ වෙළෙඳ අගය** | **2013 රු. 000** | 2012 රු. 000 |
|---|---|---|
| ජනවාරි 1 දිනට ශේෂය | **-** | - |
| හානිකරණය සඳහා වූ අධිමිල | **(27,578,100)** | - |
| නිරීක්ෂණයන් මත වූ අපර හඳුනාගැනීම් | **-** | - |
| දෙසැම්බර් 31 ට ශේෂය | **(27,578,100)** | - |

### ආ) ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගිවිසුම්

ගිවිසුම්වල කෙටිකාලීන ස්වභාවය නිසා, ආසන්න සාධාරණ අගයක් ලබා ගැනීමට ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනුවල වාර්තා කළ අගය සලකා බලනු ලැබේ. 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රතිමිලදී ගැනීම් යටතේ පවතින ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වල ධාරණ වටිනාකම රුපියල් මිලියන 84,601 ක් විය (2012 දී එය රුපියල් මිලියන 7,015) ශ්‍රී.ලං.ම.බැ සුරැකුම්පත් අගය රුපියල් ශුන්‍යකි. (2012 - ශුන්‍යකි.) 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ පවතින ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වල ධාරණ වටිනාකම රුපියල් මිලියන 12,930 (2012 දී එය රුපියල් මිලියන 26,579) කි.

**ඇ) සංසරණයේ ඇති මුදල්**

සංසරණයේ ඇති මුදල්වල සාධාරණ අගය, ශේෂ පත්‍රයෙහි වාර්තාකර ඇති පරිදි ඒවායේ මුහුණත වටිනාකමය.

**ඈ) තැන්පතු වටිනාකම**

ඉල්ලූ විටෙක දී ගෙවිය යුතු බැවින් තැන්පතුවල ධාරණ අගය ආසන්න සාධාරණ අගය ලෙස සලකනු ලැබේ.

**ඉ) සාධාරණ වටිනාකම තීරණය කිරීම හා සාධාරණ වටිනාකම් ධුරාවලිය**

පහත දැක්වෙන්නේ බැංකුවේ මූල්‍ය වත්කම් හා වගකීම් හි පන්ති ලෙස ධාරණ අගයන් හා සාධාරණ අගයන් අතර සංසන්දනාත්මක තොරතුරු වේ.

| සාධාරණ වටිනාකම් | ධාරණ වටිනාකම් | | සාධාරණ වටිනාකම් | |
|---|---|---|---|---|
| | **2013 රු. 000** | 2012 රු. 000 | **2013 රු. 000** | 2012 රු. 000 |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | |
| මුදල් හා මුදල් සමානයන් | **425,676,763** | 235,278,133 | **425,676,763** | 235,278,133 |
| විදේශීය විනිමය විකුණුම් /විකිණීම සඳහා ඇති සුරැකුම්පත් | **451,669,118** | 556,074,294 | **451,669,118** | 556,074,294 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **5,670,258** | 3,989,701 | **5,670,258** | 3,989,701 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | **85,400,764** | 81,352,282 | **85,400,764** | 81,352,282 |
| අනෙකුත් ලැබිය යුතු දේ | **591** | 8,243,512 | **591** | 8,243,512 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | **968,417,494** | 884,937,922 | **968,417,494** | 884,937,922 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **15,853,513** | 175,251,772 | **15,810,695** | 175,262,622 |
| රජයට දෙනු ලැබූ කාලීන අත්තිකාරම් | **109,167,071** | 111,291,843 | **109,167,071** | 111,291,843 |
| බැංකුවලට දෙනු ලැබූ ණය | **1,375,396** | 1,844,237 | **1,215,303** | 1,401,574 |
| අනිකුත් ලැබිය යුතු දෑ | **1,829,712** | 2,970,099 | **1,829,712** | 2,970,099 |
| මූල්‍ය හා අනෙක් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | **41,095** | 41,095 | **41,095** | 41,095 |
| අනිකුත් වත්කම් | **6,443,534** | 5,573,731 | **3,972,492** | 3,226,959 |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | **134,710,321** | 296,972,777 | **132,036,368** | 294,194,192 |
| **මුළු මූල්‍ය වත්කම්** | **1,103,127,815** | 1,181,910,699 | **1,100,453,862** | 1,179,132,114 |
| **විදේශීය මූල්‍ය නොවන වත්කම්** | | | | |
| රන්වලින් කරන ලද ආයෝජන | **95,601,221** | 77,688,838 | **95,601,221** | 77,688,838 |
| **විදේශීය මූල්‍ය නොවන වත්කම්** | **95,601,221** | 77,688,838 | **95,601,221** | 77,688,838 |
| **විදේශීය මූල්‍ය වගකීම්** | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන | **21,504,196** | 2,619,847 | **21,504,196** | 2,619,847 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **16,183,282** | 3,257,119 | **16,183,282** | 3,257,119 |
| ආසියානු නිෂ්කාශන සංගමය | **37,301,553** | 28,953,955 | **37,301,553** | 28,953,955 |
| ජා.මූ.අ. | **422,032,012** | 467,642,196 | **422,032,012** | 467,642,196 |
| අනෙකුත් | **47,221,119** | 64,520,662 | **47,221,119** | 64,520,662 |
| **මුළු විදේශීය මූල්‍ය වගකීම්** | **544,242,162** | 566,993,779 | **544,242,162** | 566,993,779 |
| **දේශීය මූල්‍ය වගකීම්** | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | **148,809,893** | 166,288,378 | **148,809,893** | 166,288,378 |
| රජය හා රජයේ ආයතන විසින් තැතන්පතු | **416,230** | 699,628 | **416,230** | 699,628 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | **84,601,000** | 7,015,000 | **84,601,000** | 7,015,000 |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | **2,419,087** | 1,341,268 | **2,419,087** | 1,341,268 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | **5,659,718** | 31,934,646 | **5,659,718** | 31,934,646 |
| **මුළු දේශීය මූල්‍ය වගකීම්** | **241,905,928** | 207,278,920 | **241,905,928** | 207,278,920 |
| **මුළු මූල්‍ය වගකීම්** | **786,148,090** | 774,272,699 | **786,148,090** | 774,272,699 |

**45. සන්සන්දනාත්මක තොරතුරු**

| | 2012 රු. 000 |
|---|---|
| අ) පෙරාතුව ඉදිරිපත් කළ ආකාරයට | |
| **දේශීය මුදල් වත්කම්** | |
| අනෙකුත් වත්කම් | 5,578,483 |
| **-දේශීය මූල්‍ය වගකීම්** | |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 31,939,398 |

| | **2013 රු. 000** | 2012 රු. 000 |
|---|---|---|
| **වත්මන් ඉදිරිපත් කිරීම** | | |
| දේශීය මූල්‍ය වත්කම් | | |
| අනෙකුත් වත්කම් | **6,443,534** | 5,573,731 |
| **දේශීය මූල්‍ය වගකීම්** | | |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | **5,659,718** | 31,934,646 |

සේවක ණය සඳහා වූ සමුච්චිත හානිකරණ අලාභය වූ රුපියල් මිලියන 4.752 ක මුදල 2012 දී අනෙකුත් ගෙවිය යුතු දෑවල අන්තර්ගතවුනි. 2013 වර්ෂයේදී වඩාත් නිවැරදි ඉදිරිපත් කිරීමක් සඳහා එම මුදල අනෙකුත් වත්කම්වල අන්තර්ගත සේවක ණය අයිතමයෙන් හිලව් කර පෙන්නුම් කර ඇත.

| | 2012 රු. 000 |
|---|---|
| ආ) පෙරාතුව ඉදිරිපත් කළ ආකාරයට | |
| **විදේශීය මූල්‍ය බැරකම් මත වූ පොලී වියදම** | |
| ශුද්ධ හුවමාරු පිරිවැය | (1,093,795) |

**වත්මන් ඉදිරිපත් කිරීම**

| **මූල්‍ය වත්කම්වලින් පොලී ආදායම** | **2013 රු. 000** | **2012 රු. 000** |
|---|---|---|
| හුවමාරු ලාභය | **6,817,308** | **2,066,692** |
| **විදේශීය මූල්‍ය බැරකම් මත වූ පොලී වියදම** | | |
| හුවමාරු පිරිවැය | **113,672** | **972,897** |

හුවමාරු (SWAP) ලාභයවන රුපියල් මිලියන 2,066.692 සහ හුවමාරු පිරිවය වන රුපියල් මිලියන 972.897 ශුද්ධ අගයක් ලෙස 2012 වර්ෂයේදී පොලී වියදමෙහි අන්තර්ගතව තිබුණි. 2013 වර්ෂයේදී හුවමාරු ලාභය පොලී ආදායම මත වූ විදේශීය වත්කම්හි දී හුවමාරු පිරිවැය පොලී වියදම මත වූ විදේශීය මූල්‍ය වගකීම්වල ද වඩාත් ඉදිරිපත්කිරීමක් සඳහා සන්සන්දනාත්මකව පෙන්නුම් කර ඇත.

**46. සම්බන්ධිත පාර්ශවයන්**

**46.1 රජය සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන සමග ගනුදෙනු**

බැංකුව විසින් සාමාන්‍ය මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී, සම්බන්ධිත පාර්ශවයන් සමග ගණුදෙනුවලට පිවිසෙනු ලැබේ. ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ම.බැ. පරම

අයිතිකරු වශයෙන්) විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රජය මගින් පාලනය කෙරෙන ආයතන ද සම්බන්ධිත පාර්ශවයන්ට ඇතුළත් වේ. අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිත 24 (සංශෝධිත) සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳ හෙළිදරව් කිරීමේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව තනිව ගත් කළ සැළකිය යුතු මට්ටමේ වන හා අනෙකුත් ගණුදෙනුවලදී එකී ගණුදෙනු තනි වශයෙන් නොව සාමූහිකව සැළකිය යුතු මට්ටමේ වන රජය සහ රජය මගින් පාලනය කෙරෙන ආයතන සමඟ එළැඹී ගණුදෙනු සහ විධිවිධානයන් පහත සඳහන් පරිදි වේ.

| ගනුදෙනු වල ස්වභාවය | **2013**<br>**රු. 000** | 2012<br>රු. 000 |
|---|---|---|
| ශ්‍රී ලං.ම.බැ. විසින් දරන ලද ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් (අ) | **2,923,513** | 148,672,772 |
| එක්වර විකිණූ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **61,099,000** | 260,000 |
| ප්‍රතිවිකිණීමේ හා මිලදී ගැනීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් ශ්‍රී.ලං.ම.බැ. සහ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **2,605,097,956** | 1,550,252,513 |
| 2013 දෙසැම්බර් 31 දිනට මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ පිරිවැය (ඇ) | **954,259** | 1,205,091 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලං.ම.බැ. විසින් සපයන ලද ඇපවීම් (සටහන 47.2) | **2,561,264** | 2,306,711 |
| 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සඳහා ගෙවූ ගාස්තු සහ බදු (ඉ) | **405,650** | 1,167,992 |
| වර්ෂය තුළ දී අතිරික්තය රජයට ගෙවීම (සටහන 30) | **25,000,000** | 33,000,000 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් (සටහන 9) | **109,167,071** | 111,291,843 |
| නිශ්චිත අරමුණු සඳහා රඳවාගත් රජයේ සුරැකුම්පත් | **1,219,657** | 1,201,292 |
| වර්ෂය තුළදී දළ විදේශ විනිමය ගනුදෙනු (උ) | | |
| - විකුණුම් | **43,991,178** | 209,530,618 |
| - මිලට ගැනීම් | **40,884,447** | 32,975,250 |
| - ශ්‍රී ලංකා රුපියල් / ඇ.එ.ජ. ඩොලර් ගැනුම් විකිණුම් | **277,458,818** | 110,783,700 |
| ප්‍රතිමූල්‍ය පහසුකම් (එ) | **6,492,418** | 5,452,617 |
| වර්ෂය තුළදී අත්හල දේපළ වෙනුවෙන් ලද අරමුදල් | **-** | 136,500 |
| ලංකා ක්ලියර් හා CRIB වලින් ලද ලාභාංශ ආදායම් | **14,811** | 14,267 |
| ලංකා ක්ලියර් පුද්ගලික සමාගමට කරන ලද ගෙවීම් | **643** | 667 |
| **ශේෂයන්** | | |
| සුසහන I හා II හා ප්‍රාදේශීය සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ලබාදුන් ණය | **1,242,405** | 1,711,019 |
| බැංකු හා මූල්‍ය ආයතනවල තත්කාලීන දළ පියවුම් ක්‍රමයේ (RTGS) ශේෂයන් | **77,899,164** | 84,679,924 |
| ලංකා බැංකුව ලන්ඩන් නොස්ට්‍රෝ ගිණුමේ ශේෂය | **106,922** | 72,320 |
| භාණ්ඩාගාරයෙන් හා අනෙකුත් අමාත්‍යාංශ වලින් ලැබිය යුතු දෑ | **1,394,987** | 2,403,335 |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ලැබිය යුතු ශේෂය (ඔ) | **333,114** | 480,814 |
| මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට කළ යුතු ගෙවීම් (සටහන 20) | **29,052,050** | 43,324,799 |
| දෙසැම්බර් 31 දිනට රජයේ හා රජයේ ආයතනවල ජංගම ගිණුම් ශේෂයන් | **172,571** | 393,691 |
| ලංකා ක්ලියර් හි ආයෝජන | **29,500** | 29,500 |
| ණය තොරතුරු කාර්යංශයෙහි ආයෝජන | **5,845** | 5,844 |
| අනෙකුත් ගණුදෙනු හා ශේෂයන් (ඕ) | **1,076,631** | 1,142,497 |

අ) දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුව, 1949 අංක 58 දරණ මුදල් නීති සංශෝධිත පනතේ 90-92 වගන්ති ප්‍රකාර, බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ කාර්යයන් ලෙස විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතුවල නියැලීම, මුදල් නීති පනතේ 93-98 වගන්ති ප්‍රකාර, නෛතික සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාව බලාත්මක කිරීම හා රජයේ කොටස් හිමිකම් ඇති වාණිජ බැංකුවල හා අනෙකුත් සමහරක් මූල්‍ය ආයතන හා රාජ්‍ය ආයතනවල බැංකුකරු ලෙස කටයුතු කරයි. 2013 දෙසැම්බර් 31 දිනට මෙම කාර්ය කිරීමේ දී උද්ගත වූ මුළු ශේෂය සටහන් 21 හා 22 හි දක්වා ඇත. රජයේ සුරැකුම්පත් මත උපයාගත් පොළිය 31 සටහනෙහි දැක්වේ.

ආ) මුදල් නීති පනතේ 28-33 වගන්ති අනුව පැවරෙන ලද බලය ප්‍රකාර බැංකුවේ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ බලපත්‍රලාභී

බැංකුවල කටයුතු විධිමත් කිරීම හා සුපරීක්ෂණ කටයුතු කරගෙන යනු ලබයි. වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය තුළ දී රජය මගින් අරමුදල් සැපයූ හෝ රජයේ වැදගත් බලපෑමක් ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු 03 ක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 07 ක් මෙම දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂණයට භාජනය කර ඇත.

බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි මූල්‍ය සමාගම්වල විධිමත්භාවය සහ සුපරීක්ෂණ කටයුතු කරගෙන යනු ලබයි. ඒ අනුව රජය විසින් පාලනය කරනු ලබන හෝ අරමුදල් සපයා ඇති බැංකුවලට සම්බන්ධිත ආයතන සහ බැංකු නොවන මූල්‍ය සමාගම් මෙම දෙපාර්තමේන්තුයේ සුපරීක්ෂණය යටතට පැවරේ.

ඇ) මුදල් නීති පනතේ 113 වගන්තිය ප්‍රකාර රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ ක්‍රියාපටිපාටිය, මුදල් මණ්ඩලය හා බැංකුව සතු වේ. ඒ අනුව, රජයේ නියෝජිතයා ලෙස, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් අයවැය අවශ්‍යතා, දේශීය හා විදේශීය ණය සේවා සපුරා ගැනීම සඳහා දේශීය වෙළෙඳපොළට සුරැකුම්පත් නිකුත් කිරීම කරනු ලැබේ. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ණය කළමනාකරණය හා ණය වෙළෙඳපොළ සංවර්ධනය කිරීම කරනු ලබයි. රජයේ අවශ්‍යතා හා එහි පියවීම් බැරකම් සපුරාලීම සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය ණය පරිපාලනය කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබේ.

ඈ) මුදල් නීති පනතේ 49 වගන්තිය ප්‍රකාර, මුදල් නිකුත් කිරීමේ තනි අයිතිය හා බලතල බැංකුව සතු වේ. ඒ අනුව බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, නෛතික ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ තනි බලධාරියා ලෙස කටයුතු කරයි. මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ කාර්යය ඩී ලා රූ ලංකා කරන්සි ඇන්ඩ් සෙකියුරිටි ප්‍රින්ට් (පුද්ගලික) සමාගම විසින් කරගෙන යනු ලැබේ. මෙහි කොටස් හිමිකමෙන් 40% දරන්නේ රජයයි.

ඉ) බැංකුව සාමාන්‍යයෙන් මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී, විවිධ භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා රාජ්‍ය ආයතන හෝ රජයේ වැදගත් බලපෑමක් හෝ පාලනයක් ඇති ආයතන සමඟ ගනුදෙනුවලට එළඹෙනු ලැබේ.

ඊ) බැංකුව භාරකරුවන් සහ අන් විශ්වාසතා තත්ත්වයන්හි කටයුතු කිරීම මගින් 48 සටහනේ පැහැදිලි කර ඇති පරිදි රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සාමාන්‍යයෙන් සිදුකරනු ලැබේ.

උ) මුදල් නීති පනතට යටත්ව බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළෙහි සංවර්ධනය හා වාණිජ බැංකුවල ඉකුත් රාත්‍රි විවෘත විදේශ විනිමය තත්වය සුපරීක්ෂණය කරනු ලැබේ. දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ සංවර්ධනය සුපරීක්ෂණයේ දී ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතය ඇඩි ලෙස වෙනස්වීම ලිහිල් කිරීමේ අරමුණින් බැංකුව වෙළෙඳපොළෙහි අංශ දෙකෙහි ම නියැලෙන්නේය. විදේශ විනිමය මිලට ගැනීම් සහ විකුණුම් ප්‍රමාණයන් එම සුපරීක්ෂණයේ ප්‍රතිඵල නියෝජනය කෙරේ.

ඌ) රජයේ පාලනයට යටත් එක් බැංකුවක භාරකාරත්ව විධිවිධානවල බැංකුව නියැලුන අතර, ඒ සඳහා ගාස්තුවක් අය නොකෙරුණි.

එ) සටහන් අංක 47.2 දක්වා ඇති පරිදි ණය ඇප වශයෙන් බැංකුව අරමුදල් සැපයූ ප්‍රතිමූල්‍යකරණ ණය ප්‍රමාණය රුපියල් මිලියන 6,492.418 (2012 රුපියල් මිලියන 5,452.617) ක් වන අතර රජය මූල්‍යකරණය කළ ප්‍රමාණය රුපියල් මිලියන 3,359.770 (2012 - රුපියල් මිලියන 2,879.460) ක් වේ.

ඒ) බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව, කෘෂිකර්මාන්තය සඳහා අවම අත්තිකාරම් සීමාව වූ 10% පවත්වාගෙන යනු නොලබන බැංකු විසින්, එම හිඟ මුදල ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක ප්‍රතිමූල්‍ය අරමුදලට දායක කළ යුතුය. මේ යටතේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මහජන බැංකුව (රු. මි. 275.618), ලංකා බැංකුව (රු. මි. 55.488), ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (රු. මි. 192.913) හා ලංකාපුත්‍ර බැංකුව (රු. මි. 31.052) හරහා රු. මි. 555.071 ණය ප්‍රතිමූල්‍ය කර ඇත. එමගින් රු. මි. 57.6042 පොළියක් උපයා ඇත.

ඔ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙනුවෙන් පෙනී සිටින විදේශ නීතිඥයන් සඳහා ගරු නීතිපතිතුමන්ගේ ඉල්ලීම හා නිර්දේශ මත රජය හා රජයේ ආයතනවල නියෝජිතයා ලෙස සහ ජාතික අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන බැංකුව විසින් නීතිඥ ගාස්තු ගෙවා ඇත. එම නීතිඥ ගාස්තු වූ රු. මිලියන 333.114 (2012 - රු. මිලියන 480.814) මුදල ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙන් ලැබිය යුතු මුදල් ලෙස සලකන ලදී.

තවද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට එරෙහිව Deutsche Bank AG විසින් පවරන ලද ඉදිරි රැකුම් නඩුව (Hedging Case) වෙනුවෙන් එය බේරුම්කරණ ක්‍රියාපටිපාටිය සඳහා පෙනී සිටින විදේශ නීතිඥයන් සඳහා වර්ෂය තුළ රු. මිලියන 25.099 (2012 - රු. මිලියන 27.674) මුදලක් නීතිඥ ගාස්තු වශයෙන් බැංකුව ගෙවන ලදී. (සටහන් 35)

ඕ) රජය හා රජයේ දෙපාර්තමේන්තු, රජය මගින් පාලනය කෙරෙන ආයතන සමඟ සිදුකළ තනිව ගත්කල සැලකිය යුතු මට්ටමේ නොවන ගනුදෙනු හා ශේෂයන්, අනෙකුත් ගනුදෙනු හා ශේෂයන් තුළ අන්තර් ගත වේ. බැංකුව විසින් සපයන ලද ඇපවීම රු.මි. 197.111 (2012-රු.මි. 178.548) ද විනිමය පාලන කටයුතු සඳහා රැස් කළ අරමුදල් ලෙස රු. මි.22.602 (2012 - රු. මි. 14.172) ද නිශ්චිත අරමුණු සඳහා රඳවාගත් රජයේ සුරැකුම්පත් රු.මි. 83.531 (2012 රු.මි. 76.235) ද ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමණාකරණ ආයතනයේ තත්කාලීන දළ පියවුම් පද්ධති ශේෂය වන රු. මි. 0.203 (2012 - රු. මි. 0.242) ද සුසහන ණය යෝජනා ක්‍රමය 01 හා 02 පළාත් සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ලබාදුන් ණය රු.මි. 142.499

(2012 - රු.මි. 77.468) ද 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සඳහා ගෙවූ ගාස්තු හා බදු රු.මි. 316.460 (2012 රු.මි. 249.309) ද රජයේ හා රජයේ ආයතන වල ජංගම ගිණුම් ශේෂ ලෙස රු.මි. 243.659 (2012 රු.මි. 305.937) ද අත්හළ දේපළ වෙනුවෙන් ලද අරමුදල් රු.මි. 45.468 (2012 රු.මි. 55.805) හා බාහිර නඩු ගාස්තු වශයෙන් රු.මි. 25.099 (2012 - රු. මිලියන 27.674) ක මුදලක් ද අනෙකුත් ගනුදෙනු හා ශේෂයන් තුළ ඇතුළත් වේ.

ක) මුදල් නීති පනතේ වගන්ති 09 ප්‍රකාර බැංකුව විසින් 2011 වර්ෂය තුළදී ඇමරිකානු එක්සත් ජනපදයේ නිව්යෝර්ක් නුවර පිහිටි දේපලක් විදේශ කටයුතු අමාත්‍යාංශයේ අන්තර් පරිහරණයට අත්පත් කර ගන්නා ලදී. එය 2012 ජූනි 01 දින සිට ආරම්භ වන තුන් අවුරුදු කාලපරිච්ඡේදයක් සඳහා මසකට ඇ.එ.ජ.ඩො 68,000 ක මුදලක බදු පදනම් මත ලබාදෙනු ලැබූ අතර ඒ වෙනුවෙන් ලැබිය යුතු අට මාසික (මැයි-දෙසැ.) බදු කුලිය වන රුපියල් මිලියන 71.130 ක මුදල අයවිය යුතු උපචිත බදු කුලී ලෙස විවිධ වත්කම් හි ඇතුළත් කොට ඇත.

ඛ) විවිධ වත්කම් හි ඇතුළත් රුපියල් මිලියන 88 ක මුදල, නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු මුදල් ලෙස සටහන් කොට ඇත. මෙය කොළඹ 01, ට්‍රාන්ස්වර්ක් චතුරශ්‍රයේ පිහිටි බදු දේපළක් වන බැංකුවේ රථගාල පිහිටි භූමිය සඳහා අදාළ බදු මුදල නියෝජනය කරයි. ඉහත බදු දේපළ වෙනුවෙන් ගෙවූ මූලික මුදලේ කොටසක් වන මෙය, බදු දීමනාකරු වන නාගරික සංවර්ධන අධිකාරිය විසින් බදු කාලය නිම වීමට ප්‍රථමයෙන් නැවත ලබාගැනීම හේතුවෙන් ඔවුන්ගෙන් ලැබිය යුතු අයිතමයක් ලෙස සටහන් කොට ඇත.

ග) දෙපාර්ශවයේම ප්‍රයෝජනය උදෙසා වනජීවී කාර්යාලයක්, පිරික්සුම් බංගලාවක් සෝමාවතිය ප්‍රදේශය තුළ ඉදිකිරීම, ස්ථාපනය කිරීම හා නඩත්තු කිරීම සම්බන්ධයෙන් වූ අවබෝධතා ගිවිසුමකට 2008 නොවැම්බර් 20 වන දින බැංකුව මූල්‍ය මණ්ඩලය හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රවිෂ්ඨ වන ලදී. ශ්‍රී.ලං.ම.බැ. විසින් ප්‍රයෝජනයට ගනු ලබන පිරික්සුම් බංගලාව දේපළ, පිරියත හා උපකරණ යටතේ වාර්තා කොට අවබෝධතා ගිවිසුම් කාලපරිච්ඡේදය (වසර 30 ක්) තුළ ක්ෂය කරනු ලැබේ. මීට අමතරව, අවබෝධතා ගිවිසුම් 3 (C) වගන්තිය යටතේ, ඉදිකරනු ලබන වනජීවී කාර්යාලය ඉදිකිරීම් වලින් අනතුරුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත බාරදීම සඳහා බැංකුව එකඟ වී ඇත. වනජීවී කාර්යාලය ඉදිකිරීම් සඳහා බැංකුව විසින් දරනු ලැබූ පිරිවැය වූ රු.මි. 6.2 ක මුදල පිරික්සුම් බංගලාව භාවිත කිරීමට ඇති හිමිකමෙහි වටිනාකම ලෙස සලකා විවිධ වත්කම් හි සටහන් කර ඇති අතර එය අවබෝධතා ගිවිසුම් කාලපරිච්ඡේදය තුළ ක්‍රමක්ෂය කරනු ඇත.

**46.2 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සමග ගනුදෙනු**

අධිපති, නියෝජ්‍ය අධිපතිවරුන්, සහකාර අධිපතිවරුන් හා කළමනාකරණ විගණන අංශයේ අධ්‍යක්ෂක ඇතුළත්ව මුදල් මණ්ඩලයේ සාමාජිකවරුන් ප්‍රධාන කළමනාකරණ මණ්ඩලයට ඇතුළත් වේ (මෙම තනතුරු සඳහා අධ්‍යක්ෂ නිලධාරීන්, සේවක හෝ කිසිදු බැංකු ආයතනයක් කොටස් හිමියා ලෙස හැඳින්වීම මුදල් නීති පනතේ සීමා කර තිබේ).

**46.3 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයට ගෙවීම් :**

| | **2013**<br>**රු. 000** | 2012<br>රු. 000 |
|---|---|---|
| කෙටිකාලීන සේවක ප්‍රතිලාභ | **57,534** | 58,189 |

මෙයට අමතරව ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා ඔවුන්ගේ සේවා ගිවිසුම් යටතේ මූල්‍ය නොවන ප්‍රතිලාභ ද සපයනු ලැබේ.

**46.4 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයේ සාමාජිකයන් සමග වූ වෙනත් ගණුදෙනු**

| | **2013**<br>**රු. 000** | 2012<br>රු. 000 |
|---|---|---|
| කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට දුන් ණය | **32,076** | 45,458 |

ණය වර්ගය සියයට 2 සිට සියයට 12 දක්වා ණය පොළී පරාසයන්හි වන අතර, මාසිකව ගෙවනු ලබන එම සියළු ණය ප්‍රමාණවත් පරිදි ආරක්ෂිත කොට ඇත.

**46.5 පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් සමග ගනුදෙනු**

| | **2013**<br>**රු. 000** | 2012<br>රු. 000 |
|---|---|---|
| ගෙවන ලද සහ ගෙවිය යුතු දායකය | **49,776** | 33,805 |

සටහන් 43 හි දක්වා ඇති පරිදි බැංකුව විසින් විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා විශ්‍රාම සැලසුම්වලට විවිධ මුදල් ප්‍රමාණවලින් දායක වූ අතර රු. මිලියන 426.580 ක් (2012 - රු. මිලියන 147.174) සේවක අර්ථසාධක අරමුදලට ගෙවන ලදී.

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී බැංකුව විසින් ස්වකීය පශ්චාත් සේවා සැළසුම් වලට බැංකු සහ මූල්‍ය සේවා සපයනු ලබයි. එවැනි සැළසුම් වල ශේෂයන් 24 සටහනෙහි දක්වා ඇත.

**47. අසම්භාව්‍ය වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම්**

**47.1 මූල්‍ය ඇප කොන්ත්‍රාත්**

රජයේ හෝ එහි නියෝජිතයන්ගේ සහ ආයතනවල නියෝජිත ලෙස ක්‍රියාකරමින්, මහා භාණ්ඩාගාරය විසින් බැංකුව වෙත නිකුත් කරනු ලබන ප්‍රති ඇප මත විවිධ පාර්ශ්වයන්ට ඇප සපයනු ලැබේ. 2013 දෙසැම්බර් 31 දිනට පරිශේෂ එවැනි ඇප කිසිවක් නොවීය.

**47.2 ණය ඇප**

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ (ප්‍රා.සං.දෙ.) කාර්ය වන්නේ පිටස්තර ණය මාර්ග තුළින් ලැබෙන මුදල් සහභාගි වන ණය දෙන ආයතන මගින් ප්‍රතිමූල්‍යකරණ ණය ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ලබාදීම, එම ව්‍යවසායකයින් සඳහා ණය ඇපවීම් නිකුත්කිරීම, ඇප වාරික රැස්කිරීම, ණය පැහැරහැරීම් මගහැරවීම සඳහා හා එම ණය නිසිපරිදි යෙදවෙන බවට සාක්ෂාත් කර ගැනීම සඳහා ණය ඇපකරු අරමුදල් පරිපාලනය සහ පශ්චාත් ණය

සුපරීක්ෂණයයි. මෙම වැඩපිළිවෙල යටතේ ලබාදුන් ණය සම්බන්ධයෙන් සහභාගි මූල්‍ය ආයතනවලට එරෙහිව විය හැකි පාඩු ආවරණය සැපයීම සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂය තුළ දී අඛණ්ඩව සිදු කරන ලදී. මෙය, ණය පැහැර හැරීම මත ආවරණයක් නොවූ පාඩු සඳහා සහභාගි වන ණය දෙන ආයතනවලට ඇතිවන්නා වූ අලාභ සඳහා කරනු ලබන ආවරණයකි. ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව සිදුවිය හැකි පාඩු පිළිබඳව සහභාගි මූල්‍ය ආයතන විසින් කරනු ලබන ඉල්ලීම් පමණක් සලකා බැලීම මෙහි අර්ථය වේ. මෙම වැඩපිළිවෙල මගින් උද්ගත වන අසම්භාව්‍ය බැරකම් පහත දැක්වේ.

**දේශීය වාණිජ බැංකු - ණය ඇප සඳහා :**

| ණය ඇප | නොපියවා පැවැති ඇප ප්‍රමාණය | |
|---|---|---|
| | **2013** | 2012 |
| | රු. **000** | රු. 000 |
| **සම්බන්ධිත පාර්ශ්වයන්** | | |
| බැංකුවේ යෝජනාක්‍රම | **177,627** | 318,421 |
| රජයේ යෝජනා ක්‍රම | **2,580,748** | 2,166,839 |
| **අනිකුත්** | | |
| බැංකුවේ යෝජනාක්‍රම | **135,803** | 584,615 |
| රජයේ යෝජනා ක්‍රම | **690,295** | 2,997,200 |
| **මුළු ණය ඇප ප්‍රමාණය** | **3,584,473** | 6,067,075 |

### 47.3 විශ්වස්ත ක්‍රියාකාරකම්

මුදල් නීති පනත අනුව බැංකුව විසින් විශ්වස්ත ක්‍රියාකාරකම් කරගෙන යනු ලබයි. ඒ අනුව ක්‍රියාකිරීමේ දී විවිධ පාර්ශ්වයන් සඳහා වත්කම් දැරීම හෝ ස්ථාපනය කිරීම ද කරනු ලැබේ. කෙසේ වුවද එසේ කිරීමෙන් කිසියම් බැරකමක් ඇතිවේ යැයි බැංකුව අපේක්ෂා කරනු නොලැබේ.

### 47.4 නෛතික හිමිකම්

අදාළ ආයතනවල අයිතීන් දරන්නන් විසින් නෛතික පොළිය ද සමග රුපියල් මිලියන 35 ක් සඳහා හිමිකම්පාමින් නීති කෘත්‍යයන් 1 ක් බැංකුව විත්තිකරු ලෙස ගොනු කර ඇත. මෙම නීති කෘත්‍යයන්ට එරෙහිව බැංකුව අභියෝග කරන බැවින් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොමැත. එසේම නෛතික පොළියද සමග සිදු වූ හානි වෙනුවෙන් රු. මි. 9.495 සඳහා හිමිකම් පාමින් නීති කෘත්‍යයන් 3ක් වෙනුවෙන් බැංකුව පැමිණිලිකරු ලෙස ඉදිරිපත් ව ඇති අතර දැනටමත් අවසන් කර ඇති නීති කෘත්‍යයන් 2 කින් රු. මිලියන 2.7 ක් ලැබීමට බැංකුව අපේක්ෂා කරන අතර අදාළ දඩ මුදල සඳහා කිසිදු වෙන් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොමැත. තව ද බැංකුවට එරෙහිව නීති කෘත්‍යයන් ගණනාවක් 2013 දෙසැම්බර් 31 දිනට පරිශේෂව තිබුණි. මේ සම්බන්ධයෙන් සැලකිය යුතු පාඩුවක් බැංකුවට ඇති නොවේය යනු බැංකුවේ මතය බැවින් ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

### 47.5 බැඳීම්

(අ) 2013 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම වෙනුවෙන් රුපියල් මිලියන 7.954 ක් හා ඇ.ඩො.මි. 1.805 (2012 රුපියල් මිලියන 710.887) ප්‍රාග්ධන බැඳීමක් බැංකුව විසින් ඇති කර ගෙන තිබෙන අතර කාසි හා මුදල් නෝට්ටු අත්පත් කර ගැනීම වෙනුවෙන් රුපියල් මිලියන 103.25 ක් සහ ඇ.ඩො. මි. 13.486 ක ප්‍රාග්ධන බැඳීමක් බැංකුව විසින් ඇති කර ගෙන තිබේ.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට කැපීපෙනෙන ඉදිරි හුවමාරු ගණුදෙනු මෙසේය.

| | **2013** | 2012 |
|---|---|---|
| | රු. **000** | රු. 000 |
| **ඉදිරි විනිමය කොන්ත්‍රාත්තු** | | |
| ඉදිරි විනිමය විකුණුම්- එක්සත් රාජධානි පවුම | 139,000 | 35,000 |
| - යූරෝ | 141,000 | - |
| - ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් | 2,337,998 | 1,368,000 |
| **ඉදිරි විනිමය මිලදී ගැනීම්** | | - |
| ශ්‍රී ලංකා රුපියල | - | 25,432,160 |

### 47.6 වත්කම් ඔඩපන කිරීම

සුරැකුම්පත් බේරුම් ක්‍රියාවලිය පහසුකරලීම සඳහා කිසිඳු සුරැකුම්පතක් ඔඩපනය නොකරන ලද අතර (2012 - එක්සත් රාජධානි පවුම් මිලියන 25 - ධාරණ අගය එක්සත් රාජධානි පවුම් මිලියන 25.434 ක්) ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 30 (2012 ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 35) ණය පහසුකම් ලබා ගෙන ඇත. ඔඩපන කරන ලද සුරැකුම්පත් යූරෝ ක්ලියර් හි වෙනම ගිණුමක රඳවා ඇත.

එම සුරැකුම්පත් මූල්‍ය තත්ව ප්‍රකාශනය තුළ 'විකිණීම සඳහා වූ මූල්‍ය වත්කම්' ලෙස ඉදිරිපත් කර තිබේ. "Collateral Agreement Governing Secured Borrowings by participants in the Euroclear System" හා "General Conditions Governing Extensions of credit to participants in the Euroclear System" යන මාර්ග නිර්දේශයන් මත පදනම් වී එකී ගණුදෙනු බැංකුව විසින් හසුරවනු ලැබේ.

### 47.7 සවරින් රෙසිඩන්සි සඳහා වූ අසම්භාව්‍ය වගකීම

බැංකුවේ මූල්‍ය මණ්ඩලය හා එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම විසින් සවරින් රෙසිඩන්සි පාලනය කිරීම සඳහා වූ බදු කුලී ගිවිසුමකට එළඹ තිබුණු අතර එහි දී බදු ගැනුම්කරු විසින් කරනු ලබන ආයෝජන/වැඩිදියුණුකිරීම් දෙපාර්ශවයම විසින් සටහන් කළ යුතු බවට එකඟ වී ඇත. ඒ ගිවිසුම අනුව යම් හෙයකින් බැංකුව එම බදු ගිවිසුමෙන් ඉවත් වුවහොත් එම ආයෝජනය සඳහා එම පවත්නා වර්ෂයේ එකඟ වූ අනුපාතිකයන්ට වූ ගෙවීමක් බදු ගැනුම්කරුට ගෙවිය යුතුය. ඒ අනුව 2013 වර්ෂයේ දී පස්වන මෙහෙයුම් වර්ෂය සඳහා සියයට 30ක් වූ රුපියල් මිලියන 13.159 (2012 - රුපියල් මිලියන 15.352) අසම්භාව්‍ය වගකීමක් ඇස්තමේන්තු කර ඇත.

### 47.8 බැඳුම්කර ණයට ගැනුම්

දින 30 කොමිස් පදනමකට යටත්ව මුහුණත් අගය රු. මිලියන 79,500 ක බැඳුම්කර බැංකුව විසින් දෙසැම්බර් මාසය තුළ සේවක අර්ථසාධක අරමුදලින් ණයට ගෙන ඇත.

මෙම බැඳුම්කර Repo පහසුම් සඳහා යොදා ගෙන ඇති අතර මුහුණත් අගය රු. මිලියන 5,940.023 ක් වූ (වෙළෙඳ අගය රු. මිලියන 3,593.676) බැඳුම්කර 2013 දෙසැම්බර් 31 දිනට වෙන් නොකර Repo පහසුකකම් සඳහා ඉතිරිව පැවතුණි.

**48. භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්**

බැංකුව සාමාන්‍යයෙන් භාරකරුවන් ලෙස සහ අන් විශ්වසනීය තත්ත්වයන්හි කටයුතු කිරීම මඟින්, රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සිදු කරනු ලැබේ. බැංකුව විසින් ඉටු කරනු ලබන සැලකිය යුතු භාර ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ.

අ) ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ර) වෙනුවෙන් විවිධ විදේශීය ණය, විදේශ අරමුදල් යොදන සංවර්ධන ව්‍යාපෘති සහ ණය යෝජනා ක්‍රම සඳහා වැය පියවීම් සහ ආපසු ගෙවීම් බැංකුව විසින් කරනු ලැබේ. තවද ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විවිධ විදේශීය ණය සහ ප්‍රදානයන් යටතේ ප්‍රතිරූපක අරමුදල් රැස්කර ප්‍රදානය කරන නියෝජිත ආයතනයන්ගේ ඉල්ලීම පරිදි එම අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරනු ලැබේ.

ආ) බැංකුව සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ) භාරකාරත්වය උසුලයි. පනතේ විධි විධාන ප්‍රකාර දායක මුදල්, අධිභාර, ආයෝජනවලින් ආදායම ලබා ගැනීම, සේ.අ. අරමුදලේ ලියාපදිංචි සාමාජිකයන්ගේ ගිණුම් පැවැත්වීම, අතිරික්ත මුදල් ආයෝජනය සහ සාමාජිකයින්ට ප්‍රතිලාභ ගෙවීම මුදල් මණ්ඩලයේ කාර්යයන්ට ඇතුළත් වන්නේය.

ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවේ බලපත්‍ර ලත් බැංකු ආයතන සහ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි, බැංකු ව්‍යාපාරයෙහි යෙදී සිටින සමුපකාර සමිතිවලට විවෘතව ඇති ස්වෙච්ඡා තැන්පත් රක්‍ෂණය යෝජනා ක්‍රමයක් වන තැන්පතු රක්‍ෂණ යෝජනා ක්‍රමය බැංකුව විසින් පරිපාලනය කර ඇත. 2010 ඔක්තෝබර් 01 දා සිට එම අරමුදල්, 2010 සැප්තැම්බර් 28 දාතම, ගැසට් අංක 1673/11 යටතේ පිහිට වූ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයට පවරා ඇත.

ඈ) ලියාපදිංචි මූල්‍ය සමාගම් විධිමත් කිරීම හා සුපරීක්ෂණ කිරීම බැංකුව විසින් කරගෙන යනු ලබයි. එහිදී මුදල් මණ්ඩලය විසින් නියෝජනය කරන ලද බලතල ප්‍රකාර, අදාල විෂය කරුණුවලට සම්බන්ධව සොයා බලනු ලැබේ. එසේ ක්‍රියාකිරීමේ දී ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් ලෙස එම ස්වශක්තිතාවයන් නොමැති හා බුන්වත් වූ මූල්‍ය සමාගම්වල වගකිවයුතු පුද්ගලයන් ගේ වත්කම් මුදල් මණ්ඩලය වෙත පවරාගැනීම ද කරනු ලබයි.

ඉ) 2010 සැප්තැම්බර් 28 දාතම වූ 1673/11 අංක දරණ ගැසට් පත්‍රය අනුව 2010 ඔක්තෝබර් 01 දා සිට බැංකුව විසින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය නමින් පාලිත තැන්පතු රක්ෂණ ක්‍රමයක් ජාතික අවශ්‍යතාවයේ කාර්යයක් ලෙස තැන්පත්කරුවන්ගේ අරමුදල් ආරක්ෂාව වෙනුවෙන් පිහිටුවා ඇත.

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු හා ලියාපදිංචි මූල්‍ය සමාගම් මෙම යෝජනා ක්‍රමයේ සාමාජිකයන් වේ. ගැසට් පත්‍රයේ 5.2 වගන්තිය අනුව විශේෂිත අතහැරීම් සේ රක්ෂණය කර ඇති සියලුම ණය හැර සමාප්ත ආයතනයන්හි ඉල්ලුම් තැන්පතු, කාලීන තැන්පතු සහ ඉතිරිකිරීමේ තැන්පතු වගකීම් රක්ෂණය කෙරේ.

රුපියල් මිලියන 331.653 ක් වූ ස්වෙච්ඡා තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමයෙහි ආයෝජන හා රුපියල් මිලියන 282.337 ක් වූ වාණිජ බැංකුවල අත්හල දේපළ තුළින් කරන ලද ආයෝජන පැවරීමෙන් මෙම තැන්පතු රක්ෂණ අරමුදල නිමවා ඇත. තැන්පතු වටිනාකම රුපියල් මිලියන 0.2 ඉක්මවුවත්, තැන්පතු හිමියෙකුට ගෙවන වන්දි මුදල රුපියල් මිලියන 0.2 හෝ විදේශ විනිමය තැන්පතු සඳහා ඊට සමාන මුදලකි.

වන්දි ගෙවීම බැංකුවේ හෝ මුදල් මණ්ඩලයේ වගකීමක් නොවන අතර, පවතින අරමුදල් ප්‍රමාණයට වන්දි මුදල සීමාවේ. නැතහොත් අවසරලත් ණය ගැනීම් හා ලැබුණු දායක මුදල්වලින් තැන්පතු රක්ෂණ අරමුදල ඉහළ දැමිය හැකිය. අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය ඉක්මවා යන කිසිදු වගකීමකට මුදල් මණ්ඩලය හා ශ්‍රී ලංකා මහ බැංකුව වගකියනු නොලැබේ.

යෝජනා ක්‍රමයේ මෙහෙයුම් හා කළමනාකරණ කටයුතු, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති ඒකකය මගින් සිදුකරන අතර, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලින් වෙන්වූ පොත් හා ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. විගණනය භාරව විගණකාධිපති කටයුතු කරයි.

මෙම යෝජනා ක්‍රමය 2013.11.22 වන දින සිට 'ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල' ලෙස නැවත නම් කරන ලදී.

ඊ) බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද චක්‍රලේඛනය අනුව, කෘෂිකාර්මික කටයුතු සඳහා මුළු අත්තිකාරම්වලින් 10% ක අවමය පවත්වාගෙන නොමැති බැංකු එම හිඟ මුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව (ප්‍රා.සං.දෙ.) විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රතිමූල්‍ය අරමුදලට දායක කළ යුතු වේ. ප්‍රා.සං.දෙ. එසේ එකතු කළ මුදල් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව තුළින් කෘෂිකාර්මික කටයුතු සඳහා "විස්කම්" ප්‍රතිමූල්‍ය ක්‍රමය යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් සපයනු ලැබේ. 2013 දෙසැම්බර් 31 දිනට එසේ රැස්කළ මුළු මුදල රුපියල් මිලියන 390.686 (2012 - 641.433) කි. වර්ෂය අවසන් දින ප්‍රාදේශීය සංවර්ධන දෙපා. විසින් රු. මි. 555.071 මුදලක ණය ලබා දී ඇති අතර එමගින් රු. මි. 57.604 පොළී ආදායමක් උපයන ලදී. වර්ෂය අවසන් දිනට ප්‍රා.සං.දෙ. ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය යටතේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, රුපියල් මිලියන 49.105 (2012 - 4.117) ක රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇත. තවද රුපියල් මිලියන 188.178 (2012 රු.මි. 188.067) ක් එම ආයෝජනවල ආදායම ලෙස උපයා ඇත.

උ) බැංකුවේ මුදල් මණ්ඩලය වෙනුවෙන්, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, විදේශීය දායකයන්ගේ හා ශ්‍රී ලංකා රජය අරමුදල් සපයන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා රජයේ විශේෂිත නියෝජිතයෙකු ලෙස කටයුතු කරයි. තව ද ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ව්‍යාපෘතිද ක්‍රියාවට නැංවීම ඉටු කරයි.

## නිමකර අවසන් ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වැදගත් ලක්ෂණ | වගකීම් හා සහතික වීම් | පොදු කොන්දේසි | විශේෂ කොන්දේසි |
|---|---|---|---|---|---|---|---|---|
| තේ සංවර්ධන ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 24.50 | කුඩා පරිමාණ තේ වතු හිමියන්ගේ ආදායම වැඩිකිරීම හා ව්‍යාපෘති කලාපවල ස්වභාවික පරිසරය සංවර්ධනය | 2,550.90 | | | | |
| බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 11.56 | බහු වාර්ෂික භෝග අංශය වාණිජ්‍යකරණය, නිෂ්පාදන වැඩි දියුණු කිරීම, තවාන් සංවර්ධනය, පසු අස්වනු පාලනය, සැකසීම හා අලෙවිකරණය | 1,453.11 | | | | |
| වැවිලි අංශය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 40.00 | ශ්‍රී ලංකාවේ තේ භෝග කර්මාන්තයේ තේ භෝග අනු අංශ වල ප්‍රතිපත්ති හා ආයතනමය ප්‍රතිසංස්කරණ වලට සහාය දීම, නිෂ්පාදනය හා ලාභදායිත්වය වැඩිදියුණු කිරීම, තරඟකාරී වාසිය පවත්වා ගැනීම | 5,200.00 | | | | |
| සුසහන මූල්‍ය හා කල්බදු සමාගම | රුපියල් | 352.69 | සුනාමියෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාරිකයන් නැවත නගා සිටුවීම | 351.06 | | | | |
| කුඩා ව්‍යාපාර නගා සිටුවීමේ වැඩසටහන | රුපියල් | 2,656.00 | සුනාමියෙන් බලපෑමට ලක්වූ කුඩා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් නැවත නගා සිටුවීම | 2,663.40 | | | | |
| කුඩා ව්‍යාපාර නගා සිටුවීමේ වැඩසටහන නගා සිටුවීමේ චක්‍රිය අරමුදල | රුපියල් | 150.00 | සුනාමිය මගින් බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් නැවත ආරම්භ කිරීම | 122.72 | නියමිත දිනට සහභාගීත්ව මූල්‍ය ආයතනවලින් ප්‍රතිමූල්‍ය එක්රැස් කිරීම සහ අවසානයේදී නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් වෙත මාරු කිරීම | වගකීම් හා සහතිකවීම් නැත | මූල්‍ය ප්‍රකාශන භාහිර විගණකයින් විගණනය කළයුතුය | අදාල සියලුම පාර්ශවයන්ගේ එකගතාව ගිවිසුමේ අයිතිවාසිකම්, බැලීම, පැවරීම, සංශෝධනය, අහෝසි කිරීම හෝ අතපාර ඇඹීම සිදුකරනු නොලැබේ |
| හැකියා සංවර්ධන ව්‍යාපෘතිය | රුපියල් | 94.31 | ගුණත්වයෙන් අනූන ශ්‍රම බලකායක් බිහි කිරීම සඳහා අවශ්‍ය හැකියා පුහුණු වැඩසටහන් වල අදාලත්වය තත්වය වැඩිදියුණු කිරීම හා හැකියා නොගැලපීම ආමන්ත්‍රණය කිරීම | 94.59 | | | | |
| නාගරික පාරිසරික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.ඩොලර් | 4.00 | නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ පාරිසරික සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වර්ධනය කිරීම | 369.15 | | | | |
| නිවාස ණය ඇපකර අඩු ආදායම් නිවාස ආවරණ ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 25.00 | රටේ අඩු ආදායම්ලාභී ජනතාවට ආධාර කිරීමට නිවාස ගොඩනැගීම අළුත්වැඩියාව සහ ඔවුන්ගේ වාසස්ථාන ව්‍යාප්ත කිරීම. | 1,362.00 | | | | |
| නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය | වි.ගැ.හි | 15.10 | අඩු ආදායම් කුටුම්භ වල නිවාස සංවර්ධනයට ආධාර කිරීමක් වශයෙන් ප්‍රාග්ධනය සපයා දීම | 1,915.76 | | | | |
| වයඹ පලාත් ජලසම්පත් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 1.80 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශවල මිනිසුන්ගේ ආර්ථික, සමාජීය හා පෝෂණ ශුභ සාධනය වැඩි දියුණු කිරීම. | 102.76 | | | | |
| මාතලේ ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 2.00 | කුඩා ව්‍යවසායකයින්ගේ ආදායම් වර්ධනය ස්ථිරකිරීම හා චිරස්ථායි කිරීම | 249.06 | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| රට මැද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 11.56 | රට මැද බහුවාර්ෂික භෝග නිෂ්පාදනය නගා සිටුවීමට ණය පහසුකම් සැලසීම | 642.00 | නියමිත දිනට සහභාගීත්ව මූල්‍ය ආයතනවලින් ප්‍රතිමූල්‍ය එක්රැස් කිරීම සහ අවසානයේදී නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් වෙත මාරු කිරීම | වගකීම් හා සහතිකවීම් නැත | මූල්‍ය ප්‍රකාශන භාහිර විගණකයින් විගණනය කළයුතුය | අදාල සියලුම පාර්ශවයන්ගේ එකගතාව ගිවිසුමේ අයිතිවාසිකම්, බැළීම්, පැවරීම්, සංශෝධනය, අහෝසි කිරීම හෝ අතපාර දැමීම සිදුකරනු නොලැබේ |
| කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය. | වි. ගැ. හි. | 17.05 | සිවිල් අර්බුද වල බලපෑමට ලක්වූ උතුරු නැගෙනහිර පළාත් හා මායිම් දිස්ත්‍රික්ක පහ තුළ පවතින මිනිස් ජීවිත හා දේපල නැවත නගා සිටුවීම | 843.00 | | | | |
| කුඩා තේ වතු හිමියන් සංවර්ධන ව්‍යාපෘති | ඇ. ඩොලර් | 12.60 | කුඩා තේ වතු හිමියන් සංවර්ධනය කිරීම හා තේ වතු පහසුකම් පුනරුත්ථාපනය කිරීම | 645.93 | | | | |
| දිළිඳු බව පිටුදැකීමේ ක්‍ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය | ජපන් යෙන් | 1,155.50 | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා විධිමත් ලෙස ණය යොමු කිරීමට ඵලදායී ණය බෙදාහැරීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම | 1,031.28 | | | | |
| ඉඩම් අහිමි කුඩා පරිමාණ ගොවි ණය ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 17.40 | අඩු ආදායම් ලබන්නන් සඳහා රැකියා උත්පාදනය කිරීමටත්, ඉතිරිකිරීමේ පුරුදු වර්ධනයටත් පිරිවැය ඵලදායී සහ ශක්තිමත් ක්ෂුද්‍ර ණය බෙදැහැරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම | 345.69 | | | | |
| කෑගල්ල සමෝධාන ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 1.50 | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රහය ලබාදීම මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශ වල මිනිසුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම | 148.00 | | | | |
| දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 27.90 | දකුණු පළාත් මිනිසුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම | 564.00 | | | | |
| ඉදිකිරීම් අංශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | යූරෝ | 9.00 | පසු සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු වලදී ඉදිකිරීමේ හා රජයේ කටයුතු සඳහා සක්‍රීයව සහභාගී වීම සඳහා දේශීය පෞද්. ව්‍යාපාර වල මූල්‍ය හා තාක්ෂණික ශක්‍යතා ශක්තිමත් කිරීම. | 1,399.73 | | | | |
| වියළි කලාපීය ජීවන වියන සහයෝගීතා හා හවුල්කාර වැඩසටහන | රුපියල් | 252.95 | අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල හා බදුල්ල යන දිස්ත්‍රික්ක වල ආදායම් ජනිත කිරීමේ කටයුතු සඳහා පහසුකම් සැලසීම | 252.95 | | | | |
| දෙවන බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘති චක්‍රීය අරමුදල | රුපියල් | 1,200.00 | රට තුල බහුවාර්ෂික භෝග අංශයට ණය පහසුකම් සපයා දීම | 1,200.00 | | | | |
| මාතලේ ප්‍රාදේශිය ආර්ථික වැඩිදියුණු කිරීමේ චක්‍රීය අරමුදල | රුපියල් | 77.00 | ග්‍රාමීය ගොවි පවුල් වල ආදායම වර්ධනය, ගොවි නොවන ව්‍යවසාය සංවර්ධනය සඳහා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව අරමුදල් සම්පාදනය හා මාතලේ දිස්ත්‍රික්කයේ පවත්නා ව්‍යාපෘති ප්‍රසාරණය | 77.00 | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| සබරගමු පළාත් ග්‍රාමීය සමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල | රුපියල් | 100.00 | සබරගමු පළාතේ නව ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා වැඩිදියුණු කිරීම | 100.00 | | | | |
| සබරගමු පළාත් ග්‍රාමීය සමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය (අදියර II) | රුපියල් | 70.00 | සබරගමු පළාතේ නව ආදායම් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා වැඩි දියුණු කිරීම | 70.00 | | | | |
| EIB ගිවිසුම් B | යූරෝ | 10.00 | සුනාමි මගින් සෘජු බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායනයන් නැවත නගා සිටුවීම | 1,553.27 | | | | |
| විස්කම් (කෘෂිකර්මික අංශය සංවර්ධනය සඳහා වූ විශේෂ ණය යෝජනා ක්‍රමය) | රුපියල් | 1,325.60 | ආයෝජන සඳහා ණය පැවැතීම තහවුරු කර ගැනීම, විවිධාංගිකරණය සහ වාණිජ කෘෂි ව්‍යාපාර ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම (වාණිජ කෘෂි ව්‍යාපාර ක්‍රියාකාරකම් සංවර්ධනය) | 882.01 | සහභාගීත්ව බැංකු විසින් අනිවාර්ය අවශ්‍යතා සම්පූර්ණ කළ පසු අරමුදල් නැවත ලබාදීම | | | |
| සුසහන ණය යෝජනා ක්‍රමය | රුපියල් | 3,000.00 | සුනාමියෙන් හානි වූ කුඩා හා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ණය පහසුකම් ප්‍රතිපාදනය | 2,750.00 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට මූල්‍ය දෙපාර්තමේන්තුවට මාරු කල යුතුය | | | |
| සුසහන II | රුපියල් | 500.00 | සුනාමියෙන් හානි වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ණය පහසුකම් ප්‍රතිපාදනය | 105.54 | | | | |
| පළාත්බද සංවර්ධන ණය යෝජනා ක්‍රමය | රුපියල් | 2,900.00 | රට තුල කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ මධ්‍ය හා දිගුකාලීන ව්‍යාපෘති සඳහා ණය පහසුකම් සැලසීම | 2,900.00 | | | | |
| පිබිදෙන උතුර | රුපියල් | 2.000.00 | උතුරු පළාත් තුළ කෘෂිකාර්මික, පශු සම්පත්, ක්ෂුද්‍ර ව්‍යාපාර හා කුඩා ව්‍යාපාර සහ අංශ සඳහා ණය පහසුකම් දීර්ග කිරීම | 2.000.00 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අදාල ගිණුම්වලට මාරු කිරීම් | | | |
| නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු පුනරාරම්භය | රුපියල් | 1,000.00 | නැගෙනහිර පළාත තුල වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය පහසුකම් ප්‍රධානය කිරීම | 1,000.00 | | | | |
| නැගෙනහිර පළාත් තුල ආර්ථික කටයුතු ප්‍රතිශ්ඨාපනය කිරීම අදියර - II | රුපියල් | 1,000.00 | නැගෙනහිර පළාත තුල කෘෂිකාර්මික හා පශු සම්පත් ක්ෂුද්‍ර ව්‍යාපාර හා කුඩා ව්‍යාපාර සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම. | 1,000.00 | | | | |

## ඉදිරියට යන ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වැදගත් ලක්ෂණ | වගකීම් හා සහතික වීම් | පොදු කොන්දේසි | විශේෂ කොන්දේසි |
|---|---|---|---|---|---|---|---|---|
| තේ සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 1,100.00 | තේ අංශය සංවර්ධනය සඳහා ණය පහසුකම් සපයාදීම. | 925.44 | නියමිත දිනට සහභාගීත්ව මූල්‍ය ආයතනවලින් ප්‍රතිමූල්‍ය එක්රැස් කිරීම සහ අවසානයේදී නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් වෙත මාරු කිරීම | | | |
| ස්වයං රැකියා ප්‍රවර්ධන මුලික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 250.00 | රටතුල පිළිගත් වෘත්තිය පුහුණු ආයතන වලින් සමත් පුහුණු තරුණ, තරුණියන්ට ඔවුන්ගේ ස්වයං රැකියා ව්‍යාපෘතිය ගොඩනගා ගැනීමට මුල්‍ය සහනාධාර සැපයීම. | 153.37 | | | | |
| කුඩා පරිමාණ වැවිලි ව්‍යවසායකයින් සංවර්ධනය කිරිමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 1.75 | නුවර එළිය, මහනුවර, කෑගැල්ල, මොණරාගල දිස්ත්‍රිකවල අඩු ආදයම් ලාභීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම. | 249.63 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අදාල ගිණුම්වලට මාරු කිරීම් | | | |
| දිළිදුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මුල්‍ය ව්‍යාපෘතිය (ප්‍රබෝධනී) | ජපන් යෙන් | 2,100.00 | ව්‍යාපෘති ප්‍රදේශයේ සිටින මාසික ආදායම රු. 15,000 ට වඩා අඩු පවුල්වල ජීවන තත්වය වර්ධනය කිරිම. | 2,880.07 | | | | |
| දිළිදුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මුල්‍ය ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල | රුපියල් | 1,901.62 | ව්‍යාපෘති ප්‍රදේශයේ සිටින මාසික ආදායම රු. 15,000 ට වඩා අඩු පවුල්වල ජීවන තත්වය වර්ධනය කිරීම. | 956.07 | | | | |
| පසු සුනාමි වෙරල බඩ පුනරුත්ථාපන සම්පත් කළමණාකරණ ව්‍යාපෘතිය | රුපියල් | 190.80 | සුනාමියේ බල පෑමට ලක් වූ ජනතාවගේ වත්කම් නැවත ලබා ගැනීම, ඔවුන්ගේ දෛනික ආර්ථික කටයුතු සඳහා වූ පදනම දැමීම හා ආදායම් උත්පාදන මාර්ග විවිධාංගීකරණය කිරීම සඳහා විම. | 190.77 | | | | |
| සුළු ගොවියන් හා ඉඩම් අහිමි වුවත් සඳහා වන ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 345.69 | අඩු ආදායම් ලාභින් අතර රැකියා ඇති කිරීමටත් ඉතුරුම් පුරුදු ඇති කිරීමටත් පිරිවැය ඵලදායි සහ තිරසාර ක්ෂුද්‍ර ණය ලබා දිමේ පද්ධතියක් ස්ථාපනය කිරීම. | 1,025.24 | | | | |
| වියලි කලාපීය ජීවන වියන සහයෝගීතා හා හවුල්කාර වැඩසටහන - චක්‍රීය අරමුදල | රුපියල් | 252.95 | කුඩා ගොවීන්ගේ කාෂිකාර්මික නිෂ්පාදනයන් ඉහල නැංවීමට අනුග්‍රය දැක්වීම හා කුඩා පරිමාණ ග්‍රාමීය නොගොවි ව්‍යාපාර පිහිටු වීම. | 123.43 | | | | |
| දිළිදුකම පිටුදැකිමේ ක්ෂුද්‍ර මුල්‍ය ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල | රුපියල් | 1,031.28 | ව්‍යාපෘති කාලාපය තුල මාසික ආදායම රු. 15,000 ට අඩු කුටුම්භයන්හි ජීවන තත්වය ඉහල නැංවීම | 2,529.78 | | | | |
| සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය | රුපියල් | 7,960.00 | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හා ව්‍යසනයන්ගෙ න් හානි වු කුඩා ව්‍යාපාර යන අංශ සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම. | 7,959.00 | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| පිබිදෙන උතුර අදියර II | රුපියල් | 2,000.00 | උතුරු පළාත් තුළ කෘෂිකාර්මික පශු සම්පත් ක්ෂුද්‍ර ව්‍යාපාර හා කුඩා ව්‍යාපාර යන අංශ සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම | 1,438.26 | | | | |
| නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු ප්‍රතිෂ්ඨාපනය කිරීම II | රුපියල් | 1,000.00 | නැගෙනහිර පළාත තුළ කෘෂිකාර්මික, පශු සම්පත්, ක්ෂුද්‍ර ව්‍යාපාර හා කුඩා ව්‍යාපාර යන අංශ සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම. | 428.43 | | | | |
| උතුරු හා නැගෙනහිර හානි නිවාස ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන | රුපියල් | 600.00 | ගැටුම් පැවති කාලසීමා තුළ නැගෙනහිර හා උතුරු පළාත්වල හානියට පත් වූ නිවාස ප්‍රතිසංස්කරණය සඳහා ණය පහසුකම් සැපයීම | 295.51 | | | | |
| ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය | රුපියල් | 200.00 | ශ්‍රී ලංකා හස්ත කර්මාන්තයේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සැපයීම | 200.00 | | | | |
| ජාතික කෘෂි ව්‍යාපාර වැඩසටහන සංවර්ධනය | ඇ. ඩොලර් | 32.90 | වෙළෙඳපොළ තුළ වටිනාකම්දාම තුළ සිට ප්‍රයෝජනලාභීන්ගේ ආදායම් ඉහළ නැංවීම මගින් සුළු ඉඩම් හිමි නිෂ්පාකයින් හා ඉඩම් අහිමි වූවන් විශේෂයෙන් යෞවනයන්ට සපයාදීම හා ආදායම් ඉහළ නැංවීම | 113.13 | | | | |

### 49. අනෙකුත් ආයතන වෙත ඇති බැඳියාව

සුසහන, සුසහන අදියර 2, පළාත් සංවර්ධන ණය ක්‍රම සඳහා බැංකුව විසින් අරමුදල් සපයා ඇති අතර, ප්‍රාග්ධන ශේෂය හා හිඟ පොලී බැංකුවේ වත්කම් ලෙස වාර්තා කර ඇති අතර ආදායම බැංකුවේ ආදායම ලෙස සලකා ඇත. තව ද පරිපාලන වියදම් ආවරණය සඳහා ශ්‍රී ලංකා රජයේ ඇතැම් මුදල්වලින් ප්‍රකාශිත ප්‍රතිශතයක් බැංකුව විසින් උපයයි.

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා වූ බැංකුව විසින් නිකුත් කරන ලද ණය ඇපකර මත හටගත් අසම්භාව්‍ය වගකීම් සටහන් අංක 47.2 හි හෙළිදරව් කර ඇත.

### 50. ශේෂ පත්‍ර දිනට පසු ඇති වූ සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමක් හෝ හෙළිදරව් කිරිමක් අවශ්‍ය වන කිසිදු ප්‍රමාණාත්මක සිදුවීමක් ශේෂ පත්‍ර දිනට පසු ඇති නොවීය.

## 2. බැංකු අධීක්ෂණ

මුදල් නීති පනතේ 28 වැනි වගන්තියට අනුව, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට බැංකුවල අඛණ්ඩ අධීක්ෂණ හා කාලීන පරීක්ෂා කිරීම් සඳහා බලය පැවරී ඇත. ඒ අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු අධීක්ෂණය සහ නියාමනය කිරීමට, රෙගුලාසි බලාත්මක කිරීමට සහ දුර්වල බැංකු සම්බන්ධයෙන් පවතින අර්බුද නිරාකරණය කිරීමට මුදල් මණ්ඩලයට, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට සහ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ නිලධාරීන්ට 1988 අංක 30 දරන බැංකු පනතෙහි හා මුදල් නීති පනතෙහි විධිවිධාන ප්‍රකාරව බලය පවරා ඇත. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකුවලට හා බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට ඇතැම් කටයුතු කරගෙන යාම සඳහා මුදල් මණ්ඩලයේ හෝ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. බැංකු පනතේ විධිවිධානවලට අනුව බැංකු සඳහා නව බලපත්‍ර, විචක්ෂණශීලී නියාමන, නිර්ණයන් හා වෙනත් උපදෙස් නිකුත් කිරීම ද මුදල් මණ්ඩලය විසින් සිදුකරනු ලැබේ. බැංකු අංශයෙහි ස්ථායීතාව තහවුරු කිරීමේ අරමුණු පෙරදැරිව බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව අඛණ්ඩ අධීක්ෂණ හා කාලීන පරීක්ෂා කිරීම් මඟින් බැංකු අංශයෙහි අභියෝග වලට මුහුණ දීමට අවශ්‍ය වර්ධනාත්මක ව්‍යාපාර පරිසරය සකස් කිරීම හා බැංකු අංශය කෙරෙහි මහජන විශ්වාසය වර්ධනය කිරීමට නියාමන රාමුව ශක්තිමත් කිරීම සිදුකරනු ලබයි. බැංකු අධීක්ෂණය සඳහා පදනම් වී ඇත්තේ බැංකු අධීක්ෂණය සඳහා වන බාසල් කමිටුව මඟින් සම්පාදිත අන්තර්ජාතිකව පිළිගත් බැංකු අධීක්ෂණ ප්‍රමිතීන්ය.

**2.1** 2013 වසර අවසන් වනවිට ශ්‍රී ලංකාවේ බැංකු අංශය, බලපත්‍රලාභී වාණිජ බැංකු 24 කින් හා බලපත්‍රලාභී විශේෂිත බැංකු 9 කින් සමන්විත විය. මෙම බැංකුවල නම්, ඇමුණුම II-1 හි සපයා ඇත. 2013 වසර තුළදී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත දක්වා ඇත.

### 2.1.1. විචක්ෂණ නියාමනයන් නිකුත් කිරීම

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විචක්ෂණ නියාමනයන් මෙම වාර්තාවේ III වැනි කොටසෙහි දක්වා ඇති අතර, ප්‍රධාන විචක්ෂණ නියාමනයන්හි සාරාංශයක් පහත දක්වා ඇත.

(අ) **බලපත්‍රලාභී බැංකුවල වාර්ෂික විගණනය කරන ලද ගිණුම් සැකසීම, ඉදිරිපත් කිරීම සහ ප්‍රකාශයට පත්කිරීම හා කාර්තුමය මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත්කිරීම:** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (IAS) අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිතිවලට (IFRS) අනුගත කිරීම හේතුවෙන් මූල්‍ය වාර්තාකරණයේ සිදුවෙමින් පවතින වෙනස්වීම් සැලකිල්ලට ගෙන බලපත්‍රලාභී බැංකුවල වාර්ෂික විගණනය කරන ලද ගිණුම් සැකසීම, ඉදිරිපත් කිරීම සහ ප්‍රකාශනය කිරීම හා කාර්තුමය මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත්කිරීම සඳහා නව ආකෘතීන් හඳුන්වා දෙන ලදී.

(ආ) **බලපත්‍රලාභී බැංකුවල කොටස් වෙළෙඳපොළ නිරාවරණයවීම් සඳහා වන අවදානම් කළමනාකරණ ප්‍රමිති:** කොටස් වෙළෙඳපොළට වන නිරාවරණයවීම් හේතුවෙන් බැංකු වෙත පැන නැගිය හැකි අවදානම් අවම කිරීම සඳහා සුදුසු අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති පිහිටුවන ලෙස සියලුම බලපත්‍රලාභී බැංකු වෙත උපදෙස් ලබාදෙන ලදී. අදාළ අවදානම් කළමනාකරණ ප්‍රමිති සහ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට ප්‍රථම බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒවා අනුමත කළයුතු බවටත්, ඒවාට අදාළ තොරතුරු පදනම් කර ගනිමින්, එම ප්‍රමිති සහ ප්‍රතිපත්ති නිරන්තර ඇගයීමට ලක්කළ යුතු බවටත් උපදෙස් දෙන ලදී.

(ඇ) **නිශ්චල දේපළ විකිණීම, හුවමාරු කිරීම, පැවරීම හෝ ඉවත් කිරීම සම්බන්ධයෙන් පවතින සීමාවන්:** මුදල් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් සතු නිශ්චල දේපළ එහි වෙළෙඳපොළ වටිනාකමට වඩා අඩු අගයකට විකිණීම, හුවමාරු කිරීම, පැවරීම හෝ ඉවත් කිරීම ද, එවැනි වත්කමක අගය එහි වෙළෙඳපොළ වටිනාකම ඉක්මවන වටිනාකමක් දක්වා ඉහළ නැංවීම ද වළකාලමින් පැවති පූර්ව විධානයන් සංශෝධනය කර බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය යටතේ එම කාර්යයන් සිදුකිරීමට බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට අවසර ලබාදෙන ලදී.

(ඈ) **ද්‍රවශීල වත්කම්හි නිර්වචනය:** බැංකු විසින්, ස්වර්ණපත්‍ර ඒකක භාරයන් හි සහ ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයන් හි සිදුකර ඇති ආයෝජනයන්, කොන්දේසි වලට යටත්ව, අදාළ බැංකුවල ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතිකය ගණනය කිරීමේ දී ද්‍රවශීල වත්කම් ලෙස සැලකිය හැකි බව නිර්ණය කරන ලදී.

(ඉ) **ආයතනික යහපාලනය:** විශේෂිත ව්‍යාපාරික ඒකකයක වුවද, වෙනත් සමාගමක වුවද, අධ්‍යක්ෂකවරයකු විසින් දැරිය යුතු වගකීම්වල නොවෙනස් බව සලකා, බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂකවරයකු ලෙස කටයුතු කිරීමට සුදුසුකම් ලැබීම සඳහා, විශේෂිත ව්‍යාපාරික ඒකක ලෙස වර්ගීකරණය කර ඇති ආයතන 10 කට වැඩි සංඛ්‍යාවක අධ්‍යක්ෂකවරයකු ලෙස කටයුතු නොකළ යුතු බව දක්වමින් පැවති සීමාවන් ඉවත් කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු සඳහා පවත්නා යහපාලනය පිළිබඳ විධානයන් සංශෝධනය කරන ලදී.

(ඊ) **බලපත්‍රලාභී වාණිජ බැංකුවල විදේශ ණය ගැනීම:** 2013 අයවැයෙහි යෝජනා ක්‍රියාවට නැංවීමට පහසුකම් සැලසීමේ අරමුණින්, 2013-2015 දක්වා කාලසීමාව තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ලබාගන්නා විදේශ ණය එ.ජ. ඩොලර් මිලියන 50 ක් දක්වා සහ නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. සඳහා එ.ජ. ඩොලර් මිලියන 250 ක් දක්වා වන විදේශ ණය

ලබාගැනීමට අවසර ලබාදෙන ලදී. තවදුරටත්, උක්ත අරමුදල් උපයෝගීකර ගනිමින් කෘෂිකාර්මික නොවන අංශයන් වෙත අදාළ බැංකු විසින් ලබාදෙන ණය පහසුකම්, කෘෂිකාර්මික අංශය සම්බන්ධයෙන් වන අනිවාර්ය ණය පහසුකම් ගණනය කිරීමේ දී නිදහස් කරන ලදී.

(ඍ) **ආයෝජන අරමුදල් ගිණුම:** ආයෝජන අරමුදල් ගිණුමෙහි භාවිතයන් පුළුල් කිරීම හරහා එමගින් අඩු පිරිවැය නිවාස ඉදිකිරීම් ඉලක්ක කොටගත් නිවාස සංවර්ධන ව්‍යාපෘති, තිරසාර බලශක්ති ප්‍රභවයන්හි සිදුකරන ආයෝජන සහ කාන්තා ව්‍යවසායකත්ව ව්‍යාපාර ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ණය සහ අත්තිකාරම් ලබාදීමට අවසර දෙන ලදී.

(ඎ) **කෘෂිකාර්මික අංශයට අනිවාර්ය ණය දීම:** කෘෂිකාර්මික අංශය සඳහා වන අනිවාර්ය ණයදීම් සම්බන්ධයෙන් පැවති උපදෙස් පහත සඳහන් දෑ අන්තර්ගත කරමින් සංශෝධනය කරන ලදී.

(i) දේශීය කෘෂිකාර්මික නිමැවුම් භාවිතා කරමින් නිෂ්පාදන ව්‍යාපාරවල නියුතු සමාගම් සහ කෘෂිකාර්මික අංශයේ අතරමැදිකරණයේ නියුතු ආයතනවලට බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය පහසුකම් ඉහත වර්ගීකරණය සඳහා ඇතුළත් කිරීමට අවසර ලබාදෙන ලදී.

(ii) කෘෂිකාර්මික අංශය වෙත ණයදීම සඳහා බැංකු විසින් අනෙකුත් බැංකු සහ මූල්‍ය ආයතන වෙත ප්‍රදානය කරන ලද ණය පහසුකම්, අදාළ බැංකු හා මූල්‍ය ආයතනවල එවැනි ණය පහසුකම් නිවැරදිව හඳුනාගැනීමට සුදුසු අධීක්ෂණ ක්‍රමවේදයක් පවත්වාගෙන යන අවස්ථාවන්හි දී පමණක්, එවැනි ණය බලපත්‍රලාභී බැංකු විසින් කෘෂිකාර්මික අංශය වෙත ලබාදුන් අනිවාර්ය ණය ලෙස සැලකීමට ඉඩදෙන ලදී.

(iii) ශ්‍රී ලංකාවෙන් පිටත ආයතන හා පුද්ගලයන් වෙත බලපත්‍රලාභී බැංකුවල අක්වෙරළ බැංකු ඒකක/විදේශීය ශාඛා විසින් ප්‍රදානය කරන ලද ණය හා අත්තිකාරම් ද, මහා පරිමාණ රාජ්‍ය සහ රජය ප්‍රවර්ධනය කළ අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබාදුන් ඍජු ණය හා අත්තිකාරම් ද, කෘෂිකාර්මික අංශයට ලබාදුන් අනිවාර්ය ණය ගණනය කිරීමේ දී අන්තර්ගත නොකිරීමට තීරණය කරන ලදී.

(එ) **ණයපත් සහ අනෙකුත් ණය සහ අත්තිකාරම් සඳහා වන පොලී අනුපාතික:** ප්‍රතිපත්තිමය පොලී අනුපාතික පහත දැමීමත් සමග අනෙකුත් මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රමෝපායයන් සැලකිල්ලට ගෙන ණයපත් ආශ්‍රිත අත්තිකාරම් සඳහා අය කරන පොලී අනුපාතිකය සහ අනෙකුත් සියළුම ණය සහ අත්තිකාරම් සඳහා වන පොලී අනුපාතිකයන් වෙළෙඳපොළ පොලී අනුපාතිකයන්ට සාපේක්ෂව ඉහළ අගයක පවතින බැවින් එම අනුපාතිකයන් අඩු කරන ලෙස බලපත්‍රලාභී බැංකු වෙත දැනුම්දෙන ලදී.

මේ අතර, දැනටමත් ලබාදී ඇති ණය පහසුකම් ඇතුළුව සියලුම ණය හා අත්තිකාරම් මත දඩ පොලී අනුපාතිකය ණය නොපියවූ කාලසීමාව තුළ, නොපියවූ මුදල මත, සියයට 2 ක වාර්ෂික අනුපාතිකයක් නොඉක්මවන මට්ටමකට අඩුකරන ලෙස බලපත්‍රලාභී බැංකුවලට දැනුම් දෙන ලදී.

(ඒ) **මූල්‍ය සමාගම් වෙත ප්‍රදානය කළ මූල්‍ය අනුග්‍රහ:** බලපත්‍රලාභී මූල්‍ය සමාගම් නියාමනයෙහි සහ අධීක්ෂණයෙහි සිදුවූ විචක්ෂණශීලී වර්ධනයන් සලකා, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව රජයේ සුරැකුම්පත්, ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් සහ ස්ථාවර තැන්පතු ඇපයට ගෙන බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වෙත මූල්‍ය අනුග්‍රහ ලබාදීම වළකාලමින් පැවති සීමාවන් ඉවත් කෙරිණි.

(ඔ) **බාසල් II දෙවැනි ආධාරකය - අධීක්ෂණ විමසුම් ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීම:** බාසල් II-දෙවැනි ආධාරකය වන අධීක්ෂණ විමසුම් ක්‍රියාවලියට අනුකූලව නිකුත් කරන ලද විධානයන්ට අනුව අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගයීමේ ක්‍රියාවලියක් ක්‍රියාවට නංවන ලෙස සහ සියලු අවදානම්වලට නිරාවරණය වීම් ආවරණය කිරීම සඳහා පළමුවන ආධාරකය යටතේ වන අවම නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා ඉක්මවා ප්‍රාග්ධනය පවත්වා ගන්නා ලෙස බලපත්‍රලාභී බැංකුවලට දැනුම් දෙන ලදී.

(ඕ) **මූල්‍ය වාර්තා සහ අනෙකුත් හෙළිදරව් කිරීම් වෙබ් අඩවි තුළින් ප්‍රසිද්ධියට පත්කිරීම:** වාර්ෂික විගණනය කරන ලද වාර්තා/මූල්‍ය ප්‍රකාශන, කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව මගින් අවශ්‍ය කෙරෙන බැංකුවල අවදානම් කළමනාකරණයට අදාළ ගුණාත්මක හෙළිදරව් කිරීම් තම වෙබ් අඩවිවල පළ කරන ලෙස බලපත්‍රලාභී බැංකුවලට දැනුම් දෙන ලදී.

(ක) **නොමග යවනසුළු සහ වෘත්තීයමය වශයෙන් ආචාර සම්පන්න නොවන දැන්වීම්:** 2008 නොවැම්බර් මස 06 වැනි දින නිකුත් කළ චක්‍රලේඛයට අවනත වෙමින්, නොමග යවනසුළු සහ වෘත්තීයමය වශයෙන් ආචාර සම්පන්න නොවන දැන්වීම් පළකිරීමෙන් වළකින ලෙසත්, සියලු වැදගත් තොරතුරු වෙත නිසි ප්‍රමුඛතාව ලබාදෙන ලෙසත් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත දැනුම් දෙන ලදී.

(ග) **ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයන්හි ආයෝජනය සඳහා අවසර ලබාදීම:** ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කළ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජනය කිරීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවල අක්වෙරළ බැංකු ඒකක සඳහා අවසර ලබාදෙන ලදී.

### 2.1.2 බැංකු, බැංකු ශාඛා හා වෙනත් බැංකු සේවා ස්ථාන සඳහා අවසර ලබාදීම

(අ) 2013 වසර තුළදී නව බැංකු ශාඛා 119 ක් සිසු ඉතුරුම් ඒකක 247 ක් සහ ජංගම බැංකු ඒකක 13 ක් විවෘත කිරීමට ද, ශාඛා 91 ක් ප්‍රතිස්ථාපනය කිරීමට ද ශාඛා වලින් පරිබාහිරව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 114 ක් පිහිටු වීමට ද අවසර ලබාදෙන ලදී. උතුරු හා නැගෙනහිර පළාත්වල ආරම්භ කිරීමට අවසර ලබාදුන් බැංකු ශාඛා 5 ක් ද මේ අතර වේ. ඒ අනුව 2013 වසර අවසන් වනවිට බැංකු ශාඛා 3,433 ක්, සිසු ඉතුරුම් ඒකක 3,039 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 2,508 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

(ආ) ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගේ අවසරය ලබාගැනීමට යටත්ව, කාගිල්ස් බැන්ක් ලිමිටඩ් හට බැංකු බලපත්‍රයක් නිකුත් කිරීමට අවසර දෙන ලදී. තවද, ඉන්දියන් ඕවර්සීස් බැංකුවට අක්වෙරළ බැංකු කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා දැනට පවත්නා බලපත්‍රයට අතිරේකයක් නිකුත් කරන ලදී.

### 2.1.3 බැංකු අඛණ්ඩව අධීක්ෂණය කිරීම

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අඛණ්ඩ අධීක්ෂණය මඟින් බැංකු අංශයට සමස්තයක් වශයෙන් හා එක් එක් බැංකුවට හානිකර ලෙස බලපාන අනතුරුදායක තත්ත්ව කලින් හඳුනා ගැනීම හා බැංකුවල මූල්‍ය තත්ත්වය තක්සේරු කිරීම සිදුකරනු ලබයි. අඛණ්ඩ පරීක්ෂණ ක්‍රියාවලියට අතිරේකයක් වශයෙන් අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීම් ක්‍රියාවලියක් ද සෑම බැංකුවක් සඳහාම සිදුකර ගෙන යනු ලැබේ. මීට අමතරව, ව්‍යවස්ථාපිත පරීක්ෂණ මඟින් හඳුනාගත් දුර්වලතාවයන් නිවැරදි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගයන්හි ප්‍රගතිය කාර්තුමය වශයෙන් පසුවිපරම් කොට බැංකු එම ක්‍රියාමාර්ග කාලානුරූපීව කරන්නේ ද යන්න සොයා බැලීම සිදුකරයි. කාලානුරූපී ප්‍රතිකර්ම හා සුදුසු පාලන ක්‍රියාත්මක කිරීමට, බැංකුවල ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය, බැංකුවල අධ්‍යක්ෂවරුන් සහ බාහිර විගණකයන් සමඟ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වසර තුළදී සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී.

අඛණ්ඩ අධීක්ෂණයේ කොටසක් ලෙස, බැංකු සඳහා සාංගමික ව්‍යවස්ථාවලිය වෙනස් කිරීමට, දෙවැනි පෙළ ප්‍රාග්ධනය (Tier II) සඳහා යටත් ණයකර ඇතුළත් කිරීමට, උපරිම ණය සීමාව ඉක්මවා ණය පහසුකම් ලබාදීමට, විදේශීය මූලාශ්‍රවලින් ණය ගැනීමට, ජංගම බැංකු කටයුතුවල යෙදීමට, පරිපාලිත ආයතනවල සහ අනෙකුත් ආයතනවල ආයෝජනය කිරීමට, විදේශීය රටවල් වලට බැංකු කටයුතු ව්‍යාප්ත කිරීමට, ව්‍යාපාර මෙහෙයුම් කටයුතු පිළිබඳ බාහිරින් සේවාවන් ලබාගැනීමට, අධ්‍යක්ෂකවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් සහ ප්‍රධාන කළමනාකාරිත්වය පත් කිරීමට සහ බැංකුවල වැදගත් අයිතිවාසිකම් අත්පත් කර ගැනීමට ද අවසර ලබාදෙන ලදී.

බැංකුවල මාසික කාර්යසාධන වාර්තාවන් හා බැංකු අංශයේ කාර්තුමය වාර්තාවන්ට අමතරව 2013 වසරේදී ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට පහසුවන පරිදි ශ්‍රී ලංකාවේ බැංකුවල තැන්පතු පොලී අනුපාතික, දඩ පොලී අනුපාතික, උකස් කලඹවල කාර්යසාධනය, අක්‍රීය ණය සහ වටිනාකම මත අනුපාතය පිළිබඳ වාර්තා සකස් කරන ලදී.

### 2.1.4 බැංකු පරීක්ෂණ සිදු කිරීම

මුදල් නීති පනතෙහි සහ බැංකු නීති පනතෙහි විධිවිධාන වලට අනුව, 2013 වසරේ දී අදාළ බැංකුවල කළමණාකාරිත්වය සමග විධිමත් සාකච්ඡා පවත්වමින් හා අදාළ වාර්තා මුදල් මණ්ඩලයට යොමු කිරීම මඟින් බැංකු 29 ක ව්‍යවස්ථාපිත පරීක්ෂණ අවසන් කරන ලද අතර, තවත් බැංකු 9 ක පරීක්ෂණ අවසන් වෙමින් පවතී. 2013 වසරේදී සිදුකරන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණ තුළ 2012 වසරේදී ආරම්භ කළ බැංකු 12 ක සහ 2013 වසරේදී ආරම්භ කළ බැංකු 26 ක පරීක්ෂණ ඇතුළත් විය. මූලික වශයෙන්, ණය අවදානම් කළමනාකරණය, භාණ්ඩාගාර මෙහෙයුම්, මෙහෙයුම් අවදානම් කළමනාකරණය, ඒකාබද්ධ අවදානම් කළමනාකරණය, අනුකූලතා කාර්යය, සාංගමික යහපාලනය, නව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුගත වීම සහ ව්‍යවස්ථාපිත නියමයන් කඩ කිරීම ආදියෙහි ඉස්මතු වූ අවදානම් හඳුනාගැනීම, අවදානම් පාලනය කිරීම, අවදානම් පහළ හෙලීම සඳහා පැවතිය යුතු සම්පත් ප්‍රමාණය තක්සේරු කිරීම සඳහා අවදානම් මත පදනම් වූ ප්‍රවේශයක් උපයෝගී කර ගනියි. මීට අමතරව, කාලානුරූපීව පැන නැගි කරුණු සම්බන්ධයෙන් සීමිත විෂය පථයකින් යුත් පරීක්ෂණ කිහිපයක් ද පවත්වන ලදී. හඳුනාගත් ප්‍රධාන ගැටළු සම්බන්ධයෙන් එකඟ වූ පරිදි නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත්දැයි තහවුරු කිරීම සඳහා කාර්තුමය පදනමක් මත ප්‍රගතිය විමසා බලනු ලබයි.

### 2.1.5 බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්ගේ රැස්වීම්

බැංකු අංශය සහ මහ බැංකුව අතර අදහස් සාකච්ඡා කිරීමේ හා හුවමාරු කර ගැනීමේ වේදිකාවක් ලෙස කටයුතු කරන, මහ බැංකු අධිපතිතුමා සහ බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් අතර පැවැත්වෙන මාසික රැස්වීම්වල ලේකම් කටයුතු බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් සිදුකරන ලදී. මෙම සාකච්ඡාවලදී, දේශීය ආර්ථික සහ මූල්‍ය වර්ධනයන් හා බැංකු අංශයේ කාර්ය සාධනය සහ බැංකු අංශයට විභව බලපෑමක් ඇති කළ ගෝලීය පරිසරයේ වර්ධනයන් පිළිබඳව ප්‍රධාන විධායක නිලධාරීන් දැනුම්වත් කරන ලදී. මීට අමතරව, අධීක්ෂණ විමසුම් ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීම, බැංකු අංශය කොටස් වෙළෙඳපොළට පවතින නිරාවරණයවීම් පිළිබඳව ඇති නියාමනයන් විධිමත් කිරීම, බැංකුවල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම හා අනෙකුත් හෙළිදරව් කිරීමේ අවශ්‍යතා නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLAS) හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති වලට (SLFRS) වලට අනුගත කිරීම, රටේ පවතින අඩු පොලී අනුපාතික පරිසරයට අනුගත වෙමින් ණය හා අත්තිකාරම් මත වන දඩ පොලී අනුපාතික ඇතුළුව අනෙකුත්

පොලී අනුපාතික පහළ දැමීම, බලපත්‍රලාභී වාණිජ බැංකුවල විදේශ ණය ගැනීම් ලිහිල් කිරීම සහ ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරනු ලබන ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජනය කිරීමට බලපත්‍රලාභී බැංකු වලට අවසර දීම ඇතුළු 2013 වසර තුළ හඳුන්වා දෙන ලද නියාමනයන් පිළිබඳව සාකච්ඡා පවත්වන ලදී. මීට අමතරව, බාසල් II ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා රාමුව යටතේ වන ඉහළ ප්‍රවේශයට සංක්‍රමණය වීම, බාසල් III ප්‍රාග්ධන ප්‍රමිති හඳුන්වාදීම සහ බලපත්‍රලාභී බැංකුවල නිශ්චල දේපළ තක්සේරු කිරීම සඳහා වන නියාමන රාමුව ඇතුළු 2014 වසරේදී සහ ඉන් ඉදිරියට හඳුන්වාදීමට නියමිත නියාමනයන් පිළිබඳව ද සාකච්ඡා කරන ලදී.

ඇමෙරිකා එක්සත් ජනපදයේ විදේශ ගිණුම්වල බදු අනුකූලතාවය පිළිබඳ පනත (FATCA) යටතේ වන අවශ්‍යතාවයන්, බලපත්‍රලාභී වාණිජ බැංකු ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස පත්කිරීම, ''බිම් සවිය'' වැඩසටහන යටතේ නිකුත් කර ඇති ඉඩම් ඔප්පුවල නෛතික නිශ්චිතභාවය, ශ්‍රී ලංකා මුදල් නෝට්ටු ප්‍රතිනිෂ්පාදනය හා පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය, බැංකු විසින් සංචාරක චෙක්පත් නිකුත් කිරීම සහ මුදල් බවට පත්කිරීම නවතා දැමීම, පොදු මූලික තොරතුරු තාක්ෂණ සුරක්ෂිතතා ප්‍රමිති පිහිටුවීම, සේවක අර්ථසාධක අරමුදල සඳහා බැංකු පද්ධතිය හරහා තත්කාලීන ගෙවීම් ක්‍රමයක් ඇති කිරීම, තැන්පතු ආකර්ෂණය කර ගැනීම සඳහා බැංකු විසින් පවත්වනු ලබන ලොතරැයි ක්‍රම නවතා දැමීම, නොමග යවනසුළු හා වෘත්තීයමය වශයෙන් සදාචාරාත්මක නොවන ප්‍රචාරණයන්, පාරිතෝෂික යෝජනා ක්‍රම හඳුන්වාදීම, බැංකු විසින් නිකුත් කරන ණයකර සඳහා විදේශ ආයෝජකයන් දායකවීම, සේවක අර්ථසාධක අරමුදල මගින් ආවරණය කර ඇති නිවාස ණය හා වෙනත් ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම සඳහා වන ණය පොලී අනුපාතික සහ බැංකු හා මූල්‍ය ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැළසීම ආදිය පිළිබඳව සාකච්ඡා මෙම රැස්වීම්වලදී සිදුකරන ලදී.

### 2.1.6 බැංකුවල සභාපතිවරුන්ගේ රැස්වීම්

බැංකුවල සභාපතිවරුන් සමග අඛණ්ඩ සංවාදයන්හි වැදගත්කම සැළකිල්ලට ගෙන මහ බැංකු අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාපතිවරුන් සමග කාර්තුමය රැස්වීම් පැවැත්වීම තවදුරටත් සිදුකරගෙන යන ලදී. මෙම රැස්වීම්වලදී ඔවුන්ගේ තීරණ ගැනීමට පහසුකම් සැලසීම සඳහා බැංකු අංශයේ කාර්ය සාධනය, දේශීය හා ගෝලීය නියාමන රාමුවේ වර්ධනය සහ ආර්ථික හා මූල්‍ය වර්ධනයන් පිළිබඳව සභාපතිවරුන් දැනුම්වත් කරන ලදී. 2013 වසර හා මින් ඉදිරියට වන මූල්‍ය ප්‍රතිපත්ති හා මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති, දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළ හේතුවෙන් බැංකු අංශය 2012 වසරේ දී මුහුණ දෙන ලද අභියෝගයන් හා ඉදිරි ගමන් මග, ගෝලීය ප්‍රාග්ධන වෙළෙඳපොළ වර්ධනයන් හා දේශීය අත්දැකීම්, බැංකුවල යහපාලන භාවිතයන් ශක්තිමත් කිරීම, යහපාලනය පිළිබඳ විධානයන් සමාලෝචනය කිරීම, බැංකුවල සැලසුම්කරණ ක්‍රියාවලියේදී බාසල් II සහ බාසල් III අවශ්‍යතාවයන් තහවුරු කිරීම, පැතිරීමේ බලපෑම අඩු කිරීම සඳහා සමූහය පුරා ඇති අවදානම් පිළිබඳ අවධානය යොමු කිරීම, පද්ධතිමය අවදානම පිළිබඳ අවධානය යොමු කිරීම සඳහා සාර්ව විචක්ෂණ නියාමනය ශක්තිමත් කිරීම, බැංකු සහ මූල්‍ය ආයතන අත්පත්කර ගැනීම් හා ඒකාබද්ධවීම් තුළින් වඩා ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය සහ විදේශ විනිමය ගලා ඒම් සඳහා පහසුකම් සැලසීම මෙම රැස්වීම්වලදී සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණුවලට ඇතුළත් විය.

### 2.1.7 ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පරිපාලනය

2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසිය අනුව තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය (DIS) පවත්වාගෙන යාම හා කළමනාකරණය කිරීමේ වගකීම බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ තැන්පතු රක්ෂණ ඒකකය සතු වේ.

තැන්පතු රක්ෂණ ඒකකය මගින් සාමාජික ආයතන වලින් වාරික සහ ගෙවිය යුතු දඩ මුදල් කාලීනව එක්රැස් කිරීම සහ එම මුදල් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම කරගෙන යන ලදී. ඒ අනුව, 2013 වසර තුළදී සාමාජික ආයතන වලින් වාරික සහ දඩ මුදල් වශයෙන් රුපියල් බිලියන 4.3 ක් එකතු කරන ලදී.

මීට අමතරව, යෝජනා ක්‍රමයේ ක්‍රමානුකූල පැවැත්ම තහවුරු කිරීම වෙනුවෙන්, තැන්පතු රක්ෂණ ඒකකය මගින් බලපත්‍රලාභී මූල්‍ය සමාගම් ඉදිරිපත් කරන දත්ත/තොරතුරු පරීක්ෂා කිරීම, තැන්පතුකරුවන්ගේ සුදුසුකම් ලත් තැන්පතුවල තොරතුරු ඉදිරිපත් කිරීමේ ක්‍රියාපටිපාටියේ/ක්‍රමයේ සඵලතාව පරීක්ෂා කිරීම සහ තැන්පතු රක්ෂණ ඒකකයේ අභ්‍යන්තර ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ මාර්ගෝපදේශයන් සමාලෝචනය කර වැඩි දියුණු කරන ලදී.

තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ පවත්නා ද්‍රවශීලතා ආධාරක ක්‍රමය පිළිබඳව ප්‍රකට කිරීම තුළින් තවදුරටත් මූල්‍ය පද්ධතිය පිළිබඳව මහජන විශ්වාසය ඉහළ නංවා රටේ සමස්ත මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ශක්තිමත් කිරීමට 2013 නොවැම්බර් මස 22 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ''ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය'', ''ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය'' ලෙසට සහ ''තැන්පතු රක්ෂණ අරමුදල'', ''ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල'' ලෙසට නැවත නම් කරන ලදී. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය, 2013 අප්‍රේල් 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ආදායම් බදුවලින් නිදහස් කර ඇත.

2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය සාමාජික ආයතන

81 කින් සමන්විත වේ. මූල්‍ය වත්කම් සහ තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල අනුපිළිවෙලින් රුපියල් බිලියන 12.7 කින් සහ රුපියල් බිලියන 12.5 කින් සමන්විත වේ.

### 2.1.8 වෙනත් කටයුතු

**(අ) නඩු කටයුතු පවත්වාගෙන යාම**

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නීතිපති දෙපාර්තමේන්තුවේ සහ නීතිය ක්‍රියාත්මක කරන නියෝජිත ආයතනයන් හි සහාය ද සහිතව වසා දමන ලද ප්‍රමුඛ සේවින්ග්ස් ඇන්ඩ් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් හි කටයුතු, විනිමය පාලන, අක්‍රමිකතා පැවති හෙජින් ගණුදෙනු, නීතිවිරෝධී යෝජනා ක්‍රම හා අයෝග්‍ය බැංකු පරිචයන් යන කරුණුවලට අදාළ නඩු කටයුතු 19 ක් පවත්වාගෙන යන ලදී.

**(ආ) අන්තර් නියාමන ආයතනික සභාව (IRIC)**

අන්තර් නියාමන ආයතනික සභාව ස්ථාපනය කරන ලද්දේ මූල්‍ය අංශයේ වඩාත් ක්‍රමවත්/විධිමත් සංවර්ධනයක් සඳහා වඩා යෝග්‍ය වූ ප්‍රතිපත්තිමය නියෝගයන් ඇති කිරීම සහතික කිරීම සහ වඩාත් පුළුල් වූ මූල්‍ය පද්ධති ස්ථායීතාවක් ඇති කිරීම සඳහා මූල්‍ය අංශයේ සියලුම නියාමන ආයතනයන් අතර සහයෝගීතාව ඇතිව තොරතුරු හුවමාරු කර ගැනීම යන මූලික අරමුණ සහිතවය. මෙරට මූල්‍ය අංශයේ සියලුම නියාමන ආයතනයන් සාමාජිකත්වය දරන මෙම කමිටුව, නියාමන සහයෝගීතාව හා තොරතුරු හුවමාරු කිරීම හරහා මූල්‍ය පද්ධති ස්ථායීතාව ඇති කිරීම උදෙසා ක්‍රියාකරයි. මෙම කමිටුවේ රැස්වීම් පැවැත්වීම සඳහා නිරතුරුවම පහසුකම් සපයන ලද්දේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවයි. මූල්‍ය අංශයේ නියාමන ආයතනයන් අතර තොරතුරු හුවමාරු කිරීමේ පනත් කෙටුම්පත සැකසීම සඳහා මෙම කමිටුව මහත් කැපවීමක් කරන ලදී. තවද, මෙම කමිටුව විසින් කොටස් වෙළෙඳපොළ තැරැව්කාර සමාගම් සඳහා වන අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය, බලපත්‍රලාභී බැංකුවල කොටස් හිමිකාරත්ව සීමා, සාංගමික ණය වෙළෙඳපොළෙහි සංවර්ධනය, ප්‍රධාන මූල්‍ය සමූහයන්, අර්බුද නිරාකරණ රාමුව තුළ නියාමන ආයතනයන් හි භූමිකාව, බලපත්‍රලාභී ආයතනයන් හි ආයතනික යහපාලනය ශක්තිමත් කිරීම, මූල්‍ය වාර්තාකරණය හා විගණකවරුන්ගේ කාර්යභාරය විධිමත් කිරීම යන කරුණු සාකච්ඡාවට භාජනය කරන ලදී.

**(ඇ) දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ ශක්‍යතා වර්ධනය**

බැංකු සතුවන අභියෝගවලට මුහුණදීමේ හැකියාව තවදුරටත් ශක්තිමත් කිරීම පිණිස, දේශීය හා විදේශීය නියාමන ක්ෂේත්‍රයේ ඇති වූ නව සංවර්ධනය පිළිබඳ තොරතුරු හුවමාරු කිරීමේ අරමුණ සහිතව "ට්‍රිලියන 10 ක බැංකු අංශයකින් ඔබ්බට" යන තේමාව යටතේ අඛණ්ඩව හයවන වරටත් බැංකු අධ්‍යක්ෂකවරුන්ගේ සම්මන්ත්‍රණය 2013 දෙසැම්බර් මාසයේදී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී. එහිදී පැවැත්වූ සාකච්ඡා අතරින් ව්‍යාප්තිය හා ස්ථායිතාව සමතුලිතකරණයෙහිලා බැංකු සතු භූමිකාව හා බැංකු අධ්‍යක්ෂකවරයකු සතු වෙනස්වනසුළු භූමිකාව යන කරුණු කෙරෙහි මූලික අවධානය යොමු කරන ලදී. මීට අමතරව, අවදානම් කළමනාකරණ පරිචයන් පිළිබඳ අත්දැකීම් හුවමාරු කර ගැනීම හා නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳව දැනුම දියුණු කිරීම අරමුණු කොටගෙන බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂකවරුන් හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා තාක්ෂණික සැසියක් ද පවත්වන ලදී. බැංකු විගණන කටයුතු කිරීමේදී විගණකවරුන් සතු භූමිකාව හා ඔවුන් සතුවන වගකීම පිළිබඳ දැනුම්වත් කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුවල විගණකවරුන් සමග රැස්වීම් ගණනාවක් ද පවත්වන ලදී. තවද, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවක මහත්ම මහත්මීන් ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙනත් දෙපාර්තමේන්තු මගින් හා පිටස්තර නියෝජ්‍යත්ව ආයතනයන් විසින් මෙහෙයවනු ලබන බොහෝ පුහුණු වැඩසටහන්වල සම්පත් දායකයන් ලෙස සහභාගි විය.

2013 වසර තුළ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව සමග එක්ව නීතිවිරෝධී යෝජනා ක්‍රමයන් හි ඇති අවදානම් පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීම සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. එසේම, මහජනතාවගෙන් තැන්පතු ලබා ගැනීමට මහ බැංකුව විසින් බලය දී ඇති බැංකු හා මූල්‍ය ආයතන ලැයිස්තුගත කරමින් බොහෝ පුවත්පත් දැන්වීම් ද පළකරන ලදී.

එසේම, තවදුරටත් නියාමන ක්ෂේත්‍රයේ සිදුවූ වෙනස්වීම් හා සංවර්ධනයන් පිළිබඳ තොරතුරු බෙදාහැරීම සඳහා පුවත්පත් නිවේදන නිකුත් කිරීම ද බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදුකරන ලදී.

**(ඈ) දත්ත සහ තාක්ෂණික සහාය ලබාදීම**

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වෙනත් දෙපාර්තමේන්තු හා මූල්‍ය පද්ධති ස්ථායීතාව පිළිබඳ කමිටුව, මූල්‍ය පද්ධති ස්ථායීතාවය පිළිබඳ උපදේශක කමිටුව, ජාතික ගෙවීම් කවුන්සිලය හා ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් යාවත්කාලීන කිරීම වැනි නියෝජ්‍යත්ව ආයතන වෙත තොරතුරු සැපයීම හා තාක්ෂණික විශේෂඥ දැනුම ලබාදීම ද අඛණ්ඩව සිදුකරන ලදී.

**2.2** බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු ඔවුන්ගේ තැන්පත්කරුවන් සහ ණය කරුවන් සඳහා වන සිය වගකීම් අවදානමකට පාත්‍ර නොවන පරිදි සිය ව්‍යාපාරික කටයුතු පවත්වාගෙනයාම සහතික කිරීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2013 වසර තුළදී සිය අධීක්ෂණ කටයුතු ඵලදායී ලෙස පවත්වාගෙන යන ලදී.

**ඇමුණුම II-1** **බලපත්‍රලාභී බැංකු ලැයිස්තුව**

**බලපත්‍රලාභී වාණිජ බැංකු**

1. අමානා බැන්ක් ලිමිටඩ්
2. ඇක්සිස් බැන්ක් ලිමිටඩ්
3. ලංකා බැංකුව
4. සිටි බැන්ක් එන් ඒ
5. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී
6. ඩොයිෂ් බැංකුව ඒජී
7. ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී
8. හබීබ් බැන්ක් ලිමිටඩ්
9. හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී
10. අයිසීඅයිසීඅයි බැන්ක් ලිමිටඩ්
11. ඉන්දියන් බැංකුව
12. ඉන්දියන් ඕවර්සීස් බැංකුව
13. එම්සීබී බැන්ක් ලිමිටඩ්
14. නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී
15. නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී
16. පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී
17. මහජන බැංකුව
18. පබ්ලික් බැන්ක් බර්හාඩ්
19. සම්පත් බැන්ක් පීඑල්සී
20. සෙලාන් බැන්ක් පීඑල්සී
21. ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුව
22. ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා
23. ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්
24. යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

**බලපත්‍රලාභී විශේෂිත බැංකු**

25. ඩීඑෆ්සීසී බැංකුව
26. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
27. ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්
28. එම්බීඑස්එල් සේවින්ස් බැන්ක් ලිමිටඩ්
29. ජාතික ඉතිරි කිරීමේ බැංකුව
30. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
31. සණස ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී
32. ශ්‍රී ලංකා සේවින්ස් බැන්ක් ලිමිටඩ්
33. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

## 3. බැංකු විද්‍යා පියෙස

බැංකු විද්‍යා පියෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ පාඨමාලා පුහුණු ආයතනයයි. ශ්‍රී ලංකා මහ බැංකු කාර්ය මණ්ඩලය හා ශ්‍රී ලංකාවේ සහ කලාපීය මූල්‍ය අංශයේ වෘත්තිකයින්ගේ දැනුම වර්ධනය කිරීම හා කුසලතා සංවර්ධනය ඉහළ නැංවීම පිළිබඳ වගකීම ඊට පැවරී ඇත. බැංකු විද්‍යා පියෙස මඟින් පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ හා වැඩමුළු සැලසුම් කිරීම හා පැවැත්වීම සිදු කරනු ලබයි. මූල්‍ය බැංකු හා ක්ෂේත්‍රයට සම්බන්ධ විදේශීය ආයතනවල නිලධාරීන් ද මෙම වැඩසටහන් සඳහා සහභාගී වේ. තවද, බැංකු විද්‍යා පියෙස විසින් කාලීනව වැදගත් මාතෘකා පිළිබඳ මහජන දේශන ද පවත්වනු ලබයි. පාසැල් සිසුන්, ගුරුභවතුන් සහ විශ්වවිද්‍යාලීය සිසුන්ගේ අර්ථ ශාස්ත්‍රය පිළිබඳ ප්‍රායෝගික දැනුම වර්ධනය කිරීමෙහිලා අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව විශේෂ වැඩසටහන් ද බැංකු විද්‍යා පියෙස මඟින් පවත්වනු ලබයි.

පුහුණු වැඩසටහන්වල සහ පහසුකම්වල ගුණාත්මකභාවය ජාත්‍යන්තර තත්ත්වය දක්වා ගෙන ඒම 2013 වසර තුළ බැංකු විද්‍යා පියෙසේ මූලික අභිප්‍රායක් විය. වේගවත්ව වෙනස්වන ගෝලීය මූල්‍ය ක්‍රමය තුළ නවීන පහසුකම්වලින් සපිරි අධ්‍යයන පරිසරයක් තුළින් වඩාත් නව්‍ය ක්‍රම මඟින් යාවත්කාලීන වූ දැනුමක් ලබා දීමේ අවශ්‍යතාවය බැංකු විද්‍යා පියෙස විසින් මනාව හඳුනා ගෙන ඇත. මෙම වෙනස්කම්වල සාර්ථකත්වය 2013 තුළ බැංකු විද්‍යා පියෙසෙහි කාර්ය සාධනය තුළින් මනාව පිළිබිඹු වේ.

බැංකු විද්‍යා පියෙස විසින් බැංකු කටයුතු මෙහෙයුම් සහ නියාමනයන්, මූල්‍ය කළමනාකරණය, අර්ථ ශාස්ත්‍රය, ග්‍රාමීය අංශයේ සංවර්ධනය, මානව සම්පත් සහ පොදු කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, භාෂා සහ සන්නිවේදන කුසලතා යන ක්ෂේත්‍රවලට අදාළව සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සම්මේලන ගණනාවක් පවත්වන ලදී. මූල්‍ය ආයතනවල ප්‍රධාන කටයුතු හා උපකාරක සේවා පිළිබඳ පුහුණු අවශ්‍යතා ඉහළ මට්ටමකින් ආවරණය කිරීමේ අරමුණින් යුතුව පුළුල් පරාසයකට අදාළ වන පරිදි පුහුණු පාඨමාලා වැඩි දියුණු කරන ලදී. ගෝලීය සම්පත් කේන්ද්‍රස්ථාන සමග පවත්නා සබඳතා පුළුල් අන්දමින් තවදුරටත් පවත්වාගෙනයන ලදී. ''ජාත්‍යන්තර අනුකූලතා සංගමය'' සහ මැන්චෙස්ටර් විශ්වවිද්‍යාලයේ සහයෝගය ඇතිව ආරම්භ කරන ලද ජාත්‍යන්තර ඩිප්ලෝමා පාඨමාලාව එවැනි සබඳතාවල ප්‍රතිඵලයක් විය.

2013 වසර තුළදී බැංකු විද්‍යා පියෙස විසින් පූර්ව සැලසුම්ගත පුහුණු පාඨමාලා 60 ක්, විවිධ මූල්‍ය ආයතනවලින් කෙරෙන ඉල්ලීම් මත සහ හඳුනාගත් දැනුම් පරතර පියවීමට සැලසුම් කළ විශේෂ පුහුණු පාඨමාලා 73 ක්, ජාත්‍යන්තර පාඨමාලා 12 ක්, ඩිප්ලෝමා පාඨමාලා 3 ක්, සහතිකපත්‍ර පාඨමාලා 4 ක් සහ පුහුණු කරන්නන් සඳහා සැකසූ පුහුණු පාඨමාලා 2 ක් පවත්වන ලදී. මීට අමතරව දැනුම බෙදා හැරීම මුල්කොටගත් මහජන දේශන 12 ක්, සැඳෑ දේශන 3 ක්, පාසැල් සිසුන් සඳහා වූ වැඩසටහන් 61 ක් සහ විශ්වවිද්‍යාල සිසුන් සඳහා වූ වැඩසටහන් 6 ක් ද 2013 වසර තුළදී බැංකු විද්‍යා පියෙස මඟින් සංවිධානය කොට පවත්වන ලදී. විදේශීය සහභාගිවන්නන් 191 ක් ඇතුළුව, විද්‍යා පියෙසෙහි පාඨමාලා සඳහා 2013 වසරේදී සහභාගි වූ මුළු ගණන 6,832 ක් විය. අධ්‍යයන පොදු සහතිකපත්‍ර උසස් පෙළ සිසුන් සඳහා සැලසුම් කළ "තක්ෂිලාව" රූපවාහිනී වැඩසටහන බැංකු විද්‍යා පියෙසේ අධීක්ෂණය යටතේ 2013 තුළදී පවත්වනු ලැබීය.

තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ පළාත් කාර්යාල මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ඒකාබද්ධව බැංකු විද්‍යා පියෙස ප්‍රාදේශීය මට්ටමින් වැඩසටහන්

මාලාවක් පවත්වන ලදී. 2013 වසර තුළ සියලුම පළාත් කාර්යාලවල පහේ සහභාගිත්වයෙන් එවැනි වැඩසටහන් 9 ක් පවත්වන ලදී. මෙම වැඩසටහන්වල විෂය ක්ෂේත්‍රය, ණය අත්තිකාරම් ප්‍රදානය සහ ණය ඇගයීම වැනි ප්‍රධාන බැංකු කටයුතුවල සිට උකස් කටයුතු වැනි උපකාරක සේවා දක්වා පුළුල් පරාසයක විය.

කලාපයේ දැනුම උත්පාදනය හා බෙදා හැරීමේ විශිෂ්ට පුහුණු ආයතනයක් වීමේ අරමුණින් "ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ සේවාදායකත්වයට වඩාත් සමීපවීම" යන තේමාවට අනුගත වෙමින් බැංකු විදු පියෙස, 2014 වසරට හා ඉන් ඉදිරියට සුදුසු අන්දමින් වාර්ෂික පුහුණු පාඨමාලා දින දර්ශනය හා විශේෂ පුහුණු පාඨමාලා සැලසුම් කරන ලදී. බැංකු විදු පියෙස මඟින් විශිෂ්ට සම්පත්දායකයින් සම්බන්ධ කොටගෙන පවත්වන ලද මහජන දේශන පදනම් කර ගනිමින් කාලීන ලිපි ප්‍රකාශන මාලාවද 2013 වසර තුළ දී නැවත ආරම්භ කරන ලදී.

# 4. සන්නිවේදන

ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය පිළිබඳ කෞතුකාගාරයේ මුල් අදියර 2013 වසරේදී නිම කිරීම නිසා මේ වසර සන්නිවේදන දෙපාර්තමේන්තුවට සුවිශේෂ වසරක් බවට පත් විය. මහ බැංකු ප්‍රධාන කාර්යාලයට ප්‍රතිවිරුද්ධ දෙසින් චැතැම් වීදියට මුහුණලා සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ලෙහි පිහිටවනු ලැබූ එම කෞතුකාගාරය මහ බැංකුවේ නවතම මහජන සම්බන්ධතා කවුළුව වේ. දිවයිනේ ආර්ථික යටගියාව පිළිබඳ සම්පූර්ණ කථා පුවත එකම වහලක් යටට ගෙන එමින් මේ කෞතුකාගාරය ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය පිළිබඳ අංග සම්පූර්ණ කෞතුකාගාරයක් බවට පත් කිරීමට සැලසුම් සකසමින් පවතී.

රාජගිරියේ බැංකු විදු පියෙසෙහි පිහිටුවා තිබූ මහ බැංකුවේ මුදල් කෞතුකාගාරය, සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ල වෙත ගෙන එමින් නව කෞතුකාගාරයේ පළමු අදියර වූ "මුදල් ප්‍රදර්ශනය" එම ගොඩනැගිල්ලෙහි ස්ථාපනය කරන ලදී. ප්‍රතිසංස්කරණය කරනු ලැබූ සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ල සහ එම ගොඩනැගිල්ලේ පිහිටුවනු ලැබූ "මුදල් ප්‍රදර්ශනය" 2013 නොවැම්බර් 11 වැනි දින ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන් අතින් උත්සවාකාරයෙන් විවෘත කරනු ලැබීය. මෙම ප්‍රදර්ශනය "මුදල් ප්‍රදර්ශනය", පොදු රාජ්‍ය මණ්ඩලීය අංශය සහ 1950 මහ බැංකුව පිහිටුවනු ලැබීමෙන් අනතුරුව ගත වූ කාලය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථික, මූල්‍ය, සංස්කෘතික සහ දේශපාලන ක්ෂේත්‍රයන් හි සිදු වූ වැදගත් සිදුවීම් අළලා සැකසුණ "ප්‍රත්‍යාවලෝකන" අංශය වශයෙන් වූ අංශ තුනකින් සමන්විත ය.

කෞතුකාගාරය විවෘත කිරීමට සමගාමීව, ශ්‍රී ලංකාවේ කාසි සහ මුදල් නෝට්ටු ඉතිහාසය පිළිබඳ විශේෂයෙන් සම්පාදිත පොතක් භාෂා තුනෙන් ම ප්‍රකාශයට පත්කරන ලදී. "ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය පිළිබඳ කෞතුකාගාරය" පිහිටුවීමේ ව්‍යාපෘතිය, දේශයේ ආර්ථික සහ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් මහජනතාව දැනුම්වත් කිරීමටත්, එම දැනුම් සම්භාරය අනාගත පරම්පරාවන්හි ප්‍රයෝජනය උදෙසා සුරක්ෂිතකර තැබීමටත් සන්නිවේදන දෙපාර්තමේන්තුව දක්වන කැපවීමෙහි සලකුණකි.

මෙවැනි සුවිශාල ව්‍යාපෘතියකට උර දෙන අතර ම, අභ්‍යන්තර සහ බාහිර පාර්ශවයන් සමග නිරන්තරයෙන් පවත්වා ගන්නා සන්නිවේදන සම්බන්ධතා ද කලට වේලාවට සහ ඉහළ ම ගුණාත්මකභාවයෙන් යුතුව පවත්වා ගැනීමට සන්නිවේදන දෙපාර්තමේන්තුව කටුයතු කරන ලදී.

## 4.1 බාහිර සන්නිවේදන කටයුතු

බැංකුවේ වඩාත්ම ප්‍රමුඛ බාහිර සන්නිවේදන ද්වාරය ලෙස හිමිව පැවති ස්ථානය, නැරඹුම් වාර මිලියන 83.6 ක් වාර්තා කරමින් 2013 වසරේදීත් රැක ගැනීමට බැංකුවේ සංස්ථාපිත වෙබ් අඩවිය www.cbsl.gov.lk සමත් විය. මෙය පෙර වසරේ වාර්තා වූ නැරඹුම් වාර මිලියන 67.7 ට සාපේක්ෂව සියයට 23.5 ක වැඩි වීමකි.

ෆේස්බුක් නිවේදන 714 ක් සහ ට්විටර් නිවේදන 786 ක් නිකුත් කරමින් බාහිර සන්නිවේදන කාර්යය සඳහා සමාජ ජාල අඩවි සතු හැකියාව සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ඵලදායී අයුරින් ප්‍රයෝජනයට ගනු ලැබී ය. තවද, වීඩියෝ දර්ශන 40 ක් යූටියුබ් වෙත එක් කරනු ලැබූ අතර, ඒවා යූටියුබ් පරිශීලකයන් විසින් 17,780 වාරයක් නරඹනු ලැබීය. එසේම, මහ බැංකුවේ ෆේස්බුක් සහ ට්විටර් නිවේදනවලට ලැබුණ ප්‍රතිචාර, සමාජ ජාල අඩවි තුළ බැංකුවේ නියෝජනය ලද ජනප්‍රියත්වය පෙන්වයි.

මහජනතාව වෙත නිවැරදි තොරතුරු ඉක්මනින් සම්පාදනය කිරීම සඳහා වූ සිය නිරන්තර කැපවීම විදහා දැක්වීම පිණිස, සන්නිවේදන දෙපාර්තමේන්තුව මේ වසරේ දී සිය සංස්ථාපිත වෙබ් අඩවිය ඔස්සේ විද්‍යුත් තැපැල පණිවුඩ සේවාවක් හඳුන්වා දුන්නේය. මේ අනුව, මහ බැංකු වෙබ් අඩවියට පිවිසෙන පාඨකයනට මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර පිළිබඳ නිවේදන, දෛනික විනිමය අනුපාත, උද්ධමන අනුපාතික නිවේදන ආදී වූ බැංකුවේ නිත්‍ය නිවේදන විද්‍යුත් තැපැල මඟින් ගෙන්වා ගැනීමේ සේවාවට ලියාපදිංචි වීමේ අවස්ථාව දැන් හිමිව ඇත. මහ බැංකුවෙන් මහජනතාව වෙත නොමිලයේ සැපයෙන සේවාවක් වන මෙය සඳහා මේ වනවිට 826 දෙනෙකු ලියාපදිංචි වී තිබේ.

2012 වසරේ දී හඳුන්වා දෙන ලද මහ බැංකුවේ කෙටි පණිවුඩ සේවාවේ (SMS) දායක සංඛ්‍යාව පසුගිය වසර අවසානයේ 435 ක් වූ අතර, මේ වසර තුළ 840 දක්වා ඉහළ ගියේ ය. මෙම සේවාව, වෙළෙඳපොළ තොරතුරු ප්‍රසිද්ධියට පත් කළ වහාම පමාවකින් තොරව ඒවා දැන ගැනීමට අවශ්‍යතාවය ඇති පුවත්පත් කලාවේදීන්, මූල්‍ය වෙළෙඳපොළෙහි ගණුදෙනු කරන්නන්ට මෙන්ම පොදුවේ සියල්ලන්ටම ප්‍රයෝජනවත් වේ.

විද්‍යුත් තැපැල කෙටි පණිවුඩ (SMS) සහ සමාජ ජාල අඩවි ආදීකොට ඇති සම්ප්‍රදායික නොවන උපකරණ භාවිතයෙන් සන්නිවේදන කාර්යය වැඩිදියුණු කිරීමට කටයුතු කරන අතරම, පුවත්පත් නිවේදන 1,792 ක් සහ ගැසට් නිවේදන 22 ක් නිකුත් කරමින් සම්ප්‍රදායික සන්නිවේදන භාවිතයන් ද සාර්ථක ලෙස පවත්වා ගැනීමට සන්නිවේදන දෙපාර්තමේන්තුව මෙම වසරේ දී සමත් විය.

2013 වසර තුළ දී මාධ්‍ය සාකච්ඡා 5 ක් ද, විවිධ ගැටළු සම්බන්ධයෙන් වූ මාධ්‍ය ආවරණයන් 28 ක්ද පවත්වන ලදී. මේ හැරුණුවිට, සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් උත්සව අවස්ථා ගණනාවක මාධ්‍ය කටයුතු සංවිධානය කළ අතර ඉන් කිහිපයක් වශයෙන්, මහ බැංකුවේ මාර්ග සිතියම එළි දැක්වීම, "ලංකා පේ" පොදු ස්වයංක්‍රීය ටෙලර් පද්ධතිය දියත් කිරීම, 18 වැනි වාර්ෂික බදු කතිකාවෙහි දී අධිපතිතුමා විසින් කළ දේශනය, කිරි කර්මාන්ත සංවර්ධන ණය යෝජනා ක්‍රමයෙහි සමාරම්භක අවස්ථාව, බැංකුවේ 63 වැනි වාර්ෂික දේශනය, ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා කෞතුකාගාරය විවෘත කිරීමේ උළෙල, බැංකු අධ්‍යක්ෂවරුන්ගේ සම්මන්ත්‍රණය දැක්විය හැකි ය. තවද, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් දියත් කෙරුණු කාසි නැවත රැස් කිරීමේ ව්‍යාපාරයේ සහායට දේශීය රූපවාහිනී නාලිකා සමග එක්ව ප්‍රචාරක ව්‍යාපෘතියක් ද සංවිධානය කරන ලදී.

අම්පාර ප්‍රදේශයේ පවත්වන ලද "දැයට කිරුළ" ප්‍රදර්ශනය සහ බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පැවති "කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය" යන ජාතික වැදගත්කමක් ඇති අවස්ථාවන්ට සන්නිවේදන දෙපාර්තමේන්තුව සිරිත් පරිදි මහ බැංකුව නියෝජනය කරමින් මේ වසරේ දී ද සහභාගි විය.

## 4.2 අභ්‍යන්තර සන්නිවේදන කටයුතු

මහ බැංකු කාර්ය මණ්ඩලය සඳහා වූ තොරතුරු ද්වාරයක් වශයෙන් පැවති ජනප්‍රියත්වය මෙම වසරේ දීත් රැක ගැනීමට සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන "cbsldaily" අභ්‍යන්තර වෙබ් අඩවිය මේ වසරේ දීත් සමත් විය. මෙම අඩවියේ ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාත සහ විනිමය අනුපාතිකය නිවේදන 495 ක් සහ පුවත්පත් නිවේදන 169 ක් වසර තුළ පළ කරන ලදී. මෙම වෙබ් අඩවිය ප්‍රවෘත්ති අඩවියක් සහ දැන්වීම් පුවරුවක් ලෙස මෙන්ම බැංකුවේ අභ්‍යන්තර වෙබ් අඩවි සඳහා බිහි දොරක් වශයෙන් ද ක්‍රියා කරයි. මහ බැංකුවේ අභ්‍යන්තර විවරණිකාව වන 'කවුළුව' සඟරාවේ කලාප හයක් මෙම වසර තුළ ප්‍රකාශයට පත් කරන ලදී. දෙපාර්තමේන්තුවේ මාධ්‍ය නිරීක්ෂණ අංශය භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රකාශිත ජාතික පුවත්පත් 15 කින් උපුටා ගන්නා ලද ප්‍රවෘත්ති, ලිපි සහ මහජන අදහස් 1,392 ක් බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කරමින් ආර්ථිකයේ සහ මහ බැංකුවේ දෛනික තත්ත්වය සම්බන්ධයෙන් ඔවුන් දැනුම්වත්ව තැබීමට කටයුතු කළේය.

## 4.3 මහජනතාව දැනුම්වත් කිරීම

ආර්ථිකය පිළිබඳවත්, මූල්‍ය සාක්ෂරතාව පිළිබඳවත් පුළුල්ව පැතිරුණ මහජන වැටහීමක් ඇති කිරීම සන්නිවේදන දෙපාර්තමේන්තුවේ ඉහළම ප්‍රමුඛතාවයන් අතර වේ. දෙපාර්තමේන්තුව, නැගෙනහිර සහ දකුණු පළාත්වල දුරබැහැර ප්‍රදේශ ද ඇතුළත්ව දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි පාසැල් ගුරුවරුන් සහ ශිෂ්‍යයන් වෙනුවෙන් සම්මන්ත්‍රණ 30 ක් සංවිධානය කර පවත්වමින් මේ අරමුණ සඳහා සිය කැපවීම ප්‍රදර්ශනය කළේ ය. තවද, සන්නිවේදන දෙපාර්තමේන්තුව 2013 වසර තුල මහ බැංකුව නියෝජනය කරමින් ජාතික මට්ටමේ ප්‍රදර්ශන 4 කට සහභාගි වෙමින් එම ප්‍රදර්ශනයන් නැරඹීමට පැමිණි මහජනතාවට මහ බැංකු ප්‍රකාශන සහ සමරු කාසි මිලදී ගැනීමේ අවස්ථාව සලසා දෙන ලදී.

මහ බැංකු ප්‍රකාශන මංගතව ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථාව සැලසී තිබීම නිසා මුද්‍රිත මහ බැංකු ප්‍රකාශනයන්ගේ අලෙවිය ගත වූ වසර තුළ පහළ වැටුණි. කෙසේ වුවද සන්නිවේදන දෙපාර්තමේන්තුව, 2012 මහ බැංකු වාර්තාව ද ඇතුළුව මහ බැංකු ප්‍රකාශන පිටපත් 16,335 ක් පාසැල් සිසු සිසුවියන් සහ ගුරුවරුන් අතර නොමිලයේ බෙදා දුන් අතර, අ.පො.ස. (උසස් පෙළ) සිසු සිසුවියන්, ගුරුවර ගුරුවරියන් සහ ආරක්ෂක හමුදාවන් හි පුහුණුලාභීන් ඉලක්ක කර ගනිමින් දැනුම්වත් කිරීමේ/අධ්‍යාපනික වැඩසටහන් 30 ක් මේ වසර තුළ පැවැත්වී ය.

## 4.4 දෙමළ භාෂා පරිවර්තන ඒකකය

සන්නිවේදන දෙපාර්තමේන්තුවේ දෙමළ භාෂා පරිවර්තන ඒකකය භාෂා ත්‍රිත්වයෙන්ම එක හා සමානව තොරතුරු සැපයීම සඳහා වූ දෙපාර්තමේන්තුවේ අරමුණට මේ වසරේ ද සිය නොමඳ දායකත්වය ලබා දුන්නේ ය.

## 4.5 මුද්‍රණාලය

මහ බැංකු මුද්‍රණාලය 2013 වසර තුළ මුද්‍රණ කාර්යයන් 145 ක් ඉහළම තත්ත්වයෙන් යුතුව සම්පූර්ණ කළේ ය. මෙසේ සම්පූර්ණ කරන ලද කාර්යයන් අතර 2014 මහ බැංකු දිනපොත, බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා නියාමන අත්පොත, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සඳහා නියාමන අත්පොත, විශේෂිත ලීසිං සමාගම් සඳහා නියාමන අත්පොත, විදේශ විනිමය ගනුදෙනු සඳහා පියවරෙන් පියවර මාර්ගෝපදේශය, ශ්‍රී ලංකා මහ බැංකුවේ උපායමාර්ගික සැලැස්ම 2014-2018, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ විවරණිකා වෙළුම් 5 ක්, ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජයීය සංඛ්‍යාන දත්ත පොතෙහි ත්‍රෛභාෂික අනුවාද සහ රාජ්‍ය ණය කළමනාකරණ විවරණිකාව ද වේ.

මහ බැංකු ප්‍රකාශනයන් වශයෙන් එළි දැක්වුණ මහ බැංකුවේ සහකාර අධිපතිවරුන් වන ආචාර්ය ඩබ්.එම්. හේමචන්ද්‍ර මහතා විසින් රචිත "පොළී අනුපාත - සිද්ධාන්ත සහ පරිචය",

මහ බැංකුවේ සහකාර අධිපති පී. සමරසිරි මහතා විසින් රචිත "ආර්ථික විද්‍යා මූලධර්ම සහ ප්‍රතිපත්ති" සහ "මූලික ආර්ථික විද්‍යා මූලධර්ම විග්‍රහය"(සිංහල/දෙමළ), බැංකු විදු පියසෙහි අධ්‍යක්ෂ සී.පී.ඒ. කරුණාතිලක මහතා විසින් රචිත "ආර්ථික විද්‍යා මූලධර්ම සඳහා හැඳින්වීමක්" යන ග්‍රන්ථ, මූල්‍ය පද්ධති ස්ථායීතා වාර්තාව - 2013, සැඳැව, කවුළුව, සටහන, ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන, බදු කතිකාවතෙහි දී අධිපතිතුමා කළ දේශනය සහ ශ්‍රී ලංකාවෙහි දී ව්‍යාපාර කටයුතු කිරීමට මඟ පෙන්වීමක් (5 වැනි සංස්කරණය) යනාදිය ද මුද්‍රණාලයෙහි මුද්‍රණය කරනු ලැබූ ප්‍රකාශනයන් අතර විය.

### 4.6 මහ බැංකුවේ වැදගත් අවස්ථාවන් ඡායාරූපයට නැගීම

මහ බැංකුවේ ප්‍රතිරූපය සෙසු ලෝකය හමුවේ නිශ්චල සහ වීඩියෝ රූ මඟින් වර්ණවත් ලෙස නිරූපණය කිරීම වෙනුවෙන් සන්නිවේදන දෙපාර්තමේන්තුවේ ඡායාරූප ඒකකය සුවිශාල මෙහෙවරක් ඉටු කරනු ලැබීය. මෙම ඒකකය විසින් පසුගිය වසර තුළ මහ බැංකුවේ විවිධ අවස්ථාවන් 435 ක් ආවරණය කළ අතර, එම අවස්ථාවන්ට අදාළව ඡායාරූප සංස්කරණය, ඡායාරූප මුද්‍රණය, වීඩියෝ සංස්කරණය, ඡායාරූප ඇල්බම සහ සංගත තැටි සැකසීම, ඡායාරූප රාමු කිරීම ආදී සේවාවන් ද ඉහළම වෘතීමය ගුණාත්මකභාවයෙන් යුතුව සලසා දෙන ලදී.

### 4.7 පුස්තකාල සහ තොරතුරු කේන්ද්‍රය

පුස්තකාලය සහ තොරතුරු කේන්ද්‍රය පොත් 27,585 ක්, වාර්තා 18,328 ක්, සංගත තැටි 1,813 ක්, ජර්නල වෙළුම් 185 ක් සහ මංගත දත්ත මූල 7 කින් පොහොසත් සිය එකතුව තුළින් මහ බැංකු කාර්ය මණ්ඩලයටත්, ඉල්ලීම් කළ බාහිර පරිශීලකයන්ටත්, ගත වූ වසර තුළ සිය සේවාව සලසන ලදී. පුස්තකාලය සහ තොරතුරු කේන්ද්‍රය විසින් දායකත්වය ලබා ඇති සයන්ස් ඩිරෙක්ට් සහ ඊ.බී.එස්.සී.ඕ. හොස්ට් යන දත්ත මූලයන් දෙක තුළින් ආර්ථිකමිතිය, ආර්ථික විද්‍යාව සහ මූල්‍ය ඇතුළු ව විවිධ විෂය පථයන්ට අයත් සම්පූර්ණ ජර්නල 115 ක් සහ පත්‍රිකා 350 ක් පමණ පරිශීලනයට අවස්ථාව සලසයි. මෙයට අමතරව, මහ බැංකුවේ කාර්යයන්ට අදාළ වන විෂයයන් ගණනාවකට සම්බන්ධ තවත් මංගත දත්තමූල කීපයකටම පුස්තකාලය සහ තොරතුරු කේන්ද්‍රය දායක වී ඇත.

පුස්තකාලය සහ තොරතුරු කේන්ද්‍රය විසින් දායකත්වය දරන විදේශීය ජර්නල සංඛ්‍යාව 119 ක් ද, දේශීය ජර්නල සංඛ්‍යාව 63 ක් ද වේ. "පුස්තකාලයට අළුතින් එක් වූ පොත්පත්", "වත්මන් තොරතුරු", "පුවත් විපරම", "ආර්ථිකය, බැංකු කටයුතු සහ මූල්‍ය පිළිබඳ දේශීය පුවත් වාර්තාව" යන ඉ-නිවේදන සම්පාදනය කිරීම පුස්තකාලය සහ තොරතුරු කේන්ද්‍රය විසින් තවදුරටත් සිදු කරනු ලැබූ අතර, ඒවා අභ්‍යන්තර පරිගණක ජාලය තුළින් බෙදා හරින ලදී. තෝරාගත් තොරතුරු බෙදා හැරීමේ සේවය ද තවදුරටත් ක්‍රියාත්මක කරනු ලැබීය. "ශ්‍රී ලංකා ආර්ථික සහ බැංකු කටයුතු පුස්තකාල ජාලය (EbanklibnetSL)" ට සම්බන්ධ පුස්තකාල 24 ක් සමග විද්‍යුත් තැපැල් මඟින් තොරතුරු බෙදා හදා ගනිමින් එම ජාලය පවත්වා ගැනීම ද පුස්තකාලය සහ තොරතුරු කේන්ද්‍රය විසින් සිදු කරන ලදී. තවද, සම්පත් සහ අත්දැකීම් හුවමාරු කර ගනිමින් සහ පර්යේෂණවලට අවශ්‍ය තොරතුරු සඳහා සහාය ලබා ගනිමින් මහ බැංකු කටයුතු පිළිබඳ තොරතුරු වෘත්තීයවේදීන්ගේ ජගත් ජාලයෙහි (cbfa List) ක්‍රියාකාරී සාමාජිකයෙකු වශයෙන් පුස්තකාලය සහ තොරතුරු කේන්ද්‍රය තවදුරටත් කටයුතු කරනු ලැබී ය. මහ බැංකු කාර්ය මණ්ඩලයට පුස්තකාලයේ අභ්‍යන්තර වෙබ් අඩවිය ඔස්සේ පිවිසුම් අවස්ථාව සලසමින් ඩිජිටල් පුස්තකාල සේවය පවත්වා ගැනීම ද සිදු කෙරුණි.

## 5. ව්‍යවහාර මුදල්

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 48 සිට 59 (අ) දක්වා වගන්තිවලට අනුව ගෙවීම් මාධ්‍යයක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ අධිකාරිත්වය දරන්නේ මුදල් මණ්ඩලයයි. මුදල් මණ්ඩලය සතු මෙම අධිකාරිත්වය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා බැංකු කටයුතු හා මුදල් දෙපාර්තමේන්තුව ලෙස 1950 ජූලි මස ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. ඒ අනුව, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ වත්මන් කාර්යයන් වනුයේ, මහජන ඉල්ලුම සපුරාලීම සඳහා නෝට්ටු හා කාසි නිකුත් කිරීම, නෝට්ටු මුද්‍රණය කිරීමට හා කාසි ටංකනය කිරීමට අවශ්‍ය කටයුතු පිළියෙළ කිරීම, මුදල් මණ්ඩලයේ තීරණ අනුව සමරු කාසි සහ නෝට්ටු නිකුත් කිරීම, බලපත්‍රලාභී වාණිජ බැංකුවල අවශ්‍යතා අනුව තැන්පතු භාර ගැනීම සහ තැන්පතු නැවත නිකුත් කිරීම මඟින් වාණිජ බැංකු සමග මුදල් කළමනාකරණ කටයුතු පවත්වාගෙන යාම, සේවා අනිසි නෝට්ටු හා කාසි සංසරණයෙන් ඉවත් කිරීම හා ව්‍යවහාර මුදල් සම්බන්ධව මුදල් නීති පනතේ සඳහන් විධිවිධාන උල්ලංඝනය කිරීමේ අවස්ථා පිළිබඳව කටයුතු කිරීමට නීති ක්‍රියාත්මක කරන බලධාරීන්ට සහයෝගය ලබාදීමයි.

### 5.1 ව්‍යවහාර මුදල් නිකුතුව

(අ) රටෙහි ව්‍යවහාර මුදල් සඳහා වන ඉල්ලුම සපුරාලීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා නව මුදල් නෝට්ටු හා කාසි නිකුත් කිරීම සහ සේවා නිසි මුදල් නෝට්ටු හා කාසි නැවත නිකුත් කිරීම යන ආකාර දෙක මඟින් ව්‍යවහාර මුදල් (නෝට්ටු හා කාසි) ආර්ථිකයට නිකුත් කරනු ලබයි. ( සංඛ්‍යා සටහන II-1 බලන්න)

මහජනතාවගේ අවශ්‍යතා අනුව ව්‍යවහාර මුදල් හුවමාරු කරගැනීමට ඉඩ සලසන අරමුණින් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, ලංකා බැංකුවේ පිටකොටුව ශාඛාවෙහි පවත්වා ගෙන යන ව්‍යවහාර මුදල් හුවමාරු කවුළු මඟින් ව්‍යවහාර මුදල් නිකුත් කිරීම් ද මෙයට ඇතුළත් වේ. 2013 වසරේ දී රුපියල් මිලියන 3,264 ක් වටිනා ව්‍යවහාර මුදල් නෝට්ටු හා රුපියල් මිලියන 79.9 ක් වටිනා කාසි මේ හරහා මහජනතාව වෙත නිකුත් කරනු ලැබීය.

**II-1 සංඛ්‍යා සටහන** **ව්‍යවහාර මුදල් නිකුතුව**

| නිකුතු | වටිනාකම | | | වෙනස ප්‍රතිශතයක් ලෙස | | |
|---|---|---|---|---|---|---|
| | 2011 | 2012 | 2013 | 2011 | 2012 | 2013 |
| නෝට්ටු (රු. බිලියන) | 335.1 | 355.4 | 401.9 | 29.4 | 6.1 | 13.1 |
| කාසි (රු. මිලියන) | 472.4 | 748.7 | 541.3 | 12.7 | 58.5 | -27.7 |
| **එකතුව (රු. බිලියන)** | **335.6** | **356.1** | **402.4** | **29.4** | **6.1** | **13.0** |

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට සංසරණයේ පැවති ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසිවල වටිනාකම රුපියල් බිලියන 339.7 ක් වූ අතර එය 2012 දෙසැම්බර් 31 පැවති සංසරණයට සාපේක්ෂව සියයට 6.8 ක වර්ධනයකි. (සංඛ්‍යා සටහන II-2 බලන්න) (වටිනාකම් අනුව විස්තර මෙම වාර්තාවෙහි සිව්වන කොටසෙහි සංඛ්‍යා සටහන් යටතේ දක්වා ඇත). ආර්ථික කටයුතුවල වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙසින් සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්වල වටිනාකම ඉහළ ගොස් ඇත. කෙසේවුවද, මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ යාම හා බැංකු පද්ධතිය හරහා නව ගෙවීම් උපකරණ භාවිතය හේතුවෙන් මුළු මුදල් සැපයුමෙන් (පුළුල් මුදල්) මහජනතාව සතු ව්‍යවහාර මුදල් ප්‍රමාණය 2008 අවසානයේ දී පැවති සියයට 10.2 ක ප්‍රමාණයේ සිට 2013 වසර අවසානය වන විට සියයට 7.7 දක්වා ක්‍රමයෙන් අඩු විය.

**II-2 සංඛ්‍යා සටහන** **සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල්**

| සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් | වටිනාකම | | | වෙනස ප්‍රතිශතයක් ලෙසින් | | |
|---|---|---|---|---|---|---|
| | 2011 | 2012 | 2013 | 2011 | 2012 | 2013 |
| නෝට්ටු (රු. බිලියන) | 287.1 | 311.2 | 332.4 | 14.8 | 8.4 | 6.8 |
| කාසි (රු. බිලියන) | 6.1 | 6.9 | 7.3 | 7.0 | 13.1 | 5.8 |
| **මුළු (රු. බිලියන)** | **293.2** | **318.1** | **339.7** | **14.7** | **8.5** | **6.8** |

(ඇ) ව්‍යවහාර මුදල් සඳහා ඇති ඉල්ලුම සපුරාලීම සඳහාත් උසස් තත්ත්වයේ නෝට්ටු, සංසරණයේ යෙදවීම තහවුරු කිරීම සඳහාත් 2013 වසර තුළ දී, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියන 189.5 ක් මුද්‍රණය කිරීමට සහ කාසි මිලියන 82.9 ක් ටංකනය කිරීමට කටයුතු යොදන ලදී. ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව 2013-2015 කාලය සඳහා රු. 10, රු. 5, රු. 2 හා රු. 1 සංසරණ කාසි මිලියන 550 ක් ටංකනය කිරීම සඳහා අන්තර්ජාතික මිල ගණන් කැඳවීමේ පටිපාටිය මගින් තෝරාගත් ටංකන සමාගම් සමග ගිවිසුම් අත්සන් කරන ලදී.

(ඈ) පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව 2013 නොවැම්බර් 15 සිට 17 දක්වා ශ්‍රී ලංකාවේ පැවැත්වීම සැමරීම සඳහා රු. 500 ක වටිනාකමින් යුත් සමරු නෝට්ටුවක් නිකුත් කරන ලදී. මෙය ශ්‍රී ලංකා මහ බැංකුව ස්ථාපිත වීමේ සිට නිකුත් කරන ලද තෙවන සමරු නෝට්ටුව වේ.

(ඉ) ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක නියෝජනය කිරීම සඳහා එක් එක් දිස්ත්‍රික්කවල විශේෂ ලක්ෂණ පිළිඹිබු කෙරෙන මෝස්තර සහිතව රු.10 කාසි කාණ්ඩයක් ටංකනය කිරීමේ කාර්යය ආරම්භ කළ අතර එම මෝස්තර සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගන්නා ලදී. මෙම කාසි 2014 වසරේ දී සංසරණය සඳහා නිකුත් කිරීමට සැලසුම් කර ඇත.

## 5.2 බලපත්‍රලාභී වාණිජ බැංකු සමග කෙරෙන මුදල් මෙහෙයුම් කටයුතු

(අ) වාණිජ බැංකු විසින් පවත්වා ගතයුතු ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව සඳහා මූලික වශයෙන්, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් ව්‍යවහාර මුදල් තැන්පතු භාර ගනු ලබයි. ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් තැන්පත් කෙරෙන සේවා නිසි මෙන්ම සේවා අනිසි නෝට්ටු සහ කාසි ද භාර ගනු ලබයි. (සංඛ්‍යා සටහන II-3 බලන්න) මෙසේ තැන්පත් කෙරුණු සේවා නිසි මුදල් එම බැංකු හරහා සංසරණය සඳහා නැවත නිකුත් කරනු ලබන අතර, සේවා අනිසි නෝට්ටු විනාශ කරනු ලබයි.

**II-3 සංඛ්‍යා සටහන** **බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් කෙරෙන ව්‍යවහාර මුදල් තැන්පතු**

| ව්‍යවහාර මුදල් තැන්පතු | වටිනාකම | | | වෙනස ප්‍රතිශතයක් ලෙසින් | | |
|---|---|---|---|---|---|---|
| | 2011 | 2012 | 2013 | 2011 | 2012 | 2013 |
| නෝට්ටු (රු. බිලියන) | 297.9 | 331.2 | 381.0 | 34.1 | 11.2 | 15.0 |
| කාසි (රු. මිලියන) | 13.8 | 3.0 | 1.4 | 115.0 | -78.3 | -53.3 |
| **මුළු (රු. බිලියන)** | **297.9** | **331.2** | **381.0** | **34.1** | **11.2** | **15.0** |

(ආ) ව්‍යවහාර මුදල් තැන්පතු සහ ආපසු ගැනීම් ඉහළ යාම නිසා ඒවා කාර්යක්ෂමව හා වේගවත් ලෙස සකස් කිරීම සඳහා මුදල් පිරිසැකසුම් කටයුතු තවදුරටත් ස්වයංක්‍රීය කිරීමට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී. ඒ අනුව, නෝට්ටු හරි වැරදි බැලීමේ, ගණන් කිරීමේ, තේරීමේ කටයුතුවල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම හා පරිසර හිතකාමී ලෙස ව්‍යවහාර මුදල් විනාශ කිරීම සඳහා ස්වයංක්‍රීය නෝට්ටු පිරිසැකසුම් යන්ත්‍ර දෙකක් මිලදී ගැනීම් කටයුතු සම්පාදනය කරන ලදී.

## 5.3 නීති ක්‍රියාත්මක කිරීමේ බලධාරීන්ට ලබාදෙන ලද සහය

2013 වසර තුළ දී, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් ව්‍යවහාර මුදල් සම්බන්ධව මුදල් නීති පනතේ විධිවිධාන

උල්ලංඝනය කරමින් මුදල් ව්‍යාජ ලෙස ප්‍රතිනිර්මාණය කිරීම් සම්බන්ධව නීති ක්‍රියාත්මක කරන බලධාරීන්ට සහය දීම සඳහා පහත සඳහන් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරන ලද අතර, ඒවා පහත පරිදි වේ.

(අ) ව්‍යාජ මුදල් සැකසීමේ ප්‍රයත්නවලට අදාළව පොලිසියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාජ මුදල් කාර්යාංශය හා නීති ක්‍රියාත්මක කරන බලධාරීන් සමග සහයෝගයෙන් කටයුතු කරන ලදී. 2013 වසර තුළ දී හඳුනාගත් ව්‍යාජ මුදල් නෝට්ටු ගණන 5,133 ක් වූ අතර එය සංසරණයේ පැවති අව්‍යාජ නෝට්ටු මිලියනයකට ව්‍යාජ නෝට්ටු 6 ක් වූ අතර එය 2012 වසරේ හඳුනාගත් ව්‍යාජ නෝට්ටු අනුපාතය හා සමාන වේ.

(ආ) ව්‍යාජ මුදල් නෝට්ටු සකස් කිරීම පිළිබඳව පැවති නඩුවිභාගවලට අවශ්‍ය කටයුතු සඳහා අභියෝග කළ නොහැකි සාක්ෂියක් වශයෙන් අදාළ උසාවිවලට අධිපතිතුමාගේ අත්සන සහිත සහතික 141 ක් නිකුත් කෙරිණ.

ඇ) ව්‍යාජ මුදල් සැකසීම පිළිබඳ අධිකරණ නඩු විභාගවල සාක්ෂිකරුවන් වශයෙන් නඩු විභාග 18 කට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පෙනී සිටිනු ලැබීය.

(ඈ) ව්‍යාජ මුදල් නෝට්ටු සංසරණයට එකතුවීම වැළැක්වීම සඳහා ව්‍යාජ මුදල් හඳුනාගත හැකි වන පරිදි ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු ශක්තිමත් කිරීමට සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය ආයතන වෙත චක්‍රලේඛන නිකුත් කරන ලදී. සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය ආයතන ව්‍යාජ මුදල් හඳුනාගත හැකි මුදල් ගණනය කිරීමේ යන්ත්‍ර භාවිතා කළ යුතු බව දන්වන ලදී.

## 5.4 වෙනත් ක්‍රියාකාරකම්

### (අ) පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම

2007 වසරේ මාර්තු මස ආරම්භ කරන ලද පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය 2013 වසරේ දී වඩා සක්‍රීයව දියත් කරන ලදී. පිරිසිදු මුදල් ප්‍රතිපත්තියේ මූලික අරමුණ වනුයේ, මැදි ආදායම්ලාභී නැගී එන ආර්ථිකයන් අතර ශ්‍රී ලංකාවේ වඩා හොඳ ප්‍රතිරූපයක් ඇති කිරීම සඳහා හොඳ තත්ත්වයේ ව්‍යවහාර මුදල් සංසරණයේ යෙදවීමයි. මුදල් නෝට්ටුවල ආයු කාලය දීර්ඝ කිරීමට හා නව මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමට යන පිරිවැය අඩු කිරීම සඳහා මුදල් පරිහරණය කිරීමේ හොඳ පුරුදු අනුගමනය කිරීමට අනුබල දෙන ලද අතර ඒ ඇතුළුව පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය ශක්තිමත්ව ක්‍රියාවට නැංවීම සඳහා 2013 වසරේ දී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

(i) සේවා නිසි හා සේවා අනිසි මුදල් නෝට්ටු තේරීමේ පරාමිතීන් පිළිබඳව චක්‍රලේඛනයක් සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද අතර එම චක්‍රලේඛනයට අනුව කටයුතු කරන බවට තහවුරු කිරීම සඳහා බැංකු ශාඛා 331 ක් පරීක්ෂා කරන ලදී.

(ii) ව්‍යවහාර මුදල් තේරීම හා මුදල් පරිහරණය කිරීමේ වෙනත් පුරුදු පිළිබඳව බලපත්‍රලාභී වාණිජ බැංකුවල මුදල් කළමනාකරුවන් සමග රැස්වීම් 4 ක් පවත්වනු ලැබීය.

(iii) නිකුත් කරන ලද උපදෙස්මාලාවන්ට අනුකූලව වාණිජ බැංකු කටයුතු කරන බවට සහතික වීම සඳහා වාණිජ බැංකු විසින් තැන්පත් කරන නෝට්ටු අහඹු ලෙස පරීක්ෂා කරන ලදී.

(iv) තමන් සතු සේවා අනිසි මුදල් නෝට්ටු බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් හුවමාරු කර ගැනීමට හා මුදල් පරිහරණයේ හොඳ පුරුදු පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම හා උනන්දු කරවීම සඳහා රූපවාහිනී දැන්වීම්, ගුවන් විදුලි සාකච්ඡා, පෝස්ටර් හා සම්මන්ත්‍රණ මගින් පුළුල් ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කරන ලදී.

(v) 2013 වසර තුළ දී ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව වෙත තැන්පත් කෙරුණු රුපියල් බිලියන 67.7 ක වටිනාකමින් යුත් සේවා අනිසි මුදල් නෝට්ටු මිලියන 157.7 ක් එම මුදල් නෝට්ටු තේරීමෙන් අනතුරුව විනාශ කරනු ලැබීය.

### (ආ) කාසි එකතු කිරීම

නව කාසි සංසරණයට නිකුත් කිරීම සඳහා සෑම වසරකම සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් වැය වේ. කෙසේ වුවද, මෙම කාසිවලින් විශාල ප්‍රමාණයක් සංසරණයට එකතු නොවී ආගමික සිද්ධස්ථාන හා කාසි කැටවල භාවිතයට නොගෙන එක් රැස්වී ඇති බවට වාර්තාවේ. එබැවින්, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව භාවිතයට නොගෙන එක්රැස් වී ඇති කාසි එකතු කර නැවත සංසරණය කිරීමේ පුළුල් වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, කාසි එකතු කිරීමේ වැඩසටහන් 125 ක් දීපව්‍යාප්තව පවත්වන ලද අතර එමගින් රුපියල් මිලියන 67.1 ක වටිනාකමින් යුත් කාසි මිලියන 24.8 ක් එකතු කර නැවත සංසරණය සඳහා නිකුත් කිරීමට හැකි විය.

### (ඇ) මහජනතාව දැනුම්වත් කිරීම

ව්‍යවහාර මුදල් නෝට්ටුවල අන්තර්ගත ආරක්ෂණ සලකුණු, උසස් ප්‍රමිතියකින් යුත් නෝට්ටු භාවිතා කිරීම මෙන්ම මුදල් නෝට්ටු හා කාසි භාවිතයේ දී ඇති කර ගත යුතු යහපත් පුරුදු පිළිබඳව මහජන අවබෝධය වැඩිදියුණු කිරීමේ අරමුණින් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව පහත විස්තර කර ඇති අයුරින් මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාව තවදුරටත් කරගෙන යන ලදී.

(i) සම්මන්ත්‍රණ/වැඩමුළු 47 ක් පැවැත්වීම, ගුවන් විදුලි/ රූපවාහිනී වැඩසටහන් 13 කට සහභාගිවීම සහ

රූපවාහිනී දැන්වීම් 5 ක් විකාශනය කිරීම සිදු කරන ලදී. මේ සඳහා බැංකු නිලධාරීන්, මුදල් අයකැමිවරුන්, පොලිස් නිලධාරීන්, පාසල් සිසුන්, රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සේවකයන් සහ මහජනතාව සහභාගී විය.

(ii) මුදල් කවය සඳහා බැඳුණු පාසල් 3 ක් වෙත තොරතුරු පත්‍රිකා බෙදා හරින ලද අතර එක් පාසලක ව්‍යවහාර මුදල් පිළිබඳ ප්‍රදර්ශනයට සමගාමීව වැඩමුළුවක් ද පවත්වන ලදී.

(iii) 2013 මාර්තු 23 සිට 30 දක්වා අම්පාරේ පැවති දැයට කිරුළ 2013 ජාතික සංවර්ධන ප්‍රදර්ශනය හා තවත් ප්‍රදර්ශන 5 ක් සඳහා ජංගම මුදල් කෞතුකාගාරය ප්‍රදර්ශනය කරවන ලදී.

(iv) නරඹන්නන් 15,754 ක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් කෞතුකාගාර තුන මගින් පහසුකම් සපයන ලදී.

**(ඈ) ව්‍යවහාර මුදල් ප්‍රතිනිර්මාණය කිරීම සඳහා අවසර ලබාදීම**

දැන්වීම් සඳහා මුදල් නෝට්ටු ප්‍රතිනිර්මාණය කිරීමේ අවස්ථාවන් 3 ක් සඳහා මුදල් මණ්ඩලයේ අනුමත ප්‍රතිපත්තියට අනුකූලව අනුමැතිය ලබාදෙන ලදී.

**(ඉ) ආර්ථික ඉතිහාස කෞතුකාගාරය පිහිටුවීම**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආර්ථික ඉතිහාස කෞතුකාගාරයක්, 2013 නොවැම්බර් 11 වන දින කොළඹ කොටුවේ පිහිටි අභිනවයෙන් පිළිසකර කරන ලද සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ලෙහි පිහිටුවන ලද අතර රාජගිරිය, බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයෙහි පවත්වා ගෙන යනු ලැබූ මුදල් කෞතුකාගාරය එම ආර්ථික ඉතිහාස කෞතුකාගාරයට ගෙන යන ලදී. ආර්ථික ඉතිහාස කෞතුකාගාරය, අනුරාධපුර (ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව.10 වන ශතවර්ෂය දක්වා), පොළොන්නරුව, කෝට්ටේ, මහනුවර රාජධානි සමයේ මෙන්ම පෘතුග්‍රීසි, ලන්දේසි හා ඉංග්‍රීසි යටත් විජිත යුගවල සහ නිදහසෙන් පසු ශ්‍රී ලංකාවේ භාවිතා වූ කාසි හා කඩදාසි නෝට්ටු විදහා දක්වයි. ව්‍යවහාර මුදල් නෝට්ටුවල අන්තර්ගත ආරක්ෂණ සලකුණු පිළිබඳව දැනුම ලබාගැනීම සඳහා අදාළ ආරක්ෂණ සලකුණු මත ස්පර්ශ කිරීමෙන් ඒ පිළිබඳ තොරතුරු ලබාගත හැකි ස්පර්ශ සංවේදී තිර ද මෙම ආර්ථික ඉතිහාස කෞතුකාගාරයෙහි පිහිටුවා ඇත.

## 6. දේශීය කටයුතු

මුදල් නීති පනතේ 5 සහ 6 වන පරිච්ඡේද යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවට පැවරී ඇති විධිවිධාන අනුව, දේශීය කටයුතු දෙපාර්තමේන්තුව එහි ප්‍රධාන කාර්යයන් ලෙස විවට වෙළෙඳ කටයුතු පවත්වාගෙන යාම, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව බලාත්මක කිරීම සහ වාණිජ බැංකුවල සහ රජයේ බැංකුකරු ලෙස කටයුතු කිරීමත් යන ප්‍රධාන කාර්යයන්හි නිරත විය.

එමෙන්ම, 2013 වසරේ දී දෙපාර්තමේන්තුව තත්කාලීන දළ පියවුම් පද්ධතියේ ගෙවීම් සහ පියවීම් කටයුතු සුමටව පවත්වා ගැනීම සඳහා වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් වෙත දෛනික ද්‍රවශීලතා පහසුකම් ලබාදෙමින් කාර්යක්ෂම හා ඵලදායී විද්‍යුත් ගෙවීම් සහ පියවීම් පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා පහසුකම් සලසන ලදී.

### 6.1 දේශීය කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන්

කෙටිකාලීන පොලී අනුපාතික, මුදල් මණ්ඩලය මගින් තීරණය කරනු ලබන ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවෙහි අපේක්ෂිත මට්ටමක පවත්වාගෙන යාමේ අරමුණින් දේශීය කටයුතු දෙපාර්තමේන්තුව, විවට වෙළෙඳ කටයුතුවල නිරත විය. ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් අනුපාතික ලෙස හැඳින්වෙන ප්‍රතිපත්ති පොලී අනුපාතික මුදල් මණ්ඩලය විසින් මාසිකව විවරණයට ලක් කරන අතර, ඒ අනුව සංශෝධනයට ලක්වන ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව විවට වෙළෙඳ කටයුතු සඳහා පදනම සපයයි. ඉහත සඳහන් කළ ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් අනුපාතික, විවට වෙළෙඳ කටයුතු සඳහා පිළිවෙළින් පොලී අනුපාත කොරිඩෝවෙහි පහළ හා ඉහළ පොලී අනුපාතික සීමාවන් තීරණය කරන අතර, ඒ යටතේ දෛනික පදනම මත නිත්‍ය පහසුකම් සපයයි. දැනට පවතින ප්‍රතිමිලදීගැනුම් නිත්‍ය පහසුකම, නිත්‍ය තැන්පතු පහසුකම ලෙස ප්‍රතිනාමකරණය කළ අතර මෙය බැංකු පද්ධතියෙහි පවතින අතිරික්ත අරමුදල් මහ බැංකුවේ තැන්පත් කිරීම වෙනුවෙන් ගෙවන පහළ පොලී අනුපාතික සීමාව ලෙස ක්‍රියාකරයි. ප්‍රතිවිකුණුම් නිත්‍ය පහසුකම, නිත්‍ය ණය පහසුකම ලෙස ප්‍රතිනාමකරණය කළ අතර මෙය මහ බැංකුව විසින් බැංකු පද්ධතියට සපයන ණය වෙනුවෙන් අයකරන ඉහළ පොලී අනුපාතික සීමාව ලෙස ක්‍රියාකරයි. එසේම වර්තමාන ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව ද නිත්‍ය පහසුකම් අනුපාතික කොරිඩෝව ලෙස ප්‍රතිනාමකරණය කෙරුණු අතර, ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය පිළිවෙළින් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය ලෙස 2014 ජනවාරි මස දෙවන දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රතිනාමකරණය කරණ ලදී. මුදල් මණ්ඩලය විසින් විටින් විට තීරණය කරනු ලබන, බලපත්‍රලාභී වාණිජ බැංකුවල තැන්පතු වගකීම් මත පවත්වා ගතයුතු ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව බලාත්මක කිරීම, රජයේ සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවල බැංකුකරු වශයෙන් කටයුතු කිරීම සහ මුදල් තැරැව්කරුවන් සුපරීක්ෂණය කිරීම ද මෙම දෙපාර්තමේන්තුව විසින් කරනු ලබයි.

### 6.2 මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

2013 වසරේ දී දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් කෙටිකාලීන පොලී අනුපාතික, පවතින මුදල් ප්‍රතිපත්තියට අනුරූපව පවත්වාගෙන යාම සඳහා මූල්‍ය වෙළෙඳපොළෙහි ද්‍රවශීලතා ඉල්ලුම හා සැපයුම සැලකිල්ලට ගනිමින් විවට වෙළෙඳ කටයුතුවල යෙදීම ප්‍රධාන වශයෙන් සිදුකරන ලදී.

2013 වසරේ ආරම්භයේ දී දේශීය මුදල් වෙළෙඳපොළ පැවති ද්‍රවශීලතා හිඟය, පළමු සතිය තුළ ලංකා බැංකුව විසින් නිකුත් කළ විදේශ බැඳුම්කරය මහ බැංකුව විසින් මිලදී ගැනීමත් සමඟ අතිරික්ත තත්ත්වයකට හැරිණි. එතැන් සිට වසර මුළුල්ලේම අතිරික්ත ද්‍රවශීලතා වාතාවරණයක් දක්නට ලැබිණි. මෙම අතිරික්තය සඳහා බලපෑ ප්‍රධාන මූලාශ්‍ර වූයේ, ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් නිකුත් කළ විදේශ බැඳුම්කරය මහ බැංකුව විසින් මුදල් කිරීම, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය පදනම් අංක 200 කින් (තැන්පතු වගකීම් වලින්) පහත හෙලීම, මහ බැංකුව මගින් විදේශ විනිමය මිලදී ගැනීම සහ මහ බැංකු අතිරික්ත ආදායම් රජය වෙත මුදාහැරීම යනාදියයි. වසර මුළුල්ලේම අතිරික්ත ද්‍රවශීලතාව සක්‍රීය විවට වෙළෙඳ කටයුතු මගින් අවශෝෂණය කරන ලදී. මේ සඳහා එක්දින ප්‍රතිමිලදීගැනීම් වලට අමතරව කෙටිකාලීන ප්‍රතිමිලදීගැනීම් වෙන්දේසි ද බහුල වශයෙන් යොදා ගන්නා ලදී. කෙසේ වුවද, වෙළෙඳපොළ ද්‍රවශීලතා හිඟය මගහැරවීම සඳහා එක්දින ප්‍රතිවිකුණුම් වෙන්දේසි සහ නිත්‍ය පහසුකම් යටතේ ප්‍රතිවිකුණුම්වලට අමතරව කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි කිහිපයක් ද පවත්වන ලදී. 2013 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් විකිණීමේ වෙන්දේසි තුළින් අතිරික්ත ද්‍රවශීලතාවයෙන් රුපියල් බිලියන 128.8 ක් ස්ථිර පදනම මත අවශෝෂණය කර ගන්නා ලදී. විවට වෙළෙඳ කටයුතු තුළින් අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කිරීමෙහිලා ශ්‍රී ලංකා මහ බැංකුව සතුව පැවති රාජ්‍ය සුරැකුම්පත් ප්‍රමාණවත් නොවීම නිසා, භාණ්ඩාගාර බැඳුම්කර ණයට ලබාගැනීමේ වැඩසටහන යටතේ, භාණ්ඩාගාර බැඳුම්කර ණයට ලබාගන්නා ලදී.

විවට වෙළෙඳ මෙහෙයුම් කටයුතු ශක්තිමත් කරමින් මුදල් වෙළෙඳපොළෙහි ද්‍රවශීලතා කළමණාකාරිත්වය වර්ධනය කිරීම පිණිස විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරම්භයේ සිට පැවති ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවයට ප්‍රධාන වෙනස්කම් කිහිපයක් 2013 වසරේ මැයි මාසයේදී හඳුන්වා දෙන ලදී. ඒ අනුව, පැවති සංචිත ගණනය කිරීම සහ පවත්වා ගැනීමේ සත් දින සාමාන්‍යකරණ කාලසීමාව මසකට දෙවතාවක් වශයෙන්, මාසයේ පළමු දින සිට 15 වන දින දක්වාත්, සහ 16 වන දින සිට මාසය අවසානය දක්වාත් දීර්ඝ කරන ලදී. ඒ සමඟම වෙළෙඳපොළ තුළ ද්‍රවශීලතාව ප්‍රමාණවත්ව පවත්වාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එදිනම පියවීමේ පදනම මත සතියක් දක්වා වූ කෙටිකාලීන වෙන්දේසි 2013 අගෝස්තු මාසයේ දී හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වන දිනයන්හි දී ප්‍රතිමිලදීගැනුම් නිත්‍ය පහසුකම මත පනවා තිබූ රුපියල් මිලියන 100 ක සීමාව ද අත්හිටුවන ලදී. ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය ද පහත හෙලන ලදී. මෙම ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයක් ලෙස වසර මුල දී ප්‍රතිපත්ති පොලී අනුපාතිකයෙහි ඉහළ සීමා ඉක්මවා යම්තාක් උච්චාවචනය වූ දෛනික බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, ප්‍රතිපත්ති අනුපාතික කොරිඩෝවෙහි මධ්‍ය දෙසට ක්‍රමයෙන් ගමන් කරන ලදී.

**II-1 රූප සටහන** **සමස්ත ද්‍රවශීලතාව සහ ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව**




### 6.2.1 විවට වෙළෙඳ කටයුතු

#### (අ) දෛනික වෙන්දේසි

#### (i) ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි

2013 සැප්තැම්බර් මස 20 වන දින දක්වා බැංකු පද්ධතිය තුළ තිබූ අතිරික්ත ද්‍රවශීලතාව දෛනික වෙන්දේසි තුළින් අවශෝෂණය කර ගනු ලැබිණි. සාමාන්‍ය වශයෙන්, දෛනිකව රුපියල් බිලියන 22.4 ක පමණ ප්‍රතිමිලදීගැනුම් පිරිනැමූ අතර, එමගින් අතිරික්ත ද්‍රවශීලතාවයෙන් සියයට 48 ක පමණ ප්‍රමාණයක් අවශෝෂණය කරගනු ලැබීය. දෛනික ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි වලදී බරිත සාමාන්‍ය එළඹ අනුපාතිකය සියයට 6.98 ත් සියයට 8.50 ත් අතර පැවැතිණි. බරිත සාමාන්‍ය එක්දින ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි අනුපාතිකය ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ පහළ සීමාව ආසන්නයේ පැවතුණි.

#### (ii) ප්‍රතිවිකුණුම් වෙන්දේසි

2013 වසරේ දී, අවස්ථා කිහිපයකදීම වෙළෙඳපොළ තුළ ද්‍රවශීලතා හිඟයක් පැවතුණි. එබැවින් ප්‍රතිවිකුණුම් වෙන්දේසි තුළින් දෛනික පොලී අනුපාතිකය ඉහළ යාමට පැවති පීඩනය මැඩ පැවැත්විණි. සාමාන්‍ය වශයෙන්, ද්‍රවශීලතා හිඟයක් පැවැති අවස්ථාවලදී රුපියල් බිලියන 6.1 ක ප්‍රමාණයක් ප්‍රතිවිකුණුම් වෙන්දේසි මගින්, සියයට 8.25 ත් සියයට 9.31 ත් අතර බරිත සාමාන්‍ය එළඹ අනුපාතිකයකට පිරිනමන ලදී. තවද, ද්‍රවශීලතා හිඟයක් පැවතුනු අවස්ථාවන්හිදී ද්‍රවශීලතා අවශ්‍යතාවයෙන් සියයට 51.7 ක ප්‍රමාණයක් ප්‍රතිවිකුණුම් වෙන්දේසි තුළින් වෙළෙඳපොළ වෙත මුදාහරින ලදී.

#### (ආ) කාලීන වෙන්දේසි

#### (i) කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි

අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණයකර ගැනීමේ පිළියමක් වශයෙන්, එදිනම පියවීමේ පදනම මත කෙටිකාලීන ප්‍රතිමිලදී

ගැනුම් යටතේ භාණ්ඩාගාර බිල්පත් විකිණීම, 2013 අගෝස්තු මාසයේදී දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් හඳුන්වාදෙන ලදී. සාමාන්‍ය වශයෙන් දෛනිකව රුපියල් බිලියන 18.5 ක් වෙන්දේසි මගින් පිරිනැමූ අතර, ඇස්තමේන්තුගත අතිරික්ත ද්‍රවශීලතාවයෙන් සියයට 31.7 ක ප්‍රමාණයක්, එනම් රුපියල් බිලියන 765.3 ක ප්‍රමාණයක් කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් තුළින් අවශෝෂණය කර ගන්නා ලදී. කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම්වල උපරිම පරිණත කාලය සතියක් වූ අතර, බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය සියයට 7.00 ත් සියයට 7.98 ත් අතර විය.

**(ii) කෙටිකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි**

එදිනම පියවීමේ පදනම මත භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීම සඳහා කෙටිකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි 2 ක් පමණක් දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී. රුපියල් බිලියන 5 ක් පමණක් එක් වෙන්දේසියක් යටතේ සියයට 8.20 ක බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකයකට වෙළෙඳපොළට මුදාහරින ලදී.

**(iii) කාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි**

ශ්‍රී ලංකා මහ බැංකුව, වසර තුළ පවත්වන ලද කාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි වලින් රුපියල් බිලියන 51.6 ක් වටිනා අතිරික්ත ද්‍රවශීලතාවක් අවශෝෂණය කර ගන්නා ලදී. කාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසිවල කල්පිරීමේ කාලය දින 7 ත් දින 63 ත් අතර විය. වසර තුළ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය සියයට 7.45 සහ සියයට 8.95 ත් අතර පැවතුණි.

**(iv) කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි**

2013 වසර තුළ දී වෙළෙඳපොළට දිගුකාලීනව ද්‍රවශීලතාව සැපයීමේ උපාය මාර්ගයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වන ලදී. එම වෙන්දේසිවල කල්පිරීමේ කාලය දින 11 ත් 30 ත් අතර පරාසයක පැවැති අතර බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය සියයට 8.25 හා සියයට 9.56 ත් අතර පැවතුණි. වසර තුළ දී මෙම වෙන්දේසි මගින් සපයන ලද ද්‍රවශීලතා වටිනාකම රුපියල් බිලියන 40.5 ක් විය.

**(ඈ) නිත්‍ය පහසුකම**

අන්තර් බැංකු මුදල් වෙළෙඳපොළ සහ විවට වෙළෙඳපොළ කටයුතු යටතේ දෛනික වෙන්දේසි තුළින් සිය කෙටිකාලීන අරමුදල් අවශ්‍යතාවන් කළමනාකරණයකර ගැනීමට අපොහොසත් වූ සහභාගිත්ව ආයතන සඳහා මහ බැංකු ප්‍රතිමිලදීගැනුම් හා ප්‍රතිවිකුණුම් අනුපාතික යටතේ නිත්‍ය පහසුකම් සැපයීම වසර පුරාම සිදු කරන ලදී. ප්‍රතිමිලදීගැනුම් ගනුදෙනු යටතේ සිදුකරන ලද නිත්‍ය පහසුකම්වල දෛනික සාමාන්‍යය රුපියල් බිලියන 9.0 ක් ද මුළු වටිනාකම රුපියල් බිලියන 2,192.2 ක් ද ලෙස වාර්තා විය. 2013 වසර තුළ දී නිත්‍ය පහසුකම් යටතේ සිදුකළ ප්‍රතිවිකුණුම් ගනුදෙනුවල වටිනාකම රුපියල් බිලියන 105.4 ක් විය.

**(ඇ) ස්ථිර පදනමක් මත වූ ගනුදෙනු**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීම සඳහා සිය ආයෝජන කළඹ සතු භාණ්ඩාගාර බිල්පත් ස්ථිර පදනම මත අලෙවි කිරීමට වෙන්දේසි පවත්වනු ලැබීය. 2013 වසරේ දී පවත්වන ලද මෙම වෙන්දේසි තුළින් අලෙවි කරන ලද භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකම රුපියල් බිලියන 128.8 ක් විය. මෙසේ අලෙවි කරන ලද භාණ්ඩාගාර බිල්පත්වල කල්පිරීමේ කාලය දින 7 සිට දින 64 දක්වා පරාසයක පැවති අතර ඵලදා අනුපාතිකය සියයට 7.28 සහ සියයට 9.10 ත් අතර විය.

**6.2.2 ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව**

ශ්‍රී ලංකා මහ බැංකුවේ රෙගුලාසිවලට අනුකූලව සෑම වාණිජ බැංකුවක්ම තම මුළු තැන්පතු වගකීම් පදනම් කර ගෙන මහ බැංකු ජංගම ගිණුමේ අනිවාර්යයෙන් පවත්වාගෙන යා යුතු අවම සංචිත ප්‍රමාණය ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ලෙස හඳුන්වයි. වාණිජ බැංකුවල ව්‍යවස්ථාපිත සංචිත පවත්වාගෙන යාම සහ එම ගිණුම පරිපාලනය කිරීමේ වගකීම දේශීය කටයුතු දෙපාර්තමේන්තුව සතුවේ. වාණිජ බැංකුවල මුළු තැන්පතු වගකීම්වලින් සියයට 8 ක් වූ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා අනුපාතය, 2013 ජූලි 01 දින සිට සියයට 6 දක්වා පහත දමන ලදී.

**6.2.3 බැංකු අනුපාතිකය**

මුදල් නීති පනතේ 87 වන වගන්තිය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සපයනු ලබන කෙටිකාලීන අත්තිකාරම් මත වූ මහ බැංකු පොලී අනුපාතිකය සියයට 15 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. කෙසේ වුවද, මෙම පොලී අනුපාතිකය යටතේ වාණිජ බැංකු විසින් මහ බැංකුවෙන් ණය ලබාගැනීමේ අවශ්‍යතාවයක් මෙම වසර තුළ දී ඇති නොවුණු අතර, මෙම බැංකු අනුපාතිකය අධ්‍යයන කරුණක් වශයෙන් පමණක් වැදගත් විය.

## 6.3 වාණිජ බැංකුවල හා රජයේ බැංකුකරු වශයෙන් මහ බැංකුවේ කාර්යභාරය

**6.3.1 මූල්‍ය ආයතනවල ගිණුම්**

මහ බැංකුවට වාණිජ බැංකුවල බැංකුකරු ලෙස ක්‍රියාත්මකවීමට අවශ්‍ය පහසුකම් ලබාදෙමින් කාර්යක්ෂම අන්තර් බැංකු ගෙවීම් හා පියවීම් පද්ධතියක් සහතික කරනු පිණිස දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් වෙත ජංගම ගිණුම් පහසුකම් සපයන ලදී. 2013 වසර අවසාන වන විට මහ බැංකුව විසින් වාණිජ බැංකු සඳහා ගිණුම් 24 ක් ද ප්‍රාථමික වෙළෙඳුන් සඳහා ගිණුම් 7 ක් ද පවත්වාගෙන යන ලදී. මෙම ගිණුම් ස්වයංක්‍රීය පොදු ලෙජර් පද්ධතිය තුළ තත්කාලීන දළ පියවුම් පදනමක් මත ක්‍රියාත්මක විය.

**6.3.2 රජයේ ගිණුම්**

රජයේ බැංකුකරු වශයෙන් රජයට අවශ්‍ය බැංකු පහසුකම් ලබාදෙමින්, දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින්, රජයේ

දෙපාර්තමේන්තු, රජයේ නියෝජිත ආයතන හා සංස්ථා සහ ඇතැම් ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අවශ්‍ය ගිණුම් පවත්වාගෙන යන ලදී. 2013 වසර අවසාන වන විට, මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලැබූ මුළු ගිණුම් සංඛ්‍යාව 55 ක් විය. මුදල් නීති පනතේ 89 වැනි වගන්තිය ප්‍රකාරව මහ බැංකුව විසින් රජයට පොලී රහිතව අත්තිකාරම් ලබාදුන් අතර මෙකී අත්තිකාරම් රජයේ ඉදිරි වසරේ ඇස්තමේන්තු මත ආදායමෙන් සියයට 10 ක් නොඉක්මවිය. රජයේ ඇස්තමේන්තු සහ ආදායම් ඉහළ යාම හේතුවෙන්, 2013 වසර තුළ රජයට සැපයිය හැකි තාවකාලික අත්තිකාරම්වල වටිනාකම් සීමාව රුපියල් බිලියන 15.3 කින් ඉහළ යමින් මුළු තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය රුපියල් බිලියන 128.3 ක් විය. 2012 වසර අවසානයේ පැවති මුළු අත්තිකාරම් වටිනාකම වූ රුපියල් බිලියන 111.3 ට සාපේක්ෂව 2013 වසර අවසානයේ දී එය රුපියල් බිලියන 109.2 ක් විය.

### 6.4 දිනය තුළ ද්‍රවශීලතා පහසුකම් සැපයීම්

**II-2 රූප සටහන** **2013 වසරේ දිනය තුළ ලබාගත් ද්‍රවශීලතා පහසුකම්**




තත්කාලීන දළ පියවුම් පද්ධතිය තුළ මෙහෙයුම් කටයුතු සුමටව හා කාර්යක්ෂමව සිදුකිරීම සහතික කිරීමට දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් සහභාගිත්ව ආයතන වෙත දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් සපයන ලදී. රජයේ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සුරැකුම් ලෙස තබාගනිමින් දිනය තුළ දී ද්‍රවශීලතා පහසුකම් සැපයීම්, ගාස්තුවකින් තොරව සිදුකළ අතර, එකී සුරැකුම්පත්වල වටිනාකම, ඒවායේ වර්තමාන මිල ගණන් මත, එම දිනය තුළ සිදුවිය හැකි මිල උච්චාවචනයන් ආවරණය කරගත හැකි පරිදි ප්‍රමාණවත් ගැලපීමක් සහිතව ගණනය කරන ලදී.

2013 වසර තුළ ලබාගත් මුළු එක්දින ද්‍රවශීලතා පහසුකම් ප්‍රමාණය සහ දෛනික වටිනාකමේ සාමාන්‍යය පිළිවෙළින් රුපියල් බිලියන 4,674.1 ක් සහ රුපියල් බිලියන 19.2 ක් විය. පසුගිය වසරේ මෙම අගයන් පිළිවෙළින් රුපියල් බිලියන 3,692 ක් සහ රුපියල් බිලියන 15 ක් වූ අතර, මේ වසරේ එක්දින ද්‍රවශීලතා පහසුකම ප්‍රයෝජනයට ගැනීම පසුගිය වසරට වඩා වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 6.5 මුදල් තැරැව්කරුවන් අධීක්ෂණය කිරීම

දේශීය මුදල් හා විදේශීය විනිමය වෙළෙඳපොළ කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආර්ථිකය තුළ ක්‍රියාත්මක වන විවිධ මූල්‍ය ආයතනවල කටයුතු නියාමනය කිරීමේ වැඩපිළිවෙළ පුළුල් කරන ලදී. මේ අනුව මූල්‍ය පද්ධති ස්ථායීතාව වඩා ශක්තිමත් කිරීමට පහසුකම් සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 1949 අංක 58 දරන මුදල් නීති පනතේ අංක 10 (ඇ) වගන්තිය යටතේ "2013 අංක 1 දරන මුදල් තැරැව්කරුවන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ රෙගුලාසි'' නිකුත් කරන ලද අතර එය 2013 පෙබරවාරි 15 දින සිට ක්‍රියාත්මක විය. මෙම නව නීතිරීතිවලට අනුව, දැනටමත් මුදල් තැරැව්කරුවකු ලෙස මුදල් තැරැව්කාර ව්‍යාපාරයේ නිරත වන හා අලුතින් මුදල් තැරැව්කාර ව්‍යාපාරයට ඇතුළත්වීමට අදහස් කරන ආයතන ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන "බලය පැවරීමේ සහතිකය" (Certificate of Authorisation) ලබාගත යුතුය. මෙම නීතිරීතිවලින් ආවරණය කරනු ලබන අනෙකුත් කරුණු අතර මුදල් තැරැව්කරුවකුගේ අවම සුදුසුකම්, නීත්‍යානුකූලව අවසරලත් ව්‍යාපාර කටයුතු, මෙහෙයුම් අවශ්‍යතා, බලය පැවරීමේ ක්‍රියාවලිය, අභ්‍යන්තර ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග, ආයතනික යහපාලනය, වාර්තා කිරීමේ අවශ්‍යතාවයන් හා මෙම නීතිරීතිවලට අනුකූල වීමට අසමත්වීම සම්බන්ධයෙන් දඬුවම් ක්‍රියාමාර්ගයන් යනාදිය ඇතුළත් වේ. මුදල් තැරැව්කරුවන්ගේ කටයුතු කෙරෙහි විශ්වාසය ඇති කිරීම සහ මූල්‍ය ආයතනයන්ට තමන් ගනු ලබන මුදල් තැරැව්කරණ සේවාවන් පිළිබඳව විශ්වාසයක් ගොඩනැංවීම මෙම නීතිරීතිවලින් බලාපොරොත්තු වේ. එමෙන්ම, රට තුළ සමස්ත මුදල් වෙළෙඳපොළෙහි සහ විදේශ විනිමය වෙළෙඳපොළෙහි හිතකර වර්ධනයන් සහතික කරමින් ප්‍රශස්ත ව්‍යාපාර රීතීන්හි වෘත්තීමය ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා පහසුකම් සලසන අතරතුර මිල තීරණය වීමේ ක්‍රියාවලියෙහි කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම ද මෙමගින් බලාපොරොත්තු වේ.

## 7. ආර්ථික පර්යේෂණ

1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව ස්ථාපිත කිරීම හා සමගාමීව 1950 දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ "ආර්ථික බුද්ධි මණ්ඩලය" වශයෙන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවට පැවරී ඇති ප්‍රධාන කාර්යයන් වන්නේ මුදල් මණ්ඩලයට සහ අධිපතිවරයාට ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා උපකාරී වීමේ අරමුණින් සහ මුදල් හා බැංකු ක්ෂේත්‍රය පිළිබඳ සහ අනෙකුත් වැදගත් ආර්ථික විෂයයන් පිළිබඳ තොරතුරු මහජනතාවට ලබාදීම සඳහා දත්ත සකස් කිරීම සහ ආර්ථික පර්යේෂණ සිදු කිරීමයි. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂට හෝ අධ්‍යක්ෂ විසින් බලය පවරා ඇති ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට දෙපාර්තමේන්තුවේ ව්‍යවස්ථාපිත වගකීම් ඉටුකිරීම සඳහා අවශ්‍ය යැයි හැඟෙන ඕනෑම තොරතුරක්

ඕනෑම පුද්ගලයෙකුගෙන් ලබා ගැනීම සඳහා අවශ්‍ය බලය මුදල් නීති පනත මගින් ලබා දී ඇත.

වසර තුළ දී, ඉහළ ආර්ථික වර්ධනයක් තිරසාරව ළඟා කර ගැනීම සඳහා ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වා ගැනීම මෙන්ම ආයෝජකයන්ගේ විශ්වාසය ශක්තිමත් කරමින් බාහිර කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා විදේශීය අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීම යන අරමුණු ළඟා කර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. තවද, ඵලදායී ප්‍රතිපත්ති සැකසීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති මූලික කරගත් ආර්ථික පර්යේෂණ සිදු කිරීම සහ වාර්ෂික වාර්තාව සහ අනෙකුත් වාර්තා ප්‍රකාශයට පත්කිරීමේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් ඉටු කිරීමද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. රජයට සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට ප්‍රතිපත්තිමය උපදෙස් සැපයීමේ දී ද දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් 2013 වසරේ දී සිය උපායමාර්ගික අරමුණු ළඟා කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

## 7.1 ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වා ගැනීම

මිල ස්ථායීතාව පවත්වාගෙන යාමේ අරමුණින්, අපේක්ෂිත සාර්ව ආර්ථික වර්ධනයන්ට අනුරූප වන පරිදි මුදල් ප්‍රසාරණය සඳහා ඉලක්කයන් සකස් කිරීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව වසර ආරම්භයේදීම කටයුතු කළේය. අනතුරුව ප්‍රතිපත්තිමය මැදිහත්වීමක් අවශ්‍ය කෙරෙන වෙනස්කම් නිර්ණය කර ගැනීම සඳහා ප්‍රවණතා සහ වර්ධනයන් සමීපව නිරීක්ෂණය කරන ලදී. මෙම භාරදූර වගකීම ඉටු කිරීමේ දී මුදල් මණ්ඩලය වෙත මුදල් ප්‍රතිපත්ති උපදේශනයන් ලබා දෙන මුදල් ප්‍රතිපත්ති කමිටුවේ මාසික රැස්වීම් සඳහා මූර්ත, විදේශ, රාජ්‍ය මූල්‍ය හා මුදල් අංශයන්ට අදාළ සාර්ව ආර්ථික සංඛ්‍යා දත්ත සම්පාදනය කිරීම සහ දේශීය සහ අන්තර්ජාතික ආර්ථික ප්‍රවණතා පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීම මගින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සිය කාර්යභාරය ඉටු කළේය. දූරදර්ශී හා කාලීන මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සලසමින් ආර්ථිකමිතික ආකෘති (Econometric Models) යොදා ගනිමින් මතුපිට උද්ධමනය හා මූලික උද්ධමනය පුරෝකතනය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. මූර්ත, විදේශීය, රාජ්‍ය මූල්‍ය සහ මුදල් අංශයන්ගේ සංවර්ධනයන් තුළින් ඇතිවිය හැකි අවදානම් පිළිබඳ ඇගයීම් මෙන්ම මෙම වර්ධනයන්ගෙන් උද්ධමනය හා ආර්ථික වර්ධනය මත ඇතිවිය හැකි බලපෑම පිළිබඳව මුදල් මණ්ඩලය අඛණ්ඩව දැනුම්වත් කිරීම සිදු කරන ලදී. තවද, පෞද්ගලික අංශයේ නියෝජිතයන්ගේ අදහස් ලබා ගනිමින් මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා පිහිටුවන ලද මුදල් ප්‍රතිපත්ති උපදේශක කමිටුව සමඟද මාසික රැස්වීම් පවත්වන ලදී.

මුදල් මණ්ඩලය විසින් ගන්නා ලද මුදල් ප්‍රතිපත්ති තීරණ, මුදල් ප්‍රතිපත්ති පිළිබඳව මාසික පුවත්පත් නිවේදන මගින් මහජනතාව වෙත සන්නිවේදනය කරන ලදී. උද්ධමන අපේක්ෂාවන් පාලනය කිරීම සඳහා ප්‍රතිපත්තිවල තාර්කික බව ඵලදායීව සන්නිවේදනය කිරීමට සහ ප්‍රතිපත්තිවල විශ්වසනීයත්වය පවත්වා ගනිමින් මහජනතාවගේ විශ්වාසය ගොඩනගා ගැනීමට මෙම පුවත්පත් නිවේදන උපකාරී විය. ඒ අනුව, වසර තුළ දී උද්ධමනය මැදි තනි අංකයක මට්ටමක පවත්වා ගැනීම සහ කෙටිකාලීන වෙළෙඳපොළ පොලී අනුපාතික හිතකර මට්ටමක පවත්වා ගැනීම මගින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සිය අරමුණු සාක්ෂාත් කර ගැනීමට සමත් විය. තවද, ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ මන්දගාමී ස්වභාවය සහ නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන්ගේ ඇති වූ නව අවිනිශ්චිතතාවන් මධ්‍යයේ වුවද සුදුසු මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කාලානුරූපව ක්‍රියාත්මක කිරීම නිසා උද්ධමනය වඩාත් හොඳින් පාලනය කිරීමට හැකිවීම හේතුවෙන් ශ්‍රී ලංකාවට සතුටුදායක ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට හැකි විය.

## 7.2 විදේශීය අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීම

විදේශ විනිමය අනුපාතිකය වඩාත් නම්‍යශීලීව තීරණය වීමට ඉඩහැරීම මගින් රටේ විදේශීය අංශයේ ස්ථායීතාව පවත්වා ගනු ලැබිණි. විදේශීය අංශයේ වර්ධනයන් සම්බන්ධව විශේෂිත යාවත්කාලීන කිරීම් සිදු කිරීමට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් විදේශ විනිමය අනුපාතිකය සහ ගෙවුම් තුලනය කෙරෙහි බලපෑම් කළ හැකි බාහිර අවදානම් තත්ත්වයන් සහ කම්පනයන් අඛණ්ඩව හඳුනා ගැනීම සිදු කළ අතර විදේශීය අංශයේ ස්ථායීතාව සහ ශක්‍යතාව තහවුරු කර ගැනීම සඳහා මුදල් මණ්ඩලය වෙත කාලීන ප්‍රතිපත්ති නිර්දේශයන් සමඟ විස්තරාත්මක විශ්ලේෂණයන් සපයන ලදී. රටෙහි විදේශ විනිමය වගකීම් සපුරා ගැනීමට ප්‍රමාණවත් මට්ටමකින් විදේශ විනිමය සංචිත පවත්වාගෙන යාම පිණිස ඇතිවිය හැකි අවදානම් සාධක අන්තර්ගත කරමින් සංචිත ප්‍රමාණාත්මකභාවය සම්බන්ධයෙන් වූ අවදානම් මත බර තැබීමේ නව ක්‍රමවේදයක් සකස් කරන ලදී. අපනයන අංශය වර්ධනය කිරීමට ඇති හැකියාව පිළිබඳව සහ අපනයනකරුවන්ගේ ක්‍රියාකාරීත්වයට පවතින ගැටලු හඳුනා ගැනීම සඳහා අපනයනකරුවන් සමඟ සාකච්ඡා පවත්වන ලදී. එවැනි කටයුතු විදේශීය අංශයේ ක්‍රියාකාරීත්වය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය දූරදර්ශී ප්‍රතිපත්තිමය උපදේශනයන් සැපයීමේ දී උපකාරී විය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් විදේශීය අංශයේ වර්ධනයන් මාසික පුවත්පත් නිවේදන හරහා සන්නිවේදනය කරන ලදී.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලද තාක්ෂණික සහයෝගය හේතුවෙන් ගෙවුම් තුලන සංඛ්‍යාලේඛන සකස් කිරීමේ දී ගෙවුම් තුලන අත්පොතෙහි 5 වන සංස්කරණයේ (BPM 5) සිට ගෙවුම් තුලන අත්පොතෙහි 6 වන සංස්කරණය (BPM 6) දක්වා වැඩිදියුණු කිරීම 2013 වසර තුළ දී අවසන් කර ඇති අතර ගෙවුම් තුලන අත්පොතෙහි 6 වන සංස්කරණය යටතේ ගෙවුම් තුලන සංඛ්‍යාලේඛන ප්‍රකාශයට පත්කිරීම මෙම වාර්ෂික වාර්තාව සමඟින් ආරම්භ වනු ඇත. සේවා අංශය සඳහා පවත්වනු ලබන වාර්ෂික සමීක්ෂණ 8 ට අමතරව, පෞද්ගලික සමාගම්

1,200 ක විදේශීය වත්කම් හා වගකීම් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සඳහා පවත්වනු ලබන අන්තර්ජාතික ආයෝජන තත්ත්වය පිළිබඳ වාර්ෂික සමීක්ෂණය (AIIS) ගෙවුම් තුලන අත්පොතෙහි 6 වන සංස්කරණයට පරිවර්තනය වීම සඳහා උපකාරී විය. තවද, ගෙවුම් තුලන අත්පොතෙහි 6 වන සංස්කරණය යටතේ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය (IIP) පිළිබඳව වූ ප්‍රකාශනය සහ සංචිත දත්ත සටහන (Reserve Data Templates) සම්පාදනය කිරීම වසර තුළ දී අවසන් කෙරිණි. එසේම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ සංචාරක පරිවාර ගිණුම් (Tourism Satellite Account) පද්ධතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කරන ලදී. ශ්‍රී ලංකාව තුළ සංචාරක පරිවාර ගිණුම ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ සහභාගිත්වයෙන් යුතුව තාක්ෂණික දැනුමින් යුතු කාර්ය මණ්ඩලයක් සහ උපදේශන මණ්ඩලයක් පිහිටුවා ඇත.

## 7.3 දූරදර්ශී ප්‍රතිපත්තිමය උපදේශන ලබාදීම

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ආර්ථික ගැටළු සඳහා රජයට සහ අනෙකුත් විවිධ පාර්ශ්වකරුවන්ට ප්‍රතිපත්තිමය උපදේශන ලබාදීම සිදු කරන ලදී. මහ බැංකුවේ අරමුණු ඉටු කර ගැනීමේ දී රජයේ වර්තමාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති මගින් සිදුවන බලපෑම අධ්‍යයනය කරමින් 2013 පළමු භාගයේ දී ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විග්‍රහයක් සහ මැදිකාලීන පෙරදැක්මක් සහිතව 2014 වසරේ රජයේ අයවැය සකස් කිරීම සඳහා උපයෝගී කර ගැනීමට ප්‍රතිපත්ති යෝජනා මාලාවක් ද ඇතුළත් කර සැප්තැම්බර් 15 වාර්තාව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. මෙම වසර තුළ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 124 කට අදාළව සාර්ව ආර්ථික බලපෑම පිළිබඳ ස්වාධීන අදහස් සහ නිර්දේශ ඉදිරිපත් කිරීම ද සිදු කරන ලදී. තවද, රජයේ විවිධ ආයතන මෙන්ම මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු විසින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද විවිධාකාර ගැටළු සඳහා සිය නිරීක්ෂණ හා අදහස් ලබාදෙන ලදී. රජය මගින් ලබාගත් විදේශීය ණය 20 කට අදාළව එහි මූල්‍යමය බලපෑම ඇගයීම් සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර සමාලෝචන කමිටුවේ (SCARC) අවශ්‍යතාව මත රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද සහනදායී නොවන ණය යෝජනා 25 ක් පිළිබඳව නිරීක්ෂණයන් මෙම වසර තුළ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, රජය සහ අනෙකුත් ආයතන මගින් පිහිටුවා ඇති ප්‍රතිපත්ති උපදේශක කමිටුවලට සහභාගි වූ අතර අදාළ ප්‍රතිපත්තිමය උපදේශන සැපයීම සිදු කරන ලදී. පොහොර සඳහා වාණිජ මිල තීරණය කිරීමේ කමිටුව, 2012 වසරේ ශ්‍රී ලංකාවේ කම්කරු හා සමාජීය ප්‍රවණතා විශ්ලේෂණය පිළිබඳ කමිටුව, ගෝලීය ව්‍යාපාර මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා වන උප කමිටුව, වෙළෙඳ කේන්ද්‍රස්ථානයේ ක්‍රියාකාරිත්වය සඳහා වූ නියාමන කමිටුව, මන්නාරම් ද්‍රෝණියේ අක්වෙරළ තෙල් ගවේෂණයේ දෙවන අදියර සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීම් කමිටුව සහ සංචාරක පරිවාර ගිණුම් වැඩසටහන ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් නියෝජනය කළ බාහිර කමිටු අතර වේ.

වෙළෙඳපොළ කටයුතු කමිටුව, මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව, දේශීය ණය කළමනාකරණ කමිටුව, විදේශ සංචිත කළමනාකරණ කමිටුව සහ අවදානම් කළමනාකරණ කමිටුව වැනි ප්‍රධාන අභ්‍යන්තර කමිටු සඳහා දායකත්වය සැපයීම සහ සහභාගිවීම ද දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් සිදු කරන ලදී. තවද, විදේශ ව්‍යවහාර මුදල් ලැබීම් අධීක්ෂණය කිරීමේ කමිටුව, ලංකා සෙට්ල් පද්ධතිය සඳහා වූ හදිසි අවස්ථා සහ ආපදා ප්‍රතිසාධන කමිටුව, පුස්තකාල උපදේශන කමිටුව, විශේෂ දත්ත ප්‍රකාශන ක්‍රමය ක්‍රියාවට නැංවීමේ කමිටුව, පංචබල කේන්ද්‍රස්ථාන ගොඩනැංවීමේ හා ක්‍රියාවට නැංවීමේ කටයුතු සඳහා පත්කළ කණ්ඩායම, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ ජාතික අවදානම තක්සේරු කිරීම සඳහා පත්කර ඇති කණ්ඩායම, කොළඹ වාණිජ ව්‍යාපාර දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් ඌනතා අධ්‍යයනය කිරීම සඳහා උපදේශකවරයෙකු පත් කිරීමේ තාක්ෂණික කමිටුව සහ ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීමේ තාක්ෂණික ඇගයීම් කමිටුව වැනි මහ බැංකුව විසින් පත් කළ අනෙකුත් අභ්‍යන්තර කමිටු සඳහා සහභාගීවීම සහ විශ්ලේෂණ සැපයීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සිදු කරන ලදී.

## 7.4 ව්‍යවස්ථාපිත සහ අනෙකුත් වාර්තා ප්‍රකාශයට පත් කිරීම මගින් තොරතුරු බෙදාහැරීම

ව්‍යවස්ථාපිත වාර්තා සහ "මෑතකාලීන ආර්ථික ප්‍රවණතා", "ප්‍රතිපත්ති පෙරදැක්ම" වැනි අනෙකුත් වාර්තා භාෂා තුනෙන්ම සකස් කිරීමේ වගකීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබේ. ඒ අනුව, මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තුවල ද සහාය ඇතිව මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය, ආංශික සාර්ව ආර්ථික සංවර්ධනයන්, මහ බැංකුවේ ගිණුම් හා මෙහෙයුම් කටයුතු සහ සංඛ්‍යාලේඛන පරිශිෂ්ට ඇතුළත් කරමින් 2012 වසර සඳහා වන මහ බැංකු වාර්ෂික වාර්තාව සකස් කොට නියමිත කාලය තුළ දී මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. 2014 වසරේ අයවැය කතාවට සමගාමීව "මෑතකාලීන ආර්ථික ප්‍රවණතා-2013 සුවිශේෂ සිදුවීම් සහ 2014 අපේක්ෂාවන්" ප්‍රකාශනය ද නිකුත් කෙරිණි. ආර්ථිකයේ සියලුම අංශවලට අදාළ දත්ත විශාල ප්‍රමාණයක් හා එක් එක් මාසයට අදාළ "සුවිශේෂ සිදුවීම්" හා පුවත්පත් නිවේදන ඇතුළත් මාසික විවරණිකා මහ බැංකු වෙබ් අඩවිය හරහා ප්‍රකාශයට පත් කෙරිණි.

මහ බැංකුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන "ප්‍රතිපත්ති පෙරදැක්ම 2013 සහ ඉදිරිය සඳහා මුදල් හා මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති" අඛණ්ඩව හත්වන වරටත් 2013 ජනවාරි මස 2 වැනි දින ප්‍රකාශයට පත් කෙරිණි. ප්‍රතිපත්ති පෙරදැක්ම ප්‍රකාශයට පත් කිරීමේ අරමුණ වූයේ ඉදිරි කාලපරිච්ඡේදය සඳහා පාර්ශ්වකරුවන්ට සිය සැලසුම් හා උපායමාර්ග නිර්මාණය කර

ගැනීමට හා සංශෝධනය කර ගැනීමට උපකාරී වන පරිදි මහ බැංකුවේ ප්‍රතිපත්තිවල පුරෝකථන හැකියාව හා විනිවිදභාවය වැඩිදියුණු කිරීමයි. 2014 සඳහා වන ප්‍රතිපත්ති පෙරදැක්ම 2013 දෙසැම්බර් මාසය තුළ දී සකස් කෙරුණු අතර එය 2014 ජනවාරි මස 2 වැනි දින ප්‍රකාශයට පත් කරන ලදී.

ඉහත කරුණුවලට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාධ්‍යවල මෙන්ම මහ බැංකු වෙබ් අඩවියේ ද පළ කරන ලද දිනපතා, සතිපතා හා මාසික දර්ශක මගින් මහජනතාවගේ දැනුම්වත් වීම සඳහා ආර්ථික හා මූල්‍ය තොරතුරු ප්‍රකාශයට පත් කරන ලදී. මුදල් ප්‍රතිපත්තිය හා විදේශ අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ මාසිකව පුවත්පත් නිවේදන නිකුත් කිරීමට අමතරව, නැගීඑන ආර්ථික ගැටළු පිළිබඳ මහජන දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන් හි දී එවැනි ගැටලු හා සම්බන්ධ පුවත්පත් නිවේදන ද නිකුත් කරන ලදී.

## 7.5 ප්‍රතිපත්ති පර්යේෂණවල නිරතවීම සහ දැනුම ලබාදීමේ ක්‍රියාකාරකම්

කාලීන වැදගත්කමක් සහිත විෂයයන් ඔස්සේ සිදු කෙරෙන පර්යේෂණ ඉහළ නැංවීමේ අරමුණ ඇතිව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මහ බැංකුවේ අවශ්‍යතාවයන් සපුරාලීමට සහ නිලධාරීන් විසින්ම ආරම්භ කළ පර්යේෂණ ගණනාවක් සිදු කරන ලදී. දෙපාර්තමේන්තුව තුළ ආර්ථික පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීමට සහ බැංකුව තුළ පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීමට ස්ථාපිත කරන ලද "පර්යේෂණ උපදේශක මණ්ඩලය" 2013 වසර තුළදී ද සිය කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. 2012 වසරේ දී ස්ථාපිත කරන ලද "සාර්ව ආර්ථික ආකෘතිකකරණ ඒකකය" (Macroeconomic Modelling Unit) විසින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා මෙන්ම බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තුවල නිලධාරීන් සඳහා ද ආර්ථික විද්‍යාව හා සම්බන්ධ පර්යේෂණ කටයුතුවල නිරතවීමට පහසුකම් සපයන ලදී. මෙම ඒකකය පිහිටුවීමත් සමඟ පර්යේෂණ පත්‍රිකා හතරක් නිම කරන ලද අතර, මෙම පත්‍රිකා 2014 වසරේ දී ප්‍රකාශයට පත් කිරීමට බලාපොරොත්තු වේ. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලද බාහිර උපාධිධාරී අභ්‍යාසලාභීන් දෙදෙනෙකුගේ පර්යේෂණ ව්‍යාපෘතිද සාර්ව ආර්ථික ආකෘතිකකරණ ඒකකය මගින් අධීක්ෂණය කරන ලදී. මීට අමතරව, මහ බැංකුවේ පශ්චාත් උපාධි අපේක්ෂකයන් විසින් සිදු කරන පර්යේෂණ ව්‍යාපෘති සඳහා මගපෙන්වීම, අධීක්ෂණය සහ ඇගයීම මඟින් ඔවුන්ගේ පර්යේෂණ කටයුතු සඳහා සහාය දැක්වීම, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, මෙම වසර තුළ දී පර්යේෂණ පත්‍රිකා 25 කට වැඩි ප්‍රමාණයක් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ඇගයුමට ලක් කරන ලදී.

2013 සැප්තැම්බර් මාසයේදී ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ පර්යේෂණ ප්‍රකාශනය වන මාණ්ඩලික පත්‍රිකා 42 වන කලාපයෙහි විස්තීර්ණ පර්යේෂණ පත්‍රිකා තුනක් ඇතුළත් විය. එලෙසම, 2013 දෙසැම්බර් මාසයේ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව අඛණ්ඩව සයවන වරටත් සංවිධානය කරන ලදී. ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව හරහා විශේෂයෙන්ම කලාපය තුළ පර්යේෂකයන්ට, ඔවුන් විසින් සිදු කරන ලද න්‍යායාත්මක සහ ප්‍රායෝගික පර්යේෂණයන් ඉදිරිපත් කිරීමට සහ සාකච්ඡා කිරීමටත්, ඔවුන් අතර අදහස් හුවමාරුකර ගැනීමටත් අවස්ථාව සැලසුණි. මැලේසියාව, පාකිස්ථානය සහ ශ්‍රී ලංකාව යන රටවල පර්යේෂකයෝ ඔවුන්ගේ පර්යේෂණ තුළින් අනාවරණය වූ කරුණු ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේ දී ඉදිරිපත් කළහ. පෙර වසරවල දී මෙන්ම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අග්නිදිග ආසියානු මහ බැංකු මධ්‍යස්ථානය සමඟ ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන්වල නිරත වන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව නිමැවුම් පරතරය ඇගයීම පිළිබඳව ඒකාබද්ධ පර්යේෂණයක් සිදුකරන අතර, 2014 වසරේ දී එය ප්‍රකාශයට පත්කිරීමට අපේක්ෂිතය.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව තුළ දැනුම හුවමාරු කිරීමේ සහ යාවත්කාලීන කිරීමේ වැඩසටහනක් ලෙස දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සතිපතා සම්මන්ත්‍රණ මෙහෙයවන ලදී. ඒ අතර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා සමහර වෘත්තීමය හා දක්ෂ දේශකයන්හට කාලීන මාතෘකා ඔස්සේ දේශන මෙහෙයවීම සඳහා ආරාධනා කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් මහ බැංකුකරණය සහ මුදල් ප්‍රතිපත්ති සම්බන්ධ විෂයන්හි ඔවුන් සතු දැනුම සහ ප්‍රවීණත්වය දේශීය හා ජාත්‍යන්තර වැඩසටහන්වල දී සැපයීම අඛණ්ඩව සිදු කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මානව සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව හා එක්ව ක්ෂේත්‍රයේ වෘත්තියවේදීන්ගේ සහභාගිත්වයෙන් "මාසික ආර්ථික සමුළුව" සංවිධානය කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කිහිපදෙනෙක් ද මාසික ආර්ථික සමුළුවේ දී දේශන පැවැත්වූහ. බැංකු විදු පියෙස, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, විශ්වවිද්‍යාල, පාසැල් සහ නොයෙකුත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන විසින් සංවිධානය කරන ලද නොයෙකුත් අධ්‍යාපනික වැඩසටහන් සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්පත් දායකත්වය සපයන ලදී. තවද, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මහ බැංකුවට පැමිණෙන දේශීය හා විදේශීය දූත මණ්ඩල සඳහා මහ බැංකුකරණය සහ සාර්ව ආර්ථික සංවර්ධනයන් පිළිබඳ දේශන පවත්වන ලදී. මීට අමතරව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කිහිපදෙනෙක් උසස් පෙළ සිසුන් සඳහා ස්වාධීන රූපවාහිනී සේවය මගින් මෙහෙයවන ලද "තක්ෂිලාව" අධ්‍යාපනික වැඩසටහන වෙනුවෙන් සිය සම්පත් දායකත්වය සැපයූහ.

## 7.6 ජාත්‍යන්තර සංවිධාන සමඟ පවත්නා වූ සබඳතාවය ශක්තිමත් කිරීම

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), අග්නිදිග ආසියානු මහ බැංකු

ආයතනය (SEACEN), අග්නිදිග ආසියානු, නවසීලන්ත සහ ඕස්ට්‍රේලියානු බැංකු සංගමය (SEANZA) සහ මහ බැංකු අධිපතිවරුන් සහ මුදල් ලේකම්වරුන්ගෙන් සමන්විත සාර්ක් මූල්‍ය ජාලය සමග ශ්‍රී ලංකාවේ කටයුතු සම්බන්ධීකරණය කරන ලද අතර, ලෝක බැංකුව (WB), ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ අනෙකුත් බහු පාර්ශ්වීය සහ ද්විපාර්ශ්වීය ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට සහාය ලබාදෙන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් රටවල්වලට හෝ කලාපවලට විශේෂිත ගැටලු හෝ පොදු ගැටලු සම්බන්ධව කටයුතු කරන අධ්‍යයන කණ්ඩායම් තුළ ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ජාත්‍යන්තර රැස්වීම් සහ සම්මන්ත්‍රණවලදී ප්‍රතිපත්තිමය සංවාද සඳහා නිරන්තරයෙන් සම්බන්ධ වෙමින් ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරන ලදී. නිලධාරීන් සහභාගි වූ එම රැස්වීම් අතුරින් කීපයක් ලෙස අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනයේ (SEACEN) අධිපති මණ්ඩලයේ රැස්වීම්, අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනය - ලතින් ඇමරිකානු මූල්‍ය අධ්‍යන කේන්ද්‍රයේ (SEACEN-SEMLA) සම්මන්ත්‍රණය, සාර්ක් මූල්‍ය ජාලයේ අධිපතිවරුන්ගේ සමුළුව, සාර්ක් මහ බැංකු ජ්‍යෙෂ්ඨ අර්ථ ශාස්ත්‍රඥයින්ගේ රැස්වීම්, සාර්ක් මූල්‍ය ජාලයේ ලේකම්වරුන්ගේ සහ අමාත්‍යවරුන්ගේ රැස්වීම්, සාර්ක් මූල්‍ය ජාලයේ සම්බන්ධීකාරකවරුන්ගේ රැස්වීම්, සාර්ක් රාජ්‍ය ණය කළමනාකරුවන්ගේ සැසි වාරය සහ අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනයේ පර්යේෂණ සහ පුහුණු අංශයේ අධ්‍යක්‍ෂවරුන්ගේ රැස්වීම් දැක්විය හැකිය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ජාත්‍යන්තර ආයෝජකයින්, ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතන සහ උපදේශක ආයතන, තානාපතිවරුන් සහ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් ඇතුළත් ජාත්‍යන්තර සංවිධානවලට ආර්ථිකය පිළිබඳ යාවත්කාලීන කිරීම්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් නිරතුරුව සිදු කරන ලදී. මේ අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වෙබ් පිටුවෙන් සංසන්දනාත්මක තොරතුරු ලබා ගැනීමට ජාත්‍යන්තර ආයතනවලට පහසුකම් සලසමින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් දැනට පවතින ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාන්‍ය දත්ත ප්‍රකාශන ක්‍රමයේ (GDDS) සිට විශේෂ දත්ත ප්‍රකාශන ක්‍රමය (SDDS) දක්වා වැඩිදියුණු කිරීමට කටයුතු ආරම්භ කරන ලදී. 2013 වසරේ දී ශ්‍රී ලංකාවේ ණය ශ්‍රේණිගත කිරීම ඉහළ නංවා ගැනීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ෆිච් රේටින්ග්ස් (Fitch Ratings), එස් ඇන්ඩ් පී රේටින්ග්ස් (S & P Ratings) සහ මූඩීස් රේටින්ග්ස් (Moody's Ratings) යන අන්තර්ජාතික ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතන සමග සහ ණය ශ්‍රේණිගත කිරීමේ උපදේශක ආයතන 3 ක් සමග සමීපව කටයුතු කරන ලදී. තවද, 2014 වසරේ ජනවාරි මාසයේ සාර්ථකව නිම කළ හය වන ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව වෙනුවෙන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සියලුම ප්‍රතිපත්තිමය විමර්ශනයන් සඳහා පියවර ගත් අතර, ආර්ථික දත්ත යාවත්කාලීන කිරීම සඳහා සියලුම ලේඛනාදියෙන් සහ ඉදිරිපත් කිරීම් මගින් සහාය දක්වන ලදී. තවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දූත පිරිස සමග සිදු කළ සාකච්ඡා (IMF Article IV), ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සම්පස්ථ ණය පහසුකම යටතේ පසු අධීක්ෂණ සාකච්ඡා සඳහා වූ දූත පිරිස (Ex - Post Evaluation), පසු වැඩසටහන් අධීක්ෂණ සාකච්ඡා සඳහා වූ දූත පිරිස (Post Programme Monitoring) ඇතුළුව විවිධ ජාත්‍යන්තර ආයතනයන්හි නියෝජිතයින්ට මෙරට සංචාරය සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සපයන ලදී.

## 8. සේවක අර්ථසාධක අරමුදල

සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විශාලතම විශ්‍රාම පාරිතෝෂික අරමුදලයි. පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනයන් හි සේවය කරනු ලබන සේවක සේවිකාවන් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ ලබා දීමේ අරමුණ පෙරදැරිකොට 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ මෙය ස්ථාපිත කරනු ලැබීය. පනතේ විධිවිධානවලට අනුව අරමුදලෙහි සියලුම පරිපාලන බලතල හා කාර්යයන් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා සතුවන අතර, අරමුදලෙහි භාරකරු ලෙස අරමුදල් කළමනාකරුවන්ට අදාළ බලතල, කාර්යයන් සහ වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට පැවරී ඇත. පනත මගින් තමන් වෙත පැවරී ඇති වගකීම් හා කාර්යභාරයයන් මුදල් මණ්ඩලය විසින් සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබයි.

### 8.1 දෙපාර්තමේන්තුවේ කාර්යයන්

සාමාජික දායක මුදල් සහ අධිභාර රැස්කිරීම, සාමාජික ගිණුම් පවත්වා ගෙන යාම, අතිරික්ත මුදල් ආයෝජනය කිරීම, සාමාජිකයින්ට හා ඔවුන්ගේ නීතිමය හිමිකරුවන්ට ප්‍රතිලාභ ආපසු ගෙවීම, පනත මගින් මුදල් මණ්ඩලය හා කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා ඇති කාර්යභාරයන් ඉටු කිරීමේ දී දරණ පිරිවැය අරමුදලේ ආදායමෙන් අයකර ගැනීම හා සාමාජික ගිණුම්වලට පොලිය බැර කිරීම යනාදිය සේ.අ.අ. දෙපාර්තමේන්තුව වෙත පවරන ලද කාර්යයන් වේ. 2013 වසරේදී එම කාර්යයන් ඉටු කිරීමේ දී සේ.අ.අ. දෙපාර්තමේන්තුව මුදල් මණ්ඩලයේ අනුමත ප්‍රතිපත්ති හා නිර්දේශයන්ට අනුව කටයුතු කළ අතර කම්කරු කොමසාරිස් ජනරාල් සමග සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යන ලදී.

### 8.2 කාර්යයන්හි කාර්යසාධනය

#### (අ) සාමාජිකත්වය, සාමාජික ගිණුම් ශේෂ හා ප්‍රතිලාභ ගෙවීම්

අරමුදලේ සමස්ත සාමාජික ගිණුම් සංඛ්‍යාව 2013 වසර අවසානයේ දී මිලියන 15 ක් වූ අතර, එය 2012 වසර අවසානයේ වූ මිලියන 14.6 හා සසඳනවිට සියයට 2.7 ක වර්ධනයකි. 2012 වසර අවසාන වනවිට දී මිලියන 2.3 ක් වූ දායක මුදල් එවන සාමාජික ගිණුම් සංඛ්‍යාව, 2013 වසර අවසාන වනවිට මිලියන 2.4 ක් දක්වා වර්ධනය විය. (සංඛ්‍යා සටහන II-4)

2013 වසර අවසානයේ දී සේ.අ.අරමුදලෙහි මුළු වටිනාකම රුපියල් බිලියන 1,300.0 ක් වූ අතර, එය 2012 වසර අවසානයේ වූ රුපියල් බිලියන 1,144.4 හා සසඳන විට සියයට 13.6 ක වර්ධනයක් පෙන්නුම් කරයි. වසර තුළ දී අරමුදල විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කිරීම මඟින් ඉපැයූ ඉහළ ආදායම සහ සාමාජික ශුද්ධ දායක මුදල් (දායක මුදල් ලැබීම්වලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු) ඉහළ යාම අරමුදලේ වර්ධනයට හේතු විය. 2012 වසරේ, සාමාජික පොලී ගෙවීම් ද ඇතුලු රුපියල් බිලියන 1,124.5 ක්ව පැවති සාමාජිකයින් සඳහා වූ අරමුදලෙහි මුළු වගකීම 2013 අවසන් වනවිට රුපියල් බිලියන 1,281.9 ක් දක්වා සියයට 14.0 කින් වර්ධනය විය (සංඛ්‍යා සටහන II-4). ශුද්ධ දායක මුදල් ලැබීම් ද පසුගිය වසරට සාපේක්ෂව රුපියල් බිලියන 21.5 සිට රුපියල් බිලියන 30.2 දක්වා වර්ධනය විය. වසර තුළ දී අරමුදලේ සාමාජිකයින් හා ඔවුන්ගේ නෛතික උරුමකරුවන් වෙත ප්‍රතිලාභ ලෙස රුපියල් බිලියන 50.2 ක මුදලක් ගෙවන ලදී. එය පෙර වසරේ ගෙවන ලද මුදල හා සසඳන විට සියයට 3.1 ක වර්ධනයක් පෙන්නුම් කරයි. අරමුදලේ ශුද්ධ ආදායම 2013 වසරේ දී රුපියල් බිලියන 125.6 ක් වූ අතර, එය 2012 වසරේ උපයන ලද රුපියල් බිලියන 111.8 හා සසඳන විට සියයට 12.3 ක වර්ධනයකි.

**II-4 සංඛ්‍යා සටහන — අරමුදල පිළිබඳ මූලික දත්ත**

| අයිතමය | 2012 | 2013 (අ) | වෙනස (%) |
|---|---|---|---|
| මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 14.6 | 15.0 | 2.7 |
| වර්තමානයේ දී දායක මුදල් එවනු ලබන ගිණුම් (මිලියන) | 2.3 | 2.4 | 4.3 |
| වර්තමානයේ දී දායක මුදල් එවනු නොලබන ගිණුම් (මිලියන) | 12.3 | 12.6 | 2.4 |
| දායක මුදල් එවනු ලබන සේවා යෝජකයින් | 68,140 | 70,392 | 3.3 |
| මුළු දායක මුදල් ලැබීම් (රු. බිලියන) | 70.2 | 80.5 | 14.7 |
| ප්‍රතිලාභ ගෙවීම් (රු. බිලියන) | 48.7 | 50.2 | 3.1 |
| ප්‍රතිලාභ ගෙවීම් සංඛ්‍යාව | 115,654 | 114,103 | -1.3 |
| ශුද්ධ ආදායම (රු. බිලියන) | 111.8 | 125.6 | 12.3 |
| සාමාජිකයන් වෙත වූ සමස්ත වගකීම (රු. බිලියන) | 1,124.5 | 1,281.9 | 14.0 |
| අරමුදලේ සමස්ත වටිනාකම (රු. බිලියන) | 1,144.4 | 1,300.0 | 13.6 |

(අ) තාවකාලික

### (ආ) අරමුදල් ආයෝජනය හා ප්‍රතිලාභ

**(i)** ආයෝජන කළඹ: 2013 වසර අවසානයේ දී සමස්ත ආයෝජන කළඹෙහි වටිනාකම රුපියල් බිලියන 1,257.3 (පොත් අගය) ලෙස වාර්තා වූ අතර, එය 2012 වසරේ පැවති රුපියල් බිලියන 1,105.5 ට සාපේක්ෂව සියයට 13.7 ක වර්ධනයක් පෙන්නුම් කරයි (සංඛ්‍යා සටහන II-5). අරමුදලේ සුරක්ෂිතභාවය ආරක්ෂා කර ගනිමින්, ප්‍රතිලාභ ගෙවීම් සිදු කිරීමට හා අනෙකුත් වියදම් සපුරා ගැනීමට ප්‍රමාණවත් පරිදි ද්‍රවශීලතාවයක් පවත්වා ගනිමින්, අරමුදලේ සාමාජිකයන් වෙත දිගුකාලීන ධන මූර්ත ප්‍රතිලාභයක් ලබාදීම ඉලක්ක කොටගත් අරමුදලේ ආයෝජන ප්‍රතිපත්තිය අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

අරමුදලේ සමස්ත ආයෝජනයන්ගෙන් සියයට 92.5 ක් රජයේ සුරැකුම්පත්හි ආයෝජනය කර තිබූ අතර, ව්‍යාපාර කොටස්වල සහ භාරකාර සහතිකපත් ඇතුළු සාංගමික ණය සඳහා පිළිවෙලින් සියයට 5.8 ක් සහ සියයට 1.2 ක් ආයෝජනය කර තිබුණි. ඉතිරි සියයට 0.5 අරමුදලේ දෛනික ද්‍රවශීලතා අවශ්‍යතාවයන් කළමනාකරණය කර ගැනීම සඳහා ප්‍රතිවිකිණීමේ ගිවිසුම (Reverse Repo) වැනි ඉහළ ද්‍රවශීලතාවයක් සහිත වත්කම්වල ආයෝජනය කර තිබුණි. රාජ්‍ය සුරැකුම් කල්පිරීමේ ව්‍යුහය සහ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතයන් සංඛ්‍යා සටහන II-6 හි දක්වා ඇත.

**II-5 සංඛ්‍යා සටහන — ආයෝජන කළඹ**

| ආයෝජන වර්ගය | 2012 | | 2013 (අ) | |
|---|---|---|---|---|
| | වටිනාකම (රු. බිලියන) | දායකත්වය (%) | වටිනාකම (රු. බිලියන) | දායකත්වය (%) |
| භාණ්ඩාගාර බැඳුම්කර සහ බිල්පත් | 1,012.1 | 91.5 | 1,140.5 | 90.7 |
| රජයේ රුපියල් ණය | 23.1 | 2.1 | 23.1 | 1.8 |
| සාංගමික ණය | 8.0 | 0.7 | 14.3 | 1.2 |
| සමාගම් කොටස් | 59.2 | 5.4 | 72.8 | 5.8 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් | 3.1 | 0.3 | 6.6 | 0.5 |
| **එකතුව** | **1,105.5** | **100.0** | **1,257.3** | **100.0** |

(අ) තාවකාලික

**II-6 සංඛ්‍යා සටහන — 2013 වසර අවසානයේ දී රාජ්‍ය සුරැකුම්පත් ආයෝජන**

| කල්පිරීම | වටිනාකම (රු. බිලියන) | දායකත්වය (%) | බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) |
|---|---|---|---|
| වසරකට වඩා අඩු | 139.5 | 10.0 | 9.79 |
| වසර 1-2 | 195.7 | 14.1 | 9.84 |
| වසර 3-4 | 216.2 | 15.5 | 10.75 |
| වසර 5 ට වැඩි | 842.0 | 60.4 | 11.92 |
| **එකතුව** | **1,393.4** | **100.0** | **11.23** |

(අ) තාවකාලික

**(ii)** ආයෝජන ආදායම : අරමුදලේ සමස්ත ආයෝජන ආදායම 2013 වසරේ දී රුපියල් බිලියන 136.7 ක් ලෙස සටහන් වූ අතර, එය 2012 වසරේ උපයන ලද සමස්ත ආයෝජන ආදායම හා සැසඳීමේ දී සියයට 12.6 ක වැඩිවීමක් පෙන්නුම් කරන ලදී (සංඛ්‍යා සටහන II-7). පොලී ආදායම අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය විය (එය ආදායමෙන් සියයට 76.9 කි). 2013 වසරේ පොලී ආදායම රුපියල් බිලියන 105.0 ක් වූ අතර, එය 2012 වසරේ උපයන ලද රුපියල් බිලියන 90.9 හා සැසඳීමේ දී සියයට 15.5 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. තවද ව්‍යාපාර කොටස්වල ආයෝජනය කිරීම තුළින් 2013 වසර තුළ දී රුපියල් මිලියන 3,339 ක් උපයන ලද අතර, එය 2012 වසරේ දී ආදායම වූ රුපියල් මිලියන 3,016 සමඟ සැසඳීමේ දී සියයට 10.7 ක වැඩි වීමකි. මෙම ප්‍රතිලාභ තුළ වසර තුළ උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ හා ලාභාංශ අන්තර්ගත වේ. කෙසේ වුවත් වට්ටම් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර මඟින් උපයන ලද ක්‍රමක්ෂය ලාභ 2012 වසරේ උපයන ලද රුපියල් බිලියන 27.8 හා සැසඳීමේදී 2013 වසර තුළ රුපියල් බිලියන 26.9 දක්වා සියයට 3 කින් අඩු විය (සංඛ්‍යා සටහන II-7).

**II-7 සංඛ්‍යා සටහන — ආයෝජන මඟින් ලද ආදායම්**

| ආදායම් මූලාශ්‍රය | 2012 | | 2013 (අ) | |
|---|---|---|---|---|
| | වටිනාකම (රු. මිලියන) | දායකත්වය (%) | වටිනාකම (රු. මිලියන) | දායකත්වය (%) |
| පොලී | 90,904 | 74.9 | 105,038 | 76.9 |
| ක්‍රමක්ෂය ලාභ | 27,792 | 22.9 | 26,956 | 19.7 |
| ප්‍රාග්ධන ලාභ - රජයේ සුරැකුම්පත් | 34 | - | 1,019 | 0.7 |
| වෙළෙඳපොළ මිලට අගය කිරීමෙන් ලාභ/(පාඩු) | -388 | -0.3 | -45 | - |
| ප්‍රාග්ධන ලාභ/ව්‍යාපාර කොටස් | 1,020 | 0.8 | 113 | 0.1 |
| ලාභාංශ | 1,996 | 1.6 | 3,226 | 2.4 |
| නිදහස් කරන ලද උකස්කර මත අධිමිල / වට්ටම් | - | - | -4 | - |
| වෙනත් | 55 | 0.1 | 354 | 0.2 |
| **එකතුව** | **121,413** | **100.0** | **136,657** | **100.0** |

(අ) තාවකාලික

**(iii) වියදම්:** 2013 වසරේ අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම රුපියල් මිලියන 979 ක් වූ අතර, එය පෙර වසරේ සමස්ත වියදම වූ රුපියල් මිලියන 948 හා සසඳන විට සියයට 3.3 ක වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. 2013 වසරේ දී අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම අරමුදලේ දළ ආදායමින් සියයට 0.72 ක් ලෙස සටහන් වූ අතර, එය 2012 වසරේ දී සියයට 0.78 ක් විය (සංඛ්‍යා සටහන II-8). අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම එහි දළ ආදායමින් සියයට 1 කට වඩා පහළ මට්ටමක පවත්වා ගැනීමට හැකිවීම වසර ගණනාවක් පුරාම අරමුදලේ කැපී පෙනුණ ලක්ෂණයක් විය.

**II-8 සංඛ්‍යා සටහන — මෙහෙයුම් වියදම්**

| අයිතමය | වටිනාකම (රු.මිලියන) | | ප්‍රතිශත වෙනස (%) |
|---|---|---|---|
| | 2012 | 2013 (අ) | |
| සේවක පිරිවැය | 514 | 569 | 10.7 |
| පරිපාලන වියදම් | 397 | 364 | -8.3 |
| වෙනත් වියදම් | 37 | 46 | 24.3 |
| **එකතුව** | **948** | **979** | **3.3** |
| **මුළු පිරිවැය දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස** | **0.78** | **0.72** | - |

(අ) තාවකාලික

**II-9 සංඛ්‍යා සටහන — සාමාජිකයන්ට ගෙවන ලද පොලිය**

| අයිතමය | වටිනාකම (රු.මිලියන) | | ප්‍රතිශත වෙනස (%) |
|---|---|---|---|
| | 2012 | 2013 (අ) | |
| දළ ආදායම | 121,413 | 136,657 | 12.6 |
| මුළු මෙහෙයුම් වියදම | -948 | -979 | 3.3 |
| ආදායම් බදු | -8,637 | -10,069 | 16.6 |
| වසරේ ශුද්ධ ආදායම | 111,828 | 125,610 | 12.3 |
| වසර තුළ සිදු කළ ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවන ලද පොලිය | -2,098 | -2,233 | 6.4 |
| සාමාජිකයන් වෙත බෙදාහැරීමට ඇති ශුද්ධ ආදායම (වසර තුළදී ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවන ලද පොලිය අඩු කළ පසු) | 110,099 | 123,433 | 12.1 |
| සංචිත වලින්/(සංචිත වලට) මාරුකිරීම | 5,700 | 3,700 | -35.1 |
| සංචිත වලින්/(සංචිත වලට) මාරුකිරීමෙන් පසු සාමාජිකයන්ට බෙදා හැරීමට ඇති ශුද්ධ ආදායම | 115,799 | 127,133 | 9.8 |
| සාමාජික ශේෂ සඳහා පොලිය | -115,771 | -126,992 | 9.7 |
| රඳවාගත් ශුද්ධ ආදායම | 28 | 141 | 403.6 |
| සාමාජික ශේෂ සඳහා ගෙවන ලද පොලී අනුපාතිකය % | **11.5** | **11.0** | - |

(අ) තාවකාලික

### (ඇ) සාමාජික ශේෂ සඳහා පොලිය ගෙවීම්

අරමුදලේ සාමාජිකයන් වෙත බෙදා හැරීමට ඇති ශුද්ධ ආදායම 2012 වසරේ පැවති රුපියල් බිලියන 110.1 සමඟ සැසඳීමේ දී 2013 වසර අවසානයේ දී රුපියල් බිලියන 123.4 ක් විය (සංඛ්‍යා සටහන II-9). සංචිතවලින් රුපියල් බිලියන 3.7 ක් මාරු කිරීමෙන් පසු සාමාජික ශේෂයන් මත පොලී අනුපාතිකය ලෙස සියයට 11.0 ක ප්‍රතිශතයක් වෙන්කිරීමට අරමුදලට හැකි වුණි (සංඛ්‍යා සටහන II-10).

**II-10 සංඛ්‍යා සටහන — සාමාජික ගිණුම් ශේෂ මත ගෙවන ලද පොලී අනුපාතික**

| වසර | ගෙවන ලද පොලී අනුපාතිකය (%) | සඵල පොලී අනුපාතිකය (%) |
|---|---|---|
| 2002 | 12.10 | 12.26 |
| 2003 | 12.00 | 12.07 |
| 2004 | 9.50 | 9.59 |
| 2005 | 9.00 | 9.13 |
| 2006 | 10.10 | 10.30 |
| 2007 | 11.20 | 11.40 |
| 2008 | 13.20 | 13.44 |
| 2009 | 13.75 | 13.92 |
| 2010 | 12.50 | 12.65 |
| 2011 | 11.50 | 11.58 |
| 2012 | 11.50 | 11.62 |
| 2013 (අ) | 11.00 | 11.14 |

(අ) තාවකාලික

## 8.3 සාමාජික සේවාවන්

### (අ) සාමාජික ගිණුම් ප්‍රකාශන

2013 වසරේ පළමු අර්ධ වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශන සේවායෝජකයන් මඟින් නිකුත් කිරීම 2013 වසරේ දෙසැම්බර් මාසය තුළ ආරම්භ කරන ලදී. 2013 වසරේ දෙවන අර්ධ වසරට අදාළ ගිණුම් ප්‍රකාශන 2014 වසරේ මැයි මාසය අවසානය වනවිට නිකුත් කිරීමට ද කටයුතු පිළියෙල කර ඇත.

### (ආ) සාමාජිකයන් සඳහා වූ නිවාස ණය පහසුකම

අරමුදල් සාමාජිකයන් හට සිය සේ.අ.අ. ගිණුමේ ශේෂය ඇපයට තබා නිවාස ණය ලබා ගැනීමේ යෝජනා ක්‍රමය 1998 වසරේ දී හඳුන්වා දුන් අතර, එම ණය ලංකා බැංකුව, මහජන බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථාව සහ සමුපකාර ග්‍රාමීය බැංකු යන සහභාගිත්ව ණය දෙන ආයතන මඟින් 2013 වසර තුළ දී ද ලබා ගැනීමට හැකි විය. මෙම යෝජනා ක්‍රමය යටතේ අරමුදලේ සාමාජිකයන් වෙනුවෙන් ශේෂ සහතික නිකුත් කිරීමේ කාර්යය 2013 වසර තුළ දී ද ක්‍රියාත්මක කරන ලදී. වසර තුළ දී මෙම ව්‍යාපෘතිය යටතේ ශේෂ සහතික 16,268 ක් අදාළ ආයතන වෙත නිකුත් කරන ලද අතර, අනුමත කරන ලද සමස්ත නිවාස ණය ප්‍රමාණය රුපියල් මිලියන 6,914 කි (සංඛ්‍යා සටහන II - 11). තවද, 2012 වසරේ දී පැහැර හරින

ලද ණය වෙනුවෙන්, අරමුදල විසින් රුපියල් මිලියන 2,178 කට ආසන්න මුදල් ප්‍රමාණයක් සාමාජික ගිණුම්වලින් අඩුකර සහභාගිත්ව ණය දෙන ආයතන වෙත 2013 වසර තුළ දී ප්‍රේෂණය කරන ලදී.

**II-11 සංඛ්‍යා සටහන**

**නිවාස ණය සේවාව**

| වසර | නිකුත් කළ සහතිකපත් (සංඛ්‍යාව) | අනුමත කළ ණය ප්‍රමාණය (රු.මිලියන) | අනුමත ණය දෙන ආයතන වෙත මුදාහළ මුදල (රු.මිලියන) |
|---|---|---|---|
| 2000 | 12,938 | 1,648 | 262 |
| 2001 | 16,066 | 2,091 | 381 |
| 2002 | 19,502 | 2,673 | 541 |
| 2003 | 18,689 | 2,792 | 670 |
| 2004 | 14,307 | 2,452 | 735 |
| 2005 | 14,600 | 2,766 | 900 |
| 2006 | 15,136 | 3,049 | 1,078 |
| 2007 | 12,969 | 2,872 | 1,240 |
| 2008 | 12,519 | 3,008 | 1,192 |
| 2009 | 10,383 | 2,680 | 1,552 |
| 2010 | 13,848 | 4,512 | 2,093 |
| 2011 | 20,041 | 6,355 | 1,896 |
| 2012 | 11,234 | 3,973 | 2,019 |
| 2013 (අ) | 16,268 | 6,914 | 2,178 |
| **එකතුව** | **208,500** | **47,785** | **16,737** |

(අ) තාවකාලික

### (ඇ) මහජනතාව දැනුම්වත් කිරීම

2013 වසරේ දී, විද්‍යුත් මාධ්‍යයෙන් තොරතුරු හා දායක මුදල් රැස්කිරීම, සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීම හා සාමාජික සේවාවන් පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහන් හා ජංගම සේවා පැවැත්වීම දෙපාර්මේන්තුවේ ප්‍රධාන කාර්යයන් අතරට මූලිකත්වය ගනු ලැබිණි. ඒ අනුව, දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ ජංගම සේවා 9 ක් විශාල සාමාජික සංඛ්‍යාවක් සහිත සේවායතනයන් සඳහා පවත්වන ලදී. තවද, මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් සාමාජිකයන්, සේව්‍යයන්, රැකියා වෙළෙඳපොළට අලුතෙන් එක්වන්නන්, කම්කරු නිලධාරීන්, ග්‍රාමීය බැංකු නිලධාරීන් හා පොදු මහජනතාව අතර අර්ථසාධක අරමුදලට සම්බන්ධ කරුණු පිළිබඳව අවබෝධයක් ලබාදීම අපේක්ෂා කරන ලදී.

2013 වසරේ දී සේවා යෝජකයින් සඳහා ජංගම සේවාවන් විවිධ ප්‍රදේශවල පවත්වන ලදී. ඒ අනුව මාස් ඉන්ටිමේට්ස් - තුරුලිය, ශ්‍රී ජයවර්ධනපුර නගර සභාව, දැයට කිරුළ ප්‍රදර්ශනය - අම්පාර, මොරටුව වෛද්‍ය හා සමාජ සත්කාරක දිනයේ දී, ක්‍රිස්ටල් මාර්ටින් (පුද්ගලික) සමාගම - ගලගෙදර, මානව සම්පත් සපයන්නන්ගේ මහා ප්‍රදර්ශනය - කොළඹ, නමුනුකුළ වතුයාය පී.එල්.සී. - ඌව පස්සර, ලංකා ටයිල්ස් පී.එල්.සී. - පාදුක්ක, ඩයිනග්‍රෝ (පුද්ගලික) සමාගම - බත්තරමුල්ල යන ස්ථානවල මෙම ජංගම සේවා පවත්වන ලදී.

ජංගම සේවාවන් කම්කරු දෙපාර්තමේන්තුව, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව වැනි අනෙකුත් අදාළ ආයතනයන්හි ද සහභාගිත්වය ඇතුළුව පවත්වන ලදී. ඒ අනුව ජංගම සේවාවන් ඔස්සේ පහත දැක්වෙන සේවාවන් ලබා දෙන ලදී.

i. සාමාජිකයින් සඳහා ශේෂ වාර්තා නිකුත් කිරීම.
ii. සාමාජික ගිණුම් නිවැරදිව සකස් කිරීම.
iii. සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීම.
iv. කෙටි පණිවිඩ (SMS) හා අන්තර්ජාලය යටතේ තොරතුරු ලබා ගැනීම සඳහා සාමාජිකයින් ලියාපදිංචි කිරීම.
v. සාමාජිකයින්ට උපදෙස් ලබා දීම.
vi. සේ.අ.අ. සාමාජිකයින්ට ජාතික හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අයදුම්පත් නිකුත් කිරීම.
vii. සේ.අ.අ. සාමාජිකයින්ට උප්පැන්න සහතික/අනුමාන වයස් සහතික ලබා ගැනීම සඳහා රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අයදුම්පත් නිකුත් කිරීම.

මීට අමතරව දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කර ඇති මහජන සබඳතා හා විමසීම් කවුළුව හා සේ.අ.අ. අත්වැල මගින් සාමාජිකයන් මුණගැසීමෙන් හා දුරකථන ඔස්සේ පවත්වන ලද සාකච්ඡා මගින් සේ.අ.අ. ක්‍රියාවලීන් සම්බන්ධයෙන් සාමාජිකයන් දැනුම්වත් කරනු ලැබිණි. ඒ අනුව 2013 වසර තුළ දී සාමාජික පැමිණිලි 222,498 කට ප්‍රතිචාර දක්වා ඇත. ඒ අතුරින් සාමාජිකයන් 118,380 කට කවුළු හරහා ද, 76,916 කට දුරකථන මාර්ගයෙන් ද, 16,057 කට විද්‍යුත් තැපැල් මාර්ග යෙන් ද, 10,185 කට ලිපි මගින් ද 960 කට ෆැක්ස් පණිවුඩ මාර්ගයෙන් ද ප්‍රතිචාර දක්වා ඇත.

### (ඈ) විද්‍යුත් මාධ්‍ය මගින් සේ.අ.අ. දායක මුදල් රැස්කිරීමේ ක්‍රමය

"සී" වාර්තාව සහ "සී3" වාර්තාව මගින් සාමාජික දායක මුදල් ගෙවීම් සඳහා වූ තොරතුරු ඉදිරිපත් කිරීම වෙනුවට සේවායෝජකයින්ට විද්‍යුත් මාධ්‍යයෙන් (e-Return) එම තොරතුරු සැපයීමේ ක්‍රමයක් සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇත. ලේඛන ඉදිරිපත් කිරීමෙන් තොරව විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් තොරතුරු දීමේ මෙම නව ක්‍රමය මඟින් අරමුදලට හා සේවායෝජකයින්ට දැනට මුහුණපාන ගැටලු අවම කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. තවද, සේ.අ.අ. දායක මුදල් හා විස්තර විද්‍යුත් මාධ්‍ය මඟින් සැපයීම, විදේශීය ආයෝජන රට තුළට ආකර්ෂණය කර ගැනීමේ වැදගත් දර්ශකයක් වන ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව ශ්‍රේණිගත කිරීමේ දර්ශකයේ ශ්‍රී ලංකාවේ ස්ථානය ඉහළ මට්ටමකට යාමේ ඉලක්ක ළඟාකර ගැනීමේ එක් පූර්ව අවශ්‍යතාවයකි.

2012 වසර වන තෙක් මෙලෙස තොරතුරු සැපයීම සේවායෝජකයින්ගේ ස්වේච්ඡාවෙන් සිදු වූ අතර මෙම ක්‍රමය සේවායෝජකයින්ට අනිවාර්යය කිරීම සඳහා 2012 අංක 2 දරණ සේ.අ.අ. පනතට සංශෝධනයක් ලෙස නව නීති ප්‍රතිපාදනයක් එක් කරන ලදී. මෙම සංශෝධනයන්ට අදාළ රෙගුලාසි 2013 මැයි මස දී ගැසට් කරන ලදී.

මීට අමතරව, විද්‍යුත් මධ්‍යය මඟින් දායක මුදල් රැස්කිරීමේ නියෝජිතයන් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු පත්කිරීම මගින් ඔවුන්ගේ සේවය ලබා ගැනීම දෙපාර්තමේන්තුව විසින් ගන්නා ලද තවත් පියවරකි. ඒ අනුව, කොමර්ෂල් බැංකුව හා ලංකා බැංකුව පිළිවෙලින් 2011 ඔක්තෝබර් හා 2012 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි සිය ගනුදෙනුකරුවන්ට මේ සඳහා තම සේවය ලබාදීමට පියවර ගන්නා ලදී. 2013 වසරේදී මහජන බැංකුව, සම්පත් බැංකුව (පී.එල්.සී.), හැටන් නැෂනල් බැංකුව (පී.එල්.සී.) මෙම පද්ධතිය හඳුන්වා දී දායක මුදල් රැස්කිරීමේ නියෝජිතයන් ලෙස සේ.අ.අ. හා එක්වෙමින් සේ.අ.අ. සඳහා දායක මුදල් සපයන තම බැංකු පාරිභෝගිකයන් වෙත සපයන සේවාවන් වැඩි කිරීමට සමත්ව ඇත. තවද, ඒ හා සමාන සේවාවක් තම ගනුදෙනුකරුවන්ට ලබාදීමට අවශ්‍ය තාක්ෂණික පද්ධති දියුණු කිරීමට අනෙක් වාණිජ බැංකු විසින් වැඩපිළවෙල සකස් කරමින් පවතී. 2013 වසර අවසාන වනවිට මෙම ගෙවීම් පද්ධතිය යටතේ සේවා යෝජකයන් 1,868 දෙනෙකු තම දායක මුදල් එවීම සිදුකර ඇත. මෙම පහසුකම, දැනට සක්‍රීය සාමාජිකයන් වන මිලියන 2.4 න් සියයට 40 ක් ආවරණය කරන අතරම එමඟින් සේ.අ.අ. සාමාජික ගිණුම් ඉක්මනින් හා නිවැරදිව යාවත්කාලීන කිරීමට හේතු වී ඇත.

තවද, මෙම ක්‍රමය යටතේ සේවායෝජකයින්ට අරමුදල වෙත කරනු ලබන ගෙවීම් සිය බැංකුව හරහා සෘජු හර කිරීමක් මඟින් මාසිකව සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුමට සෘජුවම ප්‍රේෂණය කිරීමට හා ඊට අදාළ දායකත්ව තොරතුරු විද්‍යුත් තැපැල හරහා සෘජුවම සේ.අ.අ. දෙපාර්තමේන්තුව වෙත එවීමේ පහසුකම සලසා ඇත.

2013 වසරේ දී සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් විද්‍යුත් මාධ්‍ය දායක මුදල් රැස්කිරීම් ක්‍රමය පිළිබඳව සේවායෝජකයින් හා කම්කරු දෙපාර්තමේන්තුවේ නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළු 19 ක් පවත්වා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2012 වසර අවසානයේ මෙම ව්‍යාපෘතිය යටතේ ලියාපදිංචි වී සිටි 1,385 ක් වූ සේවායෝජක සංඛ්‍යාව 2013 වසර තුළ දී 1,868 දක්වා වර්ධනය විය.

**(ඉ) සේ.අ.අ. සාමාජිකයින් නැවත ලියාපදංචි කිරීම**

සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය සේ.අ.අ. දෙපාර්තමේන්තුව හා කම්කරු දෙපාර්තමේන්තුව සම්බන්ධ වී සිදු කළ ප්‍රධාන ව්‍යාපෘති අතුරින් එකකි. එහිදී සේ.අ.අ. සාමාජිකයින් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පතෙහි (ජා.හැ.ප.) නම සඳහන්ව ඇති ආකාරයට සාමාජික ගිණුම් නැවත ලියාපදිංචි කරන අතර, ජාතික හැඳුනුම්පත් අංකය සාමාජිකයාගේ ඒකීය හඳුනා ගැනීමේ අංකය ලෙස භාවිතා කිරීම සිදු කරනු ඇත.

2013 අවසාන වනවිට මිලියන 1.4 කට ආසන්න සාමාජිකයන්ගේ ජා.හැ.ප. තොරතුරු ප්‍රමාණයක් රැස්කර ගනිමින් අරමුදලේ සක්‍රීය (වර්තමානයේ දායක මුදල ගෙවනු ලබන) සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීම් සිදුකර ඇත. ඒ අතුරින් සියයට 79 (ගිණුම් මිලියන 1.1) ක් පමණ වූ සාමාජික ප්‍රතිශතයකට ඒකීය හඳුනා ගැනීමේ අංක ලබා දී ඇති අතර, ඉදිරිපත් කර ඇති තොරතුරුවල පවතින යම් යම් ගැටලු නිසා රැස්කරන ලද ඉතිරි තොරතුරු අදාළ සේවායෝජකයන් මඟින් නැවත තහවුරු කිරීම් ලබා ගැනීමෙන් පසුව ලියාපදංචි කිරීම සඳහා යොමු කරනු ලැබේ.

2010 නොවැම්බර් මාසයේ ආරම්භ කරන ලද සේ.අ.අ.ට සම්බන්ධ වන සාමාජිකයන් තත්කාලීනව ලියාපදිංචි කරන ලදී. නව සාමාජිකයන් 130,000 ක් පමණ මේ යටතේ 2013 වසරේ දී ලියාපදිංචි වී ඇති අතර, ඒ අනුව නව සාමාජික තොරතුරු ගොනුව යාවත්කාලීන කිරීම ද මෙම කාලපරිච්ඡේදය තුළ සිදු කර ඇත. පළමු වරට දායක මුදල් ලැබෙන සාමාජිකයින්ගේ ජාතික හැඳුනුම්පත් තොරතුරු මාසික පදනමින් රැස්කර ගැනීම සඳහා මෙහෙයුම් ක්‍රියාවලියන් ද පවත්වා ගෙන යනු ලැබේ.

සාමාජිකයින්ගේ පූර්ව සේවානියුක්තියන්ට අදාළ වන සාමාජික ගිණුම් ඒකීය හඳුනා ගැනීමේ අංකයට සම්බන්ධ කිරීම, 2013 වසර තුළ දී ද සිදු කරන ලදී. ඒ අනුව, 2013 දී එවැනි සාමාජික ගිණුම් 16,000 ක් ඒකීය හඳුනා ගැනීමේ අංකයට සම්බන්ධ කරන ලදී. මෙම ක්‍රමය මඟින් අන්තර්ජාලය හරහා සහ ජංගම දුරකථන තුළින් කෙටි පණිවුඩ සේවාව හරහා ජාතික හැඳුනුම්පත් අංකය ඉදිරිපත් කිරීමෙන් සාමාජිකයන්ට තමන්ට හිමි සියලුම සාමාජික ගිණුම් පිළිබඳ තොරතුරු විමසීමට හැකියාව ලැබේ.

අරමුදලේ අක්‍රීය (වර්තමානයේ දායක මුදල් ගෙවනු නොලබන) සාමාජිකයින් නැවත ලියාපදිංචිය සඳහා මෙම යෝජිත ව්‍යාපෘතිය 2013 වසරේ දී නියාමන ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරන ලදී.

**(ඊ) ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතිය**

සේ.අ.අ. සාමාජිකයන්ට හා අනෙකුත් සහභාගීකරුවන්ට කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැලසීමේ උපායමාර්ගික අරමුණ සපුරාලනු පිණිස සේ.අ.අ. දෙපාර්තමේන්තුවෙ හි ලේඛනගත මෙහෙයුම් පරිසරය අවම ලේඛණ සහිත විද්‍යුත් මාධ්‍යයට පරිවර්තනය කිරීම උදෙසා ලේඛන පිළිබිඹු ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතිය (ISP) ආරම්භ කරන ලදී. කඩදාසිමය ලියකියවිලි පරිහරණය සඳහා වැයවන කාලය, අවකාශය, පිරිවැය සහ මානව සම්පත අවම කිරීම තුළින් දෙපාර්තමේන්තුවෙ හි මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් අවස්ථා 4 ක් යටතේ හඳුනා ගත හැක.

**(i) දැනට පවත්නා ලියකියවිලි විද්‍යුත් මාධ්‍යයට හැරවීම**

ලේඛන ඡායාස්ථගත කිරීමේ ටෙන්ඩරය සේවා සපයන ආයතනයකට ප්‍රදානය කර, ඒ සඳහා ගිවිසුම 2013 ජූලි 29 වන දින අත්සන් තබන ලදී. සැලසුම්කර ඇති කාලසටහනට අනුව 2014 අගෝස්තු මස වනවිට ප්‍රධාන

ලිපිගොනු, "ඞී" ආකෘති පත්‍ර සහ නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතියෙහි ලේඛන ඡායාස්ථගත කිරීම අවසන් කිරීමට බලාපොරොත්තු වේ.

**(ii) ලේඛන තථ්‍යකාලීනව ඡායාස්ථගත කිරීම**

කඩදාසිමය වාර්තා එක්රැස් වීම වැළැක්වීම පිණිස අදාළ ලේඛන ලැබුණු විගස ඡායාස්ථගත කිරීම 2014 වසරේ දෙවන කාර්තුවේ සිට ආරම්භ කිරීමට නියමිතය. 2013 වසරේදී මේ සඳහා වූ මෘදුකාංගය දෙපාර්තමේන්තු අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි සකස් කර ගැනීම සඳහා මෘදුකාංග අවශ්‍යතා විශේෂණ වාර්තාව (Software Requirement Specification) පිළියෙල කිරීමේ කාර්යයේ සේ.අ.අ. දෙපාර්තමේන්තුව නියැළිණි.

**(iii) විද්‍යුත් තොරතුරු ගබඩාවක් ස්ථාපනය කිරීම**

ව්‍යාපෘතියට අවශ්‍ය කරන දෘඩාංග සම්පාදනය කිරීම සඳහා වන ටෙන්ඩරය 2013 වසරේ නොවැම්බර් මස 12 වන දිනෙන් අවසන් කරන ලද අතර, ටෙන්ඩර්පත් ඇගයීමේ කමිටුව (TEC) විසින් මේ වනවිට අදාළ ටෙන්ඩරය ඇගයීමේ අවසන් අදියරෙහි නියැළී සිටී. 2014 වසරේ පළමු කාර්තුව තුළ දී අදාළ දෘඩාංග මිලදී ගැනීම සිදුකිරීමට නියමිතව ඇත.

**(iv) ලේඛන කළමනාකරණ පද්ධතිය දැනට පවත්නා සේ.අ.අ. පරිගණක පද්ධතිය සමග ඒකාබද්ධ කිරීම**

මෙම අදියර ඉහත අදියරයන් තුන අවසන් කිරීමෙන් පසු තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගිත්වයෙන් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

2014 වසර තුළ මෙම ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීම තුළින් විමධ්‍යගතව සමගාමීව වාර්තා පරිශීලනයෙහි හැකියාව, සාමාජික කේන්ද්‍රික සහ කාර්යක්ෂම ලෙස වාර්තා නැවත පරිශීලනය යන ක්‍රියාවලීන් වල දියුණුව, ආදී ප්‍රතිලාභ දෙපාර්තමේන්තුවට අත්පත් කරගත හැක. වර්තා තැන්පත් කරතැබීමේ දී දැරීමට සිදුවන බදු කුලී සහ ලේඛන හැසිරීමේදී දරණ සේවක පිරිවැය ඉවත්වීම තුළින් ද ඇතිවන පිරිවැය ඉතිරියේ ප්‍රතිලාභ ද සේ.අ.අ දෙපාර්තමේන්තුවට හිමිවනු ඇත.

## 9. විනිමය පාලන

වර්ෂ 1950 දී ස්ථාපිත කරන ලද විනිමය පාලන දෙපාර්තමේන්තුව, 1953 අංක 24 දරන විනිමය පාලන පනත යටතේ විනිමය පාලන දෙපාර්තමේන්තුවට පවරා ඇති වගකීම් අඛණ්ඩව සිදු කරගෙන යන ලදී. බලයලත් වෙළෙඳුන් හට විධානයන් නිකුත් කිරීම, ගැසට් නිවේදන නිකුත් කිරීම, විශේෂිත විදේශ විනිමය ගනුදෙනු සම්බන්ධයෙන් අවසර ලබාදීම සහ බලපත්‍ර ලබාදීම, විවිධ විදේශ විනිමය ගනුදෙනු සුපරීක්ෂණය, විනිමය පාලන පනතේ විධිවිධානයන් උල්ලංඝනය කිරීම් සම්බන්ධව විමර්ශන කටයුතු සිදු කිරීම යනාදිය තුළින් ශ්‍රී ලංකා ආර්ථිකයේ උන්නතිය උදෙසා විනිමය පාලන පනතේ විධිවිධානයන්ට අනුව විදේශ විනිමය ගනුදෙනු හා සම්බන්ධ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම විනිමය පාලන දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයන් වේ. (2013 වසර තුළ දී නිකුත් කරන ලද විධානයන් හා ගැසට් නිවේදන පිළිබඳ විස්තර වාර්ෂික වාර්තාවේ III කොටසේ දැක්වේ).

මෑත කාලවකවානුව තුළ දී මෙන්ම, 2013 වසරේ දී ද මෙම සියලුම ක්‍රියාකාරකම් හරහා ඉලක්ක කරනු ලැබුවේ ආයෝජක විශ්වාසය ඉහළ නැංවීම, විදේශ සංචිත ශක්තිමත් කිරීම, විදේශ විනිමය වෙළෙඳපොළ ස්ථායීකරණය යනාදියට මග සලසමින් ගෝලීය ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුළ ශ්‍රී ලංකාවේ තරඟකාරිත්ව වාසි ප්‍රවර්ධනය කිරීම සඳහා වර්තමාන සාර්ව ආර්ථික ප්‍රතිපත්ති රාමුවට ගැලපෙන පරිදි විදේශ විනිමය ගනුදෙනු තවදුරටත් ලිහිල් කිරීම උදෙසාය.

### 9.1 විධානයන් නිකුත් කිරීම

පහත සාරාංශගත කර ඇති ආකාරයට විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් 2013 වසර තුළ දී බලයලත් වෙළෙඳුන් හට නව විධානයන් 23 ක් නිකුත් කරන ලදී.

(අ) **විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම (FEEA)**: ඕනෑම විදේශ විනිමය උපයන්නෙකුගේ නමින්, ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් ජංගම, ඉතිරිකිරීම් හෝ කාලීන තැන්පතු ආකාරයෙන් FEEA ආරම්භ කිරීමට අවසර ලබාදීම.

(ආ) **විදේශ විනිමය ඉදිරි විකුණුම් හා මිලදී ගැනුම්**: විදේශ විනිමය විකිණීම සහ/හෝ මිලදී ගැනීම සඳහා වන ඉදිරි ගිවිසුම් සම්බන්ධයෙන් නව නියමයන් හා කොන්දේසි නියම කිරීම සහ කාලය සම්බන්ධයෙන් පැවති බාධාවන් ඉවත් කිරීම.

(ඇ) **අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් (NRFC) ගිණුම**: එම ගිණුම් හිමියාගේම සුරැකුම්පත් ආයෝජන ගිණුමකින් මාරු කරන ලද අරමුදල් අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට බැර කිරීම සඳහා අවසර ලබාදීම.

(ඈ) **විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම (SFIDA)**: එම ගිණුම් හිමියාගේම සුරැකුම්පත් ආයෝජන ගිණුමකින් මාරු කරන ලද අරමුදල් විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුමකට බැර කිරීම සඳහා අවසර ලබාදීම.

(ඉ) **නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් (RNNFC) ගිණුම**: එම ගිණුම් හිමියාගේම සුරැකුම්පත් ආයෝජන ගිණුමකින් මාරු කරන ලද අරමුදල් නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට බැර කිරීම සඳහා අවසර ලබාදීම.

(ඊ) **අනේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම (NRNNFA)**: එම ගිණුම් හිමියාගේම සුරැකුම්පත් ආයෝජන ගිණුමකින් මාරු කරන ලද අරමුදල් අනේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට බැර කිරීම සඳහා අවසර ලබාදීම.

(උ) **ආමුඛ ආයෝජන ගිණුම (IIA):** ආමුඛ ආයෝජන ගිණුම පිළිබඳ මීට පෙර නිකුත් කරන ලද විධානය අවලංගු කරමින්, එකී විධානය යටතේ විවෘත කර ඇති ගිණුම් ශ්‍රී ලංකා රුපියල් ගිණුම් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යා හැකි බව බලයලත් වෙළෙඳුන් හට දැනුම් දීම.

(ඌ) **විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම (FEEA):** විදේශීය වාණිජ ණය ගැනීමේ යෝජනා ක්‍රමය (ECBS) යටතේ ණය ලබාගෙන තිබෙන සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන්ගේ නමින් විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් විවෘත කිරීමට අවසර ලබාදීම.

(එ) **විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම (ECBA):** විදේශීය වාණිජ ණය ගැනීමේ යෝජනා ක්‍රමය (ECBS) යටතේ ලබාගත් ණය මුදල් ඕනෑම බැංකු ගිණුමකට බැර කිරීම සඳහා අවසර ලබාදීම සහ විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුමක් (ECBA) විවෘත කිරීමේ අවශ්‍යතාවය ඉවත් කිරීම.

(ඒ) **අනේවාසික ආයෝජකයන් විසින් ඒකක භාරවල ආයෝජනය කිරීම:** අනේවාසිකයන් විසින් ඒකක භාරවල ආයෝජනය කිරීමට අදාළව 2013.01.31 දින නිකුත් කරන ලද අංක 1795/39 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව එම ගනුදෙනුවලට පහසුකම් සපයන ලෙස බලයලත් වෙළෙඳුන්හට දැනුම් දීම.

(ඔ) **විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම (FEEA):** විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුමට අදාළ වාර්තාකරණ අවශ්‍යතාවය සංශෝධනය කිරීම.

(ඕ) **අන්තරාල වෙළෙඳාම:** අන්තරාල වෙළෙඳාම පිණිස භාණ්ඩ ආනයනය සහ අපනයන සඳහා වන ඉල්ලීම් සඳහා පහසුකම් සැලසීමේදී බලයලත් වෙළෙඳුන් පිළිපැදිය යුතු කොන්දේසි නියම කිරීම.

(ක) **විගාමිකයන්හට විදේශ විනිමය විකිණීම:** එක් පුද්ගලයෙකු හට එ.ජ.ඩොලර් 150,000 ක් දක්වා වන මූලික සංක්‍රමණික දීමනාවක් ලබාදීමට සහ සංක්‍රමණික ආවෘත ගිණුම් හිමියා විසින් ලබාදී ඇති උපදෙස් ප්‍රකාරව සංක්‍රමණික ආවෘත ගිණුමෙන් අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක හෝ විගාමිකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යනු ලබන ගිණුමක බැරට අරමුදල් මාරු කිරීමට බලයලත් වෙළෙඳුන්හට අවසර ලබාදීම.

(ග) **නේවාසික විදේශ ව්‍යවහාර මුදල් (RFC) ගිණුම්:** මුදල් වර්ගය නොසලකා හරිමින්, වෙනත් බලයලත් වෙළෙන්දෙකු සමග පවත්වාගෙන යනු ලබන නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් මාරු කරන ලද අරමුදල් භාවිතා කර නව නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීම සඳහා අවසර ලබාදීම.

(ච) **බලයලත් වෙළෙඳුන් විසින් නොස්ට්‍රෝ ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම:** බලයලත් වෙළෙඳුන් විසින්, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරනු ලැබූ බැංකු සමග හෝ එවැනි බැංකුවල ශාඛා සමග නොස්ට්‍රෝ ගිණුම් විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට අවසර ලබාදීම.

(ජ) **සුරැකුම්පත් ආයෝජන ගිණුම (SIA):** සුරැකුම්පත් ආයෝජන ගිණුමට අරමුදල් ගෙන්වා ගැනීම සහ එම ගිණුමෙන් අරමුදල් නැවත සිය රටවලට යැවීම පිණිස වඩාත් නම්‍යශීලී ප්‍රවේශයන් ලබාදීමේ අරමුණින්, සුරැකුම්පත් ආයෝජන ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් නව කොන්දේසි හා නියමයන් නිකුත් කිරීම.

(ට) **එතෙර ගමන් කරන ශ්‍රී ලාංකිකයන් සඳහා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කිරීම:** එතෙර ගමන් කරන ශ්‍රී ලාංකිකයන් සඳහා ලබාදෙනු ලබන විදේශ ගමන් දීමනාවේ කොටසක් වශයෙන් එ.ජ.ඩොලර් 5,000 ක් හෝ වෙනත් පරිවර්තනීය විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඊට සමාන වන ප්‍රමාණයක් දක්වා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කිරීමට අවසර ලබාදීම.

(ඩ) **අනේවාසිකයන් සතුව පවතින නිශ්චල දේපළ විකුණා ලද මුදල් නැවත සිය රටට යැවීම:** ප්‍රාග්ධන ලාභ ද ඇතුළුව (අදාළ නම් පමණක්) අනේවාසිකයන් සතුව ශ්‍රී ලංකාවේ පවතින නිශ්චල දේපළ විකුණා ලද මුදල්, සුරැකුම්පත් ආයෝජන ගිණුමකට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යනු ලබන ගිණුමකට බැර කිරීම සඳහා අවසර ලබාදීම.

(ණ) **විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් (FEEA) හිමිකරුවන් සඳහා ණය පහසුකම්:** විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් පවත්වාගෙන යනු ලබන පුද්ගලයන් හට දේශීය බැංකු ඒකක වලින් විදේශ ව්‍යවහාර මුදලින් ණය පහසුකම් ප්‍රදානය කිරීමට අවසර ලබාදීම.

(ත) **අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් (NRFC) ගිණුම:** සංක්‍රමණික ආවෘත ගිණුමෙන් අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ බැරට අරමුදල් මාරු කිරීමට සහ මුදල් වර්ගය නොසලකා හරිමින් වෙනත් බලයලත් වෙළෙන්දෙකු සමග පවත්වාගෙන යනු ලබන අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් මාරු කරන ලද අරමුදල් භාවිතා කර නව අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීම සඳහා අවසර ලබාදීම.

(ද) **බලයලත් වෙළෙඳුන් විසින් නොස්ට්‍රෝ ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම:** නොස්ට්‍රෝ ගිණුම් පිළිබඳ විස්තර විනිමය පාලන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම තවදුරටත් අවශ්‍ය නොවන බව බලයලත් වෙළෙඳුන්හට දැනුම් දීම.

(න) **බලයලත් වෙළෙඳුන් ලෙස පත් කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ද්විතීයික වෙළෙඳපොළෙහි ශ්‍රී ලංකා ස්වෛරීත්ව බැඳුම්කර මිලදී ගැනීම:** ශ්‍රී ලංකා රජය විසින් 2010, 2011, 2012 වර්ෂවල දී ශ්‍රී ලංකාවෙන් පිටත නිකුත් කරනු ලැබූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ද්විතීයික වෙළෙඳපොළ තුළ අත්පත් කර ගැනීම, රඳවා ගැනීම හා පැවරීම සඳහා බලයලත් වෙළෙඳුන්හට අවසර ලබාදීම.

(ප) **විදේශ නැව් සේවයක හෝ ගුවන් සේවයක නියෝජිතයෙකු විසින් පවත්වාගෙන යන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම, විදේශ නැව් සේවයක හෝ ගුවන් සේවයක නියෝජිතයෙකු සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම (FCAASA) ලෙස නැවත නම් කිරීම:** ශ්‍රී ලංකාව තුළ කටයුතු කරනු ලබන විදේශ නැව් සේවා හා ගුවන් සේවා නියෝජිතයන් විසින් පවත්වාගෙන යනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම, "විදේශ නැව් සේවයක හෝ ගුවන් සේවයක නියෝජිතයෙකු සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම (FCAASA)" ලෙස නැවත නම් කිරීම සහ FCAASA විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට අදාළ කොන්දේසි හා නියමයන් නියම කිරීම.

## 9.2 ගැසට් නිවේදන නිකුත් කිරීම

2013 වසර තුළ දී විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් නව ගැසට් නිවේදන අටක් නිකුත් කරන ලදී.

(අ) **විදේශීය වාණිජ ණය ගැනීමේ යෝජනා ක්‍රමය (ECBS) (2013 ජනවාරි 01 දිනැති ගැසට් අංක 1791/15):** නිශ්චිත කොන්දේසිවලට යටත්ව විදේශීය වාණිජ ණය ගැනීමේ යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකුගෙන් ණය ලබාගැනීම සඳහා අවසර ලබාදීම.

(ආ) **විදේශ ව්‍යවහාර මුදලින් වන ගෙවීම් භාරගැනීම සඳහා වන අවසරය (2013 ජනවාරි 01 දිනැති ගැසට් අංක 1791/16):** ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයින් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන පුද්ගලයන්ට සපයන ලද භාණ්ඩ හා සේවාවලට අදාළ ගෙවීම් විදේශ ව්‍යවහාර මුදලින් භාර ගැනීමට අවසර ලබාදීම.

(ඇ) **ශ්‍රී ලංකා රුපියල් වලින් නියම කර ඇති ගෙවා නිදහස් කළහැකි වරණීය කොටස් නිකුත් කිරීම සහ පැවරීම සඳහා වන අවසරය (2013 ජනවාරි 04 දිනැති ගැසට් අංක 1791/43):** නිශ්චිත කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකා රුපියල් වලින් නියම කර ඇති ගෙවා නිදහස් කළහැකි වරණීය කොටස් අනුමත කළ රටක අරමුදල්වලට, අනුමත කළ ප්‍රාදේශීය අරමුදල්වලට, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත සංස්ථාපිත ආයතනවලට සහ ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයන්ට නිකුත් කිරීම සහ පැවරීම සඳහා අවසර ලබාදීම.

(ඈ) **2010 නොවැම්බර් 22 දිනැති අංක 1681/10 දරන ගැසට් නිවේදනය සංශෝධනය කිරීම (2013 ජනවාරි 10 දිනැති ගැසට් අංක 1792/28):** "ආමුඛ ආයෝජන ගිණුම" වෙනුවට "සුරැකුම්පත් ආයෝජන ගිණුම" යන වචන ආදේශ කිරීමෙන් 2010 නොවැම්බර් 22 දිනැති අංක 1681/10 දරන ගැසට් නිවේදනය සංශෝධනය කිරීම.

(ඉ) **2011 අගෝස්තු 18 දිනැති අංක 1719/24 දරන ගැසට් නිවේදනය සංශෝධනය කිරීම (2013 ජනවාරි 30 දිනැති ගැසට් අංක 1795/32):** ශ්‍රී ලංකා රුපියල්වලින් අනේවාසිකයන්ට ගෙවීම් කිරීම සඳහා ශ්‍රී ලාංකිකයන්ට ලබා දී තිබූ පොදු අවසරය ශ්‍රී ලාංකික සම්භවයක් ඇති අනේවාසික පුද්ගලයන් දක්වා දීර්ඝ කිරීම.

(ඊ) **ඒකක භාරයක ඒකක නිකුත් කිරීම සහ පැවරීම සඳහා වන අවසරය (2013 ජනවාරි 31 දිනැති ගැසට් අංක 1795/39):** නිශ්චිත කොන්දේසිවලට යටත්ව ඒකක භාරයක ඒකක විදේශීය ආයතනික ආයෝජකයන්ට, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගම්වලට සහ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයන්ට (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ශ්‍රී ලාංකිකයන් ද ඇතුළත්ව) නිකුත් කිරීමට සහ පැවරීමට අවසර ලබාදීම.

(උ) **අනේවාසිකයන් සතුව පවතින නිශ්චල දේපළ අත්පත් කර ගැනීම පිණිස ගෙවීම් කිරීම සඳහා නේවාසිකයන්හට ලබාදෙන අවසරය (2013 ජූනි 12 දිනැති ගැසට් අංක 1814/39):** ශ්‍රී ලංකාව තුළ පවතින නිශ්චල දේපළක් විකිණීමට අදාළ ගෙවිය යුතු විකුණුම් වටිනාකම ශ්‍රී ලංකාවෙන් පිටත වාසික තැනැත්තෙකුට ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම සඳහා ශ්‍රී ලංකාවේ වාසික තැනැත්තන් හට අවසර ලබාදීම.

(ඌ) **2010 මාර්තු 11 දිනැති අංක 1644/26 දරන ගැසට් නිවේදනය සංශෝධනය කිරීම (2013 ජූනි 12 දිනැති ගැසට් අංක 1814/40):** වෙනත් රටක වලංගු නිත්‍ය නේවාසික බලපත්‍රයක් ලබාගත් පුද්ගලයන්ට හා ද්විත්ව පුරවැසියන්ට ශ්‍රී ලංකාවෙන් පිටත බැංකුවල ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා අවසර ලබාදීම.

## 9.3 අනුමැතීන්/අවසර පත්‍ර

පහත සාරාංශගත කර ඇති ආකාරයට, විනිමය පාලන පනතේ විධිවිධානයන් යටතට ගැනෙන ගනුදෙනු සඳහා විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් අනුමැතීන් සහ අවසර පත්‍ර ප්‍රදානය කරන ලදී.

(අ) අනුමැතීන්

i. විදේශීය ආයෝජනයන් සඳහා විශේෂ අනුමැතිය ඉල්ලුම් කරමින් නේවාසික සමාගම්වලින් ඉල්ලීම් 15 ක් ලැබුණු අතර සමාගම් 9 කට එ.ජ.ඩොලර් මිලියන 26.43 ක මුදලක් ආයෝජනය කිරීම සඳහා අවසර ප්‍රදානය කරන ලදී. එක් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරන ලද අතර ඉල්ලීම් 5 ක් පිළිබඳව ඉදිරි කටයුතු කරගෙන යමින් පවතී.

ii. විදේශයන්ගෙන් ණය ලබාගැනීම සඳහා නේවාසික සමාගම්වලින් ඉල්ලීම් 16 ක් ලැබුණු අතර, එ.ජ.ඩොලර් මිලියන 335.50 ක මුදලක් ණය වශයෙන් ලබාගැනීම සඳහා සමාගම් 14 කට අවසර ප්‍රදානය කරන ලදී. ඉල්ලීම් 2 ක් පිළිබඳව ඉදිරි කටයුතු කරගෙන යමින් පවතී.

(ආ) අවසර පත්‍ර/බලපත්‍ර නිකුත් කිරීම

i. මුදල් හුවමාරු කිරීමේ නව බලපත්‍ර 8 ක් නිකුත් කරන ලද අතර, බලයලත් මුදල් හුවමාරු කරන්නන් ගණන 90 දක්වා ඉහළ යන ලදී.

ii. වාර්ෂිකව එ.ජ. ඩොලර් මිලියන 4 ඉක්මවා විදේශ විනිමය මිලදී ගැනීමට සමත් වූ මුදල් හුවමාරු කරන්නන් පස්දෙනෙකුට විදේශ විනිමය විකිණීම සඳහා අවසර ලබාදුන් අතර, විදේශ විනිමය විකිණීම සඳහා අවසරලත් මුදල් හුවමාරු කරන්නන්ගේ මුළු ගණන 24 ක් විය.

iii. නව සමාගම් 34 ක් භාණ්ඩ නැව්ගත කරන්නන් ලෙස ලියාපදිංචි කළ අතර, ඒ අනුව භාණ්ඩ නැව්ගත කරන්නන්ගේ මුළු ගණන 538 දක්වා ඉහළ යන ලදී.

iv. 2013 ජනවාරි 01 දිනැති අංක 1791/16 දරන ගැසට් නිවේදනය මගින් ලබා දෙන ලද පොදු අවසරය හේතුවෙන් තීරුබදු රහිත වෙළෙඳසැල්, සංචාරක හෝටල්/අවන්හල්, මැණික් හා ස්වර්ණාභරණ වෙළෙඳසැල් සහ සංචාරක නියෝජිතයන් වැනි අනෙකුත් සීමිත බලයලත් වෙළෙඳුන් හට විදේශ මුදල් භාරගැනීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් අත්හිටුවන ලදී.

### 9.4 සුපරීක්ෂණය හා විමර්ශනයන්

විනිමය පාලන රෙගුලාසිවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් 2013 වසර තුළ දී විමර්ශනයන් 74 ක් මෙහෙයවන ලදී. එබඳු විනිමය පාලන නීතිරීති උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් පනවන ලද දඩ මුදල් වශයෙන් අය කර ගත් රුපියල් මිලියන 8.4 ක මුදලක් ඒකාබද්ධ අරමුදලට මාරු කරන ලදී. එබඳු විමර්ශනවලින් බහුතරයක්ම නේවාසිකයන් විසින් අනේවාසිකයන්ට කරන ලද අනවසර ගෙවීම්, සීමිත බලයලත් වෙළෙඳුන් විසින් බලපත්‍රයන් හි සඳහන් කොන්දේසි උල්ලංඝනය කිරීම සහ පොදු අවසරයන් හි දක්වා ඇති ක්‍රියාපටිපාටිය උල්ලංඝනය කරමින් සුරැකුම්පත් නිකුත් කිරීම මෙන්ම පැවරීම හා සම්බන්ධ වේ.

### 9.5 මහජනතාව දැනුම්වත් කිරීම

විනිමය පාලනයන් හි අඛණ්ඩ ලිහිල් කිරීම්වලට අනුගාමීව, බලයලත් වෙළෙඳුන් අතර සහ මහජනතාව අතර වර්තමාන විදේශ විනිමය ප්‍රතිපත්ති සහ මෑතදී සිදු කළ ප්‍රාග්ධන ගිණුම් ගනුදෙනු ලිහිල්කරණය පිළිබඳව දැනුම වැඩිදියුණු කිරීම පිණිස දැනුම්වත් කිරීමේ වැඩසටහන් කිහිපයක්ම පවත්වන ලදී. තවද, මහජනතාවගේ ප්‍රයෝජනය උදෙසා "A Step-by-Step Guide to Foreign Exchange Transactions" නමින් ප්‍රකාශනයක් නිකුත් කරන ලදී. වර්තමාන ක්‍රියාපටිපාටීන් පිළිබඳව ඉතා වැදගත් මාර්ගෝපදේශයක් වශයෙන් ප්‍රයෝජනයට ගැනීමේ අරමුණින් යුතුව මෙම ප්‍රකාශනය භාවිතා කරන්නාට සරලව අවබෝධ කර ගතහැකි අයුරකින් සම්පාදනය කර ඇත. එසේම, විදේශ විනිමය මෙහෙයුම් සහ තොරතුරු වෙනුවෙන්ම වෙන් වූ නව වෙබ් අඩවියක් (www.ecd.lk) දියත් කරන ලදී.

මූල්‍ය ආයතන, නීති බලාත්මක කිරීමේ අධිකාරීන්, රජයේ දෙපාර්තමේන්තු සහ මහජනතාව උදෙසා සම්මන්ත්‍රණ ස්වරූපයෙන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. 2013 වසර තුළ දී එවැනි දැනුම්වත් කිරීමේ වැඩසටහන් 43 ක් පවත්වන ලදී.

## 10. පහසුකම් කළමනාකරණ

මහ බැංකුවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා සේවයේ යෙදෙන කාර්ය මණ්ඩලයට සතුටුදායක සහ පහසු වාතාවරණයක් පවත්වාගෙන යාමට සහ සියලු වැදගත් සේවාවන් බාධාවකින් තොරව පවත්වාගෙන යාමේ කටයුතු අඛණ්ඩව සිදුකිරීමට 2013 වසර තුළ දී පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව පියවර ගන්නා ලදී.

2013 වසරේ උපායමාර්ගික සැලසුමට අනුකූලව ප්‍රවර්ධන සේවාවන්, විදුලිය, වායු සමණයකිරීම, ජල සැපයුම, ප්‍රවාහන සහ සන්නිවේදන වැනි ඉතා වැදගත් සේවාවන් ඉහළ තත්ත්වයේ මෙහෙයුම් විශ්වාසනීය මට්ටමකින් යුතුව පවත්වාගෙන යාම සහ බැංකු පරිශ්‍රය නඩත්තු කිරීම ඇතුළුව දෙපාර්තමේන්තුවේ අභිමතාර්ථයන් සපුරා ගැනීම අරමුණු කරගත් මූලික ක්‍රියාකාරකම් පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යාපාරික අඛණ්ඩතාව සහතික කිරීමට දායක වන පරිදි මෙම පහසුකම් සැපයීම සියයට සියයක විශ්වාසනීය මට්ටමකින් පවත්වාගෙන යාමට දෙපාර්තමේන්තුවට හැකි විය. කාර්යක්ෂමතාව සහ පිරිවැය ඵලදායීතාව වැඩිකිරීම මෙන්ම, වෘත්තීය මට්ටමකින් ව්‍යාපෘති ඇගයීමේ ක්‍රමවේදයක් තුළින් නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘතීන් සම්පූර්ණ කිරීම උදෙසා දෙපාර්තමේන්තුවෙන් දරනු ලබන පිරිවැය සඳහා "මුදලට වටිනාකමක්" ලැබීම තහවුරු කිරීමට ද පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට හැකිවිය. ඉහළ වෘත්තීය නිපුණතාවයෙන් සහ පිරිවැය ඵලදායීතාවයෙන් යුතු කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීම සහ ව්‍යාපෘති ප්‍රගතිය සමීප අධීක්ෂණය කිරීම මගින්, එම ව්‍යාපෘතිය අපේක්ෂිත ප්‍රමිතියෙන් යුතුව එකඟවී ඇති කාල සීමාවන් තුළ සම්පූර්ණ කිරීම සහතික කිරීමට ද හැකිවිය. ප්‍රධාන කාර්යාල පිවිසුම සහ පිළිගැනීම් කවුළුව නවීකරණය කරමින් මහ බැංකු පිවිසුම් දොරටුව මහජනතාවට වඩාත් සුහදශීලී සහ ආකර්ෂණීය වන ආකාරයට වෙනස් කරන ලදී. තවද, විවිධ කාර්යයන් සඳහා බැංකුවට පැමිණෙන මහජනතාව සඳහා මහ බැංකු පිවිසුම ආශ්‍රිතව නවීන ශ්‍රව්‍ය දෘශ්‍ය පහසුකම් සහිත සුවදායී රැඳීසිටීමේ ශාලාවක් පිහිටුවන ලදී. මෙයට අමතරව ඉලෙක්ට්‍රොනික සහ වැඩිදියුණු කරන ලද උපාංග සහිත ප්‍රවේශ පාලන (Access Controls) ක්‍රමයක් ස්ථාපනය කිරීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ ඇති ඒකාබද්ධ ආරක්ෂක පද්ධතිය යාවත්කාලීන කරන ලදී.

පළමුව නැෂනල් මියුචුවල් ඇෂුවරන්ස් ගොඩනැගිල්ල ලෙස හැඳින්වූ සෙන්ට්‍රල් පොයින්ට් (Central Point) ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු 2013 වසර තුළ දී සම්පූර්ණ කිරීම, මෙම දේපළෙහි වටිනාකම සැලකිය යුතු ලෙස වැඩිකිරීමට හේතුවිය. කොළඹ සිට රටෙහි වෙනත් ඕනෑම ගමනාන්තයකට ඇති දුර මනින කොළඹ කොටුව මධ්‍යයෙහි පිහිටීම නිසා මෙම ගොඩනැගිල්ල සෙන්ට්‍රල් පොයින්ට් ලෙස නැවත නම් කරන ලදී. මෙම ගොඩනැගිල්ලේ ස්වරූපය, ඉහළ ගුණාත්මක බවින් සපිරි ඉදිකිරීමේ

ප්‍රමිතියකින් යුතුව මුල් අලංකාරත්වයටම ප්‍රතිසංස්කරණය කිරීම පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වෘත්තීය කාර්යය මණ්ඩලය ඇතුළු බාහිර කොන්ත්‍රාත්කරුවන් / විශේෂඥයන්ගේ සාමූහික උත්සාහයක් සහ මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ මගපෙන්වීමේ මහඟු ප්‍රතිඵලයක් වේ. අතිගරු ජනාධිපතිතුමා විසින් 2013 නොවැම්බර් 11 වැනි දින විවෘත කරන ලද මෙම සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ල තුළ ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාස කෞතුකාගාරය ස්ථාපනය කරන ලදී. ප්‍රධාන කාර්යාල පරිශ්‍රයෙහි බහුමහල් රථ ගාලේ පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කර එය 2013 ඔක්තෝබර් 25 වැනි දින විවෘත කරන ලදී. මෙහි සැලකිය යුතු වාහන සංඛ්‍යාවක් නවතා තැබීමට පහසුකම් සලසාදෙනු ලබන අතර, එමගින් බැංකුවේ පුහුණු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ වටිනාකාලය ඵලදායී කාර්යයන්ට යොමු කරවීමට හැකි විය.

උතුරු පළාතේ සියලුම පරිපාලන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන සංවර්ධන කාර්යයන් කඩිනම් කිරීමට පහසුකම් සැපයීම සඳහා වන සංවර්ධන මූල්‍යකරණය වැඩිදියුණු කිරීම, බැංකු සහ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා අදාළ ක්‍රියාකාරකම් සඳහා මහජනතාව දැනුම්වත් කරලීම වැනි අරමුණු සපුරාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ උතුරු පළාත් කාර්යාලය කිලිනොච්චියේ ස්ථාපනය කරමින් ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමට පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් 2013 අගෝස්තු 12 වැනි දින මුල්ගල් තබන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙතින් මිලදී ගත්, කොළඹ 01, සර් බාරොන් ජයතිලක මාවතේ පිහිටි "වයිට් අවේස්" ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු වසර තුළ දී ආරම්භ කරන ලදී. තවද කතරගම සහ නුවරඑළියේ නිවාඩු නිකේතනයන් සඳහා අමතර අනුනිවාස (Apartment) සහ රාජගිරිය බැංකු විදුපියසේ අමතර ගොඩනැගිල්ලක් ද ඉදිකිරීමට පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මෙම වසර තුළ දී මුල්ගල තබන ලදී.

මෙහෙයුම් අවදානම් අවම කිරීම සඳහා 2013 වසර තුළ දී පවත්නා වාහනවල තත්ත්වය උසස්කිරීම මගින් පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව තම වාහන පද්ධතිය ශක්තිමත් කරගන්නා ලදී. බැංකුවේ සාමාන්‍ය කටයුතු සඳහා ප්‍රවාහන සේවා සැපයීමට අමතරව, බැංකුව විසින් අනුග්‍රහය දක්වන ලද අන්තර්ජාතික සම්මන්ත්‍රණ ගණනාවකට අඛණ්ඩ ප්‍රවාහන සේවා සැපයීමට ද දෙපාර්තමේන්තුවට හැකිවිය.

# II. මූල්‍ය කටයුතු

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන් (IAS) / ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (IFRS) හා මුදල් නීති පනතේ (MLA) අදාළ විධිවිධානයන් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය වාර්තාකරණ කාර්යභාරය සිදුකරනු ලැබේ. මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන්ට, මූල්‍ය ගණුදෙනු සම්බන්ධයෙන් අභ්‍යන්තරික වාර්තාකරණ ක්‍රමයන් පවත්වාගෙන යාම, මූල්‍ය ගිණුම් ප්‍රකාශන පිළියෙළ කිරීම, මහ බැංකුවේ වාර්ෂික අයවැය ලේඛණය පිළියෙළ කිරීම හා අධීක්ෂණය, මහ බැංකුවේ අභ්‍යන්තර හා බාහිර ගනුදෙනු සඳහා ගෙවීම් ක්‍රමයක් පවත්වාගෙන යාම, අභ්‍යන්තර අරමුදල් 12 කළමණාකරණය කිරීම, ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යාම හා සේවක ණය මුදල් සඳහා ක්‍රමවත් දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම ඇතුළත් වේ.

## II.1 මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම

(අ) **මාසික ශේෂ පත්‍රය:** මුදල් නීති පනතේ විධිවිධානයන් ප්‍රකාරව, 2012 දෙසැම්බර් මාසය සඳහා වූ ශේෂ පත්‍රය හා 2013 ජනවාරි මස සිට නොවැම්බර් දක්වා වූ මාසික ශේෂ පත්‍රයන් පිළියෙළ කිරීම හා ඒවා රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම 2013 වසර තුළදී සිදුකරන ලදී.

(ආ) **වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයන්:** 2003 වසරේ සිට වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සඳහා ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන් (IAS) හා ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (IFRS) උපයෝගී කරගෙන ඇත. මෙම මූල්‍ය ප්‍රකාශනයන් මහ බැංකු වාර්ෂික වාර්තාවේ ප්‍රකාශයට පත් කෙරේ. මෙම ප්‍රමිතීන් හා හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් අනුගමනය කරමින් මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව ගිණුම්කරණ පද්ධතිය හා ක්‍රියාපටිපාටීන් 2013 වසර තුළදීත් යාවත්කාලීන කරන ලදී. විගණනය කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ 2013 සඳහා වූ වාර්ෂික ගිණුම් වාර්තාව මෙම කොටස ආරම්භයේ ඇතුළත් කර ඇත.

## II.2 වාර්ෂික අයවැය හා ක්‍රියාකාරකම් මත පදනම් වූ අයවැය පිළියෙළ කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2014 වසර සඳහා වූ ආදායම් හා වියදම් අයවැය හා ප්‍රාග්ධන අයවැය බැංකුවේ සියලුම දෙපාර්තමේන්තුවල උපාය මාර්ගික සැලසුම්වල කාර්යයන්ට අනුකූලව සිදුකර ඇත. ක්‍රියාකාරකම් හා කාර්යයන් මත පදනම් වූ අයවැය පිළියෙළ කිරීම ද වාර්ෂික අයවැය සමගම සිදු කළ අතර එමගින් දෙපාර්තමේන්තුවල ක්‍රියාකාරකම් මත වූ පිරිවැය හා මහ බැංකුවේ කාර්යයන් මත පිරිවැය පෙන්නුම් කරන ලදී. මෙම ක්‍රියාවලිය 2013 අගෝස්තු මස ආරම්භ වූ අතර දෙසැම්බර් මස අවසාන වුණි. වාර්ෂික අයවැය සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතිය 2013 දෙසැම්බර් මස ලබාගන්නා ලද අතර අනුමත අයවැය ප්‍රකාශනය 2014 වසරේ පළමු දිනම සියලුම දෙපාර්තමේන්තුවලට ලබාදෙන ලදී. 2013 වසර සඳහා වූ අයවැයෙහි ප්‍රගතිය දැක්වෙන කාර්තුමය වාර්තා අයවැය පාලනය සඳහා සියලුම දෙපාර්තමේන්තුවලට සහ මුදල් මණ්ඩලය වෙත යොමු කරන ලදී.

## II.3 අභ්‍යන්තර හා බාහිර මූල්‍ය ගනුදෙනු සඳහා ගෙවීම් ක්‍රමය

(අ) 2013 වසර තුළ දී නියමිත කාලසීමාවන්ට අනුව අභ්‍යන්තර ගෙවීම් එනම්, සේවකයන් සඳහා ගෙවූ වේතන, සේවක ණය සහ මෙහෙයුම් වියදම් සිදු කරන ලදී.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ක්‍රියාපටිපාටීන්ට යටත්ව සියලුම බාහිර ගෙවීම් දේශීය හා විදේශීය සැපයුම්කරුවන්ට සිදුකර ඇත. ඒ අනුව 2013 වසර තුළදී ගෙවීම් 5,174 ක් සිදු කර ඇති අතර, එහි දේශීය සැපයුම්කරුවන් සඳහා ගෙවීම් 4,916 ක් හා විදේශීය සැපයුම්කරුවන් සඳහා ගෙවීම් 258 ක් ද ඇතුළත් වේ.

(ඇ) 2013 වසර තුළ දී මහා භාණ්ඩාගාරයට හා අදාළ ව්‍යාපෘතීන් සඳහා ණය මුදල් නිදහස් කිරීම් ආසන්න වශයෙන් 3,183 ක් සහ විදේශීය ණය වාරික ආපසු ගෙවීම් 555 ක් සිදුකර ඇත.

**II-12 සංඛ්‍යා සටහන**

**අරමුදල් කළමනාකරණ කාර්යසාධනය - 2013**

රුපියල් මිලියන

| අරමුදල් | ලැබීම් | ගෙවීම් | ආයෝජන | ආයෝජන වසර | වාර්ෂික සාමාන්‍ය ඵලදාව (%) |
|---|---|---|---|---|---|
| විශ්‍රාම අරමුදල් | 12,531.8 | 3,254.6 | 9,189.6 | 35,350.9 | 11.29 |
| වෛද්‍ය ප්‍රතිලාභ | 44.9 | 1.8 | 42.8 | 105.7 | 11.05 |
| විශේෂ අරමුදල් | 968.7 | 19.9 | 949.3 | 1,615.0 | 11.16 |
| එකතුව | 13,545.4 | 3,276.3 | 10,181.7 | 37,071.6 | 11.17 |

## 11.4 අභ්‍යන්තර අරමුදල් කළමනාකරණය

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව අභ්‍යන්තර අරමුදල් 12 ක් කළමනාකරණය කරන අතර, එයට සේවක හා විශ්‍රාම අරමුදල් 6 ක් ද, වෛද්‍ය ප්‍රතිලාභ අරමුදල් 3 ක් හා විශේෂ අරමුදල් 3 ක් ඇතුළත් වේ. මුදල් ප්‍රවාහ කළමනාකරණය, අරමුදල් ආයෝජනය, ගෙවීම් හා පියවීම් සිදුකිරීම, ගිණුම් තැබීම හා වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම මේ සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යයන් වේ. මෙම අරමුදල් ප්‍රධාන වශයෙන් රජයේ සුරැකුම්පත්වල, ස්ථාවර තැන්පත්වල හා ඉහළ ශ්‍රේණිගත සංස්ථාපිත ණයකරවල ආයෝජනය කරන අතර, 2013 වසර සඳහා වූ සාමාන්‍ය ඵලදා (Yield) අනුපාතිකය සියයට 11.17 ක් විය. 2012 වසර සඳහා වූ විගණනය කරන ලද මූල්‍ය වාර්තා මෙම අරමුදල්වල නීතිරීතිවලට අනුව 2013 වසර තුළ දී මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

## 11.5 ස්ථාවර වත්කම් ලේඛණය පවත්වාගෙන යාම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් පොදු ලෙජරයේ ස්ථාවර වත්කම් යටතේ ස්ථාවර වත්කම් ලේඛණය පවත්වාගෙන යනු ලබයි. එහිදී සියලුම වෙනස්කම් එනම්, නව මිලදී ගැනීම් හා ඒවායේ පිහිටුවීම්, පිහිටුවීම්වල සිදුවූ වෙනස්කම්, ප්‍රත්‍යාගණන, ක්ෂයකිරීම් සහ ඉවත් කිරීම් මෙම ලේඛණයේ 2013 වසර තුළ වාර්තා කර ඇත. මිලදී ගැනීම් 1,662 ක් සහ ඉවත්කිරීම් 645 ක් සමඟින් මෙම ලේඛණය 2013 වසර තුළදී යාවත්කාලීන කරන ලදී.

## 11.6 කාර්ය මණ්ඩල ණය දත්ත පවත්වාගෙන යාම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව මහ බැංකු කාර්ය මණ්ඩල ණය දත්ත අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන අතර, එමගින් ණය අය කර ගැනීම් වාර්තාගත කිරීම සහ සේවකයින්ට හා කළමනාකරණය වෙත ණය තොරතුරු සැපයීමේ කටයුතු පහසු කිරීම 2013 වසර තුළ දී ද සිදු කර ඇත.

## 11.7 අනෙකුත් කාර්යයන්

### (අ) මිලදී ගැනීම් ක්‍රියාවලිය

ශ්‍රී ලංකා මහ බැංකුවේ නීතිරීතිවලට අනුව, මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, භාණ්ඩ හා සේවා ලබාගැනීමට පෙර පවත්වන තාක්ෂණික ඇගයීම් කමිටුවලට හා ටෙන්ඩර් මණ්ඩලවලට සහ ලේකම් දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන ඉවත්කිරීමේ මණ්ඩලවලට ද සහභාගි විය යුතුය. 2013 වසර තුළදී දෙපාර්තමේන්තු නිළධාරීන් එවැනි ටෙන්ඩර් මණ්ඩල 360 ක් සහ ඒවාට සම්බන්ධ සියලුම තාක්ෂණික ඇගයීම් කමිටු වලට සහභාගී වී ඇත.

### (ආ) වාර්තාකරණ ක්‍රියාවලියේ වැඩිදියුණු කිරීම්

පොදු ලෙජර වාර්තාරකරණයේ සහ විදේශ සංචිත කළමණාකරණයේ ප්‍රධාන වැඩිදියුණු කිරීම් දෙකක් 2013 වසරේදී සිදුවිය. ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව වාර්තා කිරීමේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේද සහයෝගය ඇතිව තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නවතම තොරතුරු තාක්ෂණය පදනම් කරගත් පොදු ලෙජර පද්ධතියක් මහ බැංකුව තුළම නිර්මාණය කරන ලද අතර, එය 2014 ජනවාරි මස 1 දින සිට ක්‍රියාත්මක කරන ලදී. මෙමඟින් බාහිර ආයතනයක් විසින් නිර්මාණය සහ සේවාකරණය කරන ලද (DMS Software Technologies) 2003 වසරේ සිට ක්‍රියාත්මක වූ ඔරකල් පොදු ලෙජර පද්ධතිය ප්‍රතිස්ථාපනය විය. විදේශ සංචිත ගණුදෙනු සහ කළමණාකරණය සඳහා කැබිනට් මණ්ඩලය විසින් පත්කරනු ලැබූ ටෙන්ඩර් කමිටුවක් විසින් තෝරාගත් ජාත්‍යන්තර සේවා සපයන ආයතනයක් මඟින් නිර්මාණය සහ සේවාකරණය කරනු ලබන, නව භාණ්ඩාගාර කළමණාකරණ පද්ධතියක් (GUAVA) 2013 නොවැම්බර් 1 දින සිට ක්‍රියාත්මක කරන ලදී. මේ මඟින් 2004 වසරේ සිට භාවිතයට ගනු ලැබූ භාණ්ඩාගාර මෙහෙයුම් කටයුතු කළමණාකරණ පද්ධතිය (TDRMS) ප්‍රතිස්ථාපනය විය. පසුගිය වසර 10 ක කාලය තුළ මහ බැංකුවේ මුළු වත්කම් රුපියල් බිලියන 891.4 ක් දක්වා වැඩිවීම (2003 වසරේ රුපියල් බිලියන 354.6 සිට) සහ විදේශ සංචිතය කළමණාකරණය 2003 වසරේ පැවැති එ.ජ. ඩොලර් බිලියන 2.3 සිට 2013 වසරේදී එ.ජ. ඩොලර් බිලියන 7.2 ක් දක්වා වැඩිවීම තුළින් ගම්‍ය වන මහ බැංකුවේ ගණුදෙනු සංඛ්‍යාවේ සහ ඒවායේ සංකීර්ණතාවයේ වැඩිවීම සලකාබැලීමේදී, මෙම නව වැඩිදියුණු කිරීම් දෙක මඟින් මහ බැංකුවේ මූල්‍ය වාර්තාකරණයේ තත්ත්වයන් සහ වේගවත් බව අතිශයින්ම ඉහළ මට්ටමකට ගෙනෙන ලදී.

### (ඇ) ආයෝජන උපදේශකත්ව කමිටුව

මුදල් මණ්ඩලය විසින් පත්කරන ලද ආයෝජන උපදේශකත්ව කමිටුවේ කාර්යභාරය වන්නේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ

දෙපාර්තමේන්තු හතරක් මගින් කළමනාකරණය කරනු ලබන අරමුදල් දහසයක ආයෝජන කටයුතු සඳහා උපදේශකත්වය සැපයීම සහ නිරීක්ෂණය කිරීමයි. මෙම කමිටුව, සහකාර අධිපතිවරයෙකු ගේ සභාපතිත්වයෙන් අදාළ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් සහ අනෙකුත් නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් මාසිකව රැස්වෙන අතර, මූල්‍ය කටයුතු දෙපාර්ත්මේන්තුව එහි ලේකම් කාර්යභාරය ඉටු කරනු ලබයි. මෙම කමිටුව 2013 වසර තුළදී රැස්වීම් 12 ක් පවත්වා ඇති අතර, අදාළ කටයුතු සම්බන්ධ කාර්තුමය වාර්තා මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. 2013 වසර අවසානයේ දී මෙම අරමුදල්වල මුළු වටිනාකම රුපියල් බිලියන 50.7 ක් විය.

## 12. මූල්‍ය බුද්ධි ඒකකය

2006 අංක 06 දරණ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ ප්‍රතිපාදන අනුව පිහිටුවන ලද මූල්‍ය බුද්ධි ඒකකය, 2007 වසරේ සිට ශ්‍රී ලංක මහ බැංකුව තුළ ක්‍රියාත්මක වේ. මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධාන කාර්යයන් අතරට මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදී කටයුතුවලට අරමුදල් සැපයීම සහ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ දැක්වෙන අනෙකුත් නීති විරෝධී ක්‍රියාවන් සිදුවිය හැකි අවස්ථාවන් අනාවරණය කර ගැනීම පිණිස මුදල් ගනුදෙනුවලට අදාළ තොරතුරු එක්රැස් කිරීම, තොරතුරු ලබා ගැනීම, සැකකටයුතු ගනුදෙනු සහ නීතිවිරෝධී කටයුතුවලට අදාළ විශ්ලේෂණ සිදු කිරීම, නෛතික බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ස්ථාපිත කිරීම සඳහා අදාළ නියාමන සහ/හෝ නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට අවශ්‍ය තොරතුරු හා විස්තර ලබාදීම සහ මුදල් ගනුදෙනු හා විද්‍යුත් මුදල් ප්‍රේෂණ වාර්තා කරන ආයතන පරීක්ෂා කිරීම ද ඇතුළත් වේ. 2013 වසර තුළ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ සඳහන්ව ඇති පරිදි මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධාන කාර්යයන්හි සහ අනෙකුත් කටයුතුවලට සාරාංශයක් පහත දැක්වේ.

### 12.1 තොරතුරු එක්රැස් කිරීම, විමර්ශනය කිරීම සහ ප්‍රේෂණය කිරීම

දැනට පවතින ක්‍රමවේදයට අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, කොටස් තැරැව්කාර සමාගම් සහ රක්ෂණ සමාගම් විසින් මූල්‍ය බුද්ධි ඒකකය මගින් පනවන ලද අවශ්‍යතාවයන්ට අනුකූලව එනම්, රුපියල් මිලියනය සහ ඊට වැඩි මුදල් ප්‍රමාණයක් හෝ විදේශ ව්‍යවහාර මුදලින් ඊට සමාන මුදල් ප්‍රමාණයක් වන මුදල් ගනුදෙනු සහ විද්‍යුත් මුදල් ප්‍රේෂණ වාර්තා (දේශීය හා විදේශීය), මූල්‍ය බුද්ධි ඒකකය සතු මාර්ගගත දත්ත කළමනාකරණ පද්ධතිය වන ලංකාෆින් (LankaFIN) හරහා වාර්තා කරන ලදී. 2013 ජනවාරි මාසයේ සිට මුදල් ගනුදෙනු වාර්තා කරන ආයතනයන් ලෙස නම් කරන ලද විදේශ මුදල් හුවමාරු කිරීමට බලයලත් සමාගම් ද සිය නියාමකයා වන විනිමය පාලක හරහා සිය ගනුදෙනු වාර්තා කරන ලදී. ඒ අනුව, 2013 වසර තුළ දී, රුපියල් මිලියන 3.8 ට වැඩි මුදල් ගනුදෙනු සහ විද්‍යුත් මුදල් ප්‍රේෂණ වාර්තා සංඛ්‍යාවක් වාර්තා වූ අතර, සැක කටයුතු ගනුදෙනු 498 ක් වාර්තා විය. මූලික විමර්ශනවලින් අනතුරුව, සැක කටයුතු වාර්තා අතුරින් වාර්තා 73 ක් වැඩිදුර විමර්ශනය සඳහා නීතිය බලාත්මක කරන ආයතනවලට හා නියාමන අධිකාරීන් වෙත යොමු කරන ලදී. 2013 වසර අවසානය වනවිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) විසින් සිදු කරන ලද විමර්ශනයන් පදනම් කරගෙන නීතිපති දෙපාර්තමේන්තුව විසින් මුදල් විශුද්ධිකරණය හා සම්බන්ධ අධි චෝදනා පත්‍ර හතක් ද, ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම සම්බන්ධව අධි චෝදනා පත්‍ර තුනක් ද ගොනු කර ඇත.

### 12.2 වාර්තා කරන ආයතන පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම

මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලියට සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ කටයුතුවලට පාත්‍ර වීමේ අවදානම සොයා බැලීම සහ එම පනත යටතේ මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කරන ලද අනෙකුත් රීති සහ විධානයන්ට අනුකූලව වාර්තා කිරීමේ ආයතන කටයුතු කරන්නේ ද යන්න සොයා බැලීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය මගින් 2013 වසර තුළ දී පරීක්ෂණයන් 26 ක් පවත්වන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස, නිකුත් කර ඇති රීතීන්ට සහ විධානයන්ට අනුකූල නොවූ මූල්‍ය ආයතන 6 ක් හඳුනාගෙන රුපියල් මිලියන 2.9 ක දඩ මුදලක් ඔවුන් වෙත පනවන ලදී.

### 12.3 වෙනත් කටයුතු

#### (අ) අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම

සැක කටයුතු ගනුදෙනුවලට අදාළ විමර්ශන කටයුතු සහ චෝදනා ගොනු කිරීම උදෙසා තොරතුරු හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලිය පහසු කර ගැනීමට මූල්‍ය බුද්ධි ඒකකය මෙම වසර තුළ දී, ජපාන මූල්‍ය බුද්ධි මධ්‍යස්ථානය (Japan Financial Intelligence Centre - JAFIC)" ලෙබනන් විශේෂ විමර්ශන කොමිසම (Lebanon Special Investigations Commission) සහ කොස්ටරිකා හා ඩෙන්මාර්ක් මූල්‍ය බුද්ධි ඒකකයන් සමග අවබෝධතා ගිවිසුම් 4 ක් අත්සන් කරන ලදී. ඒ අනුව, 2013 වසර අවසාන වනවිට අත්සන් කර ඇති සමස්ත අවබෝධතා ගිවිසුම් සංඛ්‍යාව 24 දක්වා ඉහළ යන ලදී.

#### (ආ) නියාමන රාමුවේ ප්‍රවර්ධනය

නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදීන්ට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාත්‍යන්තර තත්ත්වයන්ගේ සහ ක්‍රමවේදයන්ගේ පැවති වෙනස්කම් සමග අනුගත වෙමින් මූල්‍ය බුද්ධි ඒකකයේ නීති සමාලෝචන කමිටුවේ උපදේශකත්වය ද ඇතිව 2005 අංක 25 දරණ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතෙහි, විශේෂයෙන්ම "ත්‍රස්තවාදියා" සහ "ත්‍රස්තවාදී ක්‍රියා" යන වචනයන්හි අර්ථ දැක්වීම් ඇතුළත් කිරීම ද ඇතුළුව වෙනස්කම් කිහිපයක්ම සිදු කරන ලදී. තවද, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට අනුව

ගනුදෙනුකරු හඳුනා ගැනීම (Know Your Customer) සහ ගනුදෙනුකරු සම්බන්ධ සුපරීක්ෂාකාරී වීමේ අවශ්‍යතාවයට (Customer Due Diligence) අදාළ රීති මූල්‍ය බුද්ධි ඒකකය විසින් විදේශ මුදල් හුවමාරු කිරීමට බලයලත් සමාගම් වෙත නිකුත් කරන ලදී.

**(ඇ) ආයතනයන්හි හැකියාව ප්‍රවර්ධනය කිරීම සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන්**

මූල්‍ය විශුද්ධිකරණයට හා ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට අදාළ ගනුදෙනු හඳුනා ගැනීම, විශ්ලේෂණය කිරීම හා වාර්තා කිරීම සම්බන්ධයෙන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් තවදුරටත් ක්‍රියාත්මක කරමින් මූල්‍ය බුද්ධි ඒකකය මගින් පුහුණු කිරීමේ හා දැනුම්වත් කිරීමේ වැඩසටහන් 36 ක් මෙම වසර තුළ දී පැවැත්වූ අතර බලපත්‍රලාභී බැංකු සහ මූල්‍ය සමාගම්, ශ්‍රී ලංකා පොලීසිය සහ අධ්‍යාපනික හා රාජ්‍ය ආයතන නියෝජනය වන පරිදි 2,540 ක පමණ පිරිසක් මේ සඳහා සහභාගී විය. තවද, මූල්‍ය බුද්ධි ඒකකය මහාධිකරණ විනිශ්චයකරුවන්ගේ සංගමයේ සහභාගීත්වයෙන් මහාධිකරණ විනිශ්චයකරුවන් සඳහා විශේෂ වැඩසටහනක් ද පවත්වන ලදී.

**(ඈ) ජාත්‍යන්තර සම්බන්ධතා**

**(i) එග්මොන්ට් කණ්ඩායම (EGMONT Group)**

විමර්ශනයන් තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යාම සඳහා මූල්‍ය බුද්ධි ඒකක 132 කින් සමන්විත (2013 දෙසැම්බර් 31 වැනි දිනට) එග්මොන්ට් කණ්ඩායමේ සහාය මූල්‍ය බුද්ධි ඒකකයට ලැබුණු අතර විමර්ශනයන්ට අදාළ තොරතුරු එක්රැස් කිරීමේ දී ද සාමාජික මූල්‍ය බුද්ධි ඒකකයන් සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කරන ලදී.

**(ii) ආසියානු ශාන්තිකර කලාපීය මුදල් විශුද්ධිකරණය පිළිබඳ කණ්ඩායම (Asia-Pacific Group on Money Laundering)**

ආසියා-ශාන්තිකර කලාපීය මුදල් විශුද්ධිකරණය පිළිබඳ කණ්ඩායමෙහි ආරම්භක සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව, 2013 වසරේ ජූලි මාසයේ දී චීනයේ පැවැත්වූ 16 වන වාර්ෂික සමුළුවට ද, 2013 සැප්තැම්බර් මාසයේ දී මොංගෝලියාවේ පැවැති මුදල් විශුද්ධිකරණ උපාය මාර්ග පිළිබඳ සහ හැකියාව ප්‍රවර්ධනය කිරීමේ 16 වන වාර්ෂික වැඩමුළුවට ද සහභාගී විය. මෙහිදී ලාභ ලැබීමේ අරමුණක් නොමැති සංවිධාන **(NPO)** පදනම් කරගෙන සිදුවන මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදීන්ට අරමුදල් සැපයීමේ අවදානම සහ අතථ්‍ය මුදල් **(Virtual Currency)** පිළිබඳව අවධානය යොමු කෙරිණි. 2013 ජූලි මාසයේ පැවැති වාර්ෂික සමුළුවේ දී ආසියා-ශාන්තිකර කලාපීය මුදල් විශුද්ධිකරණය පිළිබඳ කණ්ඩායමේ 2016-2018 කාලපරිච්ඡේදය සඳහා සම සභාපතිත්වයට ශ්‍රී ලංකාව තෝරා ගැනුණු අතර 2017 වසරේ දී පවත්වනු ලබන වාර්ෂික සමුළුවේ සත්කාරක රට වශයෙන් ද තේරී පත් විය. මෙය ගෝලීය තත්ත්වයන්ට අනුකූලව මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදීන්ට අරමුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා ශ්‍රී ලංකාවේ සැලසුම් ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකාවට ලැබුණු මහඟු අවස්ථාවක් වන අතර මෙමගින් ජාත්‍යන්තර ආයෝජකයන්ගේ විශ්වසනීයත්වය ද ඉහළ යනු ඇත.

## 13. මූල්‍ය ස්ථායීතා අධ්‍යයන

මුදල් නීති පනතට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු දෙකින් එක් අරමුණක් වන්නේ, මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීමයි. මූල්‍ය ස්ථායීතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් පර්යේෂණ සහ අවේක්ෂණ කාර්යයන් සිදු කිරීම මගින් එම අරමුණ සඳහා පහසුකම් සලසනු ඇත.

මූල්‍ය ස්ථායීතා අධ්‍යයන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වනුයේ, මූල්‍ය ස්ථායීතාවට අදාළ ක්ෂේත්‍රයන් හි පර්යේෂණ පැවැත්වීම, සාර්ව විචක්ෂණ අවේක්ෂණ රාමුවක් මාර්ගයෙන් මූල්‍ය පද්ධතියේ ඇති අවදානම් සහ සිදුවිය හැකි විචලතාවන් තක්සේරු කිරීම, එවැනි පර්යේෂණ සහ අවේක්ෂණ මත පදනම්ව සුදුසු ප්‍රතිපත්ති පියවර යෝජනා කිරීම සහ ප්‍රතිපත්ති සම්පාදකයන් මෙන්ම මූල්‍ය අංශයට සම්බන්ධ අනෙකුත් පාර්ශ්වයන් අතර මූල්‍ය ස්ථායීතාව සම්බන්ධයෙන් දැනුම්වත් කිරීම යනාදිය සිදු කිරීමයි.

### 13.1 වසර තුළ දී සිදු කරන ලද ක්‍රියාකාරකම්

**(අ) පර්යේෂණ**

2013 වසර තුළ දී පර්යේෂණ අධ්‍යයනයන් පහක් සිදු කරන ලදී. බැංකු සහ බැංකු නොවන මූල්‍ය සමාගම් අංශ රත්‍රන් මිල අඩුවීමට අනාවරණය වීමේ අවදානම, කලාපීය අනෙකුත් රටවල් හා සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ සාංගමික ණය වෙළෙඳපොළෙහි සංවර්ධනය, බැංකුවල අක්‍රිය ණය කෙරෙහි සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ බලපෑම, පද්ධතිමය මූල්‍ය වෙළෙඳපොළ යටිතල පහසුකම් තක්සේරු කිරීම සඳහා විශ්ලේෂණාත්මක රාමුව සහ උකස් මූල්‍යයන සහ පාරිභෝගික ණය: මූල්‍ය ස්ථායීතාව කෙරෙහි සිදු කරන බලපෑම යනාදී අධ්‍යයනයන් මීට ඇතුළත් ය.

**(ආ) සාර්ව විචක්ෂණ අවේක්ෂණය**

සාර්ව විචක්ෂණ අවේක්ෂණය යටතේ, පහත සඳහන් කාර්යය භාරයන් සිදු කරන ලදී.

(i) ප්‍රධාන මූල්‍ය සහ මූල්‍ය නොවන ආයතනවල ශක්තිමත් බව පරීක්ෂා කිරීම පිණිස බැංකු, බැංකු නොවන, මූල්‍ය වෙළෙඳපොළ සහ සංස්ථාපිත අංශ සඳහා අඛණ්ඩව සහ කාලීන පදනමක් මත මූල්‍ය ශක්තිමත්භාව දර්ශක පිළියෙළ කිරීම.

(ii) මූල්‍ය ස්ථායීතාවට අදාළ අංශවල වර්ධනය, අවදානම් සහ ඇතිවිය හැකි අනපේක්ෂිත විචලතාවන් පිළිබිඹු කරමින් මූල්‍ය අංශයේ අවදානම් තක්සේරු කරන වාර්තා, මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව වෙත අඛණ්ඩව ඉදිරිපත් කිරීම.

(iii) මුදල් මණ්ඩල පත්‍රිකා තුනක් මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම. බැංකු, මූල්‍ය සහ කල්බදු මූල්‍යකරණ සමාගම් රත්‍රන් මිල වෙනස් වීමට අනාවරණය වීමේ අවදානම සහ එහි බලපෑම, මූල්‍ය පද්ධති ස්ථායීතා දර්ශකය සහ මූල්‍ය ස්ථායීතා උපදේශන කමිටුවේ යෝජනා ඇතුළත් මුදල් මණ්ඩල පත්‍රිකා මීට ඇතුළත් විය.

(iv) සංවේදිතා විශ්ලේෂණය භාවිතා කරමින්, බැංකු අංශය සඳහා ණය අවදානම, වෙළෙඳපොළ අවදානම සහ ද්‍රවශීලතා අවදානම යන ඒවායේ කම්පනයන් පරීක්ෂා කිරීම සඳහා ආතති පරීක්ෂා කාර්තුමය පදනම මත සිදු කිරීම.

(v) සාමූහික දත්ත සහිත ණය අවදානම් රාමුවක් භාවිතා කරමින්, එක් එක් බැංකුව සඳහා සාර්ව ආතති පරීක්ෂා කාර්තුමය පදනම මත සිදු කිරීම.

(vi) එක් එක් අවදානම්වලට අදාළ සීමා මට්ටම් හඳුනා ගැනීමට කාර්තුමය පදනම මත සීමා ඇතුළත් ආතති පරීක්ෂණ සම්පාදනය කිරීම. උදාහරණ; ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතයේ අවශ්‍ය මට්ටමට වඩා පහළට බැංකුවක් ගමන් කිරීමට කොපමණ ප්‍රමාණයක කම්පනයන් සිදුවන්නේ ද යන්න.

(vii) බැංකු ශක්තිමත්භාව දර්ශකය කාර්තුමය පදනම මත යාවත්කාලීන කිරීම.

(viii) මුදල් සහ බැඳුම්කර, කොටස් සහ විදේශීය විනිමය යනාදී වෙළෙඳපොළවල ස්ථායීතාව තක්සේරු කිරීම සඳහා මූල්‍ය වෙළෙඳපොළ ස්ථායීතා දර්ශකය මාසික සහ කාර්තුමය පදනම මත යාවත්කාලීන කිරීම.

(ix) රාජ්‍ය මූල්‍ය, මූර්ත අංශය, මූල්‍ය අංශය සහ විදේශ අංශය මෙන්ම ගෝලීය මූල්‍ය වාතාවරණය යනාදී සාර්ව ආර්ථික අංශයන්ගේ ස්ථායීතාව තක්සේරු කිරීම සඳහා සාර්ව ආර්ථික ස්ථායීතා දර්ශකය කාර්තුමය පදනම මත යාවත්කාලීන කිරීම.

(x) බැංකු ශක්තිමත්භාව දර්ශකය, මූල්‍ය වෙළෙඳපොළ ස්ථායීතා දර්ශකය සහ සාර්ව ආර්ථික ස්ථායීතා දර්ශකය භාවිතයෙන් රටේ සමස්ත මූල්‍ය ස්ථායීතාව පිළිබිඹු කිරීම සඳහා පිළියෙල කරනු ලැබූ සංයුක්ත දර්ශකයවන මූල්‍ය පද්ධති ස්ථායීතා දර්ශකය කාර්තුමය පදනම මත යාවත්කාලීන කිරීම.

(xi) කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගම්වල ණය ආපසු ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාව තක්සේරු කිරීම මඟින් ශ්‍රී ලංකාවේ සංස්ථාපිත අංශයේ ණය ආපසු ගෙවීමේ ශක්‍යතාව විශ්ලේෂණය කිරීම උදෙසා සංස්ථාපිත අංශය සඳහා වූ ණය ආපසු ගෙවීමේ යෝග්‍යතා දර්ශකය කාර්තුමය පදනම මත යාවත්කාලීන කිරීම.

**(ඇ) ප්‍රකාශන**

2012 වසරට අදාළ මූල්‍ය පද්ධති ස්ථායීතා විමසුම 2013 අප්‍රේල් මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලදී. 2012 මහ බැංකු වාර්ෂික වාර්තාව සඳහා "මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය සහ පද්ධති ස්ථායිතාව" පරිච්ඡේදය සහ 2013 මෑතකාලීන ආර්ථික ප්‍රවණතා ප්‍රකාශනය සඳහා "මූල්‍ය අංශයේ ප්‍රවණතා සහ ස්ථායීතාව" පරිච්ඡේදය සැකසීමත් මෙම දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකරණය කරන ලදී.

**(ඈ) මූල්‍ය පද්ධති ස්ථායීතාවට අදාළ කමිටුවල කටයුතු සම්බන්ධීකරණය**

අභ්‍යන්තර කමිටුවක් වන මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව සහ පෞද්ගලික අංශයේ පළපුරුදු ප්‍රවීණ නිලධාරීන්ගෙන් සමන්විත මූල්‍ය පද්ධති ස්ථායීතා උපදේශන කමිටුවේ ලේකම් කාර්යාලය වශයෙන් අඛණ්ඩව කටයුතු පවත්වාගෙන යන ලදී.

### 13.2 දායකත්වය

**(අ) මූල්‍ය අංශයේ අවදානම් අවම කිරීම සඳහා පහසුකම් සැලසීම.**

(i) දේපළ තක්සේරු කිරීමේ දී ඇතිවිය හැකි නොගැළපීම්, විශේෂයෙන් ම මූල්‍ය වාර්තාකරණය සඳහා යොදා ගන්නා තක්සේරු සැළකිල්ලට ගෙන, තක්සේරු දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ නිලධාරීන් සමඟ සාකච්ඡා පවත්වන ලදී.

(ii) ව්‍යාපාරවල අභිවෘද්ධියට අහිතකර ලෙස බලපාන නීති හඳුනා ගැනීමේ හැකියාව පරීක්ෂා කිරීමේ අරමුණින්, නීති ආයතන සහ ආයෝජන බැංකු සමඟ ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයට සම්බන්ධ නීති රෙගුලාසි පිළිබඳව සාකච්ඡා පවත්වන ලදී.

**(ආ) මූල්‍ය වෙළෙඳපොළ සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම.**

සාංගමික ණය වෙළෙඳපොළෙහි සංවර්ධනය ඇති කිරීමේ අරමුණෙන් පත් කරන ලද මූල්‍ය පද්ධති ස්ථායීතා උපදේශන කමිටුවේ අනු කමිටුව සමඟ ද සම්බන්ධීකරණ කටයුතු කරමින්, ඊට අදාළ රැස්වීම් පවත්වන ලදී.

## 14. අධිපති ලේකම්

නිරතුරුවම වෙනස් වන මූල්‍ය හා ආර්ථික වාතාවරණයක් මධ්‍යයේ, මහ බැංකු අධිපතිතුමා වෙත අවශ්‍ය කෙරෙන මෙහෙයුම් හා තාක්ෂණික සහායයන් අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් මෙම වසර තුළ දී ද ඉටු කරන ලදී. වත්මන් ශ්‍රී ලංකාවේ අපේක්ෂිත ආර්ථික ඉලක්ක පිළිබඳ මැනවින් සැලකිලිමත්ව, තම කටයුතු ප්‍රශස්ත මට්ටමෙන් අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලදී. ඒ අනුව, අභියෝගාත්මක ආර්ථික ඉලක්ක සපුරා ගැනීම කෙරෙහි නැඹුරු වූ අධිපතිතුමාගේ කාර්යයන් පහසුවෙන් කරගෙන යාම

සඳහා අවශ්‍ය ඉහළ මට්ටමේ ලේකම් සේවාවන්, පරිපාලන සහායයන් සහ සන්ධාන සේවාවන් අධිපතිතුමා වෙත ලබා දෙන ලදී.

බැංකුවෙන් බාහිර මෙන්ම අභ්‍යන්තර හමුවීම්, රැස්වීම් සහ වෙනත් උත්සව අවස්ථාවන් ගණනාවක් ඇතුළත්ව 2013 වසර තුළ අධිපතිතුමාගේ කාර්ය සටහන, කාර්ය බහුල මට්ටමක පැවති අතර අදාළ පාර්ශ්ව සමඟ පැවති ඵලදායී සන්නිවේදනය හා පසුවිපරම් තුළින් එම කටයුතු ගැටළුවක් නොමැතිව සංවිධානය කිරීමට අධිපති ලේකම් දෙපාර්තමේන්තුවට හැකියාව ලැබුණි. තවද, ලේඛන ඉදිරිපත් කිරීම්, දේශන, සටහන් හා ලිපි හුවමාරු වීම් ආදිය සකස් කිරීම තුළින් අධිපතිතුමාට අවශ්‍ය ලේකම් සේවාවන් අධිපතිතුමාගේ උපදෙස් පරිදි සහ එතුමා විසින් බලාපොරොත්තුවන ආකාරයට ඉටුකර දෙන ලදී.

අධිපති ලේකම් දෙපාර්තමේන්තුවට එහි කාර්යයන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යවශ්‍ය කාරණයක් ලෙස බැංකු, මූල්‍ය හා ආර්ථික යන ක්ෂේත්‍රවල දේශීය මෙන්ම විදේශීය ක්‍රියාකාරීන් සමඟ සබඳතා ඇති කර ගැනීම හා එම සබඳතා පවත්වාගෙන යාම සලකනු ලබයි. විශේෂයෙන්, කලාපය තුළ නැගී එන ආර්ථිකයක් ඇති රටක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය වර්ධනය වෙමින් පවත්නා කාලවකවානුවක, ගෝලීය හවුල්කරුවන් සමඟ පවත්නා සම්බන්ධතාවයන් කළමනාකරණය සඳහා ප්‍රමුඛත්වයක් දෙනු ලැබීය. ඒ සඳහා අධිපති ලේකම් දෙපාර්තමේන්තුවට නිරන්තරයෙන් ගෝලීය ආයෝජකයින් සමඟ මනා සම්බන්ධතා පවත්වාගෙන යන අතරතුර, ඔවුන්ට නිවැරදි තොරතුරු සැපයීම හා අධිපතිතුමා සමඟ රැස්වීම් සංවිධානය කිරීම සිදු කරන ලදී. එහිදී, දුරකථන හා විද්‍යුත් සම්මන්ත්‍රණ, දුරකථන හා විද්‍යුත් සම්මුඛ සාකච්ඡා, අන්තර්ජාලය හරහා ගෝලීය ආයෝජකයන් සමඟ සිදු කෙරෙන සාකච්ඡා ආදිය සම්බන්ධ කොට ඇති නවීන සන්නිවේදන ක්‍රමවේදයන් උපයෝගී කර ගන්නා ලදී.

අධිපති ලේකම් දෙපාර්තමේන්තුව, මහ බැංකුවේ සමස්ත කාර්යයන් පිළිබඳ හා සම්බන්ධිත ආයතන පිළිබඳව මනා වැටහීමක් පවත්වා ගනිමින් සහ එම පසුබිම උපයෝගී කර ගනිමින් අධිපතිතුමන්ගේ සියලුම කටයුතු ඵලදායී ලෙස සම්බන්ධීකරණය කරන ලදී. මෙම කාර්යයන් අතරට අධිපතිතුමන් හා අධිපති ලේකම් දෙපාර්තමේන්තුව වෙත ලැබෙන හා යැවෙන දුරකථන පණිවුඩ, සාමාන්‍ය තැපැල් හා විද්‍යුත් තැපැල කළමනාකරණය කිරීමද, ඒවායේ අඩංගු කරුණු නිසි ලෙස සාරාංශගත කොට අධිපතිතුමන් වෙත යොමු කිරීමද ඇතුළත් වේ.

අධිපති ලේකම් දෙපාර්තමේන්තුවෙහි තවත් වැදගත් කාර්යයක් වනුයේ, අධිපතිතුමන් හා මුදල් මණ්ඩලයෙහි ගෞරවය හා විශ්වාසය සුරකෙන පරිදි අධිපතිතුමන්ගේ උත්සව අවස්ථාවන් හා අධිපතිතුමාගේ අමුත්තන් හට අවශ්‍ය සියලු සන්ධාන පහසුකම් සැපයීමයි. එහිදී අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගනු ලැබූ ඉහළ ආචාරශීලීත්වය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිරූපය ගොඩනැංවීමට ද හේතු සාධක විය. අධිපති හා නියෝජ්‍ය අධිපතිවරුන් සංවිධානය කරනු ලැබූ උත්සවයන්ට සහ අධිපතිතුමන්ගේ දේශීය හා විදේශීය නිල සංචාරයන්ට අදාළ සියලුම කටයුතු සඳහා අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සත්කාරකත්වය දක්වන ලදී. රටෙහි ආර්ථික වශයෙන් වැදගත්කමක් ඇති ස්ථාන වෙතට සිදු කෙරුණු ක්ෂේත්‍ර චාරිකා සඳහා ද, සන්ධාන කටයුතු ඇතුළු සියලු කටයුතු ඉටු කිරීම ද අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. ඉහළ පෙළේ ජාත්‍යන්තර රැස්වීම් හා සම්මන්ත්‍රණ, විදේශ ආයෝජන ප්‍රවර්ධන රැස්වීම් ඇතුළු සංචාරවලට මෙම වසර තුළදී ද අධිපතිතුමන් සහභාගී විය. අධිපති ලේකම් දෙපාර්තමේන්තුව මඟින් මෙම සංචාරවලට අදාළ සියලු කටයුතු ද, අධිපතිතුමන් හට අන්‍යෝන්‍ය සුහදතාවය වැඩිදියුණු කරනු ලබන විශේෂ උත්සව අවස්ථා විශාල ප්‍රමාණයක් ද සංවිධානය කරන ලදී. මේ අතරම, බැංකුවෙහි අනෙකුත් දෙපාර්තමේන්තු මඟින් සංවිධානය කරනු ලැබූ උත්සවයන්ට අවශ්‍ය සහයෝගය සැපයීමට ද අවශ්‍ය පියවර ගනු ලැබීය.

ඉහත සඳහන් කාර්යයන්ට අමතරව, ජාතික වශයෙන් වැදගත් වූ ඉතා හදිසි හා වැදගත් කාර්යයන්ට මුල්තැන දෙමින්, එම කාර්යයන් ද කාර්යක්ෂමව සිදු කරන ලදී.

## 15. මානව සම්පත් කළමනාකරණ

රැකියා වෙළඳපොළට අලුතින් එක්වන සුවිශේෂී කුසලතා සහිත පුද්ගලයන් ආකර්ෂණය කර ගැනීම සහ රඳවා ගැනීමත්, බැංකු කාර්ය මණ්ඩලයේ ශිල්පීය සහ බුද්ධිමය හැකියාවන් වර්ධනය කිරීමත්, මහ බැංකුවේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගත හැකි වනු පිණිස කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය කිරීමත් අරමුණු කර ගනිමින් මානව සම්පත් දෙපාර්තමේන්තුව 2013 වසරේ දී නව ප්‍රතිපත්තීන් හා ක්‍රියාමාර්ගයන් හඳුන්වා දෙන ලදී. මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වූයේ ඉදිරි අභියෝග හමුවේ මහ බැංකුවේ මූලික අරමුණු ඉටුකර ගැනීමට දායක විය හැකි ඉහළ ඵලදායීතාවයකින් යුත් අභිප්‍රේරණය සහ කාර්යශූර සේවක පිරිසක් සංවර්ධනය කිරීම කෙරෙහිය. සිය අරමුණ ඉටුකර ගැනීමෙහිලා මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද මූලික කාර්යයන් වූයේ, එහි උපායමාර්ගික සැලැස්මට අනුව පුහුණුවීම් ලබා දීම සහ සංවර්ධනය, කාර්යසාධන කළමනාකරණය, අනුප්‍රාප්ති සැලසුම්කරණය, උසස්වීම් ලබාදීම, නව සේවකයන් බඳවා ගැනීම, සේවකයන් දෙපාර්තමේන්තු අතර ස්ථානගත කිරීම සහ බැංකුවේ සියලු අභ්‍යන්තර පාර්ශවයන් සමඟ සමීප සබඳතාවක් පවත්වා ගැනීම වේ.

### 15.1 මානව සම්පත් ව්‍යුහය

2013 වසර අවසානය වනවිට මහ බැංකුවේ සමස්ත සේවක සංඛ්‍යාව 1,550 ක් වූ අතර, එය මාණ්ඩලික පන්තියේ නිලධාරීන් 692 කින්ද, මාණ්ඩලික නොවන පන්තියේ නිලධාරීන් 693 කින්ද, සුළු සේවක කාර්ය මණ්ඩලය 163 කින් හා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නිලධාරීන් 2 කින් ද සමන්විත විය. 2013 වසර තුළ දී මාණ්ඩලික නිලධාරීන් 32 ක් හා මාණ්ඩලික නොවන නිලධාරීන් 18 ක් බැංකු සේවාවෙන් විශ්‍රාම ගිය අතර, තවත් සේවකයන් 4 දෙනෙකු බැංකු සේවාවෙන් ඉල්ලා අස්විය.

**II-13 සංඛ්‍යා සටහන**

**2013 දෙසැම්බර් 31 දිනට පැවති මානව සම්පත් ව්‍යුහය**

| සේවක සංඛ්‍යාව | සේවක සංඛ්‍යාව | | | සාමාන්‍ය වයස (අවුරුදු) | අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පිරිමි | ගැහැණු | මුළු සංඛ්‍යාව | | පශ්චාත් උපාධිය, ප්‍රථම උපාධිය සහ වෘත්තීය සුදුසුකම් | පශ්චාත් උපාධිය සහ ප්‍රථම උපාධිය | පශ්චාත් උපාධිය සහ වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධිය සහ වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධිය | වෘත්තීය සුදුසුකම් |
| (1) මාණ්ඩලික පංතිය | | | | | | | | | | |
| (i) IV ශ්‍රේණිය සහ ඉහළ ශ්‍රේණි | 54 | 16 | 70 | 54 | 13 | 47 | 03 | 04 | 03 | 0 |
| (ii) III 2 ශ්‍රේණිය | 52 | 18 | 70 | 51 | 06 | 43 | 01 | 01 | 18 | 0 |
| (iii) III 1 ශ්‍රේණිය | 13 | 25 | 38 | 47 | 01 | 12 | 01 | 04 | 19 | 0 |
| (iv) II ශ්‍රේණිය | 101 | 116 | 217 | 43 | 21 | 33 | 04 | 20 | 98 | 09 |
| (v) I ශ්‍රේණිය | 93 | 130 | 223 | 43 | 05 | 11 | 03 | 31 | 60 | 26 |
| (vi) කළමනාකරණ පුහුණු | 38 | 36 | 74 | 28 | 02 | 01 | 0 | 19 | 47 | 05 |
| (2) මාණ්ඩලික නොවන පංතිය | | | | | | | | | | |
| (i) V ශ්‍රේණිය | 26 | 20 | 46 | 56 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| (ii) IV ශ්‍රේණිය | 67 | 40 | 107 | 50 | 0 | 0 | 0 | 0 | 11 | 04 |
| (iii) III ශ්‍රේණිය | 31 | 05 | 36 | 53 | 0 | 0 | 0 | 0 | 0 | 02 |
| (iv) II ශ්‍රේණිය | 150 | 128 | 278 | 33 | 0 | 01 | 01 | 08 | 32 | 13 |
| (v) I ශ්‍රේණිය | 94 | 07 | 101 | 44 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| (vi) බැංකු සහායක පුහුණු | 35 | 90 | 125 | 22 | 0 | 0 | 0 | 0 | 0 | 01 |
| (3) සුළු සේවක පංතිය | | | | | | | | | | |
| (i) I, II හා III ශ්‍රේණි | 150 | 13 | 163 | 35 | 0 | 0 | 0 | 0 | 01 | 0 |
| (4) කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගත් නිලධාරීන් | | | | | | | | | | |
| (i) සියලුම කාණ්ඩයන් | 01 | 01 | 02 | 59 | 0 | 0 | 0 | 0 | 0 | 01 |
| මුළු සංඛ්‍යාව | **905** | **645** | **1,550** | **40** | **48** | **148** | **13** | **87** | **289** | **61** |

**II-3 රූප සටහන**

**2013 දෙසැම්බර් 31 දිනට සේවක සංයුතිය**




2013 දෙසැම්බර් මස 31 දින වන විට මහ බැංකු කාර්ය මණ්ඩල සේවකයෙකුගේ සාමාන්‍ය වයස පසුගිය වසරේ දී පැවති අවුරුදු 42 හා සැසඳීමේ දී අවුරුදු 40 දක්වා තවදුරටත් පහත වැටුණු අතර, මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ අවුරුදු 23 ට අඩු නව බැංකු සහායක (පුහුණුවන්නන්) කණ්ඩායමක් බැංකුවට බඳවා ගැනීමයි. 2013 වසර අවසානය වන විට වයස අවුරුදු 40 ට අඩු බැංකු සේවකයන්ගේ ප්‍රතිශතය සියයට 53.3 ක් විය.

මහ බැංකුව දෙපාර්තමේන්තු 27 කින් හා පළාත් කාර්යාල 5 කින් සමන්විත වන අතර, සෑම දෙපාර්තමේන්තුවක් හා පළාත් කාර්යාලයක්ම රාජකාරී කටයුතු කාර්යක්ෂමව ඉටු කළ හැකි සුදුසුකම්ලත් සහ කුසලතාවයන්ගෙන් හෙබි සේවක මණ්ඩලයකින් සමන්විත වේ. මාණ්ඩලික පන්තියේ නිලධාරීන්ගෙන් සියයට 83 ක් පමණ ප්‍රථම උපාධි සුදුසුකමක්, පශ්චාත් උපාධි සුදුසුකමක් හෝ වෘත්තීය සුදුසුකමක් සපුරා තිබිණ. 2013 දෙසැම්බර් මස අවසානය වනවිට, බැංකු විෂය පථයට අයත් ක්ෂේත්‍රයන්ගෙන් සුදුසුකම් සපුරන ලද සමස්ත සේවක සංඛ්‍යාව 646 ක් විය. ඒ අතරින් නිලධාරීන් 19 දෙනෙකු 2013 වසරේ දී සිය පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලදී. ඉහත සඳහන් කළ නිලධාරීන් 646 දෙනා ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු පර්ෂද 5 තුළ ව්‍යාප්තව ඇති අයුරු II-14 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

## 15.2 මානව සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යයන්

### (අ) පුහුණු වැඩකටයුතු සහ සංවර්ධනය

මානව සම්පත් දෙපාර්තමේන්තුව, එහි ප්‍රධාන අරමුණක් වන සේවකයින්ගේ කුසලතා වැඩිදියුණු කිරීම, මහ බැංකුවේ මූලික/උපකාරක කාර්යයන්ට අදාළ නව තාක්ෂණික වෙනස්වීම් පිළිබඳ සේවකයන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සහ අනෙකුත් රටවල්වල අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා අවස්ථාවන් සලසා දීම මගින් ඔවුන්ගේ කාර්යසාධනය සහ ඵලදායීතාව ඉහළ නැංවීම උදෙසා අඛණ්ඩව කටයුතු කරන ලදී. 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 27 වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම පුහුණු පාඨමාලාවන් සඳහා වන වියදම් මහ බැංකුව විසින් දරනු ලැබේ.

**II-14 සංඛ්‍යා සටහන** **අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් සහිත නිලධාරීන් මහ බැංකුවේ දෙපාර්තමේන්තු පර්ෂද පහ තුළ ව්‍යාප්තිය**

| දෙපාර්තමේන්තු පර්ෂදය | අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් | | | | | |
|---|---|---|---|---|---|---|
| | පශ්චාත් උපාධිය, ප්‍රථම උපාධිය සහ වෘත්තීය සුදුසුකම් | පශ්චාත් උපාධිය සහ ප්‍රථම උපාධිය | පශ්චාත් උපාධිය සහ වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධිය සහ වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධිය | වෘත්තීය සුදුසුකම් |
| ආර්ථික සහ මිල ස්ථායීතාව | 10 | 39 | 03 | 16 | 42 | 05 |
| මූල්‍ය පද්ධති ස්ථායිතාව | 12 | 24 | 03 | 27 | 48 | 22 |
| නියෝජිත කාර්යයන් | 11 | 24 | 04 | 12 | 73 | 07 |
| ව්‍යවහාර මුදල් කළමනාකරණය | 01 | 04 | 0 | 01 | 11 | 02 |
| උපකාරක සේවා සහ වෙනත් | 14 | 57 | 03 | 31 | 115 | 25 |
| **එකතුව** | **48** | **148** | **13** | **87** | **289** | **61** |

### (i) කෙටිකාලීන පුහුණු අවස්ථා

දේශීය හා විදේශීය කෙටිකාලීන පුහුණු අවස්ථාවන් ලබාදීමේ මූලික අරමුණ වන්නේ මහ බැංකු කාර්ය මණ්ඩලයේ කුසලතා සහ නිපුණතාවයන් වැඩිදියුණු කිරීමයි. සාමාන්‍ය පරිදි, පෙර වසර අවසානයේ දී සිදු කරන ලද නිපුණතා අනුරූපන ක්‍රියාවලිය (Competancy Mapping Exercise) තුළින් හඳුනාගත් නිපුණතා පරතරයන් පදනම් කර ගනිමින් 2013 වසර ආරම්භයේ දී ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් පුහුණු වැඩකටයුතු සැලැස්ම පිළියෙල කරන ලදී. එම හඳුනා ගත් නිපුණතා පරතරයන් අවම කර ගැනීමේ අරමුණින් යුක්තව පුහුණු වැඩකටයුතු සැලැස්මට අනුකූල වන පරිදි කෙටිකාලීන දේශීය හා විදේශීය පුහුණු අවස්ථාවන් සපයන ලදී. 2013 වසරේ දී ලබා දෙන ලද සමස්ත කෙටිකාලීන දේශීය හා විදේශීය පුහුණු අවස්ථා සංඛ්‍යාව 2,343 ක් විය.

### (ii) කෙටිකාලීන විදේශ පුහුණු අවස්ථා

පිළිගත් පුහුණු ආයතනයන්, ඩොයිෂ් බුන්ඩෙස් බැංකුව (Deutsche Bundes Bank), ඉන්දීය සංචිත බැංකුව (Reserve Bank of India), මැලේසියාවේ නෙගාරා බැංකුව (Bank Negara, Malayasia), ෆෙඩරල් සංචිත බැංකුව (Federal Reserve Bank) වැනි මහ බැංකු, අන්තර්ජාතික මූල්‍යකරණ ආයතන සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, සියැසන් (SEACEN) මධ්‍යස්ථානය, ජාත්‍යන්තර පියවීමේ බැංකුව (Bank for International Settlements), ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, ආසියා ශාන්තිකර ග්‍රාමීය හා කෘෂිකාර්මික ණය ආයතනය හා කෘෂිකාර්මික බැංකුකරණය පිළිබඳ පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානය (APRACA CENTRAB) වැනි ආයතනයන් මගින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා, වැඩමුළු, සමුළු සහ අධ්‍යයන චාරිකාවන්ට සහභාගිවීම සඳහා බැංකු සේවකයන්ට අවස්ථාව ලබා දෙන ලදී. 2013 වසර තුළ දී ලබා දුන් සමස්ත විදේශීය පුහුණු අවස්ථා සංඛ්‍යාව 324 කි. 2013 වසරේ දී ලබා දුන් විදේශ පුහුණු අවස්ථා පිළිබඳ තොරතුරු පහත II-15 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

**II-15 සංඛ්‍යා සටහන** **කෙටිකාලීන විදේශ පුහුණු අවස්ථා - 2013**

| ක්ෂේත්‍රය | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| ආර්ථික විද්‍යාව | 66 |
| මූල්‍ය ස්ථායිතාව | 82 |
| සංචිත කළමනාකරණය | 26 |
| රාජ්‍ය ණය කළමනාකරණය/ආයෝජන කළඹ කළමනාකරණය | 24 |
| ව්‍යවහාර මුදල් කළමනාකරණය | 07 |
| තොරතුරු තාක්ෂණය සහ ගෙවීම් පද්ධති | 09 |
| මහ බැංකු කටයුතු | 07 |
| මානව සම්පත් කළමනාකරණය | 21 |
| වෙනත් | 82 |
| **එකතුව** | **324** |

කෙටිකාලීන විදේශ පුහුණුවීම් සඳහා සහභාගිවූවන්ට, බැංකුවේ සමස්ත කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා සහභාගී වීමට අවස්ථාව ලබා දෙමින්, එම නිලධාරීන්ට තමන් සහභාගී වූ පුහුණු වැඩසටහන් තුළින් ලබාගත් දැනුම උපයෝගී කොටගෙන විවිධ පැවරුම් සම්පූර්ණ කිරීමට පවරන ලදී. ඒ අනුව, කෙටිකාලීන විදේශ පුහුණුවීම් සඳහා සහභාගි වූ නිලධාරීන්ට 2013 වසර තුළ දී එවැනි පැවරුම් 112 ක් පවරන ලද අතර ඉන් පැවරුම් 101 ක් සම්පූර්ණ කරන ලදී. එම පැවරුම් අතරින් 40 ක් පමණ බැංකුව තුළ දැනට පවතින ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීමට හෝ බැංකුවේ සමස්ත ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා වන නව ක්‍රියාවලි හෝ ක්‍රියාමාර්ගවලට ඍජු ලෙසම අදාළ විය. 2013 වසර තුළ දී සිදු කරන ලද වටිනාකම් ආකලනයන් සහ පැවරුම් සම්පූර්ණ කිරීම පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත II-16 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

**II-16 සංඛ්‍යා සටහන** **2013 වසර තුළදී කෙටිකාලීන විදේශ පුහුණුව ලැබූ නිලධාරීන් විසින් පැවරුම් සම්පූර්ණ කිරීම**

| කාණ්ඩය | පැවරුම් සංඛ්‍යාව |
|---|---|
| මූල්‍ය ආයතන අධීක්ෂණය සඳහා වූ මාර්ගෝපදේශන | 23 |
| දැනුම බෙදාදීමේ සහ මහජනතාව දැනුම්වත්කිරීමේ වැඩසටහන් | 38 |
| සංකල්ප පත්‍රිකා සහ රටවල් පිළිබඳ අධ්‍යයන | 14 |
| පද්ධතීන් හා ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සඳහා වූ යෝජනා | 37 |
| **එකතුව** | **112** |

**(iii) කෙටිකාලීන දේශීය පුහුණු අවස්ථා**

කෙටිකාලීන දේශීය පුහුණුවීම් යටතේ බැංකු විදු පියෙස සහ වෙනත් පිළිගත් දේශීය පුහුණු ආයතන මඟින් පවත්වන ලද පුහුණු පාඨමාලා සඳහා සහභාගි වීමට සේවකයන්ට අවස්ථාව ලබා දෙන ලදී. වසර තුළ දී කෙටිකාලීන පුහුණු අවස්ථා 2,019 ක් ලබා දෙන ලද අතර, එයින් අවස්ථා 1,330 ක් බැංකු විදු පියෙස මඟින් ද අවස්ථාවන් 689 ක් වෙනත් පිළිගත් ආයතන මඟින් ද ලබා දෙන ලදී. මෙම පුහුණු අවස්ථාවන් ප්‍රධාන වශයෙන් ආර්ථික විද්‍යාව, බැංකු අධීක්ෂණ, මූල්‍ය හා ප්‍රාග්ධන වෙළෙඳපොළ, ක්ෂුද්‍ර මූල්‍යකරණය, තොරතුරු තාක්ෂණය, සන්නිවේදනය, අභ්‍යන්තර විගණනය සහ කළමනාකරණය වැනි ක්ෂේත්‍ර ඉලක්කගත කර ගන්නා ලදී.

**(iv) වැඩමුළු සහ භාෂා පුහුණු පාඨමාලා**

සේවකයන්ගේ සාමාන්‍ය නිපුණතා ඉහළ නැංවීමේ අරමුණින් යුක්තව, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් බැංකු සේවකයන් වෙනුවෙන් මානව සම්පත් කළමනාකරණය, භාෂාව හා සන්නිවේදනය සහ වාර්තා ලිවීම යන අංශ යටතේ වැඩමුළු මාලාවක් සංවිධානය කරන ලදී. 2013 වසරේ දී මෙවැනි වැඩමුළු 16 ක් සංවිධානය කරන ලද අතර, එමගින් නායකත්වය, අභිප්‍රේරණය, සන්නිවේදනය සහ වාර්තා ලිවීම යන ක්ෂේත්‍ර ආවරණය කරන ලදී. ද්‍රවිඩ භාෂාව කථා කරන ජනතාවට, වඩා කාර්යක්ෂම අයුරින් සේවා සැපයීම සඳහා බැංකු කාර්ය මණ්ඩලයට අවස්ථාව සැලසීම සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සමග එක්ව ද්‍රවිඩ භාෂා පුහුණු පාඨමාලා 2013 වසරේ දී ද අඛණ්ඩව පවත්වන ලදී. ද්‍රවිඩ භාෂා පුහුණු පන්තිවලට සහභාගි වූ නිලධාරීන් හට සිය ද්‍රවිඩ භාෂා හැකියාව විදහා දැක්වීමට අවස්ථාවක් ලබා දෙමින් ද්‍රවිඩ භාෂා විවාදයක් සංවිධානය කිරීම ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

2013 වසරේ දී ලබා දුන් කෙටිකාලීන විදේශීය හා දේශීය පුහුණු අවස්ථා දෙපාර්තමේන්තු පර්ෂද පහ තුළ ව්‍යාප්ත වූ අයුරු පහත II-4 රූප සටහනෙහි දැක්වේ.

**II-4 රූප සටහන** **කෙටිකාලීන පුහුණු අවස්ථා - 2013**




ඒ අනුව, සමස්ත කෙටිකාලීන පුහුණු අවස්ථාවලින් සියයට 39 ක් ආර්ථික හා මිල ස්ථායිතාව සහ මූල්‍ය පද්ධති ස්ථායිතාව යන පර්ෂද වලට අයත් දෙපාර්තමේන්තුවල නිලධාරීන්ට ලබා දෙන ලදී.

ආර්ථික සහ මිල ස්ථායිතා පර්ෂදයට සහ මූල්‍ය පද්ධති ස්ථායිතා පර්ෂදයට අයත් දෙපාර්තමේන්තු අතර පුහුණු අවස්ථා ව්‍යාප්තිය II-5 හා II-6 රූප සටහන් මඟින් දැක්වේ. ආර්ථික හා මිල ස්ථායිතා පර්ෂදයට අයත් දෙපාර්තමේන්තුවල නිලධාරීන් සඳහා ලබා දුන් සමස්ත පුහුණු අවස්ථා සංඛ්‍යාවෙන් සියයට 46 ක් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ලබා දෙන ලදී. ඒ අයුරින්ම, මූල්‍ය පද්ධති ස්ථායිතා පර්ෂදයට අයත් දෙපාර්තමේන්තුවල නිලධාරීන් සඳහා ලබා දුන් පුහුණු අවස්ථාවලින් සියයට 49 ක් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් උදෙසා ලබා දෙන ලදී.

මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලද පුහුණු අවස්ථාවන්ට අමතරව, විවිධ දෙපාර්තමේන්තු විසින් සිය සේවකයන්ගේ දැනුම සහ කුසලතා වැඩිදියුණු කර ගැනීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු තුළදී ම දැනුම හුවමාරු කර ගැනීමට, කුසලතා වර්ධනය කර ගැනීමට මෙන්ම පර්යේෂණ කටයුතුවල නියැලීමට අවස්ථාවන් සලසා දෙන ලදී.

**II-5 රූප සටහන** **ආර්ථික හා මිල ස්ථායිතා පර්ෂදය**




**II-6 රූප සටහන** **මූල්‍ය පද්ධති ස්ථායිතා පර්ෂදය**




**(v) දිගුකාලීන පුහුණු අවස්ථා**

දිගුකාලීන පුහුණු අවස්ථා යටතේ මහ බැංකු මාණ්ඩලික නිලධාරීන්ගේ බුද්ධිමය හැකියාවන් පුළුල් කිරීම අරමුණු

කර ගනිමින් පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු වෙනුවෙන් ශිෂ්‍යත්ව ලබා දීමට මහ බැංකුව කටයුතු කරනු ලබයි. එසේම, අවශ්‍යතාවයන්ට අනුව දිගුකාලීන පුහුණු අවස්ථා ලබා දීම උදෙසා සකස් කරන ලද මධ්‍යකාලීන සැලසුම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් වසර තුළ දී සිදු කරන ලදී. 2013 වසරේ දී එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය සහ ඕස්ට්‍රේලියාව යන රටවල පිළිගත් විශ්වවිද්‍යාලවල ආචාර්ය උපාධි සහ විද්‍යාපති උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම සඳහා පිළිවෙලින් නිලධාරීන් 6 දෙනෙකුට සහ 11 දෙනෙකුට මහ බැංකුව විසින් අනුග්‍රහය දක්වන ලදී. ඉහත නිලධාරීන් 17 දෙනාගෙන් නිලධාරීන් 13 දෙනෙක්ම ආර්ථික විද්‍යා විෂය ධාරාවෙන් සිය අධ්‍යයන කටයුතු සිදු කරති. මේ අතර, විද්‍යාපති උපාධි පාඨමාලා සාර්ථකව නිම කළ නිලධාරීන් 19 දෙනෙකු 2013 වසර තුළ දී නැවත බැංකු සේවයට වාර්තා කරන ලද අතර, ආචාර්ය උපාධිය සම්පූර්ණ කළ නිලධාරීන් 4 දෙනෙකු 2014 වසරේ දී නැවත බැංකු සේවයට වාර්තා කිරීමට නියමිත වේ.

2009 සිට 2013 දක්වා කාලපරාසය තුල ශ්‍රී ලංකා මහ බැංකුවේ ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ සිය පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සිදු කළ නිලධාරීන් සංඛ්‍යාව පහත II - 17 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

**(ආ) කාර්යසාධන කළමනාකරණය**

ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යසාධන කළමනාකරණ ක්‍රමය, රැකියා පිරිවිතර සකස් කිරීම, උපායමාර්ගික සැලැස්ම හා අනුගත වන පරිදි ඉලක්ක පිහිටුවීම, අඛණ්ඩ පදනමක් මත කාර්යසාධනය නිරීක්ෂණය, කාර්යසාධනය ඇගැයීම සහ ඉහළ කාර්යසාධනයන්ට ප්‍රතිලාභ සැලසීම යන අංශයන්ගෙන් සමන්විත වේ. කාර්යසාධන ඇගැයීම් ක්‍රියාවලියේ දී එක් එක් සේවකයින්ගේ කාර්යසාධන මට්ටම්, ''ඉලක්ක ප්‍රකාශයෙහි'' සඳහන් කරන ලද ඉලක්ක ළඟා කර ගත් ආකාරය සහ එම ඉලක්ක ළඟා කර ගැනීමට සේවකයන් සතු වූ සාමාන්‍ය නිපුණතා මට්ටම් අනුව තීරණය කරනු ලැබේ. කාර්යසාධන මට්ටම, සේවක උසස්වීම් පටිපාටියේ එක් සංරචකයක් ලෙස යොදා ගැනේ.

සියලුම බැංකු සේවකයන්ගේ 2012 වසරේ කාර්යසාධන ඇගැයීම්, උපායමාර්ගික සැලැස්මෙහි ඉලක්කගතකළ කාලසීමාවන්ට අනුකූලවම, 2013 වසරේ දී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සම්පූර්ණ කරන ලදී. 2013 වසර සඳහා දෙපාර්තමේන්තුවල සහ සේවකයන්ගේ රැකියා ඉලක්ක සකස් කිරීම ද සැලසුම් කළ පරිදිම සම්පූර්ණ කරන ලදී.

මෙයට අමතරව, කාර්යසාධන කළමනාකරණය තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව හඳුන්වා දෙන ලද මධ්‍ය වාර්ෂික කාර්යසාධන සමාලෝචනය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. එමඟින් කාර්යමණ්ඩල සාමාජිකයාගේ කාර්යසාධන මට්ටම පිළිබඳව වසරේ මුල් භාගය තුළ දී අදහසක් ලබා ගැනීමට අදාළ පාර්ශවයන්ට අවස්ථාව සැලසේ. එයට අමතරව, කාර්යමණ්ඩල සාමාජිකයන්ගේ වාර්ෂික කාර්යසාධනය ඇගයීමේ දී මාර්ගෝපදේශයක් ලෙස ද මෙම මධ්‍ය වාර්ෂික කාර්යසාධන ඇගැයීම් වාර්තා භාවිතා කරනු ලබයි.

**(ඇ) අනුප්‍රාප්ති සැලසුම්කරණය සහ උසස්වීම්**

මහ බැංකුවේ අනාගත අභියෝගවලට මුහුණදීමේදී සේවකයන්ගේ වෘත්තීය අභිවෘද්ධියෙහි සහ අනුප්‍රාප්ති සැලසුම්කරණයෙහි වැදගත්කම හඳුනා ගනිමින් මානව සම්පත් දෙපාර්තමේන්තුව 2013 වසරේ දී බැංකුවේ පවතින ඉහළ තනතුරු සියල්ලෙහිම ඇබෑර්තු, උසස්වීම් ලබාදීම තුළින් සම්පූර්ණ කිරීමට අවශ්‍ය පහසුකම් සලසන ලදී.

ඒ අනුව, 2013 වසරේ දී මාණ්ඩලික පන්තියේ III-1 ශ්‍රේණියේ නිලධාරීන් 13 දෙනෙකු නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානී ධූරයන්ට උසස් කරන ලදී. මෙයට අමතරව, මාණ්ඩලික නොවන පන්තියේ නිලධාරීන් මාණ්ඩලික පන්තියට උසස් කිරීම සඳහා වන උසස් කිරීම් පටිපාටිය යටතේ මාණ්ඩලික නොවන පන්තියේ IV හා V ශ්‍රේණිවලට අයත් නිලධාරීන් 26 දෙනෙකු මාණ්ඩලික පන්තියේ I ශ්‍රේණියට උසස් කරන ලද අතර, විවිධ පන්තිවලට අයත් සේවකයන් 199 දෙනෙකු ද ඔවුන්ට අදාළ වන උසස් කිරීම් පටිපාටි අනුව යමින් ආසන්නතම ඉහළ ශ්‍රේණියට උසස් කිරීම සිදු කරන ලදී.

**(ඈ) බඳවා ගැනීම්**

මානව සම්පත් දෙපාර්තමේන්තුවේ උපායමාර්ගික අරමුණක් වන ඉහළ ඵලදායීතාවයකින් යුත්, අභිප්‍රේරණය වූ සහ කාර්යශූර සේවක මණ්ඩලයක් බැංකුව තුළ පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහා බැංකුවෙහි නිපුණතා අවශ්‍යතාවයන් සපුරාලීම අවශ්‍ය වන අතර, ඒ අනුව, රැකියා වෙළෙඳපොළෙහි සිටින ඉහළ දක්ෂතාවයන්ගෙන් යුත් පිරිස් බැංකුවට ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් යුතුව නව බැංකු සහායකයන් කණ්ඩායමක් මහ බැංකුවට බඳවා ගැනීමට පියවර ගන්නා ලදී. ඒ අනුව, අපේක්ෂකයන් 125 දෙනෙකු 2013 ඔක්තෝබර් මස 14 දින සිට බැංකු සහායක පුහුණුවන්නන් වශයෙන් බඳවා ගන්නා ලදී. මෙයට අමතරව, පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සඳහා රියැදුරන් 9 දෙනෙකු ද, මහ බැංකු මුද්‍රණාලයේ කටර්/පොත් බඳින්නා තනතුර සඳහා එක් අයෙකු ද පසුගිය වසර තුළ දී බඳවා ගන්නා ලදී.

**(ඉ) සේවකයන් දෙපාර්තමේන්තු අතර ස්ථානගත කිරීම**

බහුවිධ කුසලතාවයන්ගෙන් යුත් ශ්‍රම බලකායක් බිහිකර, මහ බැංකුවේ සමස්ත ඵලදායීතාව ඉහළ නැංවීමේ අරමුණින් යුක්තව වාර්ෂිකව සිදු කරන සේවකයන් දෙපාර්තමේන්තු අතර ස්ථානගත කිරීමේ ක්‍රියාවලිය 2013 වසරේ දී ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, දෙපාර්තමේන්තුවල නිපුණතා අවශ්‍යතාවයන් සහ සේවකයන්ගේ සුදුසුකම් හා නිපුණතා මට්ටම් සැලකිල්ලට ගනිමින් එකම දෙපාර්තමේන්තුවේ වසර 5 ක සේවා කාලයක් හෝ එකම පළාත් කාර්යාලයේ වසර 2 ක සේවා කාලයක්

සම්පූර්ණ කළ කාර්ය මණ්ඩල සාමාජිකයන් 90 දෙනෙකු, 2013 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි දෙපාර්තමේන්තු 22 ක් හා පළාත් කාර්යාල 3 ක් අතර ස්ථානගත කිරීම සිදු කරන ලදී.

**(ඊ) සේව්‍ය සේවක සබඳතා**

මහ බැංකුව තුළ කාර්මික සාමය පවත්වාගෙන යාම සඳහා පහසුකම් සලසාදෙන්නෙකු වශයෙන් මානව සම්පත් දෙපාර්තමේන්තුව වෘත්තීය සමිති සහ කළමනාකාරිත්වය අතර සමීප සංවාදයක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අඛණ්ඩව සිදු කරන ලදී. මේ සඳහා අවශ්‍ය අවස්ථාවන් හි දී වෘත්තීය සමිතිවලට කළමනාකාරිත්වය මුණගැසී ගැටලු සාකච්ඡා කිරීමට පහසුකම් සලසා දෙන ලදී. ඒ අනුව, 2013 වසර තුළ දී එවැනි සාකච්ඡා වාර 15 ක් පමණ පවත්වන ලද අතර, එමගින් වැටුප්, උසස්වීම්, පුහුණුවීම්, සුභසාධනය, නව බඳවා ගැනීම් සහ සාමාන්‍ය පරිපාලනය යනාදිය සම්බන්ධයෙන් පැවති ඇතැම් ගැටලු විසඳා ගැනීමට කළමනාකාරිත්වයට සහ වෘත්තීය සමිතිවලට අවස්ථාව ලැබුණි.

## 15.3 උපාධිධාරීන්, උපාධි අපේක්ෂකයින් සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සිසුන් සඳහා පුහුණුව ලබා දීම

රට තුළ ඉහළ ගුණාත්මකභාවයකින් යුතු ශ්‍රම බලකායක් බිහි කිරීම සඳහා දායකත්වය සැපයීමේ අරමුණින් යුක්තව මෙන්ම මහ බැංකුවේ සාමූහික සමාජයීය වගකීම ඉටුකරලීමේ මාර්ගයක් වශයෙන් උපාධිධාරීන්, උපාධි අපේක්ෂකයන් සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සිසුන් හට පුහුණුවීම් ලබාදීම සඳහා පහසුකම් සැලසීම, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2013 වසරේ දී ද අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, පසුගිය වසර තුළ දී සමස්තයක් ලෙස පුහුණුවන්නන් 229 දෙනෙකු පුහුණු කිරීම සඳහා පහසුකම් සලසන ලදී.

**(අ) උපාධි අපේක්ෂකයින් සඳහා වූ ත්‍රෛමාසික පුහුණු වැඩසටහන**

මානව සම්පත් දෙපාර්තමේන්තුව 2013 වසරේ දී අනෙකුත් දෙපාර්තමේන්තු ද සමග එක්ව අඛණ්ඩව තෙවන වසරටත් උපාධි අපේක්ෂකයින් සඳහා වන ත්‍රෛමාසික පුහුණු පාඨමාලා පැවැත්වීම සඳහා පහසුකම් සලසන ලදී. මෙම වැඩසටහනේ මූලික අරමුණ වූයේ ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය, ගණකාධිකරණය, බැංකු හා මූල්‍ය, ව්‍යාපාර කළමනාකරණය, තොරතුරු තාක්ෂණය සහ නීතිය යන ක්ෂේත්‍රයන් පිළිබඳව ඔවුන් විශ්වවිද්‍යාලයේ දී අධ්‍යයනය කරනු ලබන න්‍යායාත්මක සංකල්පයන්හි ප්‍රායෝගික භාවිතය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා අවස්ථාවක් ලබා දීමයි. එසේම මෙම උපාධි අපේක්ෂකයන්ට මාස තුනක කාලයක් පුරා මහ බැංකුවේ දෙපාර්තමේන්තු කිහිපයකම කාර්යයන් පිළිබඳව අත්දැකීම් ලබා ගැනීමට ද මෙම වැඩසටහන තුළින් පහසුකම් සලසා ඇත. මෙයට අමතරව, රැකියා වෙළෙඳපොළ තුළ ඔවුන්ගේ රැකියා නියුක්තභාවය ඉහළ නංවා ගැනීමට උපකාරී වන පූර්ව අවශ්‍යතාවයන් වන මනා පෞරුෂත්වය සහ වෘත්තීය හැකියාව වර්ධනය කර ගැනීමට ද මේ තුළින් අවස්ථාව සැලසේ. 2013 වසරේ දී මානව සම්පත් දෙපාර්තමේන්තුව දේශීය හා විදේශීය විශ්ව විද්‍යාල 17 කින් සහ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් තෝරා ගත් සිසුන් 98 දෙනෙකු සඳහා ත්‍රෛමාසික පුහුණු පාඨමාලා 4 ක් පවත්වන ලදී.

**(ආ) උපාධි අපේක්ෂකයින් සඳහා වන වෙනත් පුහුණු වැඩසටහන්**

මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන් 2 ක් සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක කරන ලදී. මෙම උපාධි අපේක්ෂක පුහුණු වැඩසටහන් යටතේ, කණ්ඩායම් 2 ක් වශයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයන් 85 දෙනෙකුට සය මාසික පුහුණු අවස්ථාවන් ලබා දෙන ලද අතර, කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයන් 20 දෙනෙකුට ත්‍රෛමාසික පුහුණු අවස්ථාවන් ලබා දෙන ලදී.

**(ඇ) උපාධිධාරී පුහුණු වැඩසටහන**

සාර්ථකව උපාධිය සම්පූර්ණ කරන ලද උපාධිධාරීන් සඳහා මහ බැංකුවේ පුහුණු අවස්ථාවන් ලබා දෙන ලෙස උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් කරන ලද ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් මානව සම්පත් දෙපාර්තමේන්තුව, 2013 වසරේ දී පුහුණු වැඩසටහනක් ආරම්භ කරන ලදී. ඒ අනුව, පළමු

**II-17 සංඛ්‍යා සටහන** — **ශ්‍රී ලංකා මහ බැංකුවේ ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලද හා සම්පූර්ණ කරන ලද නිලධාරීන්**

| සුදුසුකම | 2009 | | 2010 | | 2011 | | 2012 | | 2013 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණකළ |
| විද්‍යාපති උපාධිය | 4 | 2 | 15 | 6 | 17 | 10 | 18 | 17 | 11 | 19 |
| ආචාර්ය උපාධිය | 1 | 1 | 1 | 1 | 2 | 2 | 4 | 2 | 6 | 0 |

උපාධිධාරී පුහුණු වැඩසටහන යටතේ 2013 ජූලි 01 දින සිට දෙසැම්බර් 31 දක්වා කාලසීමාව තුළ උපාධිධාරීන් 5 දෙනෙකු පුහුණු කරන ලදී.

**(ඈ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සිසුන් සඳහා වන ගණකාධිකරණ පුහුණු වැඩසටහන**

2013 වසර තුළ දී ද මානව සම්පත් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සිසුන් සඳහා මහ බැංකුවේ සිටින සුදුසුකම්ලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ අධීක්ෂණය යටතේ ගණකාධිකරණ පුහුණුව ලැබීමට අවස්ථාව සලසා දීම තුළින් ඔවුන්ගේ ගණකාධිකරණ පාඨමාලාවේ අනිවාර්ය පුහුණුව සම්පූර්ණ කිරීමට පහසුකම් සැලසීම අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, 2013 වසරේ දී සිසුන් 21 දෙනෙකුට මේ සඳහා පහසුකම් සලසන ලදී.

## 15.4 2013 වසර තුළ අධිපතිතුමා විදේශයන්හි දී සහභාගි වූ රැස්වීම්

1. 2013 ජනවාරි මාසයේ දී නවදිල්ලියෙහිදී පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සමුළුව, බැංකොක්හි පැවති ආයෝජන බැංකුකරුවන් සමග රැස්වීම හා සිංගප්පූරුවේ දී පැවති ''සිටි ආසියා ශාන්තිකර ආයෝජන සම්මේලනය'' (Citi Aisa Pacific Investor Conference)
2. පෙබරවාරි මාසයේ දී ඕමාන් හි දී බැංකුකරුවන් හා ආයෝජකයන් සමග රැස්වීම, අබුඩාබි හි දී බැංකුකරුවන් සමග රැස්වීම හා මුම්බායි හි පැවති කොළඹ කොටස් වෙළෙඳපොළ (CSE) ආයෝජන සමුළුවේ ප්‍රධාන දේශනය පැවැත්වීම.
3. මාර්තු මාසයේ දී ටෝකියෝ හි දී ශ්‍රී ලංකා ව්‍යාපාරික සමුළුව හා ක්වාලාලම්පූර් හි දී ආසියාව සඳහා වූ මූල්‍ය ස්ථායිතා මණ්ඩලයේ (FSB) කලාපීය උපදේශක කණ්ඩායමේ 4 වන රැස්වීම (4th Financial Stability Board (FSB) Regional Consultative Group for Asia).
4. අප්‍රේල් මාසයේ දී වොෂින්ටන් ඩීසී හි පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදල/ලෝක බැංකුව වසන්ත සෘතුවේ දී පවත්වන ලද රැස්වීම් (Spring Meetings) හා ලන්ඩන් හි දී ආයෝජකයන් සමග රැස්වීම්.
5. මැයි මාසයේ දී බැංකොක් හි පැවති ප්‍රේෂණයන් පිළිබඳ ලෝක සමුළුව (Global Forum on Remittances).
6. ජූනි මාසයේ දී ක්වාලාලම්පූර් හි පැවති හත්වන සියැසන් (SEACEN) උසස් නායකත්ව පාඨමාලාවේ ප්‍රධාන දේශනය පැවැත්වීම හා ටැන්සානියා සහ සීෂෙල්ස් රජයන් හා එහි ප්‍රමුඛ ව්‍යාපාරිකයන් සමග අතිගරු ජනාධිපතිතුමාගේ නියෝජිත පිරිස පැවැත්වූ සාකච්ඡා.
7. ජූලි මාසයේ දී සිංගප්පූරුවේ පැවති ලෝක ආර්ථිකයේ ආසියානු භූමිකාව (Asia's Road in the Global Economy) සමුළුවේ දේශනයක් පැවැත්වීම හා වොෂින්ටන් ඩීසී හි දී ආයෝජකයන් හමුවීම.
8. සැප්තැම්බර් මාසයේ දී හොංකොං හි පැවති ඉන්වෙස්ට් ශ්‍රී ලකා ආයෝජක සමුළුව (Invest Sri Lanka Investor Forum) හා බීජිං, ෂැංහයි හා පැරිසියේ දී පැවති බැංකුකරුවන් හමු වීම.
9. ඔක්තෝබර් මාසයේ දී බැංකොක් හි දී ආයෝජන බැංකුකරුවන් සමග රැස්වීම්, ක්වාලාලම්පූර් හි පැවති සියැසන් (SEACEN) තිස්වන සාංවත්සරික සම්මේලනය ඇමතීම, හත්වන සියැසන් (SEACEN) අන්තර් මධ්‍ය නායකත්ව පාඨමාලාවේ ප්‍රධාන දේශනය පැවැත්වීම හා තුන්වන SEACEN - CEMLA සම්මේලනය සහ ටෝකියෝ හි දී ආසියාව සඳහා වූ මූල්‍ය ස්ථායිතා මණ්ඩලයේ (FSB) කලාපීය උපදේශක කණ්ඩායමේ රැස්වීමේ ප්‍රධාන සාකච්ඡාකරුවෙකු ලෙස සහභාගි වීම.
10. නොවැම්බර් මාසයේ දී සීෂෙල්ස් මහ බැංකුවේ තිස්පස් වන සාංවත්සරික සැමරුම් උත්සවයේ ආරාධිත දේශනය පැවැත්වීම.

## 15.5 පත් කිරීම්

1. සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරී කේ. ගුණතිලක මහත්මිය 2013 ජූලි 01 දින සිට මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.
2. ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ පී.ඩබ්.ඩී.එන්.ආර්. රොද්‍රිගෝ මහතා 2013 ජූලි 01 දින සිට සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරී ලෙස පත් කරන ලදී.
3. සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කේ. සරවනමුත්තු මෙනෙවිය 2013 ජූලි 01 දින සිට ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.
4. මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඒ.ආර්.කේ. විජේසේකර මහතා 2013 ජූලි 01 දින සිට සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.
5. ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ වී. බාස්කරන් මහතා 2013 ඔක්තෝබර් 07 දින සිට පළාත් කාර්යාල මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.
6. අධිපති ලේකම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ටී.එම්. ඉසෙඩ් මුතාලිෆ් මහතා 2013 නොවැම්බර් 04 දින සිට සන්නිවේදන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.
7. සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එල්.ඩී.ඩී.වයි. පෙරේරා මහතා 2013 නොවැම්බර්

04 දින සිට අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

### 15.6 විශ්‍රාම ගැනීම්

1. සහකාර අධිපති ඩබ්.එම්. කරුණාරත්න මහතා 2013 මාර්තු 20 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.
2. නියෝජ්‍ය අධිපති සී. ප්‍රේමරත්න මහත්මිය 2013 ජූනි 20 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

### 15.7 මුදාහරිනු ලැබ සිටි නිලධාරීන්

1. සහකාර අධිපති කේ.ඩී. රණසිංහ මහතා විකල්ප විධායක අධ්‍යක්ෂවරයෙකු ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.
2. මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියේ කේ.එම්.ඒ.එන්. දවුලගල මහත්මිය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.
3. මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියේ එස්.ආර්. ආටිගල මහතා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.
4. මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියේ කේ.එම්.එම්. සිරිවර්ධන මහතා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.
5. මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ එම්. මහින්ද සාලිය මහතා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.
6. මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ එම්.එස්. හඳුන්ගේ මහතා ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් සමාගම වෙත.
7. මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ එස්.ජී.එස්.ඩී. ජයසේකර මහතා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත.
8. මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ එස්.ජේ.කේ. ගුරුගේ මහතා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත.
9. මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ එච්.එම්.එන්. දර්ශන මහතා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත.
10. මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ ජේ.ඒ.ඒ. ප්‍රියන්ත මහතා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත.
11. මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ ඒ.ඩබ්.යූ.සී.එන්. බණ්ඩාර මහතා ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් සමාගම වෙත.
12. මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ කේ.පී.එම්. පෙරේරා මහතා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත.
13. මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ ඩී. ජයවර්ධන මහතා ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය වෙත.
14. මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ එස්. රණසිංහ මහත්මිය ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත.
15. මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ ඒ.සී. අබේසිංහ මහත්මිය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.
16. මාණ්ඩලික නොවන පංතියේ II ශ්‍රේණියේ ඊ.ටී.එම්. සොයිසා මහතා ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් සමාගම වෙත.
17. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබූ නීති නිලධාරිනී එච්.එම්.එන්.එස්. ගුණවර්ධන මහත්මිය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.

### 15.8 වැටුප් රහිත අධ්‍යයන නිවාඩු මත සිටින නිලධාරීන්

1. මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියේ යූ.පී. අලවත්තගේ මහතා 2012 සැප්තැම්බර් 04 දින සිට වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබා සිටී.

## 16. තොරතුරු තාක්ෂණ

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව බැංකුවේ ව්‍යාපාරික කටයුතු මෙහෙයවන්නකු ලෙස කටයුතු කරමින්, බැංකුවේ විවිධ දෙපාර්තමේන්තු මගින් කරනු ලබන කාර්යයන්ගේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය නවමු ව්‍යාපාරික විසඳුම් කීපයක් ක්‍රියාත්මක කර ඇත. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2013 වසර තුළ දී ඉටු කරන ලද කාර්යභාරයන් පහත දැක්වෙන පුළුල් ක්ෂේත්‍රයන් පහ යටතේ සංවිධානය විය.

1. ඵලදායිතාව හා කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති සම්පාදනය කිරීම.
2. ජාතික වශයෙන් වැදගත්කමක් ඇති ව්‍යාපෘති සඳහා ව්‍යාපාරික සංවර්ධනයත් සමඟ තොරතුරු තාක්ෂණය සම්බන්ධීකරණය කිරීම.
3. තොරතුරු තාක්ෂණ කාර්යසාධනය හා ප්‍රමිති මිනුම්කරණය කිරීම.
4. විද්‍යුත් කාර්යාල (e-office) හා ව්‍යාපාරික අඛණ්ඩතාව සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
5. මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම.

### 16.1 ඵලදායිතාව හා කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති සම්පාදනය කිරීම.

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව, එය සතු වෘත්තීමය නිපුණත්වයන් භාවිතා කරමින් මහ බැංකුව තුළ විවිධ වූ ව්‍යාපාරික ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය නවමු ව්‍යාපාරික විසඳුම් හඳුන්වාදීමට කටයුතු කරන ලදී. දැනට භාවිතයේ පවතින සියයකට අධික ස්වයංකෘත පද්ධතීන් සඳහා අවශ්‍ය සහායක සහ නඩත්තු සේවා සපයන අතර වසර තුළ දී තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද ප්‍රධාන ව්‍යාපෘති අතරින් සමහරක් පහත දක්වා ඇත.

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවෙහි නව ව්‍යාපාරික අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා විස්තෘත ගිණුම් කේත ව්‍යුහයක් සහ තාක්ෂණික වශයෙන් ඉතා වැදගත් ව්‍යාපාරික යෙදවුම් සමඟ ක්‍රියාත්මක වන අතුරු මුහුණත් සහිතව ඒකාබද්ධ

පොදු ලෙජර් පද්ධතිය (iGLAS) නිර්මාණය කිරීම. පද්ධති හා තත්ව ආරක්ෂණ පරීක්ෂණ සහ පිළිගත් බාහිර විගණන ආයතනයක් මඟින් විගණනය කිරීමෙන් පසු, නව ව්‍යාපෘතියේ සජීව මෙහෙයුම් ආරම්භ කරන ලදී. මෙම නව පොදු ලෙජර් පද්ධතිය ව්‍යාපාරික ප්‍රජාව පිළිගත් භාවිතයන් හා ප්‍රමිතීන්ට අනුකූලව මහ බැංකුව සතු මූල්‍ය ගිණුම්වල මධ්‍යම තොරතුරු සුරක්ෂිතාගාරය ලෙස ක්‍රියා කරනු ඇත.

(ආ) ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සඳහා නව භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියක් (Guava) ස්ථාපිත කිරීම සඳහා විශේෂඥ තාක්ෂණික සහාය ලබාදීම. විදේශ විනිමය ගනුදෙනු හා හුවමාරු ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය වූ Guava හා ඒකාබද්ධව පොදු ලෙජර් පද්ධතිය (iGLAS) අතර අතුරු මුහුණත තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිර්මාණය කරන ලදී.

(ඇ) සේවක අර්ථසාධක අරමුදලට අයත් පරිගණක පද්ධතිය නඩත්තු කිරීම සඳහා අවශ්‍ය වූ තාක්ෂණික සහාය තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කාර්යක්ෂමව ලබා දෙමින් එම පද්ධතිය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා පහත දැක්වෙන ව්‍යාපෘති නිර්මාණය සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී ලෙස සම්බන්ධ විය.

(i) සේව්‍යයන් සඳහා ජාලගත දායක මුදල් රැස්කිරීමේ පද්ධතිය

(ii) විද්‍යුත් සුරක්ෂිතාගාරය සඳහා ඡායා පරිලෝකන ව්‍යාපෘතිය

(iii) වාණිජ බැංකු හරහා සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් විද්‍යුත්මය වශයෙන් සම්ප්‍රේෂණය

(ඈ) බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව (BSD) හා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව (SNBFID) සඳහා අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට (IFRS) අනුකූලව වාර්තා මොඩියුලයක් හඳුන්වා දීම මඟින් මධ්‍යගත මූල්‍ය දත්ත ගබඩාකරණ පද්ධතියෙහි (FinNet) පහසුකම් වැඩිදියුණු කිරීම.

(ඉ) නව විනිමය පාලන විධානයන්ට අනුකූල වනසේ බාහිර ආයෝජන ගිණුම් මොඩියුලය සහ සුරැකුම් ආයෝජන ගිණුම් මොඩියුලය හඳුන්වා දෙමින් ForexNet මෘදුකාංගය වැඩිදියුණු කිරීම.

(ඊ) මහජනතාව තුළ විනිමය පාලන රෙගුලාසි පිළිබඳව ඇති දැනුම වැඩිදියුණු කිරීම සඳහා විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් පිහිටුවන ලද වෙබ් අඩවිය නිර්මාණය කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීම.

(උ) ඒකාබද්ධ මානව සම්පත් කළමනාකරණ පද්ධතියෙහි කාර්යමණ්ඩල වැටුප් සහ සුභසාධන ණය මොඩියුලයන් හි (eHRNet) සැලසුම් නිර්මාණය කිරීම.

(ඌ) බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙනුවෙන් පිහිටුවන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා වාරික සහ ආයෝජන මොඩියුලයන් හඳුන්වා දීම.

(එ) දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සඳහා ඡායාගත චෙක්පත් සම්ප්‍රේෂණ පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතුවල නිරතවීම, එය ස්ථාපනය කිරීම සහ ඒකාබද්ධ පොදු ලෙජර් පද්ධතිය සමඟ ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය වූ අතුරු මුහුණත් නිර්මාණය කිරීම.

(ඒ) ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන ව්‍යාපෘතිය (NADeP) යටතේ පැවති ප්‍රජා ණය ලියාපදිංචිය, ප්‍රතිමූල්‍යකරණය, ආපසු ගෙවීම් හා පියවීම් කාර්යක්ෂමව සිදු කිරීම සඳහා අවශ්‍ය පරිගණක යෙදවුම් හඳුන්වා දීම.

(ඔ) මහ බැංකුව සඳහා නව ප්‍රවේශ පාලන පද්ධතියක් හඳුන්වා දීම සඳහා තාක්ෂණික සහාය ලබාදීම.

(ඕ) මධ්‍යගත පාලන ප්‍රවේශ පද්ධතියක් පවත්වා ගැනීම සඳහා සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව සතු ප්‍රවේශ පාලන පද්ධතිය හා ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රවේශ පාලන පද්ධතිය අතුරු මුහුණත් මඟින් ඒකාබද්ධ කිරීම.

(ක) මහ බැංකු කාර්ය මණ්ඩලය සඳහා විද්‍යුත් සන්නිවේදනයක් ලෙස 'මංසල' නමින් ආයතනික ජාලයක් හඳුන්වා දීම.

## 16.2 ජාතික වශයෙන් වැදගත්කමක් ඇති ව්‍යාපෘති සඳහා ව්‍යාපාරික සංවර්ධනයත් සමඟ තොරතුරු තාක්ෂණය සම්බන්ධීකරණය කිරීම.

ජාතික වැදගත්කමකින් යුතු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී සහ නවීන තාක්ෂණය එම ව්‍යාපෘති සඳහා යොදා ගැනීමේ දී පැනනගින විවිධ ගැටළු නිරාකරණය කිරීමට අවශ්‍ය සහාය ලබාදීම තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව වසර තුළ කරන ලද තවත් ප්‍රධාන කාර්යයක් විය. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව තම විශේෂඥතාවය පහත සඳහන් ව්‍යාපෘතීන් සඳහා සපයන ලදී.

(අ) ජාතික ගෙවීම් කවුන්සලය විසින් තීරණය කරන ලද හා ලංකාක්ලියර් පුද්ගලික සමාගම විසින් මෙහෙයවන ව්‍යාපෘතියක් වන පොදු කාඩ්පත් හා ගෙවීම් ස්විචය යටතේ පොදු ස්වයංකෘත ගනුදෙනු ස්විචයක් පිහිටුවීම.

(ආ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්යයන් පරිගණකගත කිරීම.

(ඇ) රාජ්‍ය භාණ්ඩාගාරය සඳහා ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතියක් හඳුන්වා දීම.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර කණ්ඩායම සමග (SLCERT), ISO ප්‍රමිතීන්ට අනුකූල වනසේ, මූල්‍ය අංශය සඳහා මූලික තොරතුරු ආරක්ෂණ ප්‍රමිතීන් පිළියෙල කිරීම.

## 16.3 තොරතුරු තාක්ෂණ කාර්යසාධනය හා ප්‍රමිතීන් මැනීම.

වෙබ් තාක්ෂණය පදනම් කරගත්, නව ව්‍යාපෘති සඳහා ඇති ඉහළ ඉල්ලුමත්, තොරතුරු පද්ධතීන් සඳහා ක්ෂේත්‍රය පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල වනසේ මිනුම් කිරීමේ අවශ්‍යතාවයත්

සැලකිල්ලට ගනිමින් අතිශයින් වැදගත් පද්ධති පැවැත්ම වැඩිදියුණු කරමින් තොරතුරු පද්ධති හා යටිතල පහසුකම් සඳහා ඇති අවදානම තක්සේරු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. ඒ අනුව, පද්ධතිමය වශයෙන් වැදගත් වූ ගෙවීම් හා පියවීම් ක්‍රමයේ හා අනෙකුත් උපායමාර්ගික වැදගත් පද්ධතීන්හි සියයට 99.9 කට ආසන්න උපයෝජ්‍යතාවයක් පවත්වා ගැනීමට හා අවදානම් තක්සේරුකරණයේ දී හඳුනා ගත් සමහර අංශ වැඩිදියුණු කිරීමටත් 2013 වසර තුළ දී තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව සමත් විය.

### 16.4 විද්‍යුත් කාර්යාල (e-office) හා ව්‍යාපාරික අඛණ්ඩතාව සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

විවිධ දෙපාර්තමේන්තුවල මනා ක්‍රියාකාරිත්වය නිසි ලෙස පවත්වා ගැනීමත්, ව්‍යාපාරික ගනුදෙනුවල අපේක්ෂිත වර්ධනයට මුහුණ දීම සඳහාත් තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සැපයීම සඳහා පහත දැක්වෙන මූලික යටිතල පහසුකම් සංවර්ධනය කරන ලදී.

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව හා සේවක අර්ථසාධක අරමුදලට අයත් ප්‍රධාන හා ආපදා මෙහෙයුම් කටයුතු සඳහා යොදාගත් සියලුම AS/400 පරිගණක පද්ධති ප්‍රතිස්ථාපනය කිරීම. පවත්නා මාර්ගගත අනුපිටපත් කිරීමේ පහසුකම වැඩිදියුණු කිරීම හා සේවක අර්ථසාධක අරමුදල හා කම්කරු දෙපාර්තමේන්තුව අතර තොරතුරු ප්‍රත්‍යස්ථිතික කිරීම සඳහා (Replication) අදාළ පහසුකම් වැඩිදියුණු කිරීම.

(ආ) නව තාක්ෂණය, ඉහළ ධාරිතාවය සහ ඉතා හොඳ කාර්යසාධනයක් සඳහා අවශ්‍ය වේගය පදනම් කරගත් දත්ත ගබඩාවක් සහ සේවාදායකයන් (Servers) ස්ථාපනය කිරීම.

(ඇ) කර්මාන්ත තුළ පවත්නා පිළිගත් සුදුසු ක්‍රියාමාර්ගයන්ට අනුගතව, බැංකු පරිශ්‍රයේ හඳුනාගත් ස්ථාන තුළ Wi-Fi කලාප පිහිටුවීම.

(ඈ) ජාත්‍යන්තර ප්‍රමිති ආයතනයේ ප්‍රමිතීන්ට අනුගතව, නව ආපදා ප්‍රතිපත්ති මධ්‍යස්ථානයක් පිහිටුවීමට කටයුතු ආරම්භ කිරීම.

(ඉ) පළාත් කාර්යාලවලින් අපේක්ෂිත ප්‍රධාන සහ නියෝජිත සේවා නිසි අයුරින් ඉටු කිරීම සඳහා එම පළාත් කාර්යාල ප්‍රධාන කාර්යාලය සමඟ සම්බන්ධ කිරීම සඳහා අවශ්‍ය වූ අතථ්‍ය පුද්ගලික ජාල සම්බන්ධතාවයන් (VPN) පිහිටුවීම සහ භෞතික හෝ රැහැන් රහිත අව පැතුරුම් ජාල (LAN) ස්ථාපනය කිරීමට කටයුතු කිරීම.

(ඊ) මූල්‍ය ආයතන මඟින් ව්‍යවස්ථාපිත තොරතුරු කාලීනව ලබා ගැනීම, පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් වේගවත් කිරීම හා විද්‍යුත් සන්නිවේදන විකාශනය දියුණු කිරීම සඳහා අන්තර්ජාල රැහැන් ධාරිතාව 20 Mbps දක්වා වැඩි කිරීම.

### 16.5 මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම

සැමවිටම වෙනස්වන පරිසරයක නව තාක්ෂණික හා ව්‍යාපාරික දිශානතීන් හා පුද්ගලාන්තර කුසලතාවයන් තුළ මානව ප්‍රාග්ධනය අඛණ්ඩව සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගත් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව, වසර තුළ දී සම්මන්ත්‍රණ, සම්මේලන, වැඩමුළු හා පශ්චාත් උපාධි අධ්‍යයන තුළින් තම කාර්යමණ්ඩලය සතු දැනුම හා නිපුණතාවයන් දියුණු වන ආකාරයෙන් දේශීය හා විදේශීය පුහුණු සැලසුම බලාත්මක කරන ලදී.

## 17. අභ්‍යන්තර විගණන

1951 වසරේ සිට බැංකුව තුළ අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක වන අතර ගෝලීය ප්‍රමිති සහ ක්ෂේත්‍රයේ ප්‍රශස්ත පරිචයන්ට අනුකූලව දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් 2013 වසරේ සිට ප්‍රතිව්‍යුහගත කරන ලදී. ඒ හා සමගාමීව දෙපාර්තමේන්තු නාමය ද "කළමනාකාරිත්ව විගණන" යන්නෙහි සිට "අභ්‍යන්තර විගණන" වශයෙන් වෙනස් කරන ලදී. දෙපාර්තමේන්තුවේ මෙහෙවර හා කාර්ය වපසරියත්, කළමනාකාරිත්ව විගණන අධ්‍යක්ෂකගේ හා කාර්ය මණ්ඩලයේ වගවීම, ස්වාධීනත්වය, වගකීම හා අධිකාරියත්, අභ්‍යන්තර විගණන අධිකාරී පත්‍රය මඟින් අර්ථ දක්වා ඇත. ඇමෙරිකා එක්සත් ජනපදයේ අභ්‍යන්තර විගණකයන්ගේ ආයතනයේ ජාත්‍යන්තර වෘත්තීය පරිචයන් හා බැඳුනු ආකෘතිමය රාමුවේ ප්‍රමිති සහ ක්ෂේත්‍රයේ ප්‍රශස්ත පරිචයන්ට අනුව විගණනයන් සිදුකරන ලද අතර දෙපාර්තමේන්තුව විසින් 2013 වසර තුළ සිදුකරන ලද කාර්යයන් හි සාරාංශයක් පහත දැක්වේ.

### 17.1 විගණන පැවරුම් ක්‍රියාත්මක කිරීම

(අ) 2013 වසර සඳහා වාර්ෂික විගණන සැලැස්ම

වාර්ෂික විගණන සැලැස්ම මහ බැංකුවේ වැදගත් ක්‍රියාකාරකම් සැළකිල්ලට ගනිමින් සකස් කරන ලද අතර, මුදල් මණ්ඩල උපදේශාත්මක විගණන කමිටුවේ අනුමැතිය සහිතව ක්‍රියාවට නංවන ලදී.

(ආ) අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය

විගණන ක්‍රියාවලිය අදියර හතරකින් සමන්විත වේ. එනම් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, සන්නිවේදනය හා නිරාකරණය කිරීම වේ. මීට අමතරව දෙපාර්තමේන්තුවල කටයුතු නීති, රෙගුලාසි හා ප්‍රතිපත්තිවලට අනුකූලව සිදුකරනු ලබන බව තහවුරු කර ගැනීම සඳහා පසුවිපරම් ද සිදුකරන ලදී.

(ඇ) විගණන ක්‍රියාවලියේ ප්‍රගතිය වාර්තා කිරීම

මුදල් මණ්ඩල උපදේශාත්මක විගණන කමිටුවේ නිර්දේශයන් සහිතව විගණන පැවරුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය කාර්තුමය වශයෙන් මුදල් මණ්ඩලයට වාර්තා කරන ලද අතර, විගණන කටයුතු පිළිබඳව විගණකාධිපතිතුමාට අර්ධ වාර්ෂිකව වාර්තා කරන ලදී.

(ඇ) විගණනය හා සබැඳි අනෙකුත් කාර්යයන්

ශ්‍රී ලංකා මහ බැංකුවේ සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට විගණනය පහසු කිරීමේ මාර්ගෝපදේශන වසර තුළ දී නිකුත් කරන ලදී. මෙම මාර්ගෝපදේශනයේ අවශ්‍යතාවන්ට අනුව විගණන කටයුතු පහසු කිරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අභ්‍යන්තර විගණන සම්බන්ධීකරණ නිලධාරීන් පත්කරන ලදී.

### 17.2 දැනුම්වත් කිරීමේ වැඩසටහන් හා පුහුණු සැසි පැවැත්වීම

බැංකුවේ තොරතුරු පද්ධතිවල වැදගත්කම සැළකිල්ලට ගනිමින් බැංකුවේ කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු පද්ධතිවල ආරක්ෂාව පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී. සේවකයන්ගේ අවංකභාවය වර්ධනය කිරීම පිණිස විගණන අදහස්, විද්‍යුත් තැපැල තුළින් සියලුම සේවකයින්ගේ අවධානයට යොමුකරන ලදී. දෙපාර්තමේන්තුව විසින් උපාධිධාරීන්ට, උපාධි අපේක්ෂකයන්ට හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ශිෂ්‍යයන්ට අභ්‍යන්තර විගණනය සහ ඒ හා සම්බන්ධ විෂයයන් පිළිබඳව පුහුණුවක් ලබාදෙන ලදී.

### 17.3 මුදල් මණ්ඩල උපදේශාත්මක විගණන කමිටුව

මුදල් මණ්ඩල උපදේශාත්මක විගණන කමිටුව මුදල් මණ්ඩලයේ එක් සාමාජිකයෙකු හා බාහිර විගණන වෘත්තිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. මුදල් මණ්ඩලයේ ලේකම් උපදේශාත්මක විගණන කමිටුවේ ලේකම් වන අතර අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ උපදේශාත්මක විගණන කමිටුවේ සහකාර ලේකම් වේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් උපදේශාත්මක විගණන කමිටුව සඳහා ලේඛන කටයුතු වෙනුවෙන් පහසුකම් සපයන ලදී.

වාර්ෂිකව අවම වශයෙන් සයවතාවක් (06) උපදේශාත්මක විගණන කමිටු රැස්වීම් පැවැත්වීම අවශ්‍ය වේ. වසර තුළ දී සත්වතාවක් (07) උපදේශාත්මක විගණන කමිටු රැස්වීම් පවත්වන ලද අතර, එහිදී අභ්‍යන්තර විගණන කටයුතුවල ප්‍රගතිය සහ අභ්‍යන්තර විගණන වාර්තා සඳහා වූ කළමනාකරණ ප්‍රතිචාර විමර්ශනය කරන ලදී.

තවදුරටත්, උපදේශාත්මක විගණන කමිටුව විසින් නිර්දේශ කරන ලද විගණන සම්පත් විගණනයන් අතර බෙදාහැරීම, කළමනාකාරිත්වයට අයත්වන අනුමත කිරීම් වලින් අභ්‍යන්තර විගණන කාර්ය බැහැරවීම සහ තොරතුරු තාක්ෂණ පද්ධති විගණන කටයුතු මුදල් මණ්ඩලයේ අනුමැතිය සහිතව ක්‍රියාත්මක කිරීම ද කරන ලදී.

### 17.4 බාහිර විගණන කටයුතු සඳහා පහසුකම් සැපයීම

විගණකාධිපතිතුමා විසින් බාහිර විගණනය මෙහෙයවනු ලබන අතර මුදල් මණ්ඩලයේ ලේකම් මගින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව බාහිර විගණනය සඳහා පහසුකම් සපයන්නෙකු ලෙස කටයුතු කරයි. අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපතිතුමා විසින් අර්නස්ට් ඇන්ඩ් යන්ග් (Ernst & Young) විගණන ආයතනය පත්කර ඇත. ඒ අනුව, අදාළ කටයුතු සිදුකිරීමට අවශ්‍ය තොරතුරු රැස්කිරීම, නිරීක්ෂණය, විශ්ලේෂණය හා සන්නිවේදනය කිරීම සඳහා මුදල් මණ්ඩලයේ ලේකම් වෙත තාක්ෂණික සහාය සැපයීම ද දෙපාර්තමේන්තුව මගින් සිදුකරන ලදී.

## 18. ජාත්‍යන්තර මෙහෙයුම්

ශ්‍රී ලංකාවේ විදේශ සංචිත කළමනාකරණය සඳහා අවශ්‍ය නෛතික රාමුව, මුදල් නීති පනත මගින් සලසා දෙනු ලබන අතර එමගින් විදේශ සංචිත පවත්වාගෙන යාම, එහි සංයුතිය, රුපියලෙහි විදේශීය අගය ස්ථායීකරණය කිරීම මහ බැංකුවේ විදේශ විනිමය කටයුතු සහ විදේශ සංචිත කළමනාකරණය පිළිබඳ වූ මුදල් මණ්ඩලයේ බලතල සහ වගකීම් ආවරණය කරනු ලැබේ. ඒ අනුව, මුදල් නීති පනතේ 67 වන වගන්තියෙන් වත්කම් වර්ග, ගනුදෙනු කළ හැකි පාර්ශවයන්, මූල්‍ය උපකරණ සහ මූල්‍ය උපකරණ නිකුතුකරුවන් පිළිබඳ නිර්ණායකයන් ලබා දෙනු ලැබේ. තවද, විදේශ සංචිත සුරක්ෂිතතාවය, ද්‍රවශීලතාව සහ ප්‍රතිලාභ යන අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ අභිප්‍රායෙන් විදේශ සංචිත කළමනාකරණයේ පරාසය තවත් පුළුල් කිරීමට නිර්දේශ කිරීමේ බලය ද මුදල් මණ්ඩලය සතුව ඇත. ඒ අනුව විදේශ සංචිත කළමනාකරණය සහ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ අධීක්ෂණ කටයුතු ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවට පවරා ඇත.

### 18.1 විදේශ සංචිත කළමනාකරණය

විදේශ සංචිත ආයෝජනය මුදල් මණ්ඩලය මගින් අනුමත කර ඇති විදේශ සංචිත කළමනාකරණ මාර්ගෝපදේශයන්ට අනුකූලව සහ විදේශ සංචිත කළමනාකරණ කමිටුවේ අධීක්ෂණයට යටත්ව සිදු කරනු ලබයි. එක්සත් ජනපද ඩොලර්, යුරෝ, ස්ටර්ලින් පවුම්, ඕස්ට්‍රේලියානු ඩොලර් ආදී මුදල් වර්ගවලින් සමන්විත විදේශ සංචිත, ප්‍රධාන වශයෙන් ස්ථාවර ආදායම් සුරැකුම්පත් හා රත්රන් වැනි මුදල් වෙළෙඳපොළ උපකරණ වත්කම් කාණ්ඩ දෙකෙහි ආයෝජනය කරන ලදී. බැංකුව සතු ස්ථාවර ආදායම් සුරැකුම්පත් ආයෝජන කළඹ ඉහළ ඇගයුමකින් යුතු රාජ්‍යයන් විසින් නිකුතු සුරැකුම්පත්, රාජ්‍ය ඇපවීමක් සහිත සුරැකුම්පත්, රාජ්‍ය නියෝජිත ආයතන සහ ප්‍රමුඛ ජාත්‍යන්තර ආයතන මගින් නිකුත් කළ සුරැකුම්පත්වලින් සමන්විතය. වත්කම්වල සුරක්ෂිතතාවය, ද්‍රවශීලතාව සහ ප්‍රතිලාභ සම්බන්ධව නිසි අවධානය යොමු කරමින් ස්ථාවර ආදායම් සුරැකුම්පත් සහ මුදල් වෙළෙඳපොළ ආයෝජන යන දෙවර්ගයටම අදාළ ආයෝජන කටයුතු කළමනාකාරිත්වය විසින් අනුමත කර ඇති ඉහළ ඇගයුමකින් යුක්ත වාණිජ බැංකු, මහ බැංකු හා ආයෝජන වෙළෙඳ ව්‍යාපාර වැනි ගණුදෙනුකාර පාර්ශවයන් සමග පමණක් සිදු කරන ලදී. විදේශ විනිමය ආයෝජන කළඹෙහි වත්කම් හා මුදල් වර්ග සංයුතිය තීරණය කිරීමේදී ප්‍රධාන වශයෙන් බැංකුවේ ද්‍රවශීලතා අවශ්‍යතාවයන්, ණය සේවාකරණ ගෙවීම්,

අවදානම් කළමනාකරණ නිර්ණායක, ආදායම් උත්පාදනය කිරීමේ හැකියාව සහ මුදල් මණ්ඩලය මඟින් කරනු ලබන විශේෂිත මගපෙන්වීම් ද සලකා බලන ලදී.

2013 වසර ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළෙහි සැලකිය යුතු විචලනයකින් යුතු වසරක් විය. 2013 වසරේ මූල්‍ය වෙළෙඳපොළ සිදුවීම් බොහොමයක් ඇමෙරිකා එක්සත් ජනපදයෙන් වාර්තා වූ අතර, මූල්‍ය වෙළෙඳපොළෙහි ද්‍රවශීලතාව ක්‍රමානුකූලව අඩුකිරීම සහ රාජ්‍ය අයවැය අනුමත කිරීමේ ප්‍රමාදය හේතුවෙන් සිදු වූ රාජ්‍ය කටයුතු අඩපණ වීම ප්‍රධාන කොට සැලකිය හැකිය. ඇමෙරිකානු ආර්ථික වර්ධනය යථා තත්ත්වයට පත්වීම හේතුකොටගෙන, මූල්‍ය වෙළෙඳපොළෙහි ද්‍රවශීලතාව (QE 3) ක්‍රමානුකූලව අඩුකිරීම පිළිබඳ වූ අපේක්ෂාව ගෝලීය වෙළෙඳපොළ කෙරෙහි බලපෑම් ඇති කළ අතර, එක්සත් ජනපද බැඳුම්කර පොලී අනුපාතයන්ගේ ඉහළ යාම නිසා නැගී එන ආර්ථිකයන් හි සිදු වූ ප්‍රාග්ධන ප්‍රවාහ ගලායාම් තුළින් බොහොමයක් ඉදිරිපෙළ හා නැගී එන ආර්ථිකයන් හි මුදල් ඒකක ශීඝ්‍ර ලෙස අවප්‍රමාණය විය. යුරෝපීය කලාපයේ ඔවුන්ටම ආවේනික වූ දේශපාලන හා මූල්‍ය ගැටලු පැවතුණු අතර, අවධමන අවදානමක් ද දැකගත හැකි විය. ඇමෙරිකානු ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ප්‍රවනතා සමඟ රත්රන් මිලෙහි ද සියයට 25 ක පමණ වාර්තාගත කඩා වැටීමක් 2013 වසරේ දී සිදු වූ අතර මෙවන් තත්ත්වයන් යටතේ විදේශ සංචිතයන් හි ද්‍රවශීලතාව හා සුරක්ෂිතතාවය තහවුරු කරමින් සැලකිය යුතු ඉපැයුම් අනුපාතයක් අත්කරගැනීම ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවට අභියෝග යක් විය. කෙසේ වුවත් විදේශ විනිමය ගනුදෙනු, මුදල් වෙළෙඳපොළ ආයෝජන, ප්‍රාග්ධන ප්‍රතිලාභ සහ ස්ථාවර ආදායම් සුරැකුම්පත් පොලිය හරහා මහ බැංකුවේ සමස්ත විදේශ සංචිත කළමනාකරණ කටයුතු මඟින් එක්සත් ජනපද ඩොලර් මිලියන 194.4 (ආසන්න වශයෙන් රුපියල් බිලියන 25) ක ශුද්ධ විදේශ විනිමය ආදායමක් උපදවා ගනු ලැබීය.

සාම්ප්‍රදායික දියුණු වෙළෙඳපොළවල් අස්ථායී සහ අවිනිශ්චිත තත්ත්වයේ පැවති හෙයින් ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව අවදානම් අවම කර ගැනීමේ සහ ආයෝජන විවිධාංගීකරණය කිරීමේ අරමුණින් දකුණු කොරියාව, චීනය සහ ඉන්දියාව වැනි නැගී එන ආර්ථිකයන් හි ආයෝජන කටයුතු ක්‍රමානුකූලව ආරම්භ කරන ලදී. තවදුරටත් විදේශ සංචිතයෙහි වැඩිවන අවදානම් ආවරණය කිරීම සඳහා ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විවිධ ආයෝජන මාර්ගයන් අධ්‍යයනය ද ආරම්භ කරන ලදී.

වැඩිවන ගනුදෙනු ප්‍රමාණයන් හා වෙළෙඳපොළෙහි උච්ඡාවචනය මඟින් ඇතිවන අවදානම අවම කර ගැනීමට අවශ්‍ය නව මූල්‍ය උපකරණයන්හි ආයෝජනය කිරීම සඳහා නව භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දීමේ කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2013 වසර මුල් භාගයේ දී ආරම්භ කරන ලදී. 2013 නොවැම්බර් මස පළමු වන දින සිට නව භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියේ සජීවී මෙහෙයුම් කටයුතු ආරම්භ විය.

## 18.2 අවදානම් කළමනාකරණය

විදේශ සංචිත කළමනාකරණ මාර්ගෝපදේශයන්හි නිශ්චිතව දක්වා ඇති ආයෝජන කළඹ සහ කළමනාකරණය සම්බන්ධ ප්‍රතිපත්ති සමග අනුගත වීම තහවුරු කරනු වස්, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ මැදි කාර්යාලය (middle office) විසින් ජාත්‍යන්තර සංචිත ආයෝජන කළඹ කළමනාකරණයේ දී පැන නගින අවදානම් අඛණ්ඩව නිරීක්ෂණය කරනු ලැබිණි. උපායමාර්ගික ඉලක්ක මෙන්ම ප්‍රශස්ත තත්ත්වයන් සමග සංසන්දනය පහසු කිරීමට පනවා ඇති මිනුම් දඬු සමග සංසන්දනය කිරීමෙන් සක්‍රීය මූල්‍ය ගනුදෙනුවල කාර්යසාධනය ඇගයීමට ලක් කෙරිණි. තවද පරීක්ෂාකාරීව, තීරණාත්මක පියවර ගැනීමේ අරමුණු පෙරදැරිව විවිධ වූ අවදානම් පෙළක් මඟින් ඇතිවිය හැකි හානිකර ප්‍රතිවිපාක ඉස්මතු කරමින් අවදානම් පැතිකඩයන් ද නිරන්තරයෙන්ම සකස් කෙරිණි.

ඇතිවිය හැකි විනිමය අනුපාත අවදානම හඳුනා ගැනීම සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොළ තත්ත්වයන් සියුම් ලෙස පරීක්ෂා කරන ලදී. වසර තුළ දිගින් දිගටම දැකිය හැකි වූ යුරෝපා කලාපයේ ඇති වූ අස්ථාවරභාවයන්, ජපාන මහ බැංකුව විසින් සිදු කළ සාම්ප්‍රදායික නොවන මූල්‍ය ප්‍රතිපත්ති, ඇමෙරිකානු ෆෙඩරල් සංචිත බැංකුව ඉදිරිපත් කළ මූල්‍ය වෙළෙඳපොළෙහි ද්‍රවශීලතාව ක්‍රමානුකූලව අඩුකිරීම පිළිබඳ සංවාද (tapering talks) මෙන්ම නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන්හි ඇති වූ පසුබෑම් ඔස්සේ ඇති වූ ඉහළ විචල්‍යතාවයන් මධ්‍යයේ ආයෝජන කළඹ විවිධාංගීකරණය කිරීමටත්, උපක්‍රමශීලී ආකාරයේ විදේශ මුදල් සංයෝජනයක් පවත්වා ගැනීමටත්, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව යොමු විය. විශේෂයෙන් විදේශ මුදල් සංයුතිය තීරණය කිරීමේ දී අපේක්ෂිත විදේශ මුදල් වගකීම්, ගෝලීය මුදල් වෙළෙඳපොළ තත්ත්වයන් සහ විදේශ වෙළෙඳාමේ රටාවන් ද සලකා බැලිණි. අවදානම් අගයන් නිසි මට්ටම්වල පවත්වා ගෙනයාම පිණිස අවදානම් වටිනාකම (value at risk-VaR) ගණනයන් යොදාගත් අතර සඵල ආයෝජිත කාල (duration) ගණනයන් යොදා ගනිමින් ස්ථාවර ආදායම් සුරැකුම් කළඹෙහි වටිනාකමේ විය හැකි කෙටිකාලීන පහළ යාම ඇස්තමේන්තුගත කරන ලදී. "පාඩු නැවැත්වීමේ විධාන" (stop loss orders) සහ "ගනුදෙනුකරු සීමාවන්" (dealer limits) පැනවීම මඟින් මූල්‍ය ගනුදෙනු කටයුතු තුළින් උද්ගත විය හැකිව තිබූ විදේශ විනිමය පාඩු වළක්වාගන්නා ලදී. ස්ථාවර ආදායම් සුරැකුම් කළඹ හා සම්බන්ධිත පොලී අනුපාතික වෙනස්වීමේ අවදානම වළකාලීම සඳහා සංවේදීතා විශ්ලේෂණයන් (sensitivity analysis) යොදා ගන්නා ලදී. අපේක්ෂිත එලදා වක්‍ර විතැන්වීම මත පදනම්ව ස්ථාවර ආදායම් සහ මුදල් වෙළෙඳපොළ ආයෝජනයන් විශේෂිත කාලසීමා මට්ටම්වල තබා ගැනීමෙන් පොලී අනුපාතික අවදානමට නිරාවරණය වීම අවම කෙරිණි.

මූල්‍ය සංරචක, ණය ශ්‍රේණිගතකිරීම් (credit ratings) සහ "වෙළෙඳපොළ නිරාවරණය වීම මත පදනම් වූ පාර්ශවකාර ණය

අවදානම් කළමනාකරණ පද්ධතියේ'' (Counterparty Credit Risk Management System) සහාය ඇතිව ගනුදෙනුවලට සම්බන්ධිත පාර්ශවයනට සීමාවන් පැනවීම තුළින් පාර්ශවකාර ණය අවදානම අඛණ්ඩ පදනමකින් කළමනාකරණය කිරීම සිදු කෙරිණි. වසර තුළ ණය ඇගයීම් ශ්‍රේණිගත කිරීම්හි පසුබෑමක් පෙන් වූ පාර්ශ්වකරුවන් ගණනාවකගේ ගනුදෙනු සීමාවන් නිසි පරිදි සංශෝධනය කෙරිණි. අදාළ පාර්ශව කරුවන්ට විය හැකිව තිබූ අවදානම් ඔවුන්ගේ ණය පැහැර හැරීමේ හුවමාරු අනුපාතිකයන් (CDS) සහ කොටස් වෙළෙඳපොළ මිල ගණන් නිරීක්ෂණය කිරීම හරහා හඳුනා ගැනීමට හැකි විය.

සියලුම ගෙවීම් නිසි පරිදි සිදු කිරීමට හැකියාව ලබා ගැනීම සඳහා මෙම වසර තුළදී අදාළ විදේශ මුදල් වත්කම් ද්‍රවශීලව සහ ප්‍රමාණවත්ව පවත්වා ගැනීම තහවුරු කිරීම මඟින් ද්‍රවශීලතා අවදානම අඩුකර ගැනීමට හැකි විය. එසේම අනුමත කිරීමේ ක්‍රියාපටිපාටි ශක්තිමත් කිරීම, නව භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියක් ප්‍රතිසම්පාදනය සහ ආයෝජන මාර්ගෝපදේශ නැවත සැකසීම තුළින් විදේශ සංචිත කළමනාකරණය සඳහා සහාය වන නිලධාරීන්, පද්ධති සහ කාර්ය පටිපාටීන් වෙතින් උද්ගත වන මෙහෙයුම් අවදානම් සඳහා නිරාවරණය වීම අවම කර ගැනීමට හැකි විය.

### 18.3 දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ ප්‍රගතිය

එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව, ශ්‍රී ලංකා රුපියලේ විදේශ විනිමය අනුපාතිකයෙහි සිදුවන අධි විචලතාවයන් පාලනය කිරීමත්, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ ගනුදෙනු සුමටව පවත්වා ගැනීම සඳහාත්, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ කටයුතු, අධීක්ෂණය කිරීම 2013 වසරේ දී ද අඛණ්ඩව සිදු කරන ලදී. එසේම, බලපත්‍රලාභී වාණිජ බැංකු ඔවුන් හට නියමිත දෛනික ශුද්ධ විදේශ විනිමය සීමාවන් පිළිපදිමින් කටයුතු කළ බවද තහවුරු කරන ලදී. පොදු ජනතාවට සහ විවිධ ආයතනවලට විනිමය අනුපාත සම්බන්ධ තොරතුරු ලබා දීමේ වගකීම ද ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් ඉටු කරන ලදී.

වඩාත් නම්‍යශීලී ලෙස සිය විදේශ විනිමය ගනුදෙනු කරගෙන යාම සඳහා වාණිජ බැංකු මඟින් පවත්වාගෙන යා හැකි ශුද්ධ විදේශ විනිමය ප්‍රමාණයන් හි දෛනික සීමාවන් 2013 වසරේ දී ඉහළ දමමින් සංශෝධනය කරන ලදී. ඒ අනුව, එම සීමාව 2012 වසරේ වූ එ.ජ.ඩොලර් මිලියන 64.7 සිට එ.ජ.ඩොලර් මිලියන 120 දක්වා 2013 වසරේ දී ඉහළ දමන ලදී.

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ විමර්ශන අංශයෙහි කාර්යයන් කාර්යක්ෂම කිරීම මෙන්ම ඒ සඳහා අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග හඳුන්වා දීම පිණිස බැංකුව තුළම සංවර්ධනය කරන ලද "ජාත්‍යන්තර මෙහෙයුම් කළමනාකරණ පද්ධතියෙහි'' (International Operations Management System - IOMS) මුල් අදියර වසර තුළ දී ක්‍රියාවට නංවන ලදී. මෙම පද්ධතිය, දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන විනිමය අනුපාත සම්බන්ධ තොරතුරු ගුණාත්මකව හා කඩිනම්ව ලබාදීමට තවදුරටත් ආයක වේ.

**II-18 සංඛ්‍යා සටහන — අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු ප්‍රමාණය - 2013**

එ.ජ.ඩොලර් මිලියන

| මාසය | එතැන් | පසුදින | එදින | ඉදිරි | එකතුව |
|---|---|---|---|---|---|
| ජනවාරි | 399.91 | 277.82 | 92.31 | 378.23 | 1,148.27 |
| පෙබරවාරි | 296.71 | 182.55 | 145.12 | 331.34 | 955.71 |
| මාර්තු | 367.61 | 288.98 | 165.01 | 445.79 | 1,267.39 |
| අප්‍රේල් | 418.68 | 230.94 | 278.72 | 432.50 | 1,360.83 |
| මැයි | 381.15 | 302.78 | 187.23 | 503.19 | 1,374.35 |
| ජූනි | 420.53 | 252.18 | 111.61 | 453.21 | 1,237.54 |
| ජූලි | 209.10 | 200.55 | 149.53 | 599.69 | 1,158.87 |
| අගෝස්තු | 91.84 | 225.50 | 225.50 | 550.17 | 1,093.00 |
| සැප්තැම්බර් | 122.05 | 157.95 | 125.80 | 304.21 | 710.01 |
| ඔක්තෝබර් | 292.91 | 142.62 | 235.33 | 400.43 | 1,071.28 |
| නොවැම්බර් | 146.78 | 240.83 | 214.60 | 515.82 | 1,118.02 |
| දෙසැම්බර් | 381.46 | 228.85 | 141.24 | 458.50 | 1,210.05 |
| **එකතුව** | **3,528.73** | **2,731.55** | **2,072.00** | **5,373.08** | **13,705.32** |

**II-19 සංඛ්‍යා සටහන — ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් විදේශ විනිමය මිලට ගැනුම් සහ විකුණුම් - 2013**

එ.ජ.ඩොලර් මිලියන

| මාසය | මිලට ගැනුම් | විකුණුම් | ශුද්ධ මිලට ගැනුම්/(විකුණුම්) |
|---|---|---|---|
| ජනවාරි | 434.75 | 26.00 | 408.75 |
| පෙබරවාරි | 102.50 | 25.25 | 77.25 |
| මාර්තු | 17.00 | - | 17.00 |
| අප්‍රේල් | 61.50 | 18.00 | 43.50 |
| මැයි | 20.00 | - | 20.00 |
| ජූනි | 65.00 | 59.68 | 5.32 |
| ජූලි | - | 110.30 | -110.30 |
| අගෝස්තු | 12.00 | 328.87 | -316.87 |
| සැප්තැම්බර් | 2.50 | 60.60 | -58.10 |
| ඔක්තෝබර් | 164.15 | 11.48 | 152.67 |
| නොවැම්බර් | 20.00 | 51.38 | -31.38 |
| දෙසැම්බර් | 239.20 | 11.45 | 227.75 |
| **එකතුව** | **1,138.60** | **703.01** | **435.59** |

## 19. ගෙවීම් සහ පියවීම්

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය සහ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතුවලට අදාළ ගෙවීම් හා පියවීම් කටයුතු සිදු කිරීමත්, රට තුළ සුරක්ෂිත, ආරක්ෂාකාරී සහ කාර්යක්ෂම ගෙවීම් හා පියවීම් පද්ධති වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමත් තවදුරටත් සිදු කරන ලදී. ඒ අනුව, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු පවත්වා ගැනීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ සංචිත කළමනාකරණය සහ විවට වෙළෙඳ කටයුතු සඳහා අවශ්‍ය ගෙවීම් සහ පියවීම්

උපදෙස් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා පසු මෙහෙයුම් කාර්යාල පහසුකම් සැලසීම, ස්විෆ්ට් සන්නිවේදන කටයුතු කළමනාකරණය කිරීම, ආසියානු නිෂ්කාශන සංගමයේ රටවල් අතර ගනුදෙනු පියවීම මෙන්ම ගෙවීම් හා පියවීම් පද්ධති පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ අවේක්ෂණ කටයුතු සිදු කිරීම යන කාර්යයන් සිදු කරන ලදී. 2013 වසරේ දී ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කටයුතුවලට අදාළ ක්‍රියාකාරීත්වය සාරාංශගතව පහත දැක්වේ.

## 19.1 තත්කාලීන දළ පියවීම් පද්ධතිය

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ඡායාගත චෙක්පත් පිළිබිඹු නිෂ්කාශන පද්ධතිය, ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය සහ අනෙකුත් සුළු පරිමාණ විද්‍යුත් ගෙවීම් පද්ධතිවල පියවීම් කටයුතු ඇතුළු අන්තර් බැංකු ගෙවීම් මෙන්ම ගනුදෙනුකරුවන්ගේ ගෙවීම් ද තත්කාලීන දළ පියවීම් පදනම මත පියවීම සිදු කරන ලදී. 2013 ජූලි මස ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය ක්‍රියාත්මක වීමෙන් පසු එම යාන්ත්‍රණය මඟින් සිදු කරන ලද ගනුදෙනුවලට අදාළ පියවීම් කටයුතු ද තත්කාලීන දළ පියවීම් පද්ධතිය මඟින් සිදු කරන ලදී. එමෙන්ම තත්කාලීන දළ පියවීම් පද්ධතියේ සුමට ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා අතිරේක අරමුදල් ඉල්ලා සිටි සහභාගීත්ව ආයතන වෙත දෛනිකව ලබා දෙන ද්‍රවශීලතා පහසුකම් සැලසීම සහ එම කටයුතු නිරීක්ෂණය කිරීමත් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව නොකඩවා සිදු කරන ලදී.

- 2013 වසර තුළ දී තත්කාලීන දළ පියවීම් පද්ධතිය මඟින් සිදු කළ මුළු ගනුදෙනු සංඛ්‍යාව 306,977 ක් වූ අතර, එම ගනුදෙනුවල මූල්‍යමය වටිනාකම රුපියල් බිලියන 54,070 ක් විය.
- තත්කාලීන දළ පියවීම් පද්ධතිය මඟින් සිදු කළ ගනුදෙනු සංඛ්‍යාවේ සහ ඒවායේ මූල්‍ය වටිනාකම්වල දෛනික සාමාන්‍යය පිළිවෙලින් 1,263 ක් සහ රුපියල් බිලියන 223 ක් ද විය.
- දෛනිකව ලබා දෙන ද්‍රවශීලතා පහසුකම යටතේ සහභාගීත්ව ආයතන වෙත මුදාහරින ලද මුදල් ප්‍රමාණයෙහි දෛනික සාමාන්‍යය රුපියල් බිලියන 19.2 ක් විය.
- 2013 වසර තුළ දී තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි ක්‍රියාකාරී පැවැත්ම සියයට 99.93 ක් ලෙස පවත්වා ගැනීමට ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවට හැකි විය.

## 19.2 විදේශ විනිමය ගනුදෙනු පියවීම

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලද ජාත්‍යන්තර සංචිත කළමනාකරණ ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල කටයුතු සැලසීම 2013 වසර තුළ දී ද ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් නොඩකවා සිදු කරන ලද අතර ගනුදෙනු මෙහෙයුම් මැදිරියෙහි කටයුතු නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලද නව භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය (Treasary Management System) සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා දායකත්වය සැපයීම ද සිදු කරන ලදී. ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියෙහි පසු මෙහෙයුම් කාර්යාල මොඩියුලය නිම කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා දෙන ලද අතර, එම පසු මෙහෙයුම් කාර්යාල කටයුතු පිළිබඳ පරීක්ෂණ සහ පුහුණු සැසිවාර සඳහා සහභාගි වන ලදී. 2013 නොවැම්බර් මස 01 වැනි දින භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියෙහි සජීවී මෙහෙයුම් කටයුතු ආරම්භ වීමත් සමඟ එදිනෙදා කෙරෙන ගනුදෙනු සඳහා අඛණ්ඩව පසු මෙහෙයුම් කාර්යාල සේවාවන් සපයන අතරතුරදීම නව පද්ධතියට සංක්‍රමණය වීම කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් 2013 වසරේ අවසාන මාස දෙක තුළ දී පැරණි සහ නව පද්ධතීන් දෙකම සමගාමීව ක්‍රියාත්මක කරන ලදී.

- 2013 වසර තුළ දී ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් එ.ජ. ඩොලර් බිලියන 265 ක වටිනාකමකින් යුත් විදේශ විනිමය වෙළෙඳපොළ කටයුතු, මූල්‍ය වෙළෙඳපොළ කටයුතු, ස්ථාවර ආදායම් සුරැකුම්පත් කටයුතු, රත්රන් වෙළෙඳපොළ කටයුතු සහ ආසියානු නිෂ්කාශන සංගමයේ කටයුතු හා සම්බන්ධ ගනුදෙනු 16,899 කට අදාළ ගෙවීම් පියවන ලදී. 2012 වසර සමඟ සසඳන විට දී මෙම ගනුදෙනු සංඛ්‍යාවෙහි සියයට 14 ක අඩුවීමක් පෙන්නුම් කරන ලද අතර එම ගනුදෙනුවල වටිනාකමෙහි සියයට 17 ක වැඩිවීමක් වාර්තා කෙරිණි.
- ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව මඟින් සිදුකරන ජාත්‍යන්තර සංචිත කළමනාකරණ ගනුදෙනුවල වැඩිවන ගනුදෙනු ප්‍රමාණය සඳහා පහසුකම් සැපයීමට, 2013 වසරේ දී ද බහු මුර වැඩ ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී.

## 19.3 විවට වෙළෙඳ කටයුතු පිළිබඳ ගනුදෙනු පියවීම

ලංකාසෙට්ල් පද්ධතියෙහි සහභාගිකරුවන්ගේ ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් පිළිබඳ ගනුදෙනු සඳහා සුරැකුම්පත් වෙන්කර දීම මඟින් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විවට වෙළෙඳ කටයුතු සඳහා පසු මෙහෙයුම් කාර්යාල පහසුකම් සලසා දෙන ලදී.

- ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් රුපියල් බිලියන 5,677 ක්වූ ප්‍රතිමිලදීගැනුම් ගනුදෙනු 5,270 ක් ද රුපියල් බිලියන 187 ක් වූ ප්‍රතිවිකිණුම් ගනුදෙනු 262 ක් ද රුපියල් බිලියන 129 ක්වූ ස්ථිර පදනමක් මත කරන ලද විකුණුම් ගනුදෙනු 84 ක් ද සඳහා පියවීම් කටයුතු සිදු කරන ලදී.

**19.4 ස්විෆ්ට් සන්නිවේදන කටයුතු**

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් දේශීය සහ ජාත්‍යන්තර මූල්‍ය ආයතන සමග ශ්‍රී ලංකා මහ බැංකුව සිදු කරනු ලබන ස්විෆ්ට් සන්නිවේදන කටයුතු පවත්වාගෙන යාම සිදු කරනු ලබයි. මේ අතර, මූල්‍ය කටයුතු සන්නිවේදනයේ ගෝලීය ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා 2013 නොවැම්බර් මාසයේ දී ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ස්විෆ්ට් පද්ධතියෙහි වැඩිදියුණු කරන ලද නව අනුවාදය සාර්ථකව ස්ථාපනය කරන ලදී.

- 2013 වසර තුළ දී යවන ලද සහ ලැබූ ස්විෆ්ට් පණිවුඩ සංඛ්‍යාව පිළිවෙලින් 1,553,537 ක් සහ 862,432 ක් විය.
- ස්විෆ්ට් මූලස්ථානය විසින් 2013 වසරේ දී ස්විෆ්ට් පද්ධතියට පිවිසීමට දැනට පවතින ස්විෆ්ට් යෙදවුම් අතුරු මුහුණත් ක්‍රමවේදයට අමතරව ස්විෆ්ට් වෙබ් අඩවිය හරහා පද්ධතියට පිවිසීමේ පහසුකම් සලසා දීම සඳහා ස්විෆ්ට් සේවාව වැඩිදියුණු කිරීම සිදු කරන ලදී. ඒ අනුව ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් එම පිවිසුම් ක්‍රමවේදයට තම කාර්ය මණ්ඩලය හුරුකිරීම සඳහා කටයුතු සලසන ලදී.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය ගනුදෙනු සඳහා මූල්‍ය කටයුතු සන්නිවේදනය කිරීමට පහසුකම් සැලසීම අරමුණු කරගෙන බහු මුර වැඩ ක්‍රමය යටතේ ස්විෆ්ට් සේවාව පෙරවරු 8.00 සිට පස්වරු 8.00 දක්වා පවත්වාගෙන යන ලදී.

**19.5 ආසියානු නිෂ්කාශන සංගමයේ ගනුදෙනු**

ආසියානු නිෂ්කාශන සංගමයේ (ආ.නි.සං.) සාමාජික රටවල් නවය අතර අන්තර් කලාපීය ගනුදෙනු ආ.නි.සං. යාන්ත්‍රණය හරහා සිදු කිරීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී.

- 2013 වසරේ දී ආ.නි.සං. යාන්ත්‍රණය හරහා ශ්‍රී ලංකාව විසින් සිදු කළ මුළු ගනුදෙනු සංඛ්‍යාව සහ එම ගනුදෙනුවල වටිනාකම පිළිවෙලින් 5,018 ක් හා රුපියල් බිලියන 243.6 ක් විය. ආ.නි. සං. යාන්ත්‍රණය හරහා සිදු කරන ලද ශුද්ධ පියවීම්වල වටිනාකම රුපියල් බිලියන 198.9 ක් විය.
- ආ.නි.සං. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ 42 වන රැස්වීම 2013 ජූනි මස පකිස්ථානයේ දී පවත්වන ලද අතර නියෝජ්‍ය අධිපතිතුමා, ආ.නි.සං. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ද ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරිය, ආ.නි.සං. විකල්ප අධ්‍යක්ෂකවරියක ලෙස ද එම රැස්වීමට සහභාගි වූහ. 42 වන ආ.නි.සං. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගන්නා ලද තීරණවලට අනුකූල වීම සඳහා අවශ්‍ය වෙනස්කම් ඇතුළත් කරමින් 2013 සැප්තැම්බර් මාසයේ දී ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ආ.නි.සං. යාන්ත්‍රණය පිළිබඳ මාර්ගෝපදේශ සංශෝධනය කරන ලදී.
- 2013 නොවැම්බර් මස දී භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය ආරම්භ වීමත් සමග ආ.නි.සං. ගනුදෙනු මංගතව සිදු කිරීමට පහසුකම් සැලසීම සඳහා එම ගනුදෙනු ද භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය සමග සම්බන්ධ කරන ලදී.

**19.6 ගෙවීම් පද්ධති පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය සහ අවේක්ෂණය**

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ගෙවීම් හා පියවීම් පද්ධති ස්ථායීතාව සහතික කිරීම අරමුණු කරගෙන රට තුළ සුරක්ෂිත, ශක්තිමත් සහ කාර්යක්ෂම ගෙවීම් හා පියවීම් පද්ධති පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අධීක්ෂණ කටයුතු තවදුරටත් සිදු කරන ලදී. ඊට අමතරව, සුළු පරිමාණ විද්‍යුත් ගෙවීම් පද්ධතිවල මෙහෙයුම් කටයුතු යහපත් ලෙස පවත්වාගෙන යාම සඳහා නියාමන රාමුව ශක්තිමත් කිරීමට කටයුතු කරන ලදී. මේ අනුව, 2013 වසරේ දී ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන අවේක්ෂණ කටයුතු සිදු කරන ලදී.

- ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් සේවා නියාමනය කිරීමේ දී ඇති වූ ප්‍රායෝගික සහ නීතිමය ගැටලු නිරාකරණය කිරීම සඳහා 2009 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් සඳහා වූ නියෝගය ප්‍රතිස්ථාපනය කරමින් 2013 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත සේවා සඳහා වූ නියෝග නිකුත් කරන ලදී.
- සුදුසුකම්ලත් පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපාර යෝජනා ඇගයීමෙන් අනතුරුව ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ගෙවීම් කාඩ්පත් ව්‍යාපාරයේ නිරත වීම සඳහා ආයතන තුනකට බලපත්‍ර නිකුත් කරන ලද අතර ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ජංගම දුරකථන ජාල ක්‍රියාකරුවකුට ද බලපත්‍රයක් නිකුත් කරන ලදී. මෙයට අමතරව ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට බලපත්‍රයක් නිකුත් කර ඇති ජංගම දුරකථන ජාල ක්‍රියාකරුවකුට පොදු ප්‍රවාහනය සඳහා අගය රාශිගත කාඩ්පතක් නිකුත් කරනු ලබන විද්‍යුත් මුදල් පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.
- රට තුළ ගෙවීම් කාඩ්පත් මෙහෙයුම් කටයුතුවල සුරක්ෂිතභාවය සහතික කිරීම සඳහා මූල්‍ය අත්පත්කරුවන් ලෙස ව්‍යාපාර කටයුතුවල යෙදෙන ආයතන විසින් සිය වෙළෙඳපොළ විකුණුම් යන්ත්‍ර සඳහා දත්ත සංකේතන තාක්ෂණය යොදා ගැනීම අධීක්ෂණය කරන ලදී. ඒ අනුව 2013 මාර්තු මස 31 වනවිට සියලුම මූල්‍ය අත්පත්කරුවන් තම වෙළෙඳපොළ විකුණුම් යන්ත්‍ර සඳහා දත්ත සංකේතන තාක්ෂණය ආදේශ කරමින් වැඩි දියුණු කරන ලදී.
- ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින්, සුළු පරිමාණ විද්‍යුත් ගෙවීම් පද්ධති සඳහා රටම ආවරණය වන පොදු

පසුබිමක් ක්‍රියාත්මක කිරීම අරමුණු කරගෙන, කාඩ්පත් හා අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම තවදුරටත් සිදු කරන ලදී. කාඩ්පත් හා අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි පළමුවන පියවර ලෙස ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය 2013 ජූලි මස 23 වැනි දින සජීවී මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද අතර, එම යාන්ත්‍රණයේ සුමට ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම සඳහා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සාමාජිකයින් වෙත පහත සඳහන් පොදු විධිවිධානයන් නිකුත් කරන ලදී.

(i) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු සඳහා වූ 2013 අංක 1 දරන පොදු විධිවිධානය. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට මෙන්ම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින් සඳහා විචක්ෂණශීලී සහ අනිවාර්ය අවශ්‍යතා නියම කිරීම සඳහා මෙම විධිවිධානය නිකුත් කරන ලදී.

(ii) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය මඟින් සිදු කරන ගනුදෙනු සඳහා අය කළ හැකි ගාස්තු පිළිබඳ 2013 අංක 2 දරන පොදු විධිවිධානය කාඩ්පත් නිකුත් කරන්නන් විසින් ගනුදෙනුකරුවන්ගෙන් අය කරනු ලබන ගාස්තුව සහ අන්තර් හුවමාරු ගාස්තුවක් ලෙස මූල්‍ය අත්පත්කරු විසින් කාඩ්පත් නිකුත් කරන්නාගෙන් අයකර ගත හැකි ගාස්තුව පිළිබඳව සීමාවන් පැනවීම සඳහා මෙම පොදු විධිවිධානය නිකුත් කරන ලදී.

- ඡායාගත චෙක්පත් පිළිබිඹු නිෂ්කාශන පද්ධතියට සිදු කරන ලද තාක්ෂණික වැඩිදියුණු කිරීම්වල වාසිය බැංකු ගනුදෙනුකරුවන්ට ලබාදීමට, නිෂ්කාශනය සඳහා චෙක්පත් තැන්පතු භාර ගැනීමේ සහ නිෂ්කාශනය කරන ලද චෙක්පත්වලට අදාළ අරමුදල් ගිණුම්වලට බැර කිරීමේ නව කඩඉම් වේලාවන් නියම කිරීම සඳහා 2013 අංක 3 දරන, චෙක්පත් තැන්පතු භාර ගැනීම සහ චෙක්පත්වලට අදාළ අරමුදල් බැර කිරීම සඳහා අදාළ සේවා නියමයන් සහ සම්මත වේලාවන් පිළිබඳ පොදු විධිවිධානය නිකුත් කරන ලදී. මෙම විධිවිධානය මඟින් 2007 අංක 1 දරන ඡායාගත චෙක්පත් පිළිබිඹු නිෂ්කාශන පද්ධතිය යටතේ ගනුදෙනුකරුවන්ගෙන් චෙක්පත් තැන්පතු භාර ගැනීම සහ චෙක්පත්වලට අදාළ අරමුදල් ගනුදෙනුකරුවන්ගේ ගිණුම්වලට බැර කිරීම සඳහා සහභාගීත්ව ආයතනවලට අදාළ සම්මත වේලාවන් සහ සේවා නියමයන් පිළිබඳ පොදු විධිවිධාන ප්‍රතිස්ථාපනය කරන ලදී.
- එදිනෙදා සිදුවන සුළු පරිමාණ විද්‍යුත් ගෙවීම් සඳහා සුරක්ෂිත සහ විශ්වාසදායී පරිසරයක් නිර්මාණය කිරීම මඟින් ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම සඳහා ණය කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් සඳහා වූ මාර්ගෝපදේශයන් සඳහා සේවා සැපයුම්කරුවන්ගේ අනුකූලතාවය අධීක්ෂණය කරන ලදී.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුව සිය ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් යාවත්කාලීන කර තිබේ ද යන්න අධීක්ෂණය සඳහා ලංකාසෙට්ල් පද්ධතියෙහි සහභාගීත්ව ආයතනවල ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ඇගයීම සිදු කරන ලදී. සෑම සහභාගීත්ව ආයතනයක් විසින්ම තම අධ්‍යක්ෂ මණ්ඩලයේ විමර්ශණය යටතේ වසර තුළ දී අවම වශයෙන් එක් ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් වාරයක් පවත්වන ලෙසට නියම කරන ලදී.

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ගෙවීම් හා පියවීම් පද්ධති පිළිබඳ තොරතුරු ප්‍රචාරණය කිරීම සඳහා නිකුත් කරනු ලබන කාර්තුමය ගෙවීම් සඟරාව ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙහි පළ කරන ලදී. එමෙන්ම, සුරක්ෂිත හා කඩදාසි පත් මත පදනම් වූ ගෙවීම් ක්‍රමවලට වඩා කාර්යක්ෂම විද්‍යුත් ගෙවීම් ක්‍රම භාවිතයට උනන්දු කිරීම අරමුණු කරගෙන සාමාන්‍ය ජනතාවට සහ බැංකු කාර්යමණ්ඩලවලට ගෙවීම් පද්ධති සහ අනෙකුත් අදාළ කරුණු පිළිබඳව දැනුමක් ලබාදීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

මෙයට අමතරව, ජාතික ගෙවීම් හා පියවීම් පද්ධති ප්‍රතිසංස්කරණය කරමින් ඉදිරියට යාම සඳහා සාමාජික රටවලට උපකාරී කිරීමට හා ඒ රටවල් අතර පොදු අවබෝධය හා සහයෝගීතාව ඇති කිරීමත් සාර්ක් කලාපීය රටවල් අතර වෙළෙඳ සහ ආයෝජන ප්‍රවාහයන් සඳහා පහසුකම් සලසන සුදුසු කලාපීය ගෙවීම් පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා පිහිටුවනු ලැබූ සාර්ක් ගෙවීම් කවුන්සිලයෙහි රැස්වීම් සඳහා, ගෙවීම් හා පියවීම් පද්ධතිවල කලාපීය සහයෝගීතාව වර්ධනය කිරීමේ අරමුණ ඇතිව ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී ලෙස සහභාගී විය. 2013 ජූලි මස 13 වන සාර්ක් ගෙවීම් කවුන්සිල රැස්වීම භූතානයේ දී පවත්වන ලද අතර, 2013 දෙසැම්බර් මස 14 වන සාර්ක් ගෙවීම් කවුන්සිල රැස්වීම ඉන්දියාවේ දී පවත්වන ලදී.

## 20. ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ

2007 වසරේ දී පිහිටුවන ලද ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුවට, ශ්‍රී ලංකා මහ බැංකුවේ උපාය මාර්ගික සැලසුම පිළියෙළ කිරීමේ කටයුතු සම්බන්ධීකරණය සහ ප්‍රතිපත්ති සමාලෝචන සහ අධ්‍යයනයන් සිදු කිරීම පිළිබඳ වගකීම පැවරී ඇත. මේ අනුව, ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ උපාය මාර්ගික සැලසුම පිළියෙළ කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීමත්, උපාය මාර්ගික සැලසුම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමත්, කාලීන වශයෙන් වැදගත් ගැටලු සම්බන්ධව ප්‍රතිපත්ති අධ්‍යයනයන් සිදු කිරීමත් කරනු ලබයි.

### 20.1 උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීම

2013 ජනවාරි 01 වැනි දින දියත් කරන ලද, 2013-2017 කාලපරිච්ඡේදය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ 7 වැනි උපාය මාර්ගික සැලසුමෙහි තේමාව වූයේ ''සුදානම් වන්න, ඩොලර් 4,000 ඉදිරියෙන්'' යන්නයි. එහිදී මේ පිළිබඳව බැංකුවේ සියලුම නිලධාරීන් සඳහා දින දෙකක දැනුම්වත් කිරීමේ වැඩමුළුවක්, 2013 ජනවාරි මුල් සතියේ දී පැවැත්විය. මෙම වැඩමුළුවේ දී කරන ලද සමීක්ෂණයේ තොරතුරු වලට අනුව, උපාය මාර්ගික සැලසුමෙහි අන්තර්ගතය පිළිබඳව මහ බැංකු සේවකයින්ට මනා දැනුමක් ඇති බව අනාවරණය විය.

ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව උපාය මාර්ගික සැලසුම ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය කළ අතර දෙපාර්තමේන්තු හා ප්‍රාදේශීය කාර්යාල සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම් කාර්තුමය වශයෙන් පවත්වන ලදී. අධිපතිතුමා මුලසුන දරන සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉහළ කළමනාකාරීත්වයෙන් සැදුම්ලත් උපාය මාර්ගික සමාලෝචන කමිටුව වෙත උපාය මාර්ගික සැලසුම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය වාර්තා කෙරිණි. එහිදී, සැලසුම ක්‍රියාත්මක කිරීමේ දී පැනනගින අවහිරතාවයන් සහ බාධාවන් ඉවත් කිරීම සඳහා උපාය මාර්ගික සමාලෝචන කමිටුව විසින් කරන ලද නිර්දේශයන් අදාළ දෙපාර්තමේන්තු වෙත අවශ්‍ය කටයුතු සඳහා දැනුම් දෙන ලදී. කාර්තුමය වශයෙන් ප්‍රගති වාර්තා මුදල් මණ්ඩලය වෙත ද ඉදිරිපත් කරන ලදී. 2013 වසර සඳහා වූ උපාය මාර්ගික සැලසුමේ සියයට 97 ක සාධන මට්ටමක් ශ්‍රී ලංකා මහ බැංකුව ළඟා කර ගන්නා ලදී.

ඊට අමතරව, ඉදිරි පස් අවුරුදු කාලපරිච්ඡේදය සඳහා උපාය මාර්ගික සැලසුම පිළියෙළ කිරීමට අදාළ අට වැනි උපාය මාර්ගික සැලසුම් කතිකාවත 2013 වසරේ සැප්තැම්බර් මාසයේ දී ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී. මුදල් මණ්ඩලයේ සාමාජිකයින්, මහ බැංකුවේ සාංගමික කළමනාකාරීත්වය, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, අතිරේක දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ තෝරාගත් අනෙකුත් කාර්යය මණ්ඩල සාමාජිකයින් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදේශක කමිටුවල සාමාජිකයින් මෙම කතිකාවත සඳහා සහභාගී වූහ. මෙහිදී, 2013-2017 කාලපරිච්ඡේදය සඳහා වූ උපාය මාර්ගික සැලසුම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කළ අතර "පියවර ඉහළට උගුලෙන් ඉවතට" යන තේමාව යටතේ 2014-2018 කාලපරිච්ඡේදය සඳහා වූ උපාය මාර්ගික සැලසුම පිළියෙළ කිරීමට අවශ්‍ය කටයුතු කරන ලදී. ඉහළ මට්ටමේ තිරසාර ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට සහ එමගින් මැදි ආදායම් උගුලින් ඉවතට යාමට අවශ්‍ය වන ආර්ථික පරිවර්තනයකට පහසුකම් සපයන ප්‍රතිපත්ති මෙම 2014-2018 උපාය මාර්ගික සැලසුමෙහි අන්තර්ගත වේ. 2014-2018 උපාය මාර්ගික සැලසුම සකස් කිරීම ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වගකීමක් විය.

### 20.2 ප්‍රතිපත්ති සමාලෝචන සහ අධ්‍යයන සිදු කිරීම

වසර තුළදී ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මැදි ආදායම් උගුල, මූල්‍ය අංශයේ නීති, රාජ්‍ය ආදායමේ ප්‍රවණතාවන්, ගෝලීය තේ වෙළෙඳපොළ, වෙනත් මහ බැංකුවල උපාය මාර්ගික සැලැසුම් ක්‍රියාවලිය, විදේශීය උපාධි පිරිනමන අධ්‍යාපනික ආයතන සහ අපනයන අංශයේ කාර්ය සාධනය යන විෂයන්ට අදාළ ප්‍රතිපත්ති අධ්‍යයන කිහිපයක් සිදුකරන ලදී. ප්‍රතිපත්ති සම්බන්ධ ලිපි ලේඛනවල ඉලෙක්ට්‍රොනික එකතුවක් වන ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග පිළිබඳව වූ විද්‍යුත් පුස්තකාලය අඛණ්ඩව යාවත්කාලීන කළ අතර 2013 වසර අවසාන වන විට ලිපි ලේඛන 735 ක් එහි අඩංගු විය. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය දැනුම හුවමාරු කර ගැනීමේ කටයුතුවල නිරත වෙමින් ප්‍රතිපත්ති ගැටලු පිළිබඳව අභ්‍යන්තර ඉදිරිපත් කිරීම් 11 ක් 2013 වසර තුළ දී දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

## 21. පළාත් කාර්යාල මෙහෙයුම් කටයුතු

2013 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දකුණ, උතුරු මැද, මධ්‍යම, උතුර හා නැගෙනහිර යන පළාත්වල ක්‍රියාත්මක වූ පළාත් කාර්යාල මගින්, එම පළාත්වලට අදාළව මහ බැංකු කාර්යයන් හා සංවර්ධනය හා බැඳුණු වෙනත් කටයුතු තවදුරටත් සාර්ථකව ඉටුකරන ලදී. මහ බැංකුවේ පුළුල් උපායමාර්ගික අරමුණු ඉටුකර ගැනීම සඳහා පළාත් කාර්යාල සිය කාර්යයන් ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම පිණිස පළාත් කාර්යාල මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව (ප.මෙ.දෙ.) විසින් පළාත් කාර්යාලවල කටයුතු විධිමත්ව අධීක්ෂණය කරන ලදී.

### 21.1 පළාත් කාර්යාලවල කටයුතු මෙහෙයවීම

ප.මෙ.දෙ. මගින් සිය අධීක්ෂණ කටයුතු සිදුකරන ලද්දේ වසර ආරම්භයේ දී එක් එක් පළාත් කාර්යාලය සඳහා පිළියෙල කරන ලද විස්තරාත්මක වැඩසටහන් දින දර්ශනය පදනම් කරගෙනය. සිය දුරස්ථ අධීක්ෂණ ක්‍රියාවලිය යටතේ පළාත් කාර්යාලවල කටයුතු සම්බන්ධ ප්‍රගතිය සමාලෝචනය කිරීම පිණිස ප.මෙ.දෙ. විසින් සෑම පළාත් කාර්යාලයකින් ම දෛනික වාර්තා මෙන්ම, සතිපතා සහ මාසිකව ප්‍රගති වාර්තා ලබා ගන්නා ලදී. ඊට අමතරව, අවස්ථා 27 ක දී බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ ප.මෙ.දෙ. නිලධාරීන් පළාත් කාර්යාලවලට ගොස් එතැන් පරීක්ෂණ කටයුතුවල නිරත විය. වසර තුළ දී, තවදුරටත් පළාත් කාර්යාල කටයුතුවල ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා පළාත් කළමනාකරුවන් සහ අනෙකුත් නිලධාරීන් සමඟ වීඩියෝ දුරකථන සම්මන්ත්‍රණ 6 ක් සහ ප්‍රධාන කාර්යාලයේ රැස්වීම් 7 ක් ද පවත්වන ලදී. ප.මෙ.දෙ. විසින් දේශීය මෙන්ම විදේශීය පුහුණු වැඩසටහන් කිහිපයක් සංවිධානය කිරීම මගින් සේවකයින්ගේ කළමනාකරණ හා තාක්ෂණික නිපුණතාවයන් වර්ධනය කර ගැනීම සඳහා ද අවස්ථාව සලසා දෙන ලදී.

### 21.2 පළාත් කාර්යාලවල කාර්යයන්

#### (අ) මහ බැංකු කාර්යයන් පළාත් මට්ටමින් ව්‍යාප්ත කිරීම

පළාත් කාර්යාල විසින් සාමාන්‍ය මහජනයා, මූල්‍ය ආයතන සහ රාජ්‍ය හා වෙනත් පෞද්ගලික ආයතනවල නිලධාරීන් සහ ශිෂ්‍යයන් හා ගුරුවරුන් දැනුම්වත් කිරීම සඳහා වැඩසටහන් 416 ක් වසර තුළ දී පවත්වා ඇත. මේ යටතේ විශේෂයෙන් මූල්‍ය සාක්ෂරතාවය, රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය, මහ බැංකුව විසින් හඳුන්වා දී ඇති ණය යෝජනා ක්‍රම යටතේ මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ ඇති ප්‍රයෝජන, මුදල් නෝට්ටුවල ඇතුළත් ආරක්ෂිත සළකුණු, අව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම සහ මුදල් නෝට්ටු හා කාසි භාවිතය පිළිබඳ යහපත් පුරුදු, අවසර නොලත් මූල්‍ය ආයතනවල සහ නීතිවිරෝධී යෝජනා ක්‍රමවල ආයෝජනය කිරීමේ අනිසි ප්‍රතිවිපාක යනාදී විෂය ක්ෂේත්‍රයන් ආවරණය කරන ලදී. ඊට අමතරව, මහ බැංකුවේ විවිධ දෙපාර්තමේන්තු වෙනුවෙන් දත්ත හා තොරතුරු රැස්කිරීමට ද පළාත් කාර්යාල සිය දායකත්වය සපයා ඇත. තවදුරටත්, සේවක අර්ථසාධක අරමුදලෙහි සාමාජිකයන් විසින් එම අරමුදලට අදාළව කරන ලද විමසීම් සම්බන්ධව කටයුතු කිරීමටත්, සමරු කාසි සහ මහ බැංකු ප්‍රකාශන අලෙවිය සඳහා පළාත් කාර්යාලවල අලෙවි කවුළු පවත්වා ගැනීමටත් පළාත් කාර්යාල කටයුතු කරන ලදී. සංවර්ධන කාර්යයන්ට අදාළව ඒ ඒ පළාත්වල පවත්වන ලද වැදගත් රැස්වීම් හා සම්මන්ත්‍රණ වල දී මහ බැංකුව නියෝජනය කිරීම පළාත් කළමණාකරුවන් විසින් ඉටුකරන ලදී.

#### (ආ) සංවර්ධනයට අදාළ කටයුතු

සියලුම පළාත් කාර්යාල අදාළ පළාත්වල ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා සක්‍රීය ලෙස සිය දායකත්වය සපයන ලදී. මේ යටතේ, ව්‍යවසායකයන්ගේ නිපුණතාවය වර්ධනය කිරීම, නව තාක්ෂණය හා ප්‍රශස්ත ක්‍රමවේදයන් භාවිතා කිරීම කෙරෙහි ප්‍රමුඛත්වය ලබා දෙන ලදී. පළාතේ අදාළ ආයතන සම්බන්ධකර ගනිමින් ව්‍යවසායකයන් සඳහා න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික පුහුණුව ලබා දීමට ද කටයුතු කරන ලදී. මීට අමතරව, සෑම පළාත් කාර්යාලයක් මඟින්ම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට සහයෝගය ලබා දීම සඳහා විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ දැනුමක් සහිත උපදේශක මණ්ඩලයක් පත්කිරීමට ද, නිෂ්පාදකයන් හා මහා පරිමාණ ගැණුම්කරුවන් අතර අලෙවිකරණ සම්බන්ධතා වර්ධනය කිරීම සඳහා වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ද කටයුතු කරන ලදී. තවද වසර තුළ දී, විද්‍යාත්මක කෘෂිකාර්මික ක්‍රම, පසු අස්වනු තාක්ෂණය, අධි තාක්ෂණික කෘෂිකර්මය යනාදී විෂයයන් ආවරණය වන පරිදි නිපුණතා සංවර්ධන වැඩසටහන් 135 ක් පවත්වන ලද අතර, ඊට පුද්ගලයින් 6,517 දෙනෙකු පමණ සහභාගී වී තිබුණි.

2013 වසර තුළ දී පළාත් කාර්යාල විසින් පවත්වන ලද වැඩසටහන් පිළිබඳ විස්තර අංක II-20 දරණ සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**II-20 සංඛ්‍යා සටහන** — **2013 වසර තුළදී පළාත් කාර්යාල විසින් පවත්වන ලද වැඩසටහන්**

| පළාත් කාර්යාලය | දැනුම්වත් කිරීමේ වැඩසටහන් | | නිපුණතා සංවර්ධන වැඩසටහන් | |
|---|---|---|---|---|
| | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව |
| දකුණු පළාත | 88 | 7,623 | 23 | 1,302 |
| උතුරු මැද පළාත | 78 | 6,489 | 51 | 2,493 |
| මධ්‍යම පළාත | 94 | 7,411 | 25 | 1,283 |
| උතුරු පළාත | 77 | 7,545 | 15 | 526 |
| නැගෙනහිර පළාත | 79 | 6,157 | 21 | 913 |
| **එකතුව** | **416** | **35,225** | **135** | **6,517** |

## 22. රාජ්‍ය ණය

මුදල් නීති පනතේ 113 වගන්තියට අනුව රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත. ඒ අනුව රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, දේශීය ණය සහ විදේශීය වාණිජ ණය නිකුත් කිරීම සහ රජය වෙනුවෙන් රාජ්‍ය ණය සේවාකරණය කිරීමේ කටයුතුවල අඛණ්ඩව නියැලිණි. 2013 වසර තුළ දී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

### 22.1 රාජ්‍ය අයවැය මූල්‍යනය සඳහා අරමුදල් රැස්කිරීම

2013 වසරේදී රජයේ දළ ණය අරමුදල් අවශ්‍යතාව මූල්‍යනය කිරීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුතු මඟින් දේශීය හා විදේශීය මූලාශ්‍රයන්ගෙන් මුදල් රැස්කිරීමෙහි නිරත විය. ඉහත සඳහන් කළ ණය උපකරණ මඟින් 2013 වසර තුළ දී සිදු කරනු ලැබූ මූල්‍යන කටයුතු පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ:

#### (අ) භාණ්ඩාගාර බිල්පත්

2013 වසර තුළ දී සතිපතා පවත්වනු ලැබූ වෙන්දේසි යටතේ නිකුත් කරනු ලැබූ භාණ්ඩාගාර බිල්පත්වල මුහුණත වටිනාකම රුපියල් බිලියන 1,235.3 ක් විය. විදේශීය ආයෝජකයින් 2013 වසර තුළ දී භාණ්ඩාගාර බිල්පත්වල නැවත ආයෝජනය කිරීම් ද ඇතුළත්ව සිදු කළ දළ ආයෝජනය රුපියල් බිලියන 90.3 ක් විය. වසර තුළ දී සිදු කළ මුළු නිකුත් කිරීම්වලින් රුපියල් බිලියන 1,170.5 ක් කල්පිරුණු භාණ්ඩාගාර බිල්පත් නැවත නිකුත් කිරීම් වූ අතර ඉතිරි රුපියල් බිලියන 64.8 නව නිකුතුන් විය.

#### (ආ) භාණ්ඩාගාර බැඳුම්කර

2013 වසරේ දී සිදු කල භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම්වල මුහුණත වටිනාකම රුපියල් බිලියන 1,017.1 ක් විය. මෙම නිකුතුන් ප්‍රාථමික වෙන්දේසි 13 ක් හා සෘජු තැන්පතු හරහා සිදු කරන ලදී. භාණ්ඩාගාර බැඳුම්කර මුළු නිකුත් කිරීම්වලින් රුපියල් බිලියන 560.8 ක් වසර තුළ දී කල්පිරුණු භාණ්ඩාගාර බැඳුම්කර නැවත

නිකුත් කිරීම් වන අතර ඉතිරි රුපියල් බිලියන 456.3 නව නිකුත් කිරීම් විය. 2013 වසර තුළ දී කල්පිරීමේ කාලය වසර 30 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රථම වරට නිකුත් කිරීමේ හැකියාව රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට ලැබිණ. 2013 වසරේ දී විදේශිකයන් විසින් භාණ්ඩාගාර බැඳුම්කරවල කරන ලද දළ ආයෝජන රුපියල් බිලියන 250.7 ක් වූ අතර ඉන් රුපියල් බිලියන 92.6 ක් වසර තුළ දී කල්පිරුණු භාණ්ඩාගාර බැඳුම්කර නැවත ආයෝජනයන් වේ.

**(ඇ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර**

2013 වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 1,820.2 ක් වටිනා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ප්‍රාථමික වෙන්දේසි 6 ක් මගින් නිකුත් කරන ලදී. මුළු නිකුත් කිරීම්වලින් එ.ජ. ඩොලර් මිලියන 750.1 ක් කල්පිරුණු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුතුන් වූ අතර ඉතිරිය නව නිකුතුන් විය.

## 22.2 රාජ්‍ය ණය සේවාකරණය

රජයේ ණය ගෙවීම් නිසියාකාරයෙන් කරගෙන යාමේ අඛණ්ඩ වාර්තාව තවදුරටත් රඳවා ගනිමින් ඉතා නිරවද්‍ය ලෙස, නියමිත වේලාවට රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 2013 වසරේදීත් නොකඩවාම සිදු කරන ලදී. 2013 වසර තුළ දී සිදුකරන ලද සමස්ත ණය සේවාකරණය ගෙවීම රුපියල් බිලියන 1,143.6 ක් විය. මෙම අගයට කල්පිරුණු භාණ්ඩාගාර බැඳුම්කර, දේශීය ණය සහ විදේශීය ණය ආපසු ගෙවීම් ඇතුළත්ය.

## 22.3 රාජ්‍ය සුරැකුම්පත් පියවීමේ පහසුකම් සැලසීම

ප්‍රාථමික සහ ද්විතීයික වෙළෙඳපොළ රාජ්‍ය සුරැකුම්පත්වල ගනුදෙනු පියවීමේ පහසුකම් සැලසීම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ලංකාසෙකියෝ (LankaSecure) පද්ධතිය හරහා තත්කාලීනව හා අඛණ්ඩව සිදු කරන ලදී. 2013 දෙසැම්බර් 31 දින වන විට ලංකාසෙකියෝ පද්ධතිය තුළ පැවති නිර්ලේඛන සුරැකුම්පත්හි මුළු වටිනාකම රුපියල් බිලියන 3,726 ක් විය.

## 22.4 රාජ්‍ය සුරැකුම්පත්වල හිමිකම් ලේඛණය පවත්වාගෙන යාම

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) රාජ්‍ය සුරැකුම්පත් හිමිකාරිත්වයේ සිදුවන වෙනස්කම් යාවත්කාලීනව පවත්වාගෙන යාම ද්විතීයික වෙළඳපොළෙහි ද්‍රවශීලතාව හා ගනුදෙනුවල වර්ධනයක් ඇති කිරීමට උපකාරී විය. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් 2013 වසරේ දී සෑම ගනුදෙනුකරුවෙක් සඳහාම විශේෂිත හඳුනා ගැනීමේ අංක ක්‍රමයක් හඳුන්වා දීම තුළින් එක් එක් ආයෝජකයාගේ ආයෝජන පිළිබඳ තොරතුරු වඩාත් ක්‍රමවත් ආකාරයෙන් පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී. තවද මධ්‍යම තැන්පතු පද්ධතියේ භාණ්ඩාගාර බිල්පත් හිමිකාරිත්වයේ සිදුවන වෙනස්කම් අප්‍රමාදව සටහන් කිරීමේ ක්‍රියාවලිය සහ ගිණුම් හිමියන්හට කාලීන හිමිකම්, ගනුදෙනු හා ගෙවීම් ප්‍රකාශනයන් යැවීමේ කාර්යය රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 2013 වසරේ දී අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව අර්ධ වාර්ෂික හිමිකම් ප්‍රකාශන 29,411 ක්, මාසික ගනුදෙනු ප්‍රකාශන 99,108 ක් හා ගෙවීම් ප්‍රකාශන 61,352 ක් මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන් වෙත තැපැල් මඟින් යැවීම වසර තුළ දී සිදු කරන ලදී. 2013 වසර අග වන විට මධ්‍යම තැන්පතු පද්ධතියේ පැවති මුළු ගිණුම් සංඛ්‍යාව 84,474 ක් විය. තවද ඉහත සඳහන් කාලීන ප්‍රකාශනයන් එකී ප්‍රකාශනවල අඩංගු තොරතුරුවල රහස්‍යභාවය පවත්වාගෙන යන අතර කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණින්, ඉලෙක්ට්‍රොනික වාර්තා වශයෙන් ලබා ගැනීමට කැමති ආයෝජකයන් හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මඟින් 2013 වසරේ ආරම්භ කළ අතර එමඟින් තැපැල් මඟින් ප්‍රකාශනයන් යැවීම ද නතර කර ගත හැකි වනු ඇත.

## 22.5 රාජ්‍ය සුරැකුම්පත් සඳහා වූ ප්‍රාථමික අලෙවිකරුවන් අධීක්ෂණය කිරීම

ප්‍රාථමික අලෙවිකරු ක්‍රමයේ ස්ථායිතාව සහ රජයේ සුරැකුම්පත්හි මුදල් ආයෝජනය කරන්නන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීමේ අපේක්ෂාවෙන්, දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත සහ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත යටතේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව 2013 වසරේ දී රජයේ සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික අලෙවිකරුවන් නියාමනය කිරීමේ සහ ඔවුන් වෙත විචක්ෂණශීලී නව නියාමනයන් නිකුත් කිරීමේ කටයුතුවල අඛණ්ඩව නිරත විය. 2013 වසරේ දී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද නියාමන කාර්යයන්ගේ සාරාංශයක් පහත දැක්වේ.

**(අ) විචක්ෂණශීලී නියාමනයන් නිකුත් කිරීම**

ප්‍රාථමික අලෙවිකරු ක්‍රමයේ ස්ථාවරත්වය තවදුරටත් ශක්තිමත් කිරීම සහ ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම පිළිබඳ යහපාලනය සහ අවදානම් කළමනාකරණය ආවරණය වන පරිදි රජයේ සුරැකුම්පත්හි මුදල් ආයෝජනය කරන්නන්ගේ ආරක්ෂාව, රජයේ සුරැකුම්පත්හි ආයෝජනය කර ඇති මුදල්වල ආරක්ෂාව, ප්‍රාථමික අලෙවිකරුවන් විසින් ගනුදෙනුකරුවන් වෙත ලබා දෙන සේවාවන්ගේ ගුණාත්මක බව සහ අන්තර්ගතය සහ රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ කටයුතු සුමට හා කාර්යක්ෂම කිරීම අරමුණු කර ගනිමින් 2013 වසරේ දී විචක්ෂණශීලී නියෝග/නියාමනයන් නිකුත් කිරීම සිදු කරන ලදී.

**(ආ) ප්‍රාථමික වෙළෙඳුන් අධීක්ෂණය කිරීම (එතැන් පරීක්ෂණ)**

තම ව්‍යාපාර කටයුතු මඟින් ජනනය වන එහෙත් මුළුමනින්ම අහෝසි කළ නොහැකි අවදානම් සඳහා ප්‍රමාණවත් සම්පත් පවත්වා ගැනීම ඇතුළුව ප්‍රාථමික අලෙවිකරුවන්ගේ විවිධ අවදානම් එකී අවදානම් අවම කර ගැනීමට පවත්වාගත යුතු විචක්ෂණශීලී අවශ්‍යතාවන් මෙන්ම පනවා ඇති ව්‍යවස්ථානුකූල සහ නියාමන අවශ්‍යතාවයන්ට අනුගත වී ඇති ආකාරය පිළිබඳව එතැන් පරීක්ෂණයන්හි දී ඇගයීමට ලක් කරනු ලැබේ. ඒ අනුව 2013 වසරේ දී ප්‍රාථමික අලෙවිකරුවන් දස දෙනෙකු

පිළිබඳව අවදානම ඉලක්ක කරගත් එතැන් පරීක්ෂණ සම්පූර්ණ කරනු ලැබූ අතර එම පරීක්ෂණ වාර්තා මඟින් මතු කරන ලද කරුණු නිවැරදි කිරීම සඳහා කාලසටහනක් පදනම් කරගත් ක්‍රියාකාරී සැලැස්මකට ඒ ඒ ප්‍රාථමික අලෙවිකරුවන් යටත් කිරීම සිදු කරන ලදී. 2013 වසර අවසානයේ දී එවන් තවත් එක් පරීක්ෂණයක කටයුතු සම්පූර්ණ කෙරෙමින් පැවතුණි. නියාමන කාර්යයන් පිළිබඳ නිවැරදි කිරීමේ කටයුතුවල ප්‍රගතිය, ප්‍රාථමික අලෙවිකරුවන් විසින් එවන ලද කාර්තුමය වාර්තා උපයෝගී කර ගනිමින් නිරීක්ෂණය කරනු ලැබිණි.

**(ඇ) ප්‍රාථමික වෙළෙඳුන් අධීක්ෂණය කිරීම (දුරස්ථ පරීක්ෂාව)**

ප්‍රාථමික අලෙවිකරුවන් විසින් නිතිපතා එවනු ලබන වාර්තා පදනම් කර ගනිමින් එක් එක් ප්‍රාථමික අලෙවිකරුවන්ගේ මූල්‍ය තත්ත්වය හා මෙහෙයුම් කටයුතු තත්කාලීනව විමර්ශනය කිරීමේ ක්‍රියාදාමයක් මෙන්ම සමස්ත කර්මාන්තය පිළිබඳ සිදු කෙරෙන දුරස්ථ පරීක්ෂාවන් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. වසර තුළදී සෑම මාසයක දී ම එවැනි දුරස්ථ පරීක්ෂාවන් 12 ක් සිදු කරන ලද අතර අවශ්‍ය අවස්ථාවල දී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ක්ෂණිකව නිසි නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග දියත් කරන ලදී.

**(ඇ) නියාමන අනුමැතිය ලබාදීම**

2013 වසර තුළ දී බලපත්‍රලාභී වාණිජ බැංකුවලට ප්‍රාථමික අලෙවිකරුවන් බවට පත්වීමට අවසර ලබා දෙන ලදී. ඒ අනුව පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී. සහ හොංකොං ඇන්ඩ් ෂැන්හයි බැංකින් කෝපරේෂන් ලිමිටඩ් ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස පත් කරන ලදී. ඊට අමතරව පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් ප්‍රාථමික අලෙවිකරුවකු ලෙස පත් කරන ලදී. එබැවින් 2013 වසර අවසාන වනවිට ප්‍රාථමික අලෙවිකරුවන්ගේ මුළු සංඛ්‍යාව 15 දක්වා වර්ධනය විය.

**(ඉ) ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ප්‍රධාන විධායක නිලධාරීන් සමග මාසික රැස්වීම් පැවැත්වීම**

රාජ්‍ය ණය අධිකාරී/ලේඛකාධිකාරී විසින් ප්‍රාථමික අලෙවිකරුන්ගේ ප්‍රධාන විධායක නිලධාරීන් සමඟ මාසිකව පවත්වන රැස්වීම් 12 ක් 2013 වසර තුළ දී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලැබිණි. මෙම රැස්වීම්, ආර්ථික හා මූල්‍ය සංවර්ධනයන්, ප්‍රාථමික අලෙවිකාර කර්මාන්තයේ කාර්යසාධනය සහ රජයේ සුරැකුම්පත්හි ප්‍රාථමික සහ ද්විතියික වෙළෙඳපොළ කටයුතු හා වෙළෙඳපොළ වර්ධනයන් කෙරෙහි බලපාන බොහෝ ක්ෂේත්‍රයන් පිළිබඳව අදහස් හුවමාරු කර ගැනීමේ අවස්ථාවක් ලෙස යොදා ගැණිනි.

## 22.6 අවදානම් කළමනාකරණය

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 2013 වසරේ දී රාජ්‍ය ණය කළඹ මඟින් ඇති විය හැකි අවදානම් ඇගයීම සහ අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කිරීමට මෙන්ම එවැනි අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ තත්ත්වය සහ ආවරණ කලාපය වැඩිදියුණු කිරීමට පියවර ගෙන තිබේ. මේ සම්බන්ධයෙන් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, පොදු රාජ්‍ය මණ්ඩල මහ ලේකම් කාර්යාලයේ රාජ්‍ය ණය කළමනාකරණ අංශයෙහි සහාය ඇතිව, රාජ්‍ය ණය කළමනාකරණය සඳහා යොදා ගැනෙන පරිගණක මෘදුකාංගය වන CS-DRMS හි නවතම මුහුණුවර වන “හොරයිසන්” (Horizon) සාර්ථකව ප්‍රතිස්ථාපනය කරන ලදී. හොරයිසන් මඟින් විවිධ විදේශීය මුදල් ඒකක මඟින් සහ දේශීය මුදල් ඒකක මඟින් පවතින රාජ්‍ය ණය කළඹ සඳහා ඒකාබද්ධ පරිණත දත්ත ගබඩාවක් පවත්වාගෙන යාමට පහසුකම් සලසයි. තවද නවීනතම ක්‍රමවේදයන්ගෙන් හා විශ්ලේෂණාත්මක උපාංගයන්ගෙන් සමන්විත වූ හොරයිසන් මඟින් සමස්ථ රාජ්‍ය ණය කළඹ සම්බන්ධව පවතින අවදානම් විශ්ලේෂණය කිරීමට සහ රාජ්‍ය ණය සම්බන්ධයෙන් සමස්ත පිරිවැයට හා අවදානමට සාර්ව ආර්ථික විචලනයන් මඟින් ඇති වියහැකි බලපෑම් කල්තබා ඇස්තමේන්තු කිරීමට සහ එමඟින් ප්‍රශස්ත ණය ගැනීමේ උපාය මාර්ගයක් සකස් කිරීමට පහසුකම් සැලසීම ද විශේෂයෙන් සිදු වේ.

## 22.7 ණය රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ සහ සාංගමික වෙළෙඳපොළ සංවර්ධනය

සංවර්ධිත ණය වෙළෙඳපොලක් පැවතීම රජයේ ණය ගැනීම්හි පිරිවැය සහ ප්‍රතිමූල්‍යන අවදානම අඩුකර ගැනීම සඳහා බලපාන අත්‍යවශ්‍ය අංගයකි. එමනිසා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව පහත සඳහන් පරිදි 2013 වසරේ දී ණය සුරැකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනයෙහිලා අඛණ්ඩව නිරත විය:

(අ) ආයෝජකයන්හට ඔවුන්ගේ අභ්‍යන්තර තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී පවතින ආයෝජන අවස්ථා කල්තියා සලකා බැලීමට පහසුකම් සැලසීමේ අරමුණින් අර්ධ වාර්ෂික භාණ්ඩාගාර බැඳුම්කර නිකුතු දින දර්ශනයක් ක්‍රියාවට නැංවීම.

(ආ) වසර 30 ක පරිණත කාලයක් සහිත භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව ආරම්භ කිරීම සහ එමඟින් රුපියල් සඳහා වන අවදානම් රහිත එලදා වක්‍රය වසර 30 ක් දක්වා වැඩි කිරීම.

(ඇ) කොළඹ කොටස් හුවමාරුවෙහි ද සහාය ඇතිව ණය වෙළෙඳපොළ, මුදල් වෙළෙඳපොළ සහ විදේශීය විනිමය වෙළෙඳපොළ තුළ දැනට පවතින හා ඉදිරියේ දී හඳුන්වා දිය හැකි උපකරණ ද ආවරණය කරමින් ඉලෙක්ට්‍රොනික වෙළෙඳ හුවමාරුවක් ඇති කිරීම සඳහා වූ මූලික පියවර ගැනීම.

(ඈ) ශ්‍රී ලංකාවේ ණය සුරැකුම්පත් හා මූල්‍ය වෙළෙඳපොළ ගනුදෙනු සඳහා පහසුකම් සැපයීම් වස් ශ්‍රී ලංකා

සුරැකුම්පත් සහ විනිමය කොමිසම, කොළඹ කොටස් හුවමාරුව සහ සීමාසහිත ලංකාක්ලියර් යන ආයතනයන්ගේ ද සහාය ඇතිව මධ්‍යම ප්‍රතිපාර්ශව ක්‍රමයක් (Central Counter Party) ස්ථාපිත කිරීම සහ නිෂ්කාශන සහ පියවීම් ක්‍රමයක් (Central Cleaning and Settlement System) ක්‍රියාවට නැංවීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කිරීම.

(ඉ) රජයේ සුරැකුම්පත් සඳහා පවත්වන ප්‍රාථමික වෙන්දේසියන්හි තරගකාරිත්වය ඉහළ නැංවීම පිණිස වැඩි සහභාගීකරුවන් පිරිසක් ඇති කිරීම.

(ඊ) ණය සුරැකුම්පත් වෙළෙඳපොළ ප්‍රතිමිලදීගැනුම් සඳහා වන ලියකියවිලි ප්‍රමිතිකරණය කිරීම.

(උ) සාංගමික ණය වෙළෙඳපොළ කටයුතුවල නිරත වීමට ප්‍රාථමික අලෙවිකරුවන්ට ඉඩ ලබා දීම.

(ඌ) රජයේ සුරැකුම්පත්වල මුදල් ආයෝජනය කරන්නන්ගේ අපේක්ෂාවන්ට සහ ඉල්ලීම්වලට ගැලපෙන පරිදි පාරිභෝගික සේවා සැපයීමේ ගුණාත්මක බව සහ එහි අන්තර්ගතය තවදුරටත් වැඩිදියුණු කිරීමේ අරමුණින් යුතුව ප්‍රාථමික අලෙවිකරුවන් හා ඔවුන්ගේ ගනුදෙනුකරුවන් අතර සම්බන්ධතාව පවත්වාගෙන යාම සඳහා විධිමත් ගනුදෙනුකාර ප්‍රඥප්තියක් ක්‍රියාත්මක කිරීම.

(එ) සුමට සහ කාර්යක්ෂම රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළක් පැවතීම සඳහා වන මූලික අවශ්‍යතාවයක් වන ඉදිරියේ දී ආවරණය කර ගැනීමේ පදනම මත රාජ්‍ය ණය සුරැකුම්පත් අලෙවි කිරීමට අවස්ථාව සලසා දීම. මෙම ක්‍රියාමාර්ගය මඟින් කාර්යක්ෂම මිල අනාවරණයක් සඳහා මෙහෙයුම් නම්‍යශීලීත්වයක් සපයන අතර ද්විතීයික වෙළෙඳපොළ ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම හරහා වෙළෙඳපොළ ද්‍රවශීලතාව ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ.

### 22.8 ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පවත්වා ගැනීම තහවුරු කිරීම

ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ නියෝජිතයන් මඟින් ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පවත්වා ගැනීම තහවුරු කිරීම සහ එම ශ්‍රේණිගත කිරීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය කළමනාකරණයට සෘජුව සම්බන්ධ වී ඇති බැවින් ෆිච් රේටින්ග් ලිමිටඩ්, ස්ටැන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් සහ මූඩීස් ඉන්වෙස්ටර් සර්විස් වෙතින් වාර්ෂිකව ලබාගන්නා ශ්‍රේණිගත කිරීමේ සේවා ඇගයීම ද රජයේ මූල්‍ය නියෝජිතයා ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව මත පැවරී ඇති කාර්යයකි. ඒ අනුව ශ්‍රේණිගත කිරීමේ නියෝජිතයන් තිදෙනා විසින් සපයන ලද සේවාවන් ඇගයීමේ කටයුතු රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරනු ලැබූ අතර 2013 වසරේ දී ශ්‍රී ලංකාව ශ්‍රේණිගත කිරීමේ කටයුතු සඳහා පහසුකම් සැපයීම ද සිදු කරන ලදී.

**ඇමුණුම II-2 රජයේ සුරැකුම්පත්හි ප්‍රාථමික අලෙවිකරුවන්**

1. ඇකියුටි සෙකියුරිටීස් ලිමිටඩ්
2. ලංකා බැංකු ප්‍රාථමික අලෙවිකරු අංශය
3. කැපිටල් එලයන්ස් ලිමිටඩ්
4. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. ප්‍රාථමික අලෙවිකරු අංශය
5. එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පී.එල්.සී.
6. ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් ලිමිටඩ්
7. නැට්වෙල්ත් සෙකියුරිටීස් ලිමිටඩ්
8. එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්
9. මහජන බැංකු ප්‍රාථමික අලෙවිකරු අංශය
10. සම්පත් බැන්ක් පී.එල්.සී. ප්‍රාථමික අලෙවිකරු අංශය
11. සෙලාන් බැන්ක් පී.එල්.සී ප්‍රාථමික අලෙවිකරු අංශය
12. වෙල්ත්ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ්
13. පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී.එල්.සී. ප්‍රාථමික අලෙවිකරු අංශය
14. ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් ප්‍රාථමික අලෙවිකරු අංශය
15. පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ්

## 23. ප්‍රාදේශීය සංවර්ධන

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව රජය වෙනුවෙන්, එහි නියෝජිත කාර්යය වන රටෙහි සියලු දෙනා ඇතුළත් වන පරිදි තුලිත වර්ධනයක් ළඟා කර ගැනීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා සහායවීමේ සහ මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීමේ කාර්යයේ කටයුතු සිදුකරන ලදී. එකී සන්දර්භය තුළ මූල්‍ය ප්‍රවේශය වැඩි දියුණු කිරීම සහ දැනුම්වත්භාවය ගොඩනැගීම යන පුළුල් ක්ෂේත්‍ර ද්විත්වයෙහි කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

මූල්‍ය ප්‍රවේශය ලබාදීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව කෘෂිකාර්මික හා සත්ව පාලන, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහ ක්ෂුද්‍රමූල්‍ය යන පුළුල් අංශ තුන වෙත සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා සහනදායී මූල්‍ය පහසුකම් ලබාදීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. ණය ප්‍රතිලාභීන්ගේ සහ ව්‍යවසායකයන්ගේ කුසලතා වර්ධනය කිරීම සඳහා මූල්‍ය සාක්ෂරතාවය, ව්‍යවසායකත්ව සංවර්ධනය සහ පසු අස්වනු තාක්ෂණය යන ක්ෂේත්‍ර යටතේ සියලු ප්‍රදේශ ආවරණය වන පරිදි දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. මුද්‍රිත, විද්‍යුත් සහ ගුවන්විදුලි මාධ්‍ය භාවිතා කොට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ ණය යෝජනා ක්‍රම පිළිබඳව මහජනතාව දැනුවත් කෙරිණි.

2013 වසරේදී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ණය යෝජනා ක්‍රම 20 ක් ක්‍රියාත්මක කරන ලදී. මෙම ණය යෝජනා ක්‍රම සඳහා අරමුදල් සපයන ලද්දේ ශ්‍රී ලංකා රජය, ශ්‍රී ලංකා මහ බැංකුව, ජාත්‍යන්තර ණය දෙන ආයතන සහ සහභාගීත්ව මූල්‍ය ආයතනයි. එම ණය යෝජනා ක්‍රමවලට අදාළ විස්තර සංඛ්‍යා සටහන අංක II - 22 හි දැක්වේ.

### 23.1 කෘෂිකාර්මික හා සත්ව පාලන අංශය

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව 2013 වසර තුළ සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා ණය මුදල් මුදාහැරීම දිරිමත් කරමින් කෘෂිකාර්මික හා සත්ව පාලන අංශයට දායක විය. රුපියල් මිලියන 8,440 ක ණය මුදල් ඒ අංශයට ලබාදී ඇත.

මෙම අංශයේ ප්‍රධාන ණය යෝජනා ක්‍රමය වන්නේ බෝග 32 ක් ආවරණය කරමින් ගොවීන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපයන "සරුසාර" හෙවත් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයයි. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ 2012/13 මහ කන්නයේ දී රුපියල් මිලියන 5,378 ක ණය ප්‍රමාණයක් ගොවීන් 60,120 දෙනෙකුට ප්‍රදානය කර ඇත. මෙය පසුගිය මහ කන්නය හා සැසඳීමේ දී මුදාහල ණය ප්‍රමාණයේ සියයට 10 ක සහ ණය සංඛ්‍යාවේ සියයට 17 ක අඩුවීමක් පෙන්නුම් කරයි. පසුගිය යල කන්නයේ ගොවීන් 40,077 හා සැසඳීමේ දී, 2013 යල කන්නයේ දී රුපියල් මිලියන 2,786 ක ණය ප්‍රමාණයක් ගොවීන් 36,261 දෙනෙකුට ප්‍රදානය කර ඇත. පසුගිය වසර හා සැසඳීමේ දී යල කන්නයේ දී ප්‍රදානය කළ ණය ප්‍රමාණයේ සියයට 17 ක සහ ණය සංඛ්‍යාවේ සියයට 10 ක අඩුවීමක් පෙන්නුම් කරයි. මහ කන්නයේ ඇති වූ ගංවතුර සහ යල කන්නයේ ඇති වූ නියගය මෙම අඩුවීමට හේතු විය. පසුගිය වසරවල දී මෙන් 2013 වසරේ දී ද නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ සපයන ලද ණයවලින් ඉහළම ප්‍රතිශතය වී සඳහා ද (2013 වසරේදී සියයට 54 ක්), සියයට 23 ක් එළුණු සහ ඉතිරි ප්‍රමාණය අර්තාපල්, බඩ ඉරිඟු, මිරිස්, එළවළු සහ අනෙක් ආහාර බෝග වගා කිරීම සඳහා ද ලබා දී තිබිණි. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කළ කෘෂිකාර්මික ණය අතුරින් සියයට 32 ක කොටසක් වාර්තා කරමින් නොකඩවා තෙවැනි වරට ද යාපනය දිස්ත්‍රික්කය ඉහළම ණය ප්‍රමාණයකට හිමිකම් පාන ලදී. මීළඟට අනුරාධපුරය, හම්බන්තොට සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක පිළිවෙළින් සියයට 10, සියයට 9, සහ සියයට 8 ක් වූ ප්‍රමාණයන්ට හිමිකම් පාන ලදී. ඊළඟ කන්නයේ දී බාධාවකින් තොරව වගා කටයුතු සිදු කිරීම තහවුරු කිරීම සඳහා අහිතකර කාලගුණ තත්ත්වයන්ට මුහුණ පෑ ගොවීන්ගේ ණය මුදල් ප්‍රතිලේඛණ ගත කර ගොවීන් වෙත සහන සලසන ලදී.

කිරි ස්වයංපෝෂිතභාවය ඇති කිරීමට සහායවීම සඳහා "මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය" නමින් නව ණය යෝජනා ක්‍රමයක් 2013 අගෝස්තු මාසයේ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලදී. මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය, කිරි සැපයුම් දාමයේ සියලු ක්‍රියාකාරකම් ආවරණය කරන පුළුල් ණය යෝජනා ක්‍රමයකි. 2013 වසර තුළ දී මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභීන් 60 දෙනෙකු සඳහා රුපියල් මිලියන 202 ක ණය ප්‍රදානය කර ඇත. මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ සහනදායී පොළී අනුපාතිකයකට ණය පහසුකම් සැපයීම මගින් නවීනත්වයෙන් හෙබි කිරි කර්මාන්තයක් ගොඩ නැගෙනු ඇතැයි අපේක්ෂිත අතර එහිදී කිරි ගොවීන්ගේ දැනුම ඉහළ නැංවීම, නව තාක්ෂණය කර්මාන්තයට ගෙන ඒම සහ විශිෂ්ට පරිචයන් භාවිතයට ගැනීම මගින් කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට හැකි වෙතැයි බලාපොරොත්තු වේ. තවද නවීන ගොවිපල කළමනාකරණ ක්‍රම ප්‍රවර්ධනය කිරීම, ඉහළ ගුණාත්මක බවින් යුතු තෘණ වර්ග වගා කිරීම, සාන්ද්‍ර සත්ව ආහාර භාවිතය, සත්ව ආහාර සඳහා ප්‍රමාණවත් පරිදි ජලය, ඛණිජ, විටමින් ආදිය භාවිතා කිරීම වැනි නිවැරදි පරිචයන් ඉගැන්වීම ආදී ක්‍රම තුළින් විශිෂ්ට කිරි කර්මාන්තයක් ඇති කිරීමට බලාපොරොත්තු වේ. ශ්‍රී ලංකාව තුළ කිරි ස්වයංපෝෂිතභාවය සාක්ෂාත් කර ගැනීමේ අරමුණ සපුරා ගැනීම සඳහා ඉහළ තාක්ෂණික භාවිතාවන්ට ආයෝජනය කිරීමට ශක්තිය ඇති ව්‍යවසායකයන් කිරි කර්මාන්තයට ආකර්ෂණය කර ගැනීම ද මෙම යෝජනා ක්‍රමය මගින් බලාපොරොත්තු වේ.

### 23.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සංවර්ධනය කිරීම

විශේෂයෙන්ම නිෂ්පාදන හා සේවා අංශ ඉලක්ක කර ණය යෝජනා ක්‍රම හතක් මගින් සහනදායී මූල්‍ය පහසුකම් සපයමින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට තවදුරටත් සහාය දක්වන ලදී. 2012 වසරේ දී මුදාහල රුපියල් මිලියන 4,167 හා සැසඳීමේ දී 2013 වසර තුළ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට ප්‍රදානය කළ ණයවල මුළු වටිනාකම රුපියල් මිලියන 5,538 ක් වූ අතර එය සියයට 33 ක ඉහළ යාමකි. 2012 වසරේදී ලබාදුන් 18,674 ක ණය සංඛ්‍යාව හා සැසඳීමේ දී සියයට 37 ක වර්ධනයක් දක්වමින් 2013 දී මුදාහල ණය සංඛ්‍යාව 25,483 ක් විය.

රටෙහි සියලු ප්‍රදේශ ආවරණය කරමින් සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය ව්‍යවසායකයින් 9,063 දෙනෙකුට රුපියල් මිලියන 3,492 ක් ණය ලබා දී ඇත. මේ යටතේ දුන් ණයවලින් සියයට හතළිහකටත් වඩා ප්‍රමාණයක් කාන්තා ව්‍යවසායයන්ට ක්ෂුද්‍ර, සුළු හෝ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ආරම්භ කිරීමට හෝ පවතින ව්‍යවසායයන් වැඩි දියුණු කිරීම සඳහා ලබා දී ඇත. වසරකට සියයට 9 ක සහනදායී පොලියක් මත මාස 6 ක සහන කාලයක් සහිතව අවුරුදු 5 ක් තුළ ගෙවා නිම කෙරෙන පරිදි රුපියල් මිලියන 25 දක්වා සෞභාග්‍යා ණය ලබාගත හැක. රජය පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවලින් වෘත්තීය සුදුසුකම් ලබා ඇති තරුණ ව්‍යවසායයන්ට ඔවුන්ගේම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ආරම්භ කිරීම සඳහා රටපුරා ක්‍රියාත්මක කරනු ලැබූ ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීමේ ණය යෝජනා ක්‍රමය යටතේ ණය පහසුකම් සැපයීම මගින් සහාය ලබාදෙන ලදී. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය ඉලක්ක කර ගනිමින්

**II-21 සංඛ්‍යා සටහන**

## 2013 වසර තුළ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ ණය යෝජනා ක්‍රම

| | ණය යෝජනා ක්‍රමයේ නම | අරමුදල් සපයන ලද ආයතන | පුළුල් අරමුණ | අරමුදල් යෙදවීම (රු.මිලියන) | 2013 වසරේදී මුදහල අරමුදල් (රු.මිලියන) | මුදාහැරීමට ඇති ඉතිරි අරමුදල් (රු.මිලියන) | ණයකරුවන් ගෙවිය යුතු වාර්ෂික පොලී අනුපාතිකය |
|---|---|---|---|---|---|---|---|
| 1. | **කෘෂිකාර්මික හා සත්ව පාලන අංශය** | | | | | | |
| 1.1 | දෙවන බහුවාර්ෂික බෝග සංවර්ධන චක්‍රීය අරමුදල් ණය ව්‍යාපෘතිය (SPCDP-RF) | ශ්‍රී ලංකා රජය | බහුවාර්ෂික බෝග අංශයේ වාණිජකරණය, නිෂ්පාදන දියුණු කිරීම, පැල තවාන් දැමීම, පසු අස්වනු මෙහෙයුම් කටයුතු, නිෂ්පාදන සැකසීම හා වෙළෙඳපොළ පහසුකම් ලබාදීම. | 1,200 | 2 | අරමුදල් මිපූර්ණයෙන් මුදාහැර ඇත. | 9% |
| 1.2 | තේ සංවර්ධන චක්‍රීය අරමුදල් ණය ව්‍යාපෘතිය (TDP-RF) | ශ්‍රී ලංකා රජය | කුඩා තේ වතු හිමියන්ගේ ආදායම තිරසාර ලෙස ඉහළ දැමීම සහ අපනයන වෙළෙඳපොළ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මඟින් HACCP සහතිකය ලබාගැනීම සඳහා තේ කර්මාන්තශාලා නවීකරණය කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම. | 1,100 | 69 | 174 | 9% |
| 1.3 | වාණිජකරණය වූ කෘෂි ව්‍යාපාර සංවර්ධනය සඳහා වන "විස්කම්" ණය යෝජනා ක්‍රමය [1] | ශ්‍රී ලංකා මහ බැංකුව | විවිධාංගීකරණය හා අනෙකුත් ප්‍රවර්ධනය කිරීම් මඟින් කෘෂි ව්‍යාපාර සංවර්ධනය කිරීම. | 1,329 | 3 | අරමුදල් සම්පූර්ණයෙන් මුදාහැර ඇත. | 8% |
| 1.4 | නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS) | සහභාගිත්ව මූල්‍ය ආයතන සතු අරමුදල් සහ රජයේ පොලී සහනාධාර පහසුකම් | වී සහ කෙටි කාලීන බෝග වගාවන්හි නියුතු ක්ෂුද්‍ර හා සුළු පරිමාණ ගොවීන්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් ඉහළ නැංවීම. | අරමුදල් සඳහා වන ඉල්ලුම මත | 8,164 | අදාළ නොවේ. | 9% |
| 1.5 | මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය (CSDDLS) | සහභාගීත්ව මූල්‍ය ආයතන සතු අරමුදල් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ පොලී සහනාධාර පහසුකම් | මහා පරිමාණ කිරි ගොවිපලවල් පිහිටුවීම තුළින් කිරි සහ කිරි නිෂ්පාදනවල ස්වයංපෝෂිතභාවය ළඟාකර ගැනීමට සහායවීම. | අරමුදල් සඳහා වන ඉල්ලුම මත | 202 | අදාළ නොවේ. | 8% |
| 2. | **ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය** | | | | | | |
| 2.1 | ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීමේ ණය යෝජනා ක්‍රමය (SEPI)[1] | ශ්‍රී ලංකා රජය | පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවලින් පුහුණුව ලැබූ තරුණ පිරිස් සඳහා මූල්‍ය සහාය සැපයීම. | 250 | 41 | 97 | 10% |
| 2.2 | පිබිදෙන උතුර ණය යෝජනා ක්‍රමය - අදියර II (ANLS-Ph II) | ශ්‍රී ලංකා මහ බැංකුව | උතුරු පළාත තුළ ණය ප්‍රතිලාභීන් බවට පත්විය හැකි පුද්ගලයන්ගේ ආර්ථික කටයුතු ශක්තිමත් කිරීම සඳහා සහායවීම. | 2,000[2] | 770 | 562 | 9% |
| 2.3 | නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා වන ණය යෝජනා ක්‍රමය - අදියර II (REAEP-Ph II) | ශ්‍රී ලංකා මහ බැංකුව | දැනට සිදු කෙරෙන සහ නව ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය පහසුකම් සැපයීම මඟින් නැගෙනහිර පළාත තුළ ජීවත්වන ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම. | 1,000[2] | 472 | අරමුදල් සම්පූර්ණයෙන් මුදාහැර ඇත. | 9% |
| 2.4 | නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා වන ණය යෝජනා ක්‍රමය - අදියර III (REAEP-Ph III) | ශ්‍රී ලංකා මහ බැංකුව | | 1,000 | 428 | 572 | 9% |
| 2.5 | සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය[1] | ශ්‍රී ලංකා මහ බැංකුව | ව්‍යසනවලින් හානියට පත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති හෝ වෙනත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති ඇරඹීම හෝ වැඩිදියුණු කිරීම. | 7,960 | 3,492 | අරමුදල් සම්පූර්ණයෙන් මුදාහැර ඇත. | 9% |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 2.6 | පළාත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | කෘෂිකාර්මික, සත්ව පාලන, ධීවර, වෙළෙඳ සහ ප්‍රවාහන අංශවල මධ්‍ය හා මහා පරිමාණ ව්‍යාපෘතීන්හි ආදායම් උත්පාදන කටයුතු සඳහා සහාය වීම. | 2,900 | 254 | අරමුදල් සම්පූර්ණයෙන් මුදාහැර ඇත. | 12% |
| 2.7 | පශ්චාත් සුනාමි වෙරළබඩ පුනරුත්ථාපන සහ සම්පත් කළමනාකරණ වැඩසටහන (PTCRRMP)[1,3] | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) | සුනාමි ව්‍යසනයෙන් හානියට පත් ප්‍රජාවන්ගේ වත්කම් නැවත ඇති කිරීම සහ ඔවුන්ගේ සාමාන්‍ය ක්‍රියාකාරකම්වල පදනම නැවත පිහිටුවීම සඳහා සහාය වීම. | 191 | 81 | අරමුදල් සම්පූර්ණයෙන් මුදාහැර ඇත. | 8% - 10% |
| 3 | **ක්ෂුද්‍රමූල්‍ය අංශය** | | | | | | |
| 3.1 | සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘති චක්‍රීය අරමුදල් යෝජනා ක්‍රමය (SFLCP-RF) | ශ්‍රී ලංකා රජය | ප්‍රතිලාභ ලබන්නන්ගේ සුබ සාධනය සහ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම පිණිස ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආදායම් ඉපැයීමේ කටයුතු වෙනුවෙන් විධිමත් ණය සැපයීම. | 345 | 249 | ආපසු අය කරගැනීම් නැවත අරමුදලට යෙදවේ. | 12% - 14% |
| 3.2 | දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍රමූල්‍ය චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය (PAMP-RF) | ශ්‍රී ලංකා රජය | | 1,031 | 735 | ආපසු අය කරගැනීම් නැවත අරමුදලට යෙදවේ. | 12% |
| 3.3 | දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍රමූල්‍ය ණය යෝජනා ක්‍රමය - අදියර II (PAMP II) [3] | ශ්‍රී ලංකා රජය සහ ජපන් අන්තර්ජාතික සහයෝගිතා සංවිධානය (JICA) | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සහ සංවිධිත බැකු අංශය හා සම්බන්ධ වීම සඳහා අඩු ආදායම්ලාභී කණ්ඩායම් සංවිධානය කිරීම මගින් දිළිඳු බව පිටුදැකීම. | 2,104 | 202 | 1 | 12% - 15.5% |
| 3.4 | දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍රමූල්‍ය ණය යෝජනා ක්‍රමය අදියර II - චක්‍රීය අරමුදල (PAMP II-RF) | ශ්‍රී ලංකා රජය | | 2,246 | 956 | ආපසු අය කරගැනීම් නැවත අරමුදලට යෙදවේ. | සහභාගීත්ව මූල්‍ය ආයතන - 12% සහභාගීත්ව ණය දෙන ආයතන - 14% |
| 3.5 | වියළි කලාපීය ජීවනෝපායයන් සඳහා සහායවීමේ හා හවුල්වීමේ වැඩසටහන - චක්‍රීය අරමුදල | ශ්‍රී ලංකා රජය | මොණරාගල, කුරුණෑගල, බදුල්ල හා අනුරාධපුර දිස්ත්‍රික්කවල දිළිඳු ගොවීන්ගේ ආදායම් උත්පාදන කටයුතු සඳහා සහාය වීම සහ දිළිඳුකම පිටුදැකීම. | 253 | 123 | 130 | 10% |
| 3.6 | කුඩා වතු ව්‍යවසාය සංවර්ධන වැඩසටහන (SPEnDP)[3, 4] | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) | මැදරට ප්‍රදේශයේ තේ සහ බහුවාර්ෂික බෝග වගා කරන කුඩා වතු හිමියන්ගේ සහ මොණරාගල දිස්ත්‍රික්කයේ අන්තර් කලාපීය ප්‍රදේශයන්හි උස් බිම්වල ආහාර බෝග වගා කරන රබර් වගාව සඳහා යොමු වීමට කැමති ගොවීන්ගේ ජීවන තත්ත්වය නංවාලීම. | 295 | 167 | 88 | 9% |
| 3.7 | ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන (NADeP) | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) | වැඩසටහන් ප්‍රදේශය තුළ ග්‍රාමීය දිළිඳු නිවාසවල ජීවත් වන ප්‍රජාවගේ ජීවන තත්ත්වයන් ඉහළ නැංවීමට සහ දිළිඳුකම පිටුදැකීමට දායක වීම. | 262 | 113 | 149 | 12.25% |
| 4 | **වෙනත්** | | | | | | |
| 4.1 | උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල විනාශ වූ නිවාස අලුත්වැඩියා කිරීමේ යෝජනා ක්‍රමය[1] | ශ්‍රී ලංකා මහ බැංකුව | උතුරු හා නැගෙනහිර පළාත්වල ගැටුම්වලින් හානියට පත් නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ණය පහසුකම් සැපයීම. | 600 | 211 | 305 | 8% |

1. 2013 වසරේ දී නව අරමුදල් යොදවා ඇත.
2. රුපියල් මිලියන 154 සහ රුපියල් මිලියන 78 බැගින් වූ ණය පොලී, 2.2 සහ 2.3 හි සඳහන් ණය අරමුදල්වලට ඇතුළත් නොවේ.
3. 2.7, 3.3 සහ 3.6 හි සඳහන් ණය මුදල් පිළිවෙළින් විශේෂ හර ගැනුම් ඒකක මිලියන 1.32, ජපන් යෙන් මිලියන 2,100 සහ විශේෂ හර ගැනුම් ඒකක මිලියන 1.75 වශයෙන් වන අතර රුපියල් බවට හැරවීමේ දී ණය ගිවිසුම අත්සන් කළ දිනයට අදාළ විනිමය අනුපාතිකය යොදා ගෙන ඇත.
4. ශ්‍රී ලංකා රුපියලට එරෙහිව විශේෂ හර ගැනුම් ඒකකවල අධි ප්‍රමාණය වීමද ඇතුළත් වේ.

2013 වසරේ දී ක්‍රියාත්මක වූ අනෙකුත් වැදගත් ණය යෝජනා ක්‍රම වූයේ පිබිදෙන උතුර ණය යෝජනා ක්‍රමය - අදියර II සහ නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා වන ණය යෝජනා ක්‍රමය - අදියර II සහ අදියර III යි. මෙම ණය යෝජනා ක්‍රම යටතේ අදාළ පළාත් දෙක තුළ 2012 වසරේ දී ප්‍රදානය කළ 9,158 ක ණය සංඛ්‍යාව හා සැසඳීමේ දී 2013 දී 14,845 ක ණය සංඛ්‍යාවක් දක්වා ඉහළ නැංවීමට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට හැකි විය. 2012 වසරේ දී ප්‍රදානය කළ රුපියල් මිලියන 1,197 හා සැසඳීමේ දී 2013 වසරේ දී මෙම ණය යෝජනා ක්‍රම යටතේ ප්‍රදානය කළ මුළු ණය ප්‍රමාණය රුපියල් මිලියන 1,670 කි.

### 23.3 ක්ෂුද්‍රමූල්‍ය අංශය

ක්ෂුද්‍රමූල්‍ය අංශය සඳහා ක්‍රියාත්මක කළ ණය යෝජනා ක්‍රමවල ප්‍රධාන අරමුණු වූයේ මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සහ දිළිඳුකම පිටුදැකීමයි. විධිමත් මූල්‍ය අංශයට ඇතුළත් කර නොගත් ජනතාවට සමීප වීම මෙම ණය යෝජනා ක්‍රමවල අපේක්ෂාව විය. මෙම අංශය අරමුණු කර සැලසුම් කළ ප්‍රධාන ණය යෝජනා ක්‍රම වනුයේ දිස්ත්‍රික්ක 14 ක් පුරා ක්‍රියාත්මක වන දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍රමූල්‍ය ණය යෝජනා ක්‍රමය - අදියර II සහ එහි චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමයයි. දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍රමූල්‍ය - චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය ද දිස්ත්‍රික්ක 11 ක ක්‍රියාත්මක විය. මෙම යෝජනා ක්‍රම තුන යටතේ 2012 වසරේදී ප්‍රතිලාභීන් 19,728 ක් ලැබූ රුපියල් මිලියන 1,039 ක ණය මුදල් හා සැසඳීමේ දී පිළිවෙළින් ණය සංඛ්‍යාවේ සියයට 63 ක් සහ ණය ප්‍රමාණයේ සියයට 82 ක ඉහළ යාමක් වාර්තා කරමින් 2013 දී ප්‍රතිලාභීන් 32,100 ට රුපියල් මිලියන 1,893 ක ණය ලබාදීම දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය විය. එසේම, ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආර්ථික තත්ත්වය සහ සුබ සාධනය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතියේ චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය ද ප්‍රතිලාභීන් 5,919 ට රුපියල් මිලියන 249 ක ණය ලබාදෙමින් 2013 වසරේ දී ප්‍රගතියක් වාර්තා කළේය.

### 23.4 දැනුම්වත් බව ප්‍රවර්ධනය කිරීම

විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රජාවගේ මූල්‍ය සුබ සාධනය ඉහළ නැංවීමට ඔවුන්ට අධ්‍යාපනය ලබාදීම දැනුම්වත් කිරීමේ ක්‍රියාවලියේ ප්‍රධාන අරමුණ විය. මූල්‍ය ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීම සඳහා මූල්‍ය සාක්ෂරතාවය වැදගත් වේ. මෙම වැඩසටහන්වල දී ඉතිරිකිරීම් හා ඉතිරිකිරීමේ පුරුදු, අයවැය සැකසීම, කුටුම්භ ආර්ථික කළමනාකරණය, විධිමත් මූල්‍ය ආයතනවලින් ලබාගත හැකි මූල්‍ය පහසුකම්/සේවාවන්, බුද්ධිමත් ලෙස ණය භාවිත කිරීම, අධිකාරී බලය නොලත් මූල්‍ය ආයතන සමඟ ගණුදෙනු කිරීමේ සහ තහනම් යෝජනා ක්‍රම හා එක්වීමේ ඇති අවදානම් වැනි මාතෘකා පොදුවේ ආවරණය කෙරිණි. සහභාගීත්ව මූල්‍ය ආයතනවල ද සහාය ඇතිව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් 63 ක් රටපුරා පවත්වා ඇත. තවද පිට ප්‍රදේශවල බැංකුකරුවන් සහ අදාළ ආයතන වල පුද්ගලයන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ සැසිවාර 20 ක් පැවැත්වීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සම්පත් දායකයින් ලබාදීමත් පහසුකම් සැලසීමත් සිදු කරන ලදී. බාහිර පුහුණු නිලධාරීන්ගේ ද සහාය ඇතිව ව්‍යවසායකයන් සහ ගොවීන්ගේ ප්‍රයෝජනය සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති ඇගයීමේ වැඩමුළු 37 ක් හා පසු අස්වනු තාක්ෂණය පිළිබඳ වැඩසටහන් 12 ක් වසර තුළ දී පවත්වන ලදී. දැනට පවතින මූල්‍ය පහසුකම් සහ අදාළ ආයතනවලින් ලබාගත හැකි තාක්ෂණික හා අලෙවිකරණ දැනුම පිළිබඳව අවබෝධයක් ලබාදීමටත් ගොවීන් අතර ගුණාත්මක බව සහ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා දැනුම්වත්භාවය ඇති කිරීමටත් මෙම වැඩසටහන් උපකාරී විය. ඒ හැර මහජනතාවට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි සහනදායී මූල්‍ය පහසුකම් පිළිබඳ තොරතුරු ලබාදීමට ගුවන් විදුලි වැඩසටහන් 16 ක් හා රූපවාහිනී වැඩසටහන් 2 ක් ද ප්‍රචාරය කරන ලදී.

## 24. ලේකම් දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භයේ දී ප්‍රතිෂ්ඨාපිත දෙපාර්තමේන්තු අතුරින් එකක් වන ලේකම් දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය, නිවාඩු ප්‍රතිපත්තීන් සැකසීම හා ක්‍රියාවට නැංවීම, විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ කළමනාකරණය, විදේශ සංචාරයන් සම්බන්ධයෙන් වන සේවාවන් හා අනෙකුත් පොදු සේවාවන් සැපයීම සහ නීතිමය සේවාවන් සපයා දීම ආදී කාර්යයන් ඉටු කරනු ලබයි.

2013 වසරේ දී ලේකම් දෙපාර්තමේන්තුව කලට වේලාවට භාණ්ඩ හා සේවාවන් සැපයීමෙන් ද, මෙහෙයුම් ක්‍රමවේදයන් සහ ක්‍රියාපිළිවෙත් නිරන්තර ඇගයීමකට ලක් කිරීමෙන් සහ වැඩිදියුණු කිරීමෙන් ද, නිවාඩු, විශ්‍රාම වැටුප් අරමුදල් සහ අනෙකුත් පොදු සේවාවන් සම්බන්ධ නීති හා නියෝග ක්‍රියාවට නංවමින්, බැංකුවේ කාර්යයන් වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා ආයක විය.

වසර තුළදී දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන්ම ටෙන්ඩර් පටිපාටිය මූලික කර ගනිමින් රුපියල් මිලියන 194.1 ක වටිනාකමින් යුත් ප්‍රාග්ධන හා ප්‍රාග්ධන නොවන භාණ්ඩ හා සේවාවන් ගුණාත්මක භාවයෙන් යුතුව තරඟකාරී මිල ගණන් යටතේ කලට වේලාවට සපයන ලදී. පෙර වසරවල දී මෙන්ම මහ බැංකුවේ මිලදී ගැනීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම තුළින් දෙපාර්තමේන්තුවල භාණ්ඩ හා සේවා අවශ්‍යතා කලට වේලාවට සැපයීම කඩිනම් කිරීමේ අරමුණින් මිලදී ගැනුම් සැලසුම් කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් ක්‍රියාවට නඟනු ලැබිණි. එහි ප්‍රතිඵලයක් ලෙස වසර සඳහා සැලසුම් කළ මහ බැංකුවේ සමස්ත මිලදී ගැනීමේ අවශ්‍යතාවලින් සියයට 98 ක ප්‍රමාණයක් ඉතා සාර්ථක ලෙස අවසන් කිරීමට ලේකම් දෙපාර්තමේන්තුවට හැකි විය. මීට අමතරව, බැංකුවේ සියලුම දේපළ සඳහා සඵල විස්තීරණ රක්ෂණ ආවරණයක් ලබා ගන්නා ලදී. මහ බැංකු විශ්‍රාම වැටුප් ක්‍රමය, වැන්දඹු සහ අනත්දරු අරමුදල සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු අරමුදලේ පාලන කටයුතු ද, ලේකම් දෙපාර්තමේන්තුව විසින් කරගෙන යන ලදී. මෙම

ක්‍රමයන් යටතේ 2013 වසර අවසාන වනවිට ලියාපදිංචි විශ්‍රාම ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2,070 දෙනෙකු විය. 2013 වසර තුළ දී අභාවිත සහ යථාවත් කළ නොහැකි කාර්යාලයීය උපකරණ ඉවත් කිරීම උදෙසා මාතර පළාත් කාර්යාලය, අනුරාධපුර පළාත් කාර්යාලය, නුවරඑළිය නිවාඩු නිකේතනය, බැංකු විදු පියෙස සහ මහ බැංකු ප්‍රධාන කාර්යාලයන්හි දී සමීක්ෂණ මණ්ඩල හයක කටයුතු සම්පූර්ණ කළ අතර ඒ තුළින් රුපියල් මිලියන 4.6 ක ආදායමක් උපයනු ලැබිණි.

වසර තුළ දී ලේකම් දෙපාර්තමේන්තුව, බැංකුව සඳහා අවශ්‍ය නීතිමය සේවාවන් අඛණ්ඩව සපයා දීමෙහි නිරත විය. බැංකුවේ කටයුතු උත්ප්‍රේරණය කිරීම සඳහා අවශ්‍ය සුපුරුදු නීතිමය කටයුතුවල සිට ප්‍රතිපත්ති සැලසුම් කිරීම දක්වා වූ පුළුල් පරාසයක් තුළ මෙකී සේවාවන් සපයන ලදී. අධිකරණමය කටයුතු මෙහෙයවීමේ දී පූර්ව ක්‍රියාකාරී පියවර අනුගමනය කිරීම තුළින් බැංකුවේ අයිතිවාසිකම් තහවුරු කිරීම හා රැකබලා ගැනීම සිදු විය. බැංකුව හමුවේ ඇති අභියෝගයන්ට සාර්ථකව මුහුණදීම සඳහා, බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයට අදාළ නීති සහ අනුනීති සැකසීමේ දී ක්‍රියාකාරී සහයෝගය ලබා දෙන ලදී.

2013 වසර තුළ දී දෙපාර්තමේන්තුව විසින් අලුත් අවුරුදු උත්සවය හා දීර්ඝ සේවා තිළිණ ප්‍රදානය, නිදහස් දින උත්සවය, ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවීමේ 63 වැනි සාංවත්සරික සැමරුම් උත්සවය ඇතුළු විවිධ ආගමික උත්සව සම්බන්ධීකරණය සහ සංවිධානය සිදු කරනු ලැබීය.

මාණ්ඩලික නිලධාරීන් විසිතුන්දෙනෙක්, කළමනාකරණ සහකාරවරුන් දහතුන්දෙනෙක් සහ බැංකු කාර්යසහයකවරුන් පස් දෙනෙකුගෙනුත් සැදුම්ලත් ලේකම් දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය ඉහත කාර්ය ඵලයන් ළඟා කර ගැනීම සඳහා දායක විය.

## 25. ආරක්ෂක සේවා

2013 වසරේ දී, ශ්‍රී ලංකා මහ බැංකු පරිශ්‍රයන් තුළ ආරක්ෂාවට අහිතකර කිසිම සිද්ධියකින් තොරව, මහ බැංකු රාජකාරි සාමාන්‍ය පරිදි කරගෙන යාම සඳහා අවශ්‍ය යහපත් වාතාවරණයක් පවත්වා ගැනීමට ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සමත් විය.

2013 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුවට අත්‍යවශ්‍යව තිබූ නවීන මධ්‍යගත ඒකාබද්ධ ප්‍රවේශපාලන පද්ධතියක්, පහසුකම් කළමනාකරණ හා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවල සහාය ඇතිව ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන කාර්යාලයෙහි ස්ථාපිත කෙරිණ. මහ බැංකු ප්‍රධාන කාර්යාලය, රාජගිරිය, බැංකු විදුපියෙස සහ බැංකු වාසය අතර පවතින ගුවන් විදුලි සන්නිවේදන පද්ධතිය අළුතින් ප්‍රධාන ගුවන් ඇමතුම් යන්ත්‍ර 3 ක් සහ ජංගම ඇමතුම් යන්ත්‍ර 25 ක් යොදා නවීකරණය කරන ලදී. තවද, ප්‍රධාන කාර්යාලයෙහි ස්ථාපිත කර ඇති සී සී ටී වී කැමරා පද්ධතිය තුළ අළුතින් අංකිත වීඩියෝ සටහන් කිරීමේ උපකරණ (DVR) ප්‍රතිස්ථාපනය කිරීමෙන් එම පද්ධතියේ ගබඩා ධාරිතාව මාස 01 සිට 06 දක්වා වැඩි කරන ලදී. සියලුම මහ බැංකු පරිශ්‍රයන්හි ගිනි නිවීම් උපකරණ හා ඊට සම්බන්ධ උපාංග සැළකිය යුතු ප්‍රමාණයක් විධිමත් අයුරින් පිළිසකර කරන ලදී. එක් මාණ්ඩලික නිලධාරියෙකු හා ආරක්ෂක නිලධාරීන් 8 දෙනෙකු මාලබේ පිහිටි කොළඹ ජාත්‍යන්තර නාවික ඉංජිනේරු විද්‍යාලයේදී (CINEC) ගිනි නිවීම් සම්බන්ධව පුහුණුවක් සඳහා සහභාගි කරවන ලදී. කොළඹ ගිනි නිවීම් ඒකකයේ හා ශාන්ත ජෝන් ගිලන් රථ සේවයේ සහයෝගය ඇතිව සියලුම දෙපාර්තමේන්තු නියෝජනය වන පරිදි තෝරාගත් ගිනි සහායක නිලධාරීන් 106 දෙනෙකු සඳහා පුළුල් පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ කොළඹ ගිනි නිවීම් ඒකකය සමගින් සමස්ත මහ බැංකු සේවා නියුක්තිකයන් උදෙසා ගිනි වැළැක්වීම හා ගිනි නිවීම සම්බන්ධව පෙරහුරු වැඩසටහනක්ද 2013 වසර තුළ පවත්වන ලදී.

රාජගිරිය විදු පියෙසේදී, ආරක්ෂක නිලධාරීන් 25 දෙනෙකු සඳහා නායකත්ව සහ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම අරමුණු කරගත් පුහුණු පාඨමාලා 2 ක් පැවැත්වූ අතර ආරක්ෂක නිලධාරීන් 32 කින් සමන්විත තවත් කණ්ඩායමක් සඳහා අතුරුගිරිය ජාතික වතු කළමනාකරණ ආයතනයේ දී එදිනෙදා ආරක්ෂක කටයුතු, ප්‍රභූ ආරක්ෂාව, පරිවාර රාජකාරි හා මහජන සම්බන්ධතා පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම පිණිස දින දෙකකක නේවාසික පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී.

එමෙන්ම 2013 වසරේදී, ශ්‍රී ලංකා මහ බැංකු පරිශ්‍රයන්හි පවත්වන්නට යෙදුනු සියලුම රැස්වීම් හා දීප ව්‍යාප්ත කාසි එකතු කිරීමේ වැඩසටහන් සියල්ල සඳහා ද ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සිය සේවය ලබාදෙන ලදී.

## 26. සංඛ්‍යාන

ශ්‍රී ලංකාවේ සංඛ්‍යාන දත්ත පුළුල් ලෙස එක්රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම පෙරදැරි කරගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව, 1978 වසරේ දී සංඛ්‍යාන දෙපාර්තමේන්තුව පිහිටවනු ලැබීය. ඒ අනුව, මෙම දෙපාර්තමේන්තුව විසින් ජාතික ගිණුම් සැකසීම, නියැදි සමීක්ෂණ පැවැත්වීම හා ආර්ථිකමිතික ආකෘතීන් සකස් කිරීම වැනි පුළුල් පරාසයක පැතිරුණු කාර්යයන් ඉටු කරනු ලැබිණි. මේ වනවිට සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය මූලික සාර්ව ආර්ථික විචල්‍යයන් පුරෝකථනය හා තක්සේරු කිරීම, මිල හා වැටුප් දර්ශක සකස් කිරීම, ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය සකස් කිරීම හා පළාත් දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම, සමීක්ෂණ පැවැත්වීම, දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ තුළින් දත්ත එක්රැස් කිරීම හා අවශ්‍ය පරිදි දත්ත සම්පාදනය කිරීම, ප්‍රකාශන හා පුවත්පත් නිවේදන මගින් තොරතුරු යාවත්කාලීනව නිකුත් කිරීම සහ ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව පිළිබඳ ශ්‍රේණිගත කිරීමේ දර්ශකය වැඩිදියුණු කිරීම වැනි පුළුල් පරාසයක් දක්වා ක්‍රමිකව විකාශනය වී ඇත.

### 26.1 ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන් පුරෝකථනය කිරීම

දෙපාර්තමේන්තුව කෙටි කාලීන පදනම මත පාරිභෝගික මිල උද්ධමනය සහ ආර්ථික වර්ධනය පුරෝකථනය කරනු ලබන අතර, රටෙහි මුදල් ප්‍රතිපත්ති සැකසීම වඩාත් පහසු කිරීම සඳහා එය මුදල් ප්‍රතිපත්ති කමිටුව සහ මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත්

කරයි. උද්ධමන පුරෝකථනය අනාගත මිල විචලනයන්හි දිශානතිය පිළිබඳ ප්‍රමුඛ දර්ශකයක් ලෙස භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ. උද්ධමනය සඳහා බලපෑම් කරනු ලබන විචල්‍යයන්ට අදාළ මිල ගණන්වල සිදුව ඇති සහ සිදු වේ යැයි අපේක්ෂිත වෙනස්කම්වලට අනුරූපව එය නිරන්තරවම යාවත්කාලීන කෙරේ. ඒ අනුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙහි (කො.පා.මි.ද.) ඇතුළත් පාරිභෝගික භාණ්ඩ හා සේවාවන්හි මිල විචලනයන් පිළිබඳව දෙපාර්තමේන්තුව ක්‍රමවත්ව සහ සමීපස්ථව සොයා බැලීම් සිදු කළ අතර, එම මිල වර්ධනයන් විශ්ලේෂණය කරමින් මාසිකව පුවත්පත් නිවේදන නිකුත් කළේය. පාරිභෝගික මිල ගණන්හි අතීත හා අනාගත ප්‍රවණතා සහ දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලද ආර්ථිකමිතික ක්‍රමවේදයන් උද්ධමන පුරෝකථනයන් සඳහා ප්‍රධාන වශයෙන් පදනම් විය.

ආංශික ආර්ථික සංවර්ධන විශ්ලේෂණයන් සමගින් ප්‍රාථමික සහ ද්විතීයික මූලයන් තුළින් එක්රැස් කරගන්නා ලද දත්ත පදනම් කරගනිමින් ආංශික සංයුතීන් ද ඇතුළත් වන පරිදි දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) වාර්ෂිකව සහ කාර්තුමය වශයෙන් පුරෝකථය කරනු ලැබේ. ආර්ථිකයේ සිදුවන වත්මන් සංවර්ධනයන් විදහා දැක්වීමට නව දර්ශක විචල්‍යයන් එක්කිරීම සහ සංඛ්‍යාන විධික්‍රම හඳුන්වාදීම තුළින් පුරෝකථනයන්හි ගුණාත්මක බව සහ විශ්වසනීයත්වය තවදුරටත් ඉහළ නැංවීය. පරිභෝජනය, ආයෝජනය සහ ඉතිරිකිරීම් වැනි අනෙකුත් ජාතික ආදායම් ගිණුම් සංරචකයන් පිළිබඳ පුරෝකථනයන් ද වාර්ෂිකව පිළියෙළ කෙරේ.

## 26.2 මිල හා වැටුප් දර්ශක ගණනය කිරීම

පළාත් නවය සඳහා වන පළාත්බද පාරිභෝගික මිල දර්ශක සහ සමස්ත දිවයිනම ආවරණය කරනු ලබන සංයුක්ත පාරිභෝගික මිල දර්ශකය ගණනය කිරීම සහ විශ්ලේෂණය කිරීම ද දෙපාර්තමේන්තුව විසින් මාසිකව සිදු කරන ලදී. පළාත් මට්ටමෙන් මිල විචලනයන් සන්සන්දනය කිරීම මෙම පාරිභෝගික මිල දර්ශක ගණනය කිරීමෙහි ප්‍රධාන අරමුණ විය. 2003/04 වර්ෂයන්හි දී දෙපාර්තමේන්තුව මඟින් පවත්වන ලද පාරිභෝගික මූල්‍ය සහ සමාජ ආර්ථික සමීක්ෂණය, පළාත්බද පාරිභෝගික මිල දර්ශක සඳහා පදනම සැපයීය. මෙම දර්ශක සැකසීම සඳහා භාවිතා කරන දත්ත දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ (දීප දත්ත) සහ අනෙකුත් අදාළ විශ්වසනීය බාහිර මූලාශ්‍ර වෙතින් ලබා ගැනිණි.

ප්‍රාථමික වෙළෙඳපොළ මට්ටමෙහි නිෂ්පාදන සහ තොග වෙළෙඳ මිල ගණන්හි විචලනයන් මිනුම් කිරීම සඳහා තොග මිල දර්ශකය (තො.මි.ද.) ගණනය කිරීම ද දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කළේය. තො.මි. දර්ශකය සැකසීම සඳහා අවශ්‍ය දත්ත, දීප දත්ත වැඩපිළිවෙළ හරහා සහ අනෙකුත් අදාළ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන වෙතින් රැස් කෙරේ. නිෂ්පාදන මට්ටමෙහි දී මිල වර්ධනයන් මිනුම් කිරීම සඳහා වඩාත් නියෝජනාත්මක මිල දර්ශකයක් හඳුන්වා දීමේ අරමුණෙන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ ද සහයෝගය ඇතිව ශ්‍රී ලංකාව සඳහා නිෂ්පාදන මිල දර්ශකයක් (නි.මි. දර්ශකයක්) සකස් කිරීමට අදාළ කටයුතු 2013 වසරේ දී ආරම්භ කළේය. යෝජිත දර්ශකය හඳුන්වා දීමට අදාළ ගැටළු පිළිබඳව දෙපාර්තමේන්තුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමග වසර මුළුල්ලේම නිරන්තර සංවාදයන්හි යෙදුණි.

මිල දර්ශකයන්ට අමතරව, ආර්ථිකයෙහි වැටුප් සහ වේතනවල විචලනයන් තක්සේරු කිරීම සඳහා දෙපාර්තමේන්තුව වැටුප් ප්‍රමාණ දර්ශකද ගණනය කරන ලදී. ඒ අනුව, රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා නාමික සහ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකත් විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකත් දෙපාර්තමේන්තුව විසින් ගණනය කරන ලදී. රාජ්‍ය අංශය සඳහා වූ වැටුප් ප්‍රමාණ දර්ශකය මඟින් මධ්‍යම රජයෙහි විධායක නොවන, සුළු සේවක ශ්‍රේණි සහ රජයේ පාසල් ගුරුවරුන් පමණක් ආවරණය වූ බැවින් 2012 වසරේ පැවැත් වූ වාර්ෂික රාජ්‍ය අංශයේ සේවක සමීක්ෂණය (APSES) යටතේ එක්රැස් කළ තොරතුරු පදනම් කර ගනිමින්, රාජ්‍ය අංශයේ සියලුම සේවක ශ්‍රේණි ආවරණය වන පරිදි රාජ්‍ය අංශය සඳහා වැටුප් ප්‍රමාණ දර්ශකයක් සකස් කිරීමට අදාළ කටයුතු 2013 වසරේ දී දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලදී. විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් විචලනයන් විශ්ලේෂණය කිරීම සඳහා දෙපාර්තමේන්තුව අවම මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක සැකසූ අතර, ඒ සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් ගණනය කරන ලද අවම වැටුප් ප්‍රමාණ දර්ශක (නාමික) සහ කො.පා.මි. දර්ශකය (2006/07=100) යොදා ගැනිණි. මීට අමතරව, දීප දත්ත වැඩපිළිවෙළ හරහා කෘෂිකර්මාන්ත සහ ගොඩනැගිලි ඉදිකිරීම් උප අංශයන් ආවරණය කරමින් රැස් කරගනු ලැබූ දෛනික වැටුප් තොරතුරු පදනම් කර ගනිමින් අවිධිමත් පෞද්ගලික අංශයෙහි වැටුප් විචලනයන් විශ්ලේෂණය කෙරිණි.

## 26.3 ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය ගණනය කිරීම

සමස්ත ශ්‍රී ලංකාවේ සහ එහි එක් එක් පළාත්වල සෞභාග්‍ය තත්ත්වය තක්සේරු කිරීම සඳහා සංයුක්ත දර්ශකයක අවශ්‍යතාවය ඉටුකර ගැනීමට 2008 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය, සමස්ත දිවයිනෙහි සහ එක් එක් පළාත්වල ආර්ථික හා සමාජීය සංවර්ධනයන් පිළිබිඹු කරන බහුමාන දර්ශකයක් වේ. ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය, ආර්ථික හා ව්‍යාපාර පරිසරය, ජන ජීවිතයේ යහපැවැත්ම සහ සමාජීය ආර්ථික යටිතල පහසුකම් යන උප දර්ශක තුනෙන් සංයුක්ත වන අතර, සමස්ත දර්ශකය විචල්‍යයන් 26 කින් සමන්විත වේ. ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මඟින් වාර්ෂික පදනම් යටතේ ගණනය කරනු ලබන අතර, 2009-2011 කාලපරිච්ඡේදය සඳහා එම දර්ශකය 2012 දී ප්‍රකාශයට පත්කරන ලදී. සෞභාග්‍යය ළඟා කර ගැනීම සඳහා රට තුළ සිදු වන ආර්ථික පරිවර්තනය වඩාත් හොඳින් පිළිබිඹු වන විචල්‍යයන් ඇතුළත් කරමින් ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය වැඩිදියුණු කිරීමට අවශ්‍ය පියවර දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇත.

## 26.4 පළාත් දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම

2012 වසර සඳහා නාමික පළාත් දළ දේශීය නිෂ්පාදිතය (ප.ද.දේ.නි.) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුගත ද.දේ.නි. පාදක කොට ගෙන සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලැබිණි. පළාත් නමය සඳහා වාර්ෂික පදනම මත ගණනය කරනු ලැබූ ප.ද.දේ.නි. 2013 දී ප්‍රකාශයට පත්කරන ලදී.

## 26.5 සංඛ්‍යාන සමීක්ෂණ

2006 වසරේ දී ආරම්භ කරන ලද, උද්ධමන අපේක්ෂාවන් පිළිබඳ සමීක්ෂණය සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් මාසිකව පවත්වන ලදී. මෙම සමීක්ෂණය මගින් මූල්‍ය ආයතන, රාජ්‍ය අංශයේ ආයතන, පාසල් හා සිල්ලර වෙළෙඳසැල් ආවරණය වන පරිදි 300 ක් පමණ පිරිසකගේ ප්‍රතිචාර ලබා ගැනේ. විද්‍යුත් තැපැල් හා සම්මුඛ පරීක්ෂණ මගින් ප්‍රතිචාර එක්රැස් කරගනු ලැබේ. ප්‍රතිචාර දක්වන්නන් විසින් වර්තමාන උද්ධමන තත්ත්වය මෙන්ම ඉදිරි මාස 12 ක කාලය තුළදී අපේක්ෂිත උද්ධමනය පිළිබඳව ද ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු සපයනු ලැබේ. අදාළ මාසයේ සමීක්ෂණයේ ප්‍රතිඵල මුදල් ප්‍රතිපත්ති කමිටුවට හා මුදල් මණ්ඩලයට වාර්තා කරනු ලැබේ.

රටෙහි රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙහි මට්ටම් හා උපනතීන් නිර්ණය කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික සහ කාර්තුමය සමීක්ෂණ (QPSES) මෙම වසරේදී ද සිදු කරන ලදී. මෙම දත්ත ජාතික ආදායම ඇස්තමේන්තු කිරීමේදී ද භාවිතා කෙරේ. 2012 වසරේ සිදු කළ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික සමීක්ෂණයෙහි දී වාර්තා වූ සේවකයන් 1,000 ට වැඩි සියලුම මධ්‍යම රජයේ ආයතන, පළාත් පාලන ආයතන සහ අර්ධ රාජ්‍ය ආයතන කාර්තුමය සමීක්ෂණය තුළින් ආවරණය කෙරිණි. මෙම සමීක්ෂණවලින් අනාවරණය කර ගන්නා ලද තොරතුරු පදනම් කර ගෙන 2013 දී විශ්ලේෂණාත්මක වාර්තාවක් පිළියෙළ කරන ලදී. සේවා නියුක්තිය, සේවා වියුක්තිය, විදේශ සේවා නියුක්තිය, කම්කරු සබඳතා, ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ සහ ශ්‍රම ඵලදායිතාව යන අංශ ආවරණය වන පරිදි ශ්‍රම බලකාය සහ ශ්‍රම වෙළෙඳපොළ පිළිබඳව රැස්කළ තොරතුරු විශ්ලේෂණය කිරීම ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී.

පෞද්ගලික සේවා කටයුතු මගින් ද.දේ.නි.යට එකතු කළ අගය මත දායකත්වය ඇගයීම අරමුණු කර ගනිමින් ප්‍රමාණවත් ලෙස ආවරණය වී නොතිබූ තෝරාගත් පෞද්ගලික සේවාවන් සඳහා විශේෂ සමීක්ෂණ මාලාවක් දෙපාර්තමේන්තුව මගින් දියත් කරන ලදී. පෞද්ගලික අංශයේ සෞඛ්‍ය, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලිය පදනම් කරගත් සේවා බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (IT/BPO) සේවාවන් සහ අනෙකුත් පෞද්ගලික සේවා කටයුතු ඔස්සේ මෙම සමීක්ෂණයන් ක්‍රියාත්මක කෙරිණි. පවත්නා තොරතුරු අනුව සම්භාවිතාව මත පදනම් වූ මෙන්ම එසේ නොවන නියැදීම් ක්‍රම ද මෙම සමීක්ෂණ සඳහා යොදා ගන්නා ලදී. ආංශික වර්ධන ඇස්තමේන්තු මෙන්ම බහිර්නිවේශන ක්‍රම භාවිතයෙන් මෙම එක් එක් අංශය මගින් දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙන දායකත්වය තක්සේරු කරනු ලැබීය. අනාගත ප්‍රතිපත්ති සම්පාදනය සඳහා උපකාරී වනු පිණිස මෙම සමීක්ෂණයන්හි ප්‍රතිඵල කළමණාකාරිත්වයට ඉදිරිපත් කරනු ලැබීය.

## 26.6 දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ

1978 වසරේ දී ආරම්භ කරන ලද, දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ, දත්ත සමීක්ෂකයන් ලෙස ක්‍රියාකරන දිවයින පුරා විහිදුණු රජයේ පාසල් ගුරුවරුන්ගෙන් සමන්විත ජාලයක් හරහා අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ. මෙම වැඩපිළිවෙළ මගින් දත්ත රැස් කිරීමේ මධ්‍යස්ථාන 102 ක් ආවරණය කෙරේ. මෙම දත්ත සමීක්ෂකවරුන් විසින් පාරිභෝගික භාණ්ඩවල සිල්ලර මිල ගණන්, කෘෂිකාර්මික භාණ්ඩවල හා මත්ස්‍ය නිෂ්පාදනවල නිෂ්පාදක මිල ගණන්, අවිධිමත් පෞද්ගලික අංශයේ දෛනික වැටුප් සහ කෘෂිකාර්මික හා මත්ස්‍ය නිෂ්පාදනවල අනාගත නිෂ්පාදන මට්ටම් සතිපතා, මාසපතා හා කාර්තුමය වශයෙන් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව වෙත වාර්තා කරනු ලබයි. මීට අමතරව, පිටකොටුව වෙළෙඳපොළ, මරඳගහමුල සහල් වෙළෙඳපොළ සහ දඹුල්ල හා නාරාහේන්පිට විශේෂ ආර්ථික මධ්‍යස්ථානවලින් තොග සහ සිල්ලර මිල ගණන් දෛනිකව හා සතිපතා රැස් කිරීම සඳහා ගුරුවරුන් නොවන සමීක්ෂකවරුන් සිව් දෙනෙකුගේ සේවය ලබා ගනී.

මෙම වැඩපිළිවෙළ යටතේ එක් රැස් කරනු ලබන දත්ත, මිල දර්ශක ගණනය කිරීම, මිල විචලනයන් පුරෝකථනය කිරීම, ප්‍රතිපත්ති වෙනස් කිරීම් මගින් මිල මත ඇති කළ බලපෑම ඇගයීම සහ ජාතික ආදායම හා වියදම ඇස්තමේන්තු කිරීම වැනි විවිධ අරමුණු සඳහා යොදා ගනු ලබයි. දත්ත සමීක්ෂකවරුන් විසින් වාර්තා කරනු ලබන දත්තවල නිරවද්‍ය බව හා කාලීන බව පවත්වා ගෙන යෑම සඳහා දෙපාර්තමේන්තුව විසින් ක්‍රමවත් ස්ථානීය හා දුරස්ථ අධීක්ෂණයන් සිදු කරනු ලබයි. මීට අමතරව, සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් කොළඹ දිස්ත්‍රික්කයේ තෝරා ගන්නා ලද වෙළෙඳපොළවලින් ඍජුවම රැස්කරනු ලබන මිල ගණන් සමග සැසඳීම මගින් මෙම දත්තවල නිරවද්‍යතාව තවදුරටත් තහවුරු කරගනු ලබයි. 2012 වසරේ දී මෙන්ම තෝරාගත් දත්ත එක්රැස් කිරීමේ මධ්‍යස්ථානවල අධීක්ෂණ කටයුතු මහ බැංකුවේ පළාත් කාර්යාල හරහා සිදු කරන ලදී.

මෑත කාලීනව ආර්ථිකය තුළ හටගත් වෙළෙඳපොළ වර්ධනයන් සහ ආර්ථික ක්‍රියාකාරකම් ආවරණය වන පරිදි, යාවත්කාලීන කළ දත්ත රැස් කිරීමේ ලේඛන හඳුන්වා දීම මගින් වසර තුළ දී දත්ත රැස් කිරීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කරන ලදී. එමෙන්ම වැඩි තොරතුරු ප්‍රමාණයක් ලබා ගැනීමේ අරමුණෙන් හා පරිශීලනය පහසුවන අයුරින් "පූර්ව අනතුරු ඇඟවීමේ" වැඩසටහන සම්බන්ධ දත්ත රැස් කිරීමේ ලේඛනය ද වසර තුළ දී සංශෝධනය කරන ලදී.

දත්ත සමීක්ෂණය කිරීමේ දී මුහුණ දුන් අත්දැකීම් බෙදා හදා ගැනීමටත් හඳුනාගත් ප්‍රාදේශීය මිල වර්ධනයන්ගේ වෙනස්කම් පිළිබඳ ප්‍රතිපෝෂණයක් ලබා ගැනීමටත් වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ ගැටළු සාකච්ඡා කිරීමටත් සුපුරුදු පරිචය අනුව යමින් 2013 වසරේ දී කොළඹ, මාතර, අනුරාධපුර, මහනුවර සහ යාපනය යන ස්ථානවල දී ප්‍රාදේශීය සම්මන්ත්‍රණ පහක් පැවැත්විණි. ආර්ථිකයේ වත්මන් වර්ධනයන් පිළිබඳ විශේෂ අධ්‍යාපනික සැසි ද, මෙම සම්මන්ත්‍රණයට ඇතුළත් විය.

### 26.7 ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව ශ්‍රේණිගත කිරීම වැඩිදියුණු කිරීම

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව 2009 වසරේ සිට ශ්‍රී ලංකාවේ "ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව" පිළිබඳ වන ශ්‍රේණිය වැඩිදියුණු කිරීමේ කාර්යයෙහි නිරත විය. ඒ සඳහා දෙපාර්තමේන්තුව මඟින් 2103 වසරේ දී ප්‍රධාන කාර්යයන් කිහිපයක් සිදු කරන ලදී. ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව ශ්‍රේණි ගත කිරීම වැඩිදියුණු කිරීම සහ මෑදි කාලීනව එය තවදුරටත් වර්ධනය කිරීම සඳහා අවශ්‍ය සකස් කිරීමට, උපායමාර්ග ප්‍රධාන කොටස්කරුවන්ගේ සහ දත්ත සැපයුම්කරුවන්ගේ සහභාගිත්වයෙන් අදාළ සංවිධාන හා අදාළ ක්‍රියාපටිපාටීන්ගේ ප්‍රතිසංශෝධන විය යුතු අංශ පිළිබඳ ඔවුන් දැනුවත් කිරීම සඳහා සාකච්ඡා සංවිධානය කිරීම, සිදු කළ ප්‍රතිසංස්කරණ හා ගැටළුමය තැන් පැහැදිලි කර ගැනීමට හා ඊට අදාළ වාර්තා ලෝක බැංකුව වෙත යොමු කළ හැකි පරිදි, පාර්ශ්වකරුවන් වොෂින්ටනයේ ලෝක බැංකු මූලස්ථානය සමඟ ඍජුවම සාකච්ඡා කළ හැකි වීඩියෝ සම්මන්ත්‍රණ පැවැත්වීම යන ක්‍රියාකාරකම් ඒ අතර වේ. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව, ඉදිකිරීම් සම්බන්ධ බලපත්‍ර ලබා ගැනීම, විදුලිබලය ලබා ගැනීම, බදු ගෙවීම හා දේශසීමා හරහා වෙළෙඳාම යන අංශවලින් පෙන්නුම් කළ වර්ධනය මඟින් ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව ශ්‍රේණිගත කිරීමේ දර්ශකයේ අගය 2013 පැවැති 60.87 සිට 2014 දී 61.83 දක්වා වැඩි දියුණු කර ගැනීමටත් මායිම් වක්‍රය සමඟ ඇති පරතරය (distance to frontier) අඩු කර ගැනීමටත් සමත් විය. මෙම ශ්‍රේණිගත කිරීම තුළ දකුණු ආසියාවේ ඉහළම ශ්‍රේණිය ලැබූ රට ශ්‍රී ලංකාව වේ.

### 26.8 සංඛ්‍යාන තොරතුරු බෙදාහැරීම

ප්‍රතිපත්ති සම්පාදකයන්, පර්යේෂකයන්, ශාස්ත්‍රඥයන්, වෘත්තිකයන්, ශිෂ්‍යයන් හා මහජනතාවට අවශ්‍ය ඔවුන් උනන්දුවක් දක්වන සමාජ ආර්ථික දත්ත පුළුල් පරාසයකින් ලබාදීමට සංඛ්‍යාන දෙපාර්තමේන්තුව වගකීමෙන් යුතුව කටයුතු කරනු ලබයි. මෙම වසර තුළ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රධාන වාර්ෂික ප්‍රකාශනයන් දෙකක් ප්‍රකාශයට පත් කළ අතර, "ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන 2013 - XXXV වෙළුම" දෙවන වතාවට භාෂා ත්‍රිත්වයෙන්ම 2013 අප්‍රේල් මස ප්‍රකාශයට පත්කරන ලද අතර, "ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත 2013 - XXXVI වෙළුම" 2013 ජූනි මස ප්‍රකාශයට පත්කරන ලදී. ඊට අමතරව, 2013 වසරේ දී සතිපතා හා මාස්පතා ආර්ථික දර්ශකද ප්‍රකාශයට පත් කරන ලදී. සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මඟින් ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව හා මෑත කාලීන ආර්ථික ප්‍රවණතා යන ප්‍රකාශන සඳහා පරිච්ඡේද දෙකක් සපයන අතර, මාසික විවරණිකාව සඳහා ක්‍රමවත් දායකත්වයක් දක්වනු ලැබීය. තවදුරටත්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් ලබාගත් තෝරාගත් භාණ්ඩවල මිල ගණන් සතිපතා ප්‍රතිපත්තිමය අරමුණු උදෙසා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට ඉදිරිපත් කරයි. අදාළ තොරතුරු දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ (StaNet) හා ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ යාවත්කාලීන කර ඇත.

## 27. කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ

කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව (කා.සේ.ක.)[1] විසින් ප්‍රතිලාභීන් වෙත සුභසාධන පහසුකම් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස මෙම වසර තුළ දී ද සපයන ලදී. කා.සේ.ක. දෙපාර්තමේන්තුවේ කාර්යයන් තුළ කාර්ය මණ්ඩල නිවාස (උකස්) ණය ක්‍රමය, අර්ථසාධක අරමුදල් ණය ක්‍රමය සහ කාර්ය මණ්ඩල සුභසාධන ණය ක්‍රමය යටතේ ණය ලබා දීම, සේව්‍ය දායක වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීම සහ ආපනශාලා පහසුකම් සැපයීම ඇතුළත් වේ. සේවා නියුක්තිකයන්, විශ්‍රාමිකයන්, වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා ලියාපදිංචි යැපෙන්නන්ගෙන් සමන්විත වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ මුළු ලියාපදිංචි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 11,500 ඉක්මවිය.

2013 වසර තුළ දී, කා.සේ.ක. දෙපාර්තමේන්තුව විසින් අර්ථසාධක අරමුදල් ණය, කාර්ය මණ්ඩල සුභසාධන ණය ක්‍රමය යටතේ වාහන ණය, පරිගණක ණය හා වෙනත් ණය සහ නිවාස ණය ඇතුළු මුළු ණය 2,162 ක් ප්‍රදානය කරන ලදී. අයදුම්කරු විසින් අදාළ සියලුම ලියකියවිලි සහිතව ඉදිරිපත් කරනු ලැබූ අයදුම්පත් සඳහා නියමිත දින ගණන ඇතුළත ණය නිකුත් කිරීමට හැකි විය. ණය අධීක්ෂණ ක්‍රමය මඟින් වඩාත් කාර්යක්ෂමව සේවා නියුක්තිකයන්ට ණය ලබා දීමට හැකි වී ඇත.

මහ බැංකු ආපනශාලාව මඟින් බැංකු කාර්ය මණ්ඩලයට උදෑසන සහ දිවා ආහාර සැපයීම තවදුරටත් සිදු කරන ලදී. දෙපාර්තමේන්තුව මඟින් උදෑසන සහ සවස තේ/ඔසුපැන් ලබා දීමේ සේවයට අතිරේකව දියර කිරි සපයනු ලැබීය. 2014 වසර තුළ දී ආපනශාලා පහසුකම් තවත් වැඩිදියුණු කිරීමට අවශ්‍ය සියලු මූලික විධිවිධාන සකස් කරන ලදී.

සියලුම ලියාපදිංචි ප්‍රතිලාභීන් සඳහා වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කා.සේ.ක. දෙපාර්තමේන්තුව විසින් නොකඩවා ක්‍රියාත්මක කරන ලදී. පසුගිය වසරට සාපේක්ෂව ප්‍රතිපූරණ කරන ලද වෛද්‍ය වියදම්

1 2013 අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සුභසාධන දෙපාර්තමේන්තුව, කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව ලෙස නම් කරන ලදී.

ප්‍රමාණය සියයට 5 කින් ඉහළ ගොස් ඇත. 2013 දෙසැම්බර් මස 06 දින සිට ක්‍රියාත්මක වන පරිදි වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමයේ "ඇ" සහ "ඈ" කාණ්ඩ යටතේ වූ හිමිකම් සීමාවන් වැඩි කරන ලදී. පිළිගත් පෞද්ගලික ආරෝග්‍යශාලාවකින් ලබාගත් වෛද්‍ය සේවා මගින් කාර්යාල වේලාවන් තුළ දී මහ බැංකුවේ වෛද්‍ය මධ්‍යස්ථානය ඔස්සේ කාර්ය මණ්ඩලයට අවශ්‍ය වෛද්‍ය සේවාවන් සපයන ලදී. තව ද, සාධාරණ මිලකට රසායනාගාර පරීක්ෂණ පහසුකම් ද වෛද්‍ය මධ්‍යස්ථානය තුළින් සිදු කෙරිණි. සෞඛ්‍ය සේවාවන් සම්බන්ධව සේවා නියුක්තිකයන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පහක් මෙම වසර තුළ දී කා.සේ.ක. දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරන ලදී.

"සේවා නියුක්තිකයන්ගේ සහ විශ්‍රාමිකයන්ගේ ආපදා සහන අරමුදලේ" සාමාජිකයකු හට හදිසියේ ඇතිවන අසාධ්‍ය රෝගාබාධයක්, බරපතල සැත්කමක් හෝ කල්ගතව පවත්නා රෝගී තත්ත්වයකදී වෛද්‍ය ප්‍රතිකාර ගැනීම සඳහා මූල්‍යමය දුෂ්කරතාවයකට මුහුණ පෑමට සිදු වූ අවස්ථාවක දී එකී ප්‍රතිකාර වෙනුවෙන් වැය කළ යුතු වියදම මහ බැංකු වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ එකී සාමාජිකයාහට හිමිකම් පෑ හැකි ප්‍රමාණය ඉක්මවා යන අවස්ථාවල දී මූල්‍ය ආධාර සැපයීම සඳහා මෙම අරමුදලේ නීතිරීති සංශෝධනය කරන ලදී.

## 28. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ

### 28.1 විධි නියෝගය

බලපත්‍රලාභී මුදල් සමාගම් නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපර්තමේන්තුව 1988 වසරේ දී ස්ථාපනය කරන ලදී. ඒ වන විට, බලාත්මක වූ 1979 අංක 27 දරන මුදල් සමාගම් පාලන පනත වෙනුවට 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත ප්‍රතිස්ථාපනය කර මුදල් සමාගම් පනතෙහි ඇති විධිවිධාන බලගැන්වීමෙහි වගකීම මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරිණි. බලපත්‍රලාභී මුදල් සමාගම් නියාමනය හා අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කිරීමට හා අනවසරයෙන් තැන්පතු රැස්කරන ව්‍යාපාර මැඩලීමේ අරමුණින්, මුදල් සමාගම් පනත අහෝසි කරමින් 2011 නොවැම්බර් 09 දින සිට බලාත්මක වන පරිදි 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත ප්‍රතිස්ථාපනය කරන ලදී. 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත බලාත්මක වීමත් සමග කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර නියාමනය හා අධීක්ෂණය ද මෙම දෙපාර්තමේන්තුව යටතට පත්විය.

### 28.2 කාර්යයන්

මුදල් ව්‍යාපාර හා විශේෂිත කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම, විචක්ෂණ අවශ්‍යතා සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, අඛණ්ඩ අධීක්ෂණයන් හා කාලාවර්තීත එතැන් පරීක්ෂණ සිදු කිරීම, නියාමන අනුමැතීන් ලබාදීම, අනවසරයෙන් පවත්වාගෙන යන මුදල් ව්‍යාපාර විමර්ශනය කිරීම හා එම ආයතන පිළිබඳ නීතිමය පියවර ගැනීම හා අනවසර මූල්‍ය ආයතනවල මුදල් තැන්පත් කිරීමේ ඇති අවදානම පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම මෙම දෙපාර්තමේන්තුවේ වගකීම්වලට ඇතුළත් වේ.

2013 වසර අවසානය වන විට, බලපත්‍රලාභී මුදල් සමාගම් 48 ක් සහ බලපත්‍රලාභී වාණිජ බැංකු 13 කින්, බලපත්‍රලාභී විශේෂිත බැංකු 7 කින්, බලපත්‍රලාභී මුදල් සමාගම් 46 කින් හා විශේෂිත කල්බදු මූල්‍යකරණ ආයතන 10 කින් සමන්විත ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන 76 ක් පැවතිණ. මෙම බලපත්‍රලාභී මුදල් සමාගම් හා ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතනවල නම් මෙහි ඇමුණුම II-3 හි දක්වා ඇත.

### 28.3 වසර තුළ සිදු කළ ක්‍රියාකාරකම්

**(අ) බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අධීක්ෂණය කිරීම**

**(i) බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සම්බන්ධ දුරස්ථ පරීක්ෂණ**

බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් මගින් කාලාවර්තීතව ඉදිරිපත් කරන මූල්‍ය තොරතුරු පරීක්ෂා කිරීමෙන් සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සම්බන්ධව අඛණ්ඩ දුරස්ථ පරීක්ෂණ සිදු කෙරිණි. තවද, දෙපාර්තමේන්තුව විසින් අනතුරු කල්තියා හැඟවීමේ හා පසුවිපරම් කිරීමේ පද්ධති මගින් බලපත්‍රලාභී මුදල් සමාගම්හි ඇති විය හැකි අවදානම් හඳුනාගත් අතර එම අවදානම් අවම කර ගැනීම සඳහා වූ ක්‍රියාමාර්ග නිර්දේශ කරන ලදී. තවද, මූල්‍යමය ශක්තිමත් භාවය අනුව බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් ශ්‍රේණිගත කිරීම සඳහා අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයක් ද ක්‍රියාත්මක කරන ලදී.

**(ii) බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍ය කරණ සමාගම් සම්බන්ධ එතැන් පරීක්ෂණ**

අවදානම් හඳුනා ගැනීම, අවදානම් කළමනාකරණය හා එම අවදානම් අවම කිරීමට අවශ්‍ය සම්පත් ඇගයීම කේන්ද්‍ර කරගත් අවදානම් මත පදනම් වූ ප්‍රවේශයන් කාලාවර්තීත එතැන් පරීක්ෂණ සිදු කිරීමේ දී භාවිතා කෙරිණ. බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ද්‍රවශීලතාව, වත්කම්වල ගුණාත්මක භාවය, ප්‍රාග්ධන ප්‍රමාණත්වය, කළමනාකරණ කාර්යක්ෂමතාව, ඉපැයීම්, ලාභදායිත්වය, පද්ධති පාලන ක්‍රම හා ආයතනික යහපාලන තත්ත්වය ඇගයීම මෙම කාලාවර්තීත එතැන් පරීක්ෂණවල දී සිදු කරන ලදී. 2013 වසර තුළ දී, දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් 35 ක හා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 7 ක එතැන් පරීක්ෂණ සිදු කරන ලදී. හඳුනාගත් අවදානම් හා නිර්දේශ ඇතුළත් පරීක්ෂණ වාර්තා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ අධ්‍යක්ෂක මණ්ඩලයන් වෙත

ඉදිරිපත් කරන ලදී. මීට අමතරව, දුර්වල අංශ කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වමින් සීමිත විෂය පථයක් තුළ බලපත්‍රලාභී මුදල් සමාගම් 8 ක් හා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 2 ක් පරීක්ෂාවට ලක්කරන ලදී.

**(ආ) විධානයන් හා විචක්ෂණශීලී අවශ්‍යතාවයන් හඳුන්වා දීම**

මුදල් මණ්ඩලයේ අනුමැතිය සහිතව බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නව විධානයන් හා විචක්ෂණශීලී අවශ්‍යතා හඳුන්වා දෙන ලදී.

(i) පැවති ව්‍යුහාත්මක වෙනස්කම් සම්බන්ධයෙන් වන විධානයෙහි අමතර අංශයන් ලෙස බලපත්‍රලාභී මුදල් සමාගම්, මුදල් මණ්ඩලයේ සහ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂගේ අනුමැතිය ලබාගත යුතු අංශයන් වෙන් වෙන් වශයෙන් දක්වමින් එහි විෂය පථය පුළුල් කරන ලදී. තවද, වත්කම් මාරු කිරීම සම්බන්ධයෙන් වන විධානයෙහි ප්‍රතිපාදන ද නව ව්‍යුහාත්මක වෙනස්කම් පිළිබඳ විධානයට ඇතුළත් කරන ලදී.

(ii) මුදල් සමාගම් විසින් සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබාදෙන ණය පහසුකම් ලියා හැරීම සඳහා මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගත යුතුව තිබූ අවශ්‍යතාව, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයාගේ අනුමැතිය ලබාගත යුතු ලෙස ප්‍රතිස්ථාපනය කරන ලදී.

(iii) මුදල් සමාගම් විසින් නිකුත් කරනු ලබන ණය උපකරණ සඳහා විශේෂයෙන් ද්‍රවශීලතා හා පොලී අනුපාත/කුපන් අනුපාත වැනි අංශ සඳහා අධීක්ෂණ රාමුවක් හඳුන්වා දීම සඳහා විධානයන් සකස් කරන ලදී.

(iv) 2012 වසර සඳහා යොදාගත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLAS) 32, 39 සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) 7 අනුගමනය කිරීම පිළිබඳ මාර්ගෝපදේශය, ලාභාංශ බෙදා හැරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු බවට නියම කරන ලදී.

(v) ආයතනික යහපාලන විධානයෙහි විශේෂිත ව්‍යාපාරික ඒකක සහ බාහිර විගණකවරුන්ගේ වාර්තා/සහතික කිරීම් යන අංශයන්හි හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවන් සඳහා අවශ්‍ය සංශෝධන සිදු කරන ලදී.

(vi) මහ බැංකුවේ නියාමන/අධීක්ෂණ පිරිවැය සැලකිය යුතු ලෙස ඉහළ යාමක් අපේක්ෂා කළ හැකි බැවින් වාර්ෂික බලපත්‍ර ගාස්තු සංශෝධනය කරන ලදී. තවද, බලපත්‍රලාභී මුදල් සමාගමක් බලපත්‍රය ලබාගන්නා වසර තුළ දී ගෙවිය යුතු බලපත්‍ර ගාස්තුව ද වැඩි කරන ලදී.

**(ඇ) නියාමන අනුමැතීන්**

2013 වසර තුළ දී, සියපත ෆිනෑන්ස් ලිමිටඩ් සහ ඉන්ද්‍රා ෆිනෑන්ස් ලිමිටඩ් යන විශේෂිත කල්බදු මූල්‍යකරණ ආයතන බලපත්‍රලාභී මුදල් සමාගම් බවට පත් වූ අතර පීපල්ස් ෆිනෑන්ස් පීඑල්සී සමාගම, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගම සමග ඒකාබද්ධ වීමෙන් මුළු බලපත්‍රලාභී මුදල් සමාගම් සංඛ්‍යාව 47 සිට 48 දක්වා වැඩි විය. මීට අමතරව සීලීස් ලිමිටඩ් සමාගම, එම්සීඑස්එල් ෆිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ් සමාගම සමග ඒකාබද්ධ විය.

**(ඈ) බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සමග පැවති හමුවීම්**

(i) බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයට අදාළ ගැටලු සම්බන්ධයෙන් අදහස් හුවමාරු කර ගැනීම සඳහා මහ බැංකු අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන් සමග කාර්තුවකට වරක් රැස්වීම් පැවැත්විණ.

(ii) තවද, නියාමන අවශ්‍යතාවයන් හා නිවැරදි භාවිතයන් පිළිබඳ දැනුම්වත් භාවය වර්ධනය කිරීම සඳහා මහ බැංකු අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල සභාපතිවරුන් සමග රැස්වීමක් පැවැත්විණ. "ට්‍රිලියන එක ඉක්මවා යන බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය" යන තේමාව යටතේ බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල අධ්‍යක්ෂකවරුන් හා ප්‍රධාන විධායක නිලධාරීන් සඳහා වූ වාර්ෂික සමුළුව දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී.

**(ඉ) අනෙකුත් ක්‍රියාකාරකම්**

**(i) අනවසරයෙන් පවත්වාගෙන යන මුදල් ව්‍යාපාර පිළිබඳ විමර්ශනය**

2013 වසර තුළ දී දෙපාර්තමේන්තුව විසින් මුදල් ව්‍යාපාර පනතේ 42 වන වගන්තිය යටතේ අධිකාරි බලයක් නොමැතිව මුදල් ව්‍යාපාරවල නිරත වන පුද්ගලයන්/ආයතන සම්බන්ධව තවදුරටත් පරීක්ෂණ කෙරිණ. වසර තුළ දී දෙපාර්තමේන්තුව විසින් එක් ආයතනයක කටයුතු විධිමත් කළ අතර තවත් ආයතනයකට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා යොමු කරන ලදී.

**(ii) බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ඒකාබද්ධ කිරීමේ වැඩසටහන**

බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ඒකාබද්ධ වීම් සහ අත්පත් කර ගැනීම්

දිරිමත් කිරීම සඳහා එම ආයතනවලට බදු සහන ලබාදීමේ යෝජනාවක් 2014 අයවැය වෙත ඉදිරිපත් කරන ලදී. ආර්ථික වර්ධනයට සමගාමීව මූල්‍ය අංශයේ වැඩිවන ඉල්ලුමට සරිලන පහසුකම් සැලසීම සඳහා ශක්තිමත් බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයක් ගොඩ නැගීම සහ ඇතිවිය හැකි අසාර්ථක වීම් වැලැක්වීම මෙම යෝජනාවේ අරමුණ විය. 2014 වසර තුළ හා ඉන් ඉදිරියට මූල්‍ය අංශය තුළ ඇති කිරීමට යෝජිත ඒකාබද්ධ කිරීම් සම්බන්ධව මූලික සැලසුමක් ද දෙපාර්තමේන්තුව විසින් සකසන ලදී.

**(iii) බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා වූ ශිල්පීය සැසිවාර**

දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සඳහා අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) හා අවදානම් කළමනාකරණය සම්බන්ධ පුහුණු වැඩමුළු දෙකක් පවත්වන ලදී.

## 28.4 මහජනතාවට සිදුකළ දායකත්වය

**(අ) බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ වර්ධනය හා ස්ථාවරත්වය**

දෙපාර්තමේන්තුවට පැවරී ඇති කාර්යපථය අනුව බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ස්ථාවරත්වය තහවුරු කිරීමට දෙපාර්තමේන්තුව විසින් ගනු ලබන අධීක්ෂණ ක්‍රියාමාර්ග අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. 2013 වසර තුළ දී, සිදු වූ සාර්ව ආර්ථික වෙනස්වීම් සහ ජාත්‍යන්තර වෙළෙඳපෙළෙහි රත්රන් මිලෙහි සිදු වූ උච්ඡාවචනයන් නිසා ඇති වූ අභියෝග ඇතුළු අභියෝග රාශියකට බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයට මුහුණ දීමට සිදු විය. කෙසේ වෙතත්, බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් හි අවදානම් දරා ගැනීම සහ වර්ධනය අඛණ්ඩව පවත්වා ගැනීම තහවුරු කිරීමට දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබාදුන් අතර ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ දැඩි අධීක්ෂණ ක්‍රියාමාර්ගද ක්‍රියාත්මක කරන ලදී. තැන්පතු හා ණය ගැනීම් පිළිවෙළින් සියයට 33 ක හා සියයට 9 ක වර්ධනයක් අත්කර ගනිමින් අරමුදල් මූලාශ්‍රයන් දැක්වූ යහපත් වර්ධනය හේතුවෙන් මෙම අංශයේ වත්කම් ප්‍රමාණය ද සියයට 20 කින් වර්ධනය විය. ණය ලබාදීම් සියයට 17 කින් වර්ධනය විය. 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මාස 12 සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයෙහි රුපියල් බිලියන 8 ක බදු පසු ලාභයක් (විගණනය නොකළ) වාර්තා වූ අතර මුළු ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාතය සියයට 15 ක යහපත් මට්ටමක පැවතිණ.

**(ආ) මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන්**

**(i) දැනුම්වත් කිරීමේ වැඩසටහන් :** මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් මඟින් අනවසර මුදල් ව්‍යාපාරවල ආයෝජනය කිරීමේ ඇති අවදානම පිළිබඳව මහජනතාවට අධ්‍යාපනයක් ලබාදෙන ලදී. වසර තුළ දී මඩකලපුව, මොණරාගල, අම්පාර, හම්බන්තොට, කළුතර, කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් 23 ක් පවත්වන ලදී.

**(ii) ගුවන් විදුලි හා රූපවාහිනී වැඩසටහන්:** නුවර "ඇසළ පෙරහැර" හා සමගාමීව ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවයේ කඳුරට සේවාවේ විශේෂ විකාශය මඟින් මහජනතාව වෙත අනවසර මුදල් ව්‍යාපාර සම්බන්ධව විශේෂ පණිවිඩ විකාශය කරන ලදී.

**(iii) පත්‍රිකා හා පුවත්පත් දැන්වීම්:** මොණරාගල, මඩකලපුව හා යාපනය දිස්ත්‍රික්කවල ග්‍රාම නිලධාරීන් අතර බලපත්‍රලාභී බැංකු හා මුදල් සමාගම්වල නම් ලැයිස්තු ඇතුළත් දැන්වීම් පත්‍රිකා 2,000 ක් පමණ බෙදා දෙන ලදී. බලපත්‍රලාභී බැංකු හා මුදල් සමාගම්වල නම් ලැයිස්තු හා වෙනත් ප්‍රයෝජනවත් තොරතුරු ඇතුළත් අත්පත්‍රිකා 24,000 ක්ද මහජනයා අතර බෙදා දෙන ලදී. තැන්පතු රැස්කිරීමට අවසර ලත් ආයතනවල නම් ලැයිස්තුවක් භාෂා තුනෙන්ම පුවත්පත්වල පළ කළ අතර, 2013 වසරේ දෙවන භාගය තුළ දී හඳුනාගත් යථාරූපී නොවූ යෝජනා ක්‍රමවල අවදානම පිළිබඳ මහජනයා දැනුම්වත් කිරීමේ විශේෂ දැන්වීම්ද භාෂා තුනෙන්ම පුවත්පත්වල පළ කරන ලදී. ඉහත සියලුම ක්‍රියාකාරකම් මහජනතාව අතර මූල්‍යමය සාක්ෂරතාව ඉහළ නැංවීමට ඉවහල් වී ඇත.

**(ඇ) මහජන පැමිණිලි සඳහා යොමුවීම**

බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සම්බන්ධව මහජනතාවගෙන් නැගෙන පැමිණිලි විසඳීම සඳහා දෙපාර්තමේන්තුව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබීය. එවැනි චෝදනා අදාළ බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත යොමු කරන ලද අතර ඒ පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳවද පසු විමසීම් කරන ලදී.

**ඇමුණුම II-3**

## බලපත්‍රලාභී මුදල් සමාගම් සහ ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ සමාගම්

**නීති ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ බලපත්‍රලාභී ආයතන (2013 වසර අවසානයට)**

### බලපත්‍රලාභී මුදල් සමාගම්

1. අබාන්ස් ෆිනෑන්ස් පීඑල්සී
2. අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ්
3. ආර්පිකෝ ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
4. ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
5. ඉන්ද්‍රා ෆිනෑන්ස් ලිමිටඩ්
6. ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ්
7. එම්සීඑස්එල් ෆිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ්
8. එල්බී ෆිනෑන්ස් පීඑල්සී
9. එලායන්ස් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
10. ඒඑම්ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
11. ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පීඑල්සී
12. ඒෂියන් ෆිනෑන්ස් ලිමිටඩ්
13. ඔරියන්ට් ෆිනෑන්ස් පීඑල්සී
14. කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ්
15. කැපිටල් එලායන්ස් ෆිනෑන්ස් පීඑල්සී
16. කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
17. කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
18. පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පීඑල්සී
19. පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
20. ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රො ෆිනෑන්ස් ලිමිටඩ්
21. විලච් ෆිනෑන්ස් පීඑල්සී
22. ජෝර්ජ් ස්ටුවර්ට් ෆිනෑන්ස් පීඑල්සී
23. ටීකේඑස් ෆිනෑන්ස් ලිමිටඩ්
24. ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී
25. ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
26. ද ස්ටැන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ්
27. දේශෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
28. බ්‍රැක් ලංකා ෆිනෑන්ස් පීඑල්සී
    (පෙර, නන්දා ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී)
29. නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී
30. බාර්ට්ලීට් ෆිනෑන්ස් පීඑල්සී
31. බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී
32. මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
33. මල්ටි ෆිනෑන්ස් පීඑල්සී
34. මෙල්ස්ටා රීගල් ෆිනෑන්ස් ලිමිටඩ්
35. යූබී ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
36. රිචඩ් පීරිස් ආර්පිකෝ ෆිනෑන්ස් ලිමිටඩ්
37. ලංකා ඔරික්ස් ෆිනෑන්ස් පීඑල්සී
38. වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී
39. ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී
40 සිටි ෆිනෑන්ස් කෝපරේෂන් ලිමිටඩ්
41. සියපත ෆිනෑන්ස් ලිමිටඩ්
    (පෙර, සම්පත් ලීසිං ඇන්ඩ් ෆැක්ටරිං ලිමිටඩ්)
42. සිංගර් ෆිනෑන්ස් (ලංකා) පීඑල්සී
43. සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී
44. සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී
45. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී
46. සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී*
47. සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
48. සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී

### ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන

**(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු**

1. අමානා බැන්ක් ලිමිටඩ්
2. එම්සීබී බැන්ක් ලිමිටඩ්
3. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී
4. ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී
5. නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී
6. නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී
7. පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී
8. මහජන බැංකුව
9. යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී
10. ලංකා බැංකුව
11. සම්පත් බැන්ක් පීඑල්සී
12. සෙලාන් බැන්ක් පීඑල්සී
13. හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී

**(ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකු**

1. එම්බීඑස්එල් සේවින්ග්ස් බැන්ක් ලිමිටඩ්
2. ඩීඑෆ්සීසී බැංකුව
3. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
4. සණස ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී
5. ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්
6. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
7. ශ්‍රී ලංකා සේවින්ග්ස් බැන්ක් ලිමිටඩ්

**(ඇ) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්**

1. ඇසෙට්ලයින් ලීසිං කම්පැනි ලිමිටඩ්
2. එල්ඕඑල්සී මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ්
3. එස්එම්බී ලීසිං පීඑල්සී
4. ඉසුරු ලීසිං කම්පැනි ලිමිටඩ්
5. මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී
6. ලිස්වින් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
7. ලාෆ්ස් කැපිටල් ලිමිටඩ් (පෙර, සොෆ්ට්ලොජික් ක්‍රෙඩිට් ලිමිටඩ්)
8. කොෂීබා ලීසිං කම්පැනි ලිමිටඩ්
9. කෝපරේටිව් ලීසිං කම්පැනි ලිමිටඩ්
10. නිවෙස්ට් කැපිටල් ලිමිටඩ්

**(ඇ) ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රො ෆිනෑන්ස් ලිමිටඩ් සහ දේශෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්** යන සමාගම් හැර ඉහත සඳහන් සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම්

*ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කරන ලද කළමණාකරණ නියෝජිතයකු විසින් කළමණාකරණය සිදු කරන අතර ප්‍රතිව්‍යුහගත කරමින් පවතී. ඒ අතරතුර තැන්පත් රැස් කිරීම අත්හිටුවා ඇත.